276 වන කාණ්ඩය - 4 වන කලාපය | 2020 පෙබරවාරි 18වන අඟහරුවාදා
தொகுதி 276 - இல. 4 | 2020 பெப்ருவரி 18, செவ்வாய்க்கிழமை
Volume 276 - No. 4 | Tuesday, 18th February, 2020

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

ගරු රන්ජන් රාමනායක මහතා ලබා දුන් හඬ පට

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තා

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

ඉන්ධන මිල පහත දැමීම

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:

දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) -[ගරු අශෝක ප්‍රියන්ත මහතා] පළමුවන වර කියවන ලදී.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත:

නියෝග

ශ්‍රී ලංකා අපනයන සංවර්ධක පනත:

නියෝගය

සීමාසහිත කලුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015/2016)

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

සී/ස ලංකා පොස්පේට් සමාගම:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016/2017)

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)

වී අලෙවි මණ්ඩලය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013)

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

වී අලෙවි මණ්ඩලය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014)

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය:

වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014)

කල් තැබීමේ යෝජනාව:

භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ ව්‍යවහාරික විගණන වාර්තා

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்கவினால் வழங்கப்பட்ட குரல்பதிவுகள்

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

கணக்காய்வு சேவைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

தேசிய பெறுகை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கைகள்

அரசாங்க சேவை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கை

அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை

அரசாங்கப் பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

எரிபொருள் விலையைக் குறைத்தல்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:

தெதிகம ஶ்ரீ மைத்திரீ பிரக்ஞார்த்த பௌத்த கல்வி தஹம் சபாவ (கூட்டிணைதல்) - [மாண்புமிகு அசோக்க பிரியந்த] - முதன் முறை மதிப்பிடப்பட்டது

தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம்:

ஒழுங்குவிதிகள்

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்:

கட்டளை

களுபோவிட்டியான தேயிலைத் தொழிற்சாலை லிமிரெட்:

ஆண்டறிக்கை மற்றும் கணக்குகள் (2015/2016)

தேசிய பெருந்தோட்டக் கைத்தொழில் முகாமைத்துவ நிறுவனம்:

ஆண்டறிக்கை மற்றும் கணக்குகள் (2016)

தேயிலை சிறு பற்றுநிலங்கள் அபிவிருத்தி அதிகாரசபை:

ஆண்டறிக்கை மற்றும் கணக்குகள் (2015)

தேயிலை சிறு பற்றுநிலங்கள் அபிவிருத்தி அதிகாரசபை:

ஆண்டறிக்கை மற்றும் கணக்குகள் (2016)

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை:

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2016)

இலங்கை துறைமுக அதிகாரசபை:

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2015)

இலங்கை துறைமுக அதிகாரசபை:

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2016)

இலங்கை கமத்தொழில் ஆய்வுக் கொள்கைக்கான சபை:

ஆண்டறிக்கையும் கணக்குகளும் (2016)

இலங்கை பொஸ்பேட்டு லிமிடட்:

ஆண்டறிக்கையும் கணக்குகளும் (2016/2017)

அறுவடைக்குப் பிந்திய தொழில்நுட்ப நிறுவகம்:

ஆண்டறிக்கையும் கணக்குகளும் (2015)

நெல் சந்தைப்படுத்தும் சபை:

ஆண்டறிக்கையும் கணக்குகளும் (2013)

கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை:

ஆண்டறிக்கையும் கணக்குகளும் (2016)

ஹெக்டர் கொப்பேகடுவ விவசாய ஆராய்ச்சி மற்றும் பயிற்சி நிறுவகம்:

ஆண்டறிக்கையும் கணக்குகளும் (2016)

நெல் சந்தைப்படுத்தும் சபை:

ஆண்டறிக்கையும் கணக்குகளும் (2014)

தேசிய போக்குவரத்து வைத்திய நிறுவகம்:

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2015)

இலங்கை சிவில் விமானச் சேவைகள் அதிகாரசபை:

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2015)

இலங்கை சிவில் விமானச் சேவைகள் அதிகாரசபை:

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2016)

இலங்கை போக்குவரத்துச் சபை:

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2014)

ஒத்திவைப்புப் பிரேரணை:

பிணைமுறி விநியோகம் பற்றிய தடயவியல் கணக்காய்வறிக்கைகள்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Voice Recordings Handed Over by Hon. Ranjan Ramanayake

PERFORMANCE REPORT OF THE HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

PROGRESS REPORTS OF THE NATIONAL PROCUREMENT COMMISSION

PROGRESS REPORT OF THE PUBLIC SERVICE COMMISSION

REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Reduction of Fuel Prices

PRIVATE MEMBERS' BILLS:

Dedigama Sri Maithri Pragnartha Bouddha Educational DahamSabhawa (Incorporation) - [The Hon. Ashoka Priyantha] – Read the First time

NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT:

Regulations

SRI LANKA EXPORT DEVELOPMENT ACT:

Order

KALUBOVITIYANA TEA FACTORY LTD.:

Annual Report and Accounts (2015/2016)

NATIONAL INSTITUTE OF PLANTATION MANAGEMENT:

Annual Report and Accounts (2016)

TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY:

Annual Report and Accounts (2015)

TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY:

Annual Report and Accounts (2016)

SRI LANKA EXPORT DEVELOPMENT BOARD:

Annual Report and Accounts (2016)

SRI LANKA PORTS AUTHORITY:

Annual Report and Accounts (2015)

SRI LANKA PORTS AUTHORITY:

Annual Report and Accounts (2016)

SRI LANKA COUNCIL FOR AGRICULTURAL RESEARCH POLICY:

Annual Report and Accounts (2016)

LANKA PHOSPHATE COMPANY LTD.:

Annual Report and Accounts (2016/2017)

INSTITUTE OF POST-HARVEST TECHNOLOGY:

Annual Report and Accounts (2015)

PADDY MARKETING BOARD:

Annual Report and Accounts (2013)

AGRICULTURE AND AGRARIAN INSURANCE BOARD:

Annual Report and Accounts (2016)

HECTOR KOBBEKADUWA AGRARIAN RESEARCH AND TRAINING INSTITUTE:

Annual Report and Accounts (2016)

PADDY MARKETING BOARD:

Annual Report and Accounts (2014)

NATIONAL TRANSPORT MEDICAL INSTITUTE:

Annual Report and Accounts (2015)

CIVIL AVIATION AUTHORITY OF SRI LANKA:

Annual Report and Accounts (2015)

CIVIL AVIATION AUTHORITY OF SRI LANKA:

Annual Report and Accounts (2016)

SRI LANKA TRANSPORT BOARD:

Annual Report and Accounts (2014)

ADJOURNMENT MOTION:

Forensic Audit Reports on Issuance of Treasury Bonds

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2020 පෙබරවාරි 18වන අඟහරුවාදා
2020 பெப்ருவரி 18, செவ்வாய்க்கிழமை
Tuesday, 18th February, 2020

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

ගරු රන්ජන් රාමනායක මහතා ලබා දුන් හඬපට
மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்கவினால் வழங்கப்பட்ட குரல்பதிவுகள்
VOICE RECORDINGS HANDED OVER BY HON. RANJAN RAMANAYAKE

ගරු කථානායකතුමා.
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2020 ජනවාරි මස 21 වැනි දින පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රන්ජන් රාමනායක මහතා විසින් පාර්ලිමේන්තු සභාගර්භයේදී කතාවක් පවත්වන ලදී. එම කථාව අතරතුර හඬපට කිහිපයක් සභාගත කරන බව එතුමා විසින් ප්‍රකාශ කළ නමුත්, එදින හඬපට සභාගත කිරීමක් සිදු කර නොතිබුණි. එකී හඬපට සභාගත නොකරන ලද බව එදින හැන්සාඩ් වාර්තාවේ 430 හා 437 තීරුව යටතේ ඉතා පැහැදිලිව දක්වා ඇත.

කෙසේ වෙතත් ඉන් දින කිහිපයකට පසුව, එනම් 2020 ජනවාරි මස 24 වැනි දින සවස පාර්ලිමේන්තුවේ රැස්වීම ද අවසන් වූ පසුව ගරු මන්ත්‍රීතුමා විසින් දුරකථන සංවාද 19ක් අඩංගු හඬපටයක් හැන්සාඩ් දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී. ඒ වන විට 21 දිනට අදාළ හැන්සාඩ් වාර්තාව මුද්‍රණය කර තිබුණි. මෙම සභාගත කරන ලද හඬපටය මන්ත්‍රීවරුන්ට ඇසීමට නිකුත් කරන මෙන් මන්ත්‍රීවරුන් විසින් බලවත් ඉල්ලීම් කිහිපයක් කරන ලදී. 2020.02.07 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධයෙන් මා විසින් පක්ෂ නායකයන් දැනුවත් කරන ලද අතර, එහිදී එළැඹි එකඟතාව මත අදාළ හඬපටයේ අන්තර්ගත ඇතැම් කරුණු සංස්කරණය කිරීමෙන් පසුව මන්ත්‍රීවරුන්ට මුදාහැරීම සුදුසුයැයි අදහස් කරන ලදී. ඒ අනුව මෙම හඬපටයේ අඩංගු පටිගත කිරීම් පිළිබඳ වාර්තා කිරීම සඳහා මා විසින් මන්ත්‍රීවරුන් සිව්දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරන ලදී.

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලේඛන සම්බන්ධයෙන් මෙම ගරු සභාව විසින් පවත්වාගෙන යනු ලබන පිළිගත් සම්ප්‍රදායයන් හා කාර්ය පටිපාටියක් ඇත. කිසියම් ලේඛනයක් එලෙස සභාගත කරනු ලබන්නේ මූලාසනයේ අවසරය හා අනුමැතිය ලබා දෙන්නේ නම් පමණි. එසේම එම සභාගත කරනු ලබන ලේඛනය මන්ත්‍රීවරයකු විසින් කරනු ලබන කථාවට අදාළත්වයක් තිබිය යුතුය. එම සභාගත කරන ලේඛන, කථාව අවසන් වූ වහාම සභා මේසය මත තැබිය යුතුය. එසේ සභාගත කරනු ලැබූ ලේඛනයක් නැවත සංස්කරණය කිරීමක් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියා පටිපාටිය නොවෙයි.

කෙසේ වෙතත්, ගරු මන්ත්‍රීවරුන්ගෙන් නැගුණු බලවත් ඉල්ලීම නිසා සහ පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි මෙම සංවාද 19ක් අඩංගු හඬපටය සංස්කරණය කිරීමෙන් අනතුරුව මුදා හැරීමට සුදුසු බව මා තීරණය කරන අතර, මෙම තීරණය මතු දිනක සභාගත කරනු ලබන ලේඛන පිළිබඳව පූර්වාදර්ශයක් නොවිය යුතු බවටත් තරයේ අවධාරණය කරනු කැමැත්තෙමි.

පාර්ලිමේන්තුව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හා පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත මඟින් ගරු මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති භාෂණයේ නිදහස ඔවුන් විසින් වග කීමකින් යුක්තව මෙම ගරු සභාවේ කීර්තිය හා ගෞරවය සුරක්ෂිත වන ආකාරයෙන් භාවිත කරනු ඇතැයි මා විශ්වාස කරමි.

අනාගතයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලේඛන සභාගත කිරීමේදී මවිසින් ඉහත සඳහන් කර ඇති පරිදි තම වගකීම නිසි පරිදි ඉටු නොකරන්නේ නම් එබඳු අවස්ථාවකදී එසේ සභාගත කරනු ලබන ලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබීමට සිදු වනු ඇති බව දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු විමල් වීරවංශ ඇමතිතුමා.

ගරු විමල් වීරවංශ මහතා (කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය සහ කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு விமல் வீரவங்ச - சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்துறை மற்றும் தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சரும் கைத்தொழில் மற்றும் வழங்கல் முகாமைத்துவ அமைச்சரும்)
(The Hon. Wimal Weerawansa - Minister of Small and Medium Business and Enterprise Development and Minister of Industries and Supply Chain Management)

ගරු කථානායකතුමනි, ඔබතුමා විසින් හඬපට පිළිබඳව කරන ලද ප්‍රකාශයේ කියවුණා, "යම් සංස්කරණයකට ලක් කළා" කියලා. සංස්කරණයකට ලක් කළේ මොන වාගේ කොටසද? ඒ කියන්නේ, දේශපාලන වාසි අවාසි බලලාද, එහෙම නැත්නම්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, එතැනදී කිසිම විධියකින් දේශපාලන වාසි අවාසි බැලුවේ නැහැ. මම කලින් සඳහන් කළ පරිදි මෙම හඬපටයේ අඩංගු පටිගත කිරීම් පිළිබඳව වාර්තා කිරීම සඳහා සියලු පක්ෂ නියෝජනය වන පරිදි -ගරු සභානායකතුමා, විපක්ෂ නායකතුමා හා අනෙකුත් පක්ෂ නියෝජනය වන පරිදි- මන්ත්‍රීවරුන් හතර දෙනෙකුගෙන් යුක්ත කමිටුවක් පත් කළා. මෙතැන දේශපාලන භේදයක් නොවෙයි තිබුණේ. එහි තිබුණු භාෂාව වැනි නොගැළපෙන කරුණු තමයි සංස්කරණය කළේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ඒ මන්ත්‍රීවරු හතරදෙනාගේ කණ්ඩායම විසින්ද මේ කටයුත්ත කළේ ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාටම දෙන්න බැහැ නේ. ඒකයි මම මන්ත්‍රීවරු හතරදෙනෙකුට දුන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම කියන්නේ නැහැ, මන්ත්‍රීවරු 225දෙනාටම දෙන්න කියලා. ඔබතුමා කියන්නේ ඒ මන්ත්‍රීවරු හතරදෙනාගේ කණ්ඩායම තමයි සංස්කරණය කළේ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ මන්ත්‍රීවරු හඬ පට ඇසුවා. අවසානයේ හැන්සාඩ් සංස්කාරකතුමිය ඇතුළු කණ්ඩායමක් තමයි එම කටයුත්ත කළේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මොන වාගේ කොටස්ද ඉවත් වන්නේ කියලා දැන ගන්න පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මට දැන් මෙතැනදී කියන්න බැහැ. මම සොයා බලා කියන්නම්. පසුගිය සතියේත් අපි - [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
දැන ගන්න අවශ්‍ය නැද්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, මම රීති ප්‍රශ්නයක් මතු කරනවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මහජන නියෝජිතයන් විධියට තමන්ගේ කාර්ය භාරය කාර්යක්ෂමව කරගෙන යෑම සඳහා යම් වරප්‍රසාද ලබා දී තිබෙනවා. කථා කිරීමේ, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ලබා දී තිබෙනවා. දැන් ඔබතුමා සඳහන් කළ හඬ පටවල තිබෙන්නේ මන්ත්‍රීවරයෙක් සහ යම් යම් පුද්ගලයන් විසින් සිදු කළ අල්ලාප සල්ලාප, සහ ඕපාදූප. ඔබතුමා සඳහන් කළ ආකාරයට ඒ හඬ පටවල තිබෙන කරුණුවලට පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත යටතේ යම් වරප්‍රසාදයක් ලැබෙන්නේ කොහොමද? අනෙක් කරුණ, මන්ත්‍රීවරයෙක් සමාජයේ නොයෙකුත්දෙනා සමඟ කථා කරපු නොයෙකුත් හරුප ඇතුළත්, අසභ්‍ය කථා හෝ එහෙම දේවල් නැති හඬ පට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කිසිම ප්‍රතිපාදනයක් අපේ ස්ථාවර නියෝගවල නැහැ. ඒ නිසා මෙය ලේඛනයක් විධියට සලකන්න බැහැ. එහෙම හඬ පට ලබා දීමෙන් සමාජයට කිසිදු ප්‍රයෝජනයක් ලැබෙන්නේත් නැහැ. එයින් වන්නේ සමාජ මනස දූෂණය වීම පමණයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් අසා සිටින්නේ, මේ හඬ පට මේ පාර්ලිමේන්තුව තුළ බෙදා හරින්නේ කුමන ප්‍රතිපාදනයක් යටතේද, ඒ බෙදා හැරීම තුළින් මේ පාර්ලිමේන්තුව සමාජයට ඉටු කරන්න බලාපොරොත්තු වන යහපත කුමක්ද කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් විවිධ මත තිබෙනවා. එම නිසායි මෙතැනදී මම නැවතත් කිව්වේ මෙය පූර්වාදර්ශයක් කරගන්න එපා කියලා. නමුත් සභාවේ ගරු මන්ත්‍රීවරු බොහෝ දෙනෙකුගේ නම් සඳහන් කර තිබෙන නිසා එතුමන්ලාගේ නම් පිරිසිදු කරගැනීම සඳහා කරුණු පැහැදිලි කර ගැනීමට අවස්ථාව ලබාදුන්නා. ඒ අනුව තමයි පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ නියෝජනයක් තිබූ ඒ සියලුදෙනාගේ අනුමැතිය ඇතිව ඒවා පරීක්ෂා කර බලන්න දුන්නේ. ඕපාදූපවලටත් වඩා එතැන තිබෙන්නේ අසභ්‍ය වචන-,

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඇයි, මේ අසභ්‍ය වචනවලට මේ තරම් ප්‍රමුඛතාවක් ලබා දීලා මන්ත්‍රීවරුන්ට ඒවා ලබාදෙන්න කටයුතු කරන්නේ? ගරු කථානායකතුමනි, මම බොහොම ගෞරවාන්විතව මතක් කරනවා, පක්ෂ නායකයන් එකඟ වුණත්, මේ පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කිරීමේ ප්‍රධාන වගකීම දරන්න ඔබතුමාට වගකීමක් තිබෙන බව. ගරු කථානායකතුමනි, පක්ෂ නායකයන් එකඟ වුණා වුණත්, මෙය අනාගතයේ පූර්වාදර්ශයක් වීම වළක්වන්නට බැහැ. මොකද, අද දින මෙයට අවසර ලබා දුන් නිසා. ඒ තුළින් සිදුවන්නේ, අනාගතයේදීත් යම් නොහැඳුණු, අශීලාචාර මන්ත්‍රීවරුන් මේ පාර්ලිමේන්තුව තුළට ආවාට පසු ඒ ගොල්ලන්ගේ අසභ්‍ය ප්‍රකාශ මේ පාර්ලිමේන්තුව තුළ බෙදා හරින්නට සිදු වීම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට මහා විනාශයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ අදහස්වලට මම ගරු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, මම සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු ක්‍රියාදාමය තුළ කාගේත් අදහස් විමසා, විශේෂයෙන්ම පක්ෂ නායකයන්ගේ අදහස් විමසා තමයි පසුගිය අවුරුදු හතරහමාර තුළම ක්‍රියා කළේ. එම නිසා මෙතැනදීත් යම් කිසි අකැමැත්තක් තිබෙනවා නම්, බහුතරය මේ අදහසට විරුද්ධ නම්, මට ඒවා release නොකර ඉන්න පුළුවන්. මම ආපසු-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මේ පිළිබඳව දොස් පවරන්නේ නැහැ. මොකද, පක්ෂ නායකතුමන්ලා මේ තීරණයට එකඟ වූ නිසා. නමුත් ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නේ, කවදා හෝ දිනයක මේක පූර්වාදර්ශයක් විධියට ක්‍රියාත්මක වුණොත්, ඔබතුමාගේ නම කළු පැල්ලමක් එක්ක ඉතිහාසයට එකතු වන බවයි. ඒ නිසා මම ගෞරවයෙන් අයැද සිටිනවා, මේ පාර්ලිමේන්තුවේ සිටින එක් එක් අයගේ එකඟතාව මත නොවෙයි, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත සහ ස්ථාවර නියෝග අනුව පමණක් කටයුතු කරමින්, ව්‍යසනයකට දොර හරින, ඉඩ හරින මේ තීන්දුව වෙනස් කරන ලෙස.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායකයන් හමුවෙලා ඒ ගැන මට නැවත වරක් සාකච්ඡා කරන්න පුළුවන්. මම මගේම තනි කැමැත්තට කටයුතු කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඉස්මතු කළ කාරණාව පිළිබඳව නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. පක්ෂ නායකවරු කිසිම දිනයක එකඟ වුණේ නැහැ, මේ හඬ පට සභාගත කරන්න. ඒක පක්ෂ නායකවරුන්ගේ එකඟතාවක් මත සිදු වූ දෙයක් නොවෙයි. නමුත්, සභාගත වූ, හැන්සාඩගත වූ ඒ හඬ පටවල අඩංගු වූ කරුණු කාරණා පිළිබඳව සහ එහි අන්තර්ගතය තුළින් මේ උත්තරීතර සභාවටත්, හැම පාර්ශ්වයක්ම නියෝජනය වන -අන්න ඒකත් හොඳට මතක තබාගන්න- දේශපාලන නායකයන්ටත්, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යුහයටත් සිදුවිය හැකි හානිය පිළිබඳව සලකා බලා තමයි ඒවා සංස්කරණය කිරීමක් ගැන කථා කළේ. කිසිම ආකාරයකින්, කිසිම දවසක, කිසිම පක්ෂ නායකයෙක් එකඟ වුණේ නැහැ, මේ හඬ පට සභාගත කරන්න. ඒක මේ සභාව තුළදී සිදු වූ දෙයක්. සභාව තුළදී ඒවා සභාගත කළාට පසු, එයින් සිදුවන අගතිය මහ හරවා ගන්නටයි, ඒවා මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුට බලන්න ඉඩ දීමට පක්ෂ නායකවරු එකඟ වුණේ.

ඒ වාගේම හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ සංස්කාරකතුමියගේ ප්‍රධානත්වයෙන් මේ ගැන හොයා බලා, හඬ පටවලින් එළි දක්වන්න සුදුසු දේ මොකක්ද කියන එක තීන්දු කළේ එතැනදී. එහෙම නැතිව, හඬ පට සභාගත කරන්න පක්ෂ නායකයන් එකඟ වුණේ නැහැ. ඒ හඬ පට සභාගත කිරීම මේ ගරු සභාව තුළින් සිදු වූ දෙයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, මම මතක් කරන්න ඕනෑ, එදා ඔබතුමාගේ නියෝජිතයාත් මේ හඬ පට බැලූ බව. මම පොඩි නිවැරැදි කිරීමක් මේ කරන්නේ. ඔබතුමාගේ නියෝජිතයාත්, ආණ්ඩු පක්ෂයේ නියෝජිතයාත් බලලා තමයි තීරණය කළේ මේ විධියට කටයුතු කරන්න. නැත්නම් මට මේවා නිකුත් කිරීම නවත්වන්න පුළුවන්. ගරු සභානායකතුමනි, අපි මේක නවත්වමු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි. සමාවෙන්න, අපේ හිටපු ඇමතිතුමනි -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විපක්ෂ නායකතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. කිසිම වේලාවක, කිසිම පක්ෂයක, කිසිම නායකයකු කිව්වේ නැහැ, මේ හඬ පට සභාගත කරන්න, මේ හඬ පට හැන්සාඩගත කරන්න කියලා. ඒක මේ ගරු සභාව ඇතුළේ සිදු වූ දෙයක්. ඒ හඬ පට හැන්සාඩගත වුණාට පසුව, සභාගත වුණාට පසුව, හැම පාර්ශ්වයකටම බලපාන නුසුදුසු කරුණු කාරණා ගණනාවක් - මේ වෙලාවේ ඒවා විග්‍රහ කරන්න යන්න හොඳ නැහැ.- සම්බන්ධයෙන් ඒ තීන්දුව ගත්තේ හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ සංස්කාරකතුමිය හරහායි. විවිධ පාර්ශ්ව නියෝජනය වන ආකාරයට පක්ෂ නායක රැස්වීමට පැමිණෙන කණ්ඩායමක් මේ ගැන හොයලා බලලා තමයි මේ තීන්දුව ගත්තේ. එහෙම නැතිව පක්ෂ නායකවරුන් කවදාවත් කිව්වේ නැහැ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"පක්ෂ නායකයන් නියෝජනය කරන" මම නැවතත් එය නිවැරදි කරන්න ඕනෑ. ඔබතුමා නියෝජනය කරන මන්ත්‍රීවරයකුත් එදා එතැන හිටියා. ඒ අනුව හැම එකකටම-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම ඒක නැහැ කියලා කිව්වේ නැහැනේ ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විපක්ෂ නායකතුමනි, හැම වෙලාවේම මට පක්ෂ නායකයන් කැඳවන්න බැහැ. ඔබතුමා නියෝජනය කරන්න, සභානායකතුමා නියෝජනය කරන්න, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන්න, ටීඑන්ඒ එක නියෝජනය කරන්න නියෝජිතයන් සිටියා. ඒ නිසා මේ ගරු සභාව දිගටම මේ කාරණය ගැන කථා කරන්න ඕනෑ නැහැ. දැන් අපි මේ කාරණය මෙතැනින් නවත්වලා දමමු. ගරු සභානායකතුමනි, මේක මෙතැනින් නවත්වන්න පුළුවන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ සබඳතා අමාත්‍ය, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு உறவுகள் அமைச்சரும் திறன்கள் அபிவிருத்தி, தொழில்துறை மற்றும் தொழில் உறவுகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign Relations, Minister of Skills Development, Employment and Labour Relations and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මෙම කාරණය මතු වෙලා තිබෙන්නේ ඔබතුමා ඒ හඬ පට සභාගත කිරීම නිසායි. ඒ හඬ පටවලට සවන් දෙන්න, ඒවා පරීක්ෂාවට ලක් කරන්න ආණ්ඩු පක්ෂයෙන් එක් කෙනෙකු නම් කරන්න කියලා ඔබතුමා අපෙන් ඉල්ලා සිටියා. විපක්ෂයටත් එහෙම කිව්වා. විපක්ෂයෙනුත් එක් කෙනෙක් නම් කළා. ඒ අනුව, ඒවා පරීක්ෂා කරලා අපේ අදහස් කිව්වා මිස, ඒ හඬ පට සභාගත කරන්න කියලා අපි කොයි වෙලාවකවත් ඔබතුමාට කිව්වේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්. එහෙම නම්, අපි ඒක නතර කරමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒක තමයි සත්‍ය තත්ත්වය. ඔබතුමා සභාව එකඟ නැති දෙයක් සභාගත කරන්න යන්නේ නැතිව, මේ සභාගත කිරීම ඉවත් කර ගත්තා නම් හරි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, අපි ඒක අයින් කරමු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. මගේ ප්‍රකාශයෙන් ඔබතුමාටවත්, වෙනත් කිසිම කෙනෙකුටවත් අගතියක් කළා නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මට ප්‍රශ්නයක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම උත්තර දුන්නේ විජයදාස රාජපක්ෂ මැතිතුමා මේ ගරු සභාවේ කරපු ප්‍රකාශයට. ඒ හඬ පට සභාගත කරන්නවත්, හැන්සාඩ්ගත කරන්නවත් කියලා පක්ෂ නායකවරු කිසිම දවසක කිව්වේ නැහැ. ඒ සිද්ධිය වුණාට පස්සේ තමයි, ගරු කථානායකතුමාත්, අප හැමෝමත් එකඟ වෙලා, පක්ෂ නායකයන්ගෙන් පුංචි කණ්ඩායමක් පත් කරගෙන, ඒ හඬ පට ටික අහලා බලලා, ඒවා එළි දක්වන්නට සුදුසු නුසුදුසුභාවය තීන්දු කළේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග පිළිබඳ අපැහැදිලිතාවක් තිබුණත්, ඔබතුමාට තමයි මේ ගැන අවසාන තීරණය දෙන්න පුළුවන් වන්නේ. ඒ අනුව,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟ නැත්නම්, අපි මේ කටයුත්ත මෙතැනින් නවත්වමු.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
සභාවේ එහෙම එකඟතාවක් නැහැ නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමනි, දැන් මම තීරණය කළා, මේවා නිදහස් කරන්නේ නැහැ කියලා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, මා විනාඩියයි ගන්නේ. ගරු කථානායකතුමනි, මම ගෞරවයෙන් සඳහන් කරන්නේ මේකයි. මම මුලින්ම ගරු විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ කාරණය ගැන අප දැනුවත් කිරීම පිළිබඳව. මේ ගරු සභාව පාලනය කිරීමට අදාළ ස්ථාවර නියෝග මෙන්ම පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත කියන දෙකම අනුව මෙවැනි පෞද්ගලික දේවල් සභාගත කිරීමට කිසිම ප්‍රතිපාදනයක් නැහැ.

මේ සභාවේ අදහස් දැක්වූ ආකාරයට පෙනී යන පරිදි, පෞද්ගලික දේවල් සභාගත කරලා මේ සභාවේ කීර්ති නාමයට, උත්තරීතරභාවයට අගෞරව නොකර, කරුණාකර ඒ ක්‍රියාදාමය මෙතැනින් නතර කරන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. මම එක සැරයක් කිව්වා. ඒක එතැනින් ඉවරයි. අපි දැන් මේ කාරණය මෙතැනින් නවත්වමු.

ගරු නිමල් ලාන්සා මහතා (ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் லான்சா - சமுதாய அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Nimal Lanza - State Minister of Community Development)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඉතාම පැහැදිලිව කිව්වා, මේ ඉදිරිපත් කර තිබෙන හඬ පටවල සභාවට ඉදිරිපත් කරන්න තරම් හොඳ මට්ටමේ කථා නැති නිසා සංස්කරණය කරලා යම් කිසි කොටසක් මේ සභාවට දෙන්න පක්ෂ නායක රැස්වීමේදී එහි නියෝජිතයන් සමඟ එකතු වෙලා තීන්දුවක් ගත්තා කියලා. ඉතින් අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය, මෙම හඬ පටවල තිබුණේ "වැඩිහිටියන්ට පමණයි" කියන ඒවා ද කියන එකයි. දෙවැනි ප්‍රශ්නය මෙයයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225 දෙනාම නියෝජනය කරන ප්‍රධානියා විධියට අප සලකන්නේ, ගරු කථානායකතුමායි. ඒ හඬ පටවල අසභ්‍ය දේවල් නම් තිබුණේ, ඔබතුමා ඒ මන්ත්‍රීවරයාට විරුද්ධව ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

ඒ වාගේම, මම ගරු විපක්ෂ නායකතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරන ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට තාවකාලික පක්ෂ තහනමක් පනවා තිබෙනවා කියලා පුවත් පත්වල සඳහන්ව තිබෙනවා අපි දැක්කා. හැබැයි, එයින් එහා ඔබතුමන්ලා ගත්තු තීන්දු කිසිවක් අපි දැකලා නැහැ. එතුමා සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ ස්ථාවරය මොකක්ද කියලා අපි අහනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, රන්ජන් රාමනායක මන්ත්‍රීවරයා එතුමා කථාවක් අතරතුර අදාළ හඬපට සභාගත කරනවා කියලා ප්‍රකාශ කළා. මේ සභාවේ කොතැනකදීවත් මූලසුනේ ප්‍රධානියා හෝ වෙනත් මන්ත්‍රීවරයෙක් හෝ එම හඬ පට සභාගත කරන්න එපා කියලා විරෝධතාවක් මේ සභාව තුළ මතු කළේ නැහැ. එතුමාගේ කථාව හොඳද, නරකද, අඩංගුව මොකක්ද කියන එක වෙනම විවාදයක් කළ යුතු කාරණයක්. හැබැයි, එතුමාගේ කථාවට අනුරූප වන පරිදි, එතුමා හඬ පට වගයක් සභාගත කළා. ඊළඟට විවාදය පැන නැඟුණේ ඒ සභාගත කිරීම පිළිබඳව නොවෙයි. ඒ සභාගත කරන ලද හඬ පට මේ පාර්ලිමේන්තුවේදී අවස්ථා ගණනාවකදී මන්ත්‍රීවරු ඉල්ලා සිටියා. සභාගත කරන ලද හඬ පට නිකුත් කරන්න එපා කියලා යම් නියෝගයක් ලබා දීලා තිබුණා. එතකොට, අප විසින් සාකච්ඡා කරනු ලැබුවේ සභාගත කරන ලද හඬ පට නිකුත් කරනවාද, නැද්ද යන්නයි. එහෙම නැතිව, ඒවා සභාගත කරනවාද, නැද්ද කියන එක ගැන නොවෙයි. ඒවා සභාගත කරලා ඉවරයි, එතුමාගේ කථාව වෙලාවේදී. ඒවා නිකුත් කරනවාද, නැද්ද කියන එකයි සාකච්ඡාවට ගැනුණේ. එහිදී තමයි, යම් නියෝජිත කණ්ඩායමක් විසින් විමර්ශනය කරලා, ඒවා නිකුත් කරන්නේ නම් ඒවායේ සමහර දේවල් සංස්කරණය කළ යුතුයි කියන යෝජනාව ඉදිරිපත් වුණේ. ගරු කථානායකතුමනි, හරි

නම්, සභාගත කරපු ඒ ඔක්කෝම අපට අහන්න දෙන්න ඕනෑ කියලායි මා කියන්නේ. හැබැයි, ඔබතුමා ඒකට එකඟ නැතිව යම් ප්‍රමාණයක් සංස්කරණය කරනවා නම්, සභාගත කර තිබෙන දේ එසේ සංස්කරණය කළ එක හෝ අහන්න මේ මන්ත්‍රීවරුන්ට අයිතිය තිබෙන්න ඕනෑ. ඒවා සභාගත කරන කොට විරෝධයක් දක්වන්නේ නැතිව, ඒවාට සවන් දීමට හෝ මාධ්‍යවලට නිකුත් කිරීමට හෝ බාධා පැමිණවීම කිසිසේත් යුක්තිසහගත නැහැ කියන එකයි අපේ අදහස. ඒ නිසා ඒ සියලු හඬ පට අදාළ තීන්දුව පරිදි මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න කියන එක තමයි මා යෝජනා කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිබඳව සභාවේ මත දෙකක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ සභාවේ ගරුත්වය ආරක්ෂා වන්නේ ජන මාධ්‍යවලින් මාස ගණනක් තිස්සේ ප්‍රචාරය කරලා පට්ට ගහපු ඒ හඬ පට මේ සභාවට ඉදිරිපත් කරන එක නතර කිරීමෙන් නොවෙයි. මේ සභාවේ ගරුත්වය ආරක්ෂා වන්නේ හරියාකාරව, සංවරව කටයුතු කිරීමෙන්.

දෙවැනි කාරණය මේකයි. අප සභාගත කරන හැම දෙයක්ම පරිහරණය කරන්න අවසර දෙන්න ආණ්ඩු පක්ෂයට, විපක්ෂයට හෝ කථානායකතුමාට නැවත බලය පැවරෙනවා නම්, ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන ප්‍රධාන වරප්‍රසාදයක් උල්ලංඝනය වීමක්. මෙතැනදී කියැවෙන අසභ්‍ය වචන, පාර්ලිමේන්තුවට නුසුදුසු වචන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමේ බලය ඔබතුමාට තිබෙනවා. ඔබතුමා ඒ කටයුත්ත මේවා සම්බන්ධයෙන් කළත් ප්‍රශ්නයක් නැහැ.

නමුත් මෙතැන ඉන්න මන්ත්‍රීවරු ඕනෑ තරම් ඇත්ත ඒවා, බොරු ඒවා හැන්සාඩ්ගත කරනවා. ඒක මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයකු වශයෙන් ආවාට පස්සේ තිබෙන යම්කිසි පිළිගැනීමක්, වරප්‍රසාදයක් මත කරන දෙයක්. නමුත් ඒවා ඇත්තද, බොරුද කියලා සමාජය ඉදිරියේ දී තේරෙයි. දැන් රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාව සම්පූර්ණයෙන්ම demonize කරලා, එතුමා තමයි ඔක්කෝම වැරදි කළේ කියන තත්ත්වයටයි පත්වෙලා තිබෙන්නේ. ඒක වෙනම කථාවක්. නමුත් එතුමා මේ හඬපට සභාගත කළා. ඒවා වැරදි වුණත්, කොච්චර කැත වුණත් ඒක අපේ රටේ දේශපාලනයේ පැතිකඩක්, සමාජ පැතිකඩක් පෙන්වනවා. මම හිතන විධියට ඒවා සැඟවීම ඔබතුමා නොකළ යුතු දෙයක්. අනාගතයේ දී එය නරක පූර්වාදර්ශයක් වෙන්නත් පුළුවන්. මොකද, ආණ්ඩු පක්ෂයෙන් කිව්වොත්, ඕනෑ ඕනෑ දේවල් හැන්සාඩ්ගත කරන්න බැහැ කියලා? ගරු කථානායකතුමනි, මේ හඬපට දැන් සමාජගත වෙලා තිබෙන්නේ. ඇත්තටම දැන් මේ සාකච්ඡාව අවසන් වෙලායි තිබෙන්නේ. දැන් රටේ මේ හඬපට ගැන ලොකු සාකච්ඡාවක් නැහැ. ඒ නිසා කරුණාකර මන්ත්‍රීවරුන්ගේ අයිතිය ආරක්ෂා කෙරෙන විධියට ඔබතුමා මේ කාරණයේ දී කටයුතු කළ යුතුයි කියා මා කියා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ කාරණය පක්ෂ නායකයන් සමඟ නැවත සාකච්ඡා කරන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු නිමල් ලාන්සා රාජ්‍ය ඇමතිතුමා මගේ නම සඳහන් කළා. මම කාගේවත් නම් ගම් කියන්නටවත්, තොරතුරු කියන්නටවත් යන්නේ නැහැ. නමුත් මම එතුමාට මේ කාරණය කියන්න කැමැතියි. මොකද, එතුමාට දැන ගන්න ඕනෑ වුණා නේ මොනවාද මේවායේ අන්තර්ගතය කියලා. සමහර අවස්ථාවල සමහර පුද්ගලයන් එක් එක් රටවල් පිළිබඳව කරපු ඉතාම අපහාසාත්මක, උපහාසාත්මක මත තිබෙනවා. ඒවා මේ වෙලාවේ එළියට ආවොත් ඒක රටටත් හොඳ නැහැ; පාර්ලිමේන්තුවටත් හොඳ නැහැ; භේදයෙන් තොරව මන්ත්‍රී මණ්ඩලයටත් හොඳ නැහැ. ඉතින් මම ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමැතියි, ඒවා එළියට දමන එක හරිද කියලා. ඒ ඒ රටවල්වලට අපහාස කරන එක, විවිධ විවිධ ඉහළ තලයේ පුද්ගලයන් ඒ රටවලට අපහස කරන කාරණා එළියට දමන එක හරිද? ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාම ඒක කියන්න. ඒකයි ඒවා සංස්කරණය කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා. [බාධා කිරීමක්] දැන් මේ කාරණය ගැන විවාදයකට යන්න ඕනෑ නැහැ.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
Sir, I rise to a point of Order. ගරු කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කළා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මෙම කාරණය පිළිබඳව පක්ෂ නායක රැස්වීමේ දී ඉතාම හොඳින් සලකා බැලුවා. ඒ සලකා බැලීමෙන් පස්සේ, මේ පාර්ලිමේන්තුව විසින් අනුගමනය කරන සම්ප්‍රදාය පිළිබඳව ඉතාම හොඳින් දන්නා හැන්සාඩ් සංස්කාරකතුමියට වගකීම පැවරුවා, මෙහි ඇති පාර්ලිමේන්තුවට නොගැළපෙන්නා වූ සියලු දේ ඉවත් කරන්න. ඒ අනුව, ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ ඒ ප්‍රශ්නය දැන් මතු වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අනෙක් අතට මේ පාර්ලිමේන්තුව තමයි මේ රටේ තිබෙන උත්තරීතර වාද මණ්ඩපය. මේ පාර්ලිමේන්තුව තුළ තිබෙන භාෂණයේ නිදහස අප සීමා නොකළ යුතුයි. ඒ භාෂණයේ නිදහස ආරක්ෂා කිරීම අද විපක්ෂයේ ඉන්න අපටත්, ආණ්ඩු පක්ෂයටත්, ඒ වාගේම මේ රටේ පුරවැසියන්ටත් - සියලුදෙනාටම- වැදගත් වෙනවා. ඒ භාෂණයේ නිදහස ආරක්ෂා කර ගැනීම සඳහා අප කටයුතු කළ යුතුමයි. ඒ වෙනුවෙන් ගරු මන්ත්‍රීවරයකුට ඇති නිදහස කිසිම ආකාරයකින් අප සීමා නොකළ යුතුයි, ගරු කථානායකතුමනි. ඒ නිසා ඔබතුමා ගත් තීරණය නිවැරදියි; ඔබතුමා ගත් ක්‍රියා මාර්ගය හරි. ඒ වාගේම, ඒ තීරණයට පාර්ලිමේන්තුවේ පක්ෂ නායක රැස්වීමේ දී සියලු පක්ෂවල එකඟතාව පළ වුණා. ඒ නිසා, මෙහි අන්තර්ගතය පිළිබඳව මෙතැනින් එහාට තීරණය කළ යුත්තේ ජනතාව කියා මා හිතනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, අපි මේ කථාව මෙතැනින් අවසන් කරමු.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මෙහිදී ඔබතුමා ස්ථාවර නියෝග අනුව කටයුතු කිරීම ඉතා වැදගත් කොට සලකනවා. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ සභාවට පැමිණියා. මේ හඬපට ප්‍රශ්නය නිසා එතුමා තවදුරටත් රිමාන්ඩ් භාරයේ සිටිනවා. මේ හඬපට මුලින්ම නොයෙක් මාධ්‍ය තුළින්, සමාජ මාධ්‍ය තුළින් එළියට ආ බව අපි දන්නවා. ඒ විධියට එළියට ආවේ විපක්ෂයට යම්කිසි ආකාරයකින් බලපාන ඒවායි. මා රන්ජන් රාමනායක මැතිතුමා බලන්න බන්ධනාගාරයට ගිය වෙලාවේ එතුමා මා සමඟ කිව්වා, මේ ඉදිරිපත් කරලා තිබෙන හඬපට අතර රාජ්‍ය නායකයන්, ඇමතිවරුන්, සමහර ඇමතිවරුන්ගේ බිරින්දෑවරුන් සමඟ කථා කළ හඬපට තිබෙන බව. මෙතුමා ඒවා සභාගත කළ නිසාද මේ ක්‍රියාව නතර වුණේ කියන කාරණය අපි දන්නේ නැහැ. නමුත්, සභාවක් විධියට අපි මේ ගැන දැනගන්න කැමැතියි.

ඒ වාගේම, ස්ථාවර නියෝග අනුව යම්කිසි document එකක් සභාගත කරපුවාම ඒකේ හොඳ-නරක නොවෙයි බලන්න ඕනෑ. අපි, එහි ඇත්ත-නැත්ත විචක්ෂණය කරලා විචාරශීලීව බලන්න ඕනෑ. ඒ නිසා මේ සභාගත කරපු ඒවා ගැන දැන ගැනීමේ අයිතියක් අපට තිබෙනවා කියලා මම හිතනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අනුව තිබෙන්නේ මහ බැංකුව කොල්ලකෑම ගැන කථා කරන්නයි. එහිදී සිදු වූ පාඩුව කොපමණද, සොරකම් කරපු අය කවුද, දෙපැත්තේම අය කවුද කියන එක සොයා ගන්නට ඕනෑ. මේ ගැන ජනතාවත් බලාගෙන ඉන්නවා. දැන් මේ මාතෘකාව ඇද ගෙන යෑම හරහා ඒ ගැන කථා කරන්න බැරි වෙනවා. ඒ නිසා ඉක්මනට අද දිනට නියමිත වැඩ කටයුතු පටන් ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු රන්ජන් රාමනායක මහතා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, මට උසාවියේදී කථා කරන්න දෙන්නේ නැහැ; පාර්ලිමේන්තුවෙත් කථා කරන්න දෙන්නේ නැහැ. ඒ නිසා මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු කථානායකතුමනි, "මා ළඟ හඬ පට ගණනාවක් තිබෙනවා, ඒ හඬ පට මම සභාගත කරනවා" කියලා එදා කථාවේ දී මම බොහොම පැහැදිලිව කිව්වා. මම ඒ සියලු හඬ පටවලින් තෝරා ගත් ඒවා කිහිපයක් පමණක් සභාගත කළා. ඒ හඬ පටවල ආණ්ඩු පක්ෂයට අභියෝග කළ හිටපු ජනාධිපතිවරු, දැන් සිටින අගමැති, කැබිනට් ඇමතිවරු, කැබිනට් ඇමතිවරුන්ගේ බිරින්දෑවරුන් ආදී සියලුදෙනාගේ හඬ තිබෙනවා. ගරු කථානායකතුමනි, හරියටම 14වැනි දා තමයි මා අත්අඩංගුවට ගත්තේ. 14වැනි දා අත්අඩංගුවට ගත් අවස්ථාවේ, ලංකාවට කුඩු ගෙනෙන නාලිකාව වන "හිරු නාලිකාව" ඒ වේලාවේම නිවසට ඇවිත් ඒක live telecast කළා. මට ලොකු අසාධාරණයක් වුණා. මම අද සිටින්නේ රිමාන්ඩ් බන්ධනාගාරයේ. මම හොරෙක්වත්, වංචාකාරයෙක්වත්, කුඩුකාරයෙක්වත් නොවෙයි. උදයංග වීරතුංග සහ SriLankan Airlines එකේ කපිල චන්ද්‍රසේන ඉන්න මැදිරි දෙක අතර තමයි අද මම ඉන්නේ. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මගේ දුක කියන්න ඉන්නේ ඔබතුමා විතරයි.

මම කිසිම වංචාවක්, හොරකමක් කරලා නැහැ. මම කියලා තිබෙන්නේ, හොරුන් ඇතුළට දමන්න කියලා. මම අදත් ඒක කියනවා, හෙටත් කියනවා. මොකද, ඒක අපේ ඡන්ද පොරොන්දුවක්. 2015 ජනවාරි 08වන දා රෑ 12.00ට Airport එක වහලා හොරු අල්ලන බව කියලා, ඒක නොකළ නිසා තමයි මම judgesලාට කථා කළේ. විනිසුරුවරු මට කථා කරලා තිබෙනවා, මම විනිසුරුවරුන්ට කථා කරලා තිබෙනවා. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මම කියලා තිබෙනවා, ෆවුසි ඇමතිතුමා පවා පැයකට හෝ හිරේ දමන්න කියලා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව, මම අදත් ඒක කියනවා.

මේ කථාව අහගෙන ඉන්න ජනතාවට මම කියන්නේ මෙච්චරයි. මම හැම දාම කළේ හොරු අල්ලන ව්‍යාපෘතියේ එක්තරා කොටසක් පමණයි. මගේ කාර්ය මණ්ඩලය මට ගෙනැත් දුන්නා, Apple phone එකක්. නමුත් ඒ Apple phone එකෙන් record කරද්දී, "කීක් කීක්" ගානවා මට ඇහුණා. ඒක නිසා මම ඒක වෙනස් කරලා, Samsung phone එකක් ගත්තා.

වර්තමාන අගමැති ගරු මහින්ද රාජපක්ෂ මහත්මයා මගේ මිත්‍රයෙක්. මා ඉස්සෙල්ලාම අත්අඩංගුවට ගත්තේ ලෙබනන්වලදී, මැද පෙරදිග කාන්තාවන් ගැන කථා කරන්න ගිහිල්ලා. මම වර්තමාන අගමැතිතුමාට කථා කරලා තමයි එදා එළියට ආවේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තමයි මට කිව්වේ, ලෙබනන් safe house එකට ගිහිල්ලා phone එකකින් ඒවා record කරගෙන එන්න කියලා. මට ඒ අවවාදය දුන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

භාරව හිටපු ඇමතිතුමා. මම ළඟ ඒ recording එකත් තිබෙනවා. මේ සභාවේ ඉන්න අනෙක් අය, "හොරු හොරු" කියලා කෑ ගැහුවාට ඒ අයට සාක්ෂි නැහැ, ගරු කථානායකතුමනි. නමුත් ඒ සාක්ෂි - incoming call එක, ඒ duration එක, පණිවුඩය ආපු නම්බර් එක, detailed copy එක හා සංවාදයේ recording එක කියන සියලු තොරතුරු - මා ළඟ තිබෙනවා. ඕනෑම කෙනෙක් අභියෝග කරන්න, ඒ අයගේ සංවාදවල recordings, detailed copies, durations ආදී සියල්ල මා ළඟ තිබෙනවා. මේ සභාවේ ඉන්න අයගේ බිරින්දෑවරුත් මට කථා කරලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි දැන් ඉතිරි වැඩ කටයුතුවලට යමු, ගරු මන්ත්‍රීතුමනි. පැය භාගයක්,- [බාධා කිරීමක්] ගරු රන්ජන් රාමනායක මැතිතුමනි, දැන් අවසන් කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මේ කාරණා ටික කියන්න මට අවසර දෙන්න, ගරු කථානායකතුමනි. මම රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉන්නේ. ඔබතුමාට එදා මේ දේවල් කිව්වාම, ඔබතුමා කිව්වා නේ, ලිඛිතව දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, හරි. දැන් කියන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, වෙනත් රටවල් මාධ්‍ය ලයිසන් එක දෙන්නේ ගෞරවනීය පුද්ගලයන්ට. නමුත් අද ලයිසන් දීලා තිබෙන්නේ කාටද? කුඩුවලට චෝදනා ලබා අද හිරේ ඉන්න දුමින්ද සිල්වා කියන ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු අධීක්ෂණ මන්ත්‍රීවරයාගේ සහෝදර රේනෝ සිල්වාගේ කුඩු නාළිකාව තමයි අද හැමෝම බලන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් බලන්නේ හිරු නාළිකාවයි. මාත් රිමාන්ඩ් එකේදී බලන්නේ හිරු නාළිකාවයි. ගරුතර මහා සංඝ රත්නයත් බලන්නේ හිරු නාළිකාවයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම බලන්නේ මොන නාළිකාවද කියන එක ඔබතුමා දන්නේ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, මම කියන්නේ වෙනත් රටවල, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් ප්‍රධාන වැඩ කටයුතුවලට යමු.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, point of Order එකක් මතු කරන්න තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, අපේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ හඬ පටයකුත් මා ළඟ තිබෙනවා. මම - [බාධා කිරීම්] කථා කළාම නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා තමයි phone එක ඉස්සුවේ. එතුමාගේ හඬ පටයක් තිබෙනවා, විනාඩි 18ක. මා ඒකත් සභාගත කරන්නම්. ගරු කථානායකතුමනි, එතුමා තමයි කිව්වේ, - [බාධා කිරීමක්]

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, point of Order එකක් තිබෙනවා. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, මට මේ title එක දුන්නේ කවුද? නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමායි. එතුමා තමයි කිව්වේ, මම "හොරු අල්ලන ඇමති" කියලා. "හොරු අල්ලන ඇමති" කියන නම මට ඉස්සෙල්ලාම කිව්වේ මා මිත්‍ර ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමායි. ඒ නිසා තමයි මම හොරු අල්ලන වැඩේට බැස්සේ. හොරු අල්ලන්න යනකොට හොරුන්ට කේන්ති යනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වැලිකඩ බන්ධනාගාරයේ සිටියේ ක්‍රිෂ් ආයතනයේ සල්ලි හොරකම් කරලායි. අනිත් අයත් සිටියේ හොරකම් කරලායි. නමුත් රන්ජන් රාමනායක වන මම ජනතාවට කියනවා, මම දූෂණයක්, වංචාවක් කරලා නැති බව. මම තවම ඉන්නේ මාදිවෙල මන්ත්‍රී නිවාසයේයි. හිඟන්නෙක් වාගෙයි මම තවම ඉන්නේ. ලංකාවේ කොහේවත් ඉඩම් පර්චස් එකක්වත් මට නැහැ. ලෝකයේත් නැහැ. මම සල්ලි ඉතුරු කළේ නැහැ. Permit එක විකුණපු සල්ලිත් මම පදනම්වලට දැම්මා. ඒ සල්ලි බෙදලා තිබෙනවා. LOLC එකේ fixed deposit එකේ රුපියල් ලක්ෂ 70ක් තිබෙනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මෙහෙම ගියොත් අද අපට මේ ගැනම පැය 2ක් තිස්සේ කථා කරන්න පුළුවන්. සභාව මට අවසරය දෙනවා නම් අපි ප්‍රධාන කටයුතුවලට යමු. ගරු සභානායකතුමනි, ඔබතුමා ඒකට එකඟද? ගරු සභානායකතුමනි, මේ අවස්ථාවේ අද දිනයේ ප්‍රධාන කටයුතුවලට යන එක වඩා හොඳයි. එහෙම නැත්නම් මේ සම්බන්ධයෙන් පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කරලා තීරණයක් දෙන්නම්. [බාධා කිරීමක්] ඉඩ දෙනවා නම්, මම සියලුදෙනාටම ඉඩ දෙන්න ඕනෑ.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය, වරාය හා නාවික කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - வீதி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Roads and Highways, Minister of Ports and Shipping and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ඔබතුමා අදත් ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දුන්නා. එතුමා විනාඩි 10ක් විතර කථා කරලා සමහර මන්ත්‍රීවරුන්ගේ නම් කියලා චෝදනා කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම්, මම සවස 7 විතර වෙනතුරු මේ ගැන කථා කරන්න අවස්ථාව දෙන්නම්.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ඔබතුමා දැන් කියනවා, මේ ගැන කථා කළොත් තව පැය ගණනක් අපතේ යනවා කියලා. එතකොට සමහර අයට අසාධාරණයක් නේ, වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් අපි දිගටම කථා කරමු.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාටත් කථා කරන්න ඉඩ දෙන්න ඕනෑ. ඒක තමයි සම්ප්‍රදාය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, තව මන්ත්‍රීතුමන්ලා තුන්දෙනෙක් ඉන්නවා, මේ ගැන කථා කරන්න.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ හඬ පට ඉවත් කරන්න අවශ්‍ය නම්, ඒ සඳහාත් ඔබතුමාට සම්පූර්ණ බලය තිබෙනවා. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගැන මත දෙකක් තිබෙනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ඉවත් කරන්න කියන එක නොවෙයි මම කියන්නේ. [බාධා කිරීම්] ඔබතුමන්ලා මම කියන එක අහගන්න. ගරු කථානායකතුමනි, මම කිව්වේ, ඔබතුමාට තිබෙන බලය ගැනයි. ඒවා ඉවත් කළත්, ඉදිරිපත් කළත් අපට කමක් නැහැ. එම හඬ පට ඉදිරිපත් කර තිබෙන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමා ඒවායේ අසභ්‍ය වචනවලින් කථා කරලා තිබෙන්නේ. එතුමාට මොන සම්ප්‍රදායයක්ද තිබෙන්නේ? එතුමා රූපවාහිනී නාළිකාවලට පහර ගහනවා. එතුමාට සල්ලි නැහැ, දුප්පත් කියලා කිව්වාට, එතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

සල්ලි දීපු කෙනෙක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please!

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

එතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දැක්ක ගමන් සල්ලි බෙදන කෙනෙක්. ඒක එතුමාගේ telephone callsවලින් පෙනෙනවා.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

Sir, I rise to a point of Order.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

එතුමාට තිබෙන දුප්පත්කම මොකක්ද, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ඔබතුමා දැන් ඉඳගන්න. Hon. State Minister, what is your point of Order? [බාධා කිරීමක්]

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මුලින්ම ගරු නිමල් ලාන්සා රාජ්‍ය අමාත්‍යතුමා කථා කරන්න. ඊට පස්සේ ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඊට පස්සේ ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා තමයි මගේ නම කියලා කථා කළේ. මම ඉතා පැහැදිලිව කිව්වේ මේකයි. ගරු කථානායකතුමාත්, ගරු විපක්ෂ නායකතුමාත් මෙතැනදී පැහැදිලි කළා, රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ හඬ පට සංස්කරණය නොකර ප්‍රසිද්ධ කළොත් ප්‍රශ්නයක් වෙනවා කියලා; ඒවා තුළ අසභ්‍ය වචන විශාල වශයෙන් තිබෙනවා කියලා කිව්වා. ගරු කථානායකතුමනි, එතකොට මම ගරු විපක්ෂ නායකතුමාගෙන් පැහැදිලිවම ඇහුවේ, "මේ මන්ත්‍රීතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන්නේද?" කියන ප්‍රශ්නයයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ඔබතුමා ප්‍රශ්නය අහලා ඉවරයි නේ, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

එතුමා වෙනුවෙන් ඊළඟට ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලාත් මම ඇහුවා. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමාට එක එක්කෙනාට ඇඟිල්ල දිගු කරමින් කථා කරන්නයි,- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාට අවස්ථාව.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, අපි මේ සභාවේ යම් කථාවක් කළොත්, ස්ථාවර නියෝග අනුව ඒ කථාවට අදාළ documents

සභාගත කළ හැකියි. කිසි වේලාවකවත් කාටවත් ඒවා පරීක්ෂා කර, ඒ සභාගත කළ documents අයින් කරන්න කියන්න අයිතියක් නැහැ. එහෙම කරන්න බැහැ. එහෙම නම් ස්ථාවර නියෝග වෙනස් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග අනුව කටයුතු කර තිබෙනවා. අපි එය අගය කරනවා. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී පැහැදිලිව ප්‍රකාශ කළා, සභාවේ අවසර අරගෙන ඒ ඒ දේවල් සභාගත කළ බව. සභාගත කළාට පසුව ඒවා අයින් කරන්න කියන එක ඉතාම අසාධාරණයි. මේ අවස්ථාවේදී කෙහෙල් කැන වැට පැනලාද, පුහුල් හොරා කරෙන් දැනෙනවාද කියලා අප දන්නේ නැහැ. දැන් යම් යම් අය කලබල වෙලා තිබෙනවා. අපට ඒකට කරන්න දෙයක් නැහැ. නමුත් ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න කියන - [බාධා කිරීමක්]

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, මට කාරණා දෙකක් ගැන පැහැදිලි කරන්න තිබෙනවා. එකක් තමයි, ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ චෝදනාවක් තමයි මගේ හඬ පටත් තිබෙනවාය කියන එක. එසේ තිබෙනවා නම් ඒවා එළියට දමන්න. මට නම් ප්‍රශ්නයක් නැහැ. මොකද, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එක්ක මම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]
ගැන කථා කළේ නැහැ නේ. ඒ නිසා ඔබතුමාට ඕනෑ එකක් එළියට දමන්න පුළුවන්.

අනෙක් එක ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා, පාර්ලිමේන්තු සභා ගර්භයේ නොමැති අයට මඩ ගහන එක වැරදියි. කරුණාකර ඔබතුමා ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගන්න. හැම දාම මේක පුරුද්දකට ගිහිල්ලා අවසානයේ මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් හෑල්ලුවට ලක් වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගැන රටේ මිනිසුන් මොනවා හිතාගෙන ඉන්නවාද කියන එක නොවෙයි බලන්න ඕනෑ. ඔබතුමා හැසිරෙන විධියෙන් මේ 225දෙනා දිහාම රටේ මිනිසුන් බලාගෙන සිටින බව කියන්න ඕනෑ. ඔබතුමන්ලා වරප්‍රසාදවලට මුවා වෙලා, පාර්ලිමේන්තුවේදී වචනයක්වත් කථා කරන්න බැරි අය ගැන, එහෙම නැත්නම් අධිකරණයේ පවතින නඩු තීන්දුවක් ගැන විවේචනය කරන්න පටන් ගත්තාම, සමස්ත පාර්ලිමේන්තුවම හෑල්ලුවට ලක් වෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව තීන්දුවක් ගන්න.

අනෙක් එක, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ අවශ්‍යතාව ඉටු කරන්න පාර්ලිමේන්තුවේ පැය දෙකක කාලයක් නාස්ති කරන්න එපා, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, මේ කථාවලින් තේරුම් යන්නේ, අනවශ්‍ය, අසභ්‍ය දේවල් මේ හඬපටවල තිබුණාය කියන එකයි. මුළු රටම පාර්ලිමේන්තුව දෙස සහ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම, විනය පිළිබඳ බලාගෙන ඉන්න කාලයක්. ඔබතුමා කථානායකවරයා හැටියට, අදාළ මන්ත්‍රීවරු නියෝජනය කරන පක්ෂවල පක්ෂ නායකවරු මේ ආකාරයෙන් හැසිරීම නැවැත්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කුමක්ද කියන එක පිළිබඳ රටට පැහැදිලි කිරීම ඔබතුමාගේ වගකීමක්. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරන්න, රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන්න ගත හැකි සහ ගත් ක්‍රියාමාර්ග කුමක්ද කියන එක කරුණාකරලා පෙන්වන්න. අපි කිසිම ආකාරයකින් මොකුත් හංගන්න කියන්නේ නැහැ. හැබැයි, පියවර ගන්න ඕනෑ විනයානුකූලවයි. [බාධා කිරීමක්]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - மின்வலு இராஜாங்க அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - State Minister of Energy)
ගරු කථානායකතුමනි, ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා විසින් ගරු අග්‍රාමාත්‍යතුමාගේ නම ප්‍රකාශ කර හඬ පටයක් ගැන කිව්වා. බොහොම පැහැදිලිව අපි කියනවා, එතුමා ළඟ අග්‍රාමාත්‍යතුමාගේ එවැනි හඬපටයක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න කියලා. එතුමාවත් දන්නේ නැතිව නේ එතුමාගේ හඬ පට ටික මුළු රටටම ගියේ. එතුමාවත් දන්නේ නැහැ, එතුමාගේ හඬ පට ටික මුළු රටම ඇහුවා කියලා. එතුමාගේ හඬපට මුළු රටම ඇහුවා, ගරු කථානායකතුමනි. එතුමා ගරු අගමැතිතුමා ගැන කිව්වා; නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ගැන කිව්වා. ගරු කථානායකතුමනි, එහෙම හඬපට තිබෙනවා නම් කරුණාකරලා එම හඬපට ඉදිරිපත් කරන්න කියන්න. ගරු කථානායකතුමනි, එතුමා අපහාස කළේ මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරු 225දෙනාට විතරක් නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීකමේ නමටත් අපහාස කරලායි තිබෙන්නේ. අද හැරුණුකොට එතුමාට පාර්ලිමේන්තු එන්න පුළුවන් හරියටම තවත් දින දෙකයි. එතුමාට ආයෙත් ජීවිතයටවත් පාර්ලිමේන්තුවට එන්න ලැබෙන්නේ නැහැ. ඒ තරමටම එතුමා මේ පාර්ලිමේන්තුවේ ගරුත්වයට හානි කරලා තිබෙනවා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඊටපස්සේ, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙන්නම්.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, දැන් මෙතැන පුංචි අසාධාරණයක් තිබෙනවා. ඇත්තවශයෙන්ම මෙතුමාගේ හඬපට ටික එළියට ගියේ මෙතුමාගේ දැනුවත්කමකින් තොරවයි. එතකොට දැන් මෙතුමාට කොහේද තිබෙන්නේ අවස්ථාව පැහැදිලි කරන්න? මෙතුමා කළ දේ හරිද නැද්ද කියන එක පිළිබඳ අපි ඔක්කෝමලාට විශාල ප්‍රශ්න තිබෙනවා. නමුත්, මෙතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මෙතැනදී මෙතුමාට සාධාරණයක් වෙන්න ඕනෑ. මෙතුමා එන්නේ ඔබතුමාගේ ඉදිරියටයි. මෙතුමා ඇවිල්ලා අහනවා, මගේ හඬපටවලින් තෝරාගත් හඬ පට ටිකක් mediaවල ගියා; ඒක කවුද කළේ, මොන චේතනාවෙන්ද කළේ කියලා. මොකක්ද වුණේ කියලා මේ ගරු සභාවට සහ ලංකාවට, ලෝකයට දැන ගැනීමට සැලැස්වීමට මෙතුමාට හඬපට ටිකක් සභාගත කරන්න ඕනෑ නම්, ඔබතුමාට ඉදිරිපත් කරන්නේ නැතිව වෙන කොහේට ඉදිරිපත් කරන්නද? ඇයි මේකට විරුද්ධ වෙන්නේ? මාත් රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා එක්ක කථා කරලා තිබෙනවා. ඒකත් ආපුදෙන්. ඒක සමාජ විරෝධී දෙයක් වෙන්න පුළුවන්. නමුත්, මේ මනුෂ්‍යයාට සාධාරණයක් ඉටු විය යුතුමයි. මෙතුමාට ඒ සාධාරණය ඉටු කරලා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මැතිතුමා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මෙතැනින් මේ කථාව නවත්වමුනේද, ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි. ඔබතුමා පැහැදිලි කළා නේ. අපි ඊට පසුව ප්‍රධාන වැඩකටයුතුවලට යමු. මෙතැනින් මේ කාරණය අවසන් කරමු.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා ඉදිරිපත් කරන පළමු කරුණ මෙයයි.

ගරු මන්ත්‍රීවරුන්ට ලේඛන හැන්සාඩ්ගත කිරීමේ අයිතිය, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේම තිබෙන බව අපි නැවත අවධාරණය කරනවා. "ඒක කරන්න එපා" කියලා, මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ suppress කරලා නැහැ. ඒවායේ අඩංගුව unparliamentary නම්, ඒක ඒ මට්ටමට වෙනස් කරන්න. ඊට එහා දෙයක් කරන්න එපා. නැත්නම් අපට ආණ්ඩු පක්ෂයෙන් අහලා ලිපි ලේඛනාදිය සභාගත කරන්න වන තත්ත්වයක් ඉදිරියේදී එන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරු බොහෝ දෙනෙකු පාර්ලිමේන්තුවේ විනය පිළිබඳව කරුණු මතු කළා. එය ඉතා වැදගත්. විනය සම්බන්ධව ගනිද්දී, ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීවරයාගේ හැසිරීම සම්බන්ධව රටේ බරපතළ විවේචන තිබෙනවා. නමුත් ඒ වාගේම අපි දන්නවා, රන්ජන් රාමනායක මහතා විසින් කරන ලද හානිය හා සමානව හෝ ඊට වැඩි මට්ටමින් විනය කඩවීමක් සිදු වුණ බව. මිරිස් කුඩු ගහලා පාර්ලිමේන්තුවේ විනය ඉතා බරපතළ ලෙස උල්ලංඝනය කරමින් මහා විශාල විනාශයක් මේ ගරු සභාව තුළ සිදු වුණා. ඒ සම්බන්ධව සොයා බැලීමට විවිධ පක්ෂවල මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවක් ඔබතුමා පත් කළා. මාත් ඒ කමිටුවේ සාමාජිකයෙක්. ඔබතුමාට ඒ කමිටුවේ වාර්තාව දීලා තිබෙනවා. නමුත්, ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මම හිතන විධියට, මා මේ කරුණෂ මතක් කරන දහවැනි වතාව. මේ පාර්ලිමේන්තු වාරය අවසන් වෙන්න කලින් ඔබතුමා ඒ සම්බන්ධයෙන් මොකක්ද දෙන නියෝගය? විනය කියන එක ගරු කථානායකතුමනි, හංගලා රකින්න පුළුවන් දෙයක් නොවෙයි. එය එළිපිට රකින්න ඕනෑ දෙයක්.

ගරු කථානායකතුමනි, රන්ජන් රාමනායක මහතාගේ භාවිතය සම්බන්ධව මොන විවේචන තිබුණත් මන්ත්‍රීවරුන්ට ලිපි ලේඛන සභාගත කිරීමේ අයිතිය රකින්න කියලා, මා ඔබතුමාට අවධාරණය කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. මීළඟට, ලිපි ලේඛනාදිය පිළිගැන්වීම.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් explanations සඳහා ඉඩ දෙන්න අමාරුයි. අද දිනට නියමිත ප්‍රධාන වැඩකටයුතුවලට යා යුතුයි. මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. ගරු කථානායකතුමනි, ලෙ ාකු අසාධාරණයක් මෙතැන- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I am sorry. I have to move on to the other items of today. I will give you another opportunity.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF THE HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව සහ 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 30 වගන්තිය ප්‍රකාරව, 2019 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2019.01.01 - 2019.03.31) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
கணக்காய்வு சேவைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2019 වර්ෂයේ තෙවැනි කාර්තුව සඳහා (2019.07.01 - 2019.09.30) විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තා
தேசிய பெறுகை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கைகள்
PROGRESS REPORTS OF THE NATIONAL PROCUREMENT COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2018 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2018.01.01 -2018.03.31) සහ දෙවැනි කාර්තුව සඳහා (2018.04.01 - 2018.06.30) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තා මම ඉදිරිපත් කරමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව
அரசாங்க சேவை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கை
PROGRESS REPORT OF THE PUBLIC SERVICE COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) සහ 55(5) ව්‍යවස්ථා ප්‍රකාරව 2019 වර්ෂයේ තෙවැනි කාර්තුව සඳහා (2019.07.01 - 2019.09.30) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය, වරාය හා නාවික කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - வீதி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Roads and Highways, Minister of Ports and Shipping and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියෝග සහ නිවේදන ඉදිරිපත් කරමි.

(i) 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහනමත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 ඔක්තෝබර් 31 දිනැති අංක 2147/72 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 දෙසැම්බර් 14 දිනැති අංක 2153/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iii) සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 4, 13 සහ 17 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය (අංක 05/2019 දරන සුරාබදු නිවේදනය);

(iv) සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 2152/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය (අංක 07/2019 දරන සුරාබදු නිවේදනය);

(v) සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 12, 14 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 2152/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය (අංක 08/2019 දරන සුරාබදු නිවේදනය); සහ

(vi) සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 2152/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය (අංක 09/2019 දරන සුරාබදු නිවේදනය)

එම නියෝග සහ නිවේදන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු චමල් රාජපක්ෂ මහතා (මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය, අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - மகாவலி, கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சரும் உள்ளக வர்த்தக, உணவுப் பாதுகாப்பு மற்றும் பாவனையாளர் நலனோம்புகை அமைச்சரும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Mahaweli, Agriculture, Irrigation and Rural Development, Minister of Internal Trade, Food Security and Consumer Welfare and State Minister of Defence)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභා වාරයේ තෙවැනි වාර්තාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - தகவல் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் உயர் கல்வி, தொழில்நுட்பம் மற்றும் புத்தாக்க அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardane - Minister of Information and Mass Media and Minister of Higher Education, Technology and Innovation)

ගරු කථානායකතුමනි, පහත සඳහන් නියම මම ඉදිරිපත් කරමි.

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 30 දිනැති අංක 2156/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියම; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ එස්.එල්.ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, නාගානන්ද ඉන්ටනැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සහ සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතන වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජනවාරි 06 දිනැති අංක 2157/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියම.

එම නියම අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා (කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - கைத்தொழில் ஏற்றுமதி மற்றும் முதலீட்டு மேம்பாடு அமைச்சரும் சுற்றுலா மற்றும் விமானச் சேவைகள் அமைச்சரும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Industrial Export and Investment Promotion and Minister of Tourism and Civil Aviation)

ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පිළිගන්වන ලද වාර්තා
சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED

ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
இலங்கை சுற்றாடலியல் தொழில் வல்லுநர்கள் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
INSTITUTE OF ENVIRONMENTAL PROFESSIONALS, SRI LANKA (INCORPORATION) BILL

ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. J.M. Ananda Kumarasiri - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, "ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත" පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක සහ නීතිපති විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර්මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත.

මෙම පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ."

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2020 පෙබරවාරි 19වන බදාදා සලකා බලනු ලැබේ.

சட்டமூலம், சட்டவாக்க நிலையியற் குழுவினால் அறிக்கை செய்யப்பட்டவாறு 2020 பெப்ருவரி 19ஆந் திகதி புதன்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.

Bill, as reported by Legislative Standing Committee, to be considered upon Wednesday, 19th February, 2020.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි සහ දෙවැනි වාර්තා, එම කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා විසින් පිළිගැන්වීම.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை

REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

ගරු ලසන්ත අලගියවන්න මහතා (රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - அரச முகாமைத்துவ மற்றும் கணக்கீட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Public Management and Accounting)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන 844ක මූල්‍ය පාලනය සහ කාර්ය සාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2018 මුදල් වර්ෂය සම්බන්ධයෙන් අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව සහ අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව (2019.02.20 සිට 2019.11.07 දක්වා) මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ මූල්‍ය වගකීම පිළිබඳ කාර්ය භාරය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් විසින් තමයි ඉටු කරනු ලබන්නේ. මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම කාරණයක් සඳහන් කරන්න ඕනෑ. අද දිනය ගත්තත් විනාඩි 40කට ආසන්න කාලයක් හඬ පට පිළිබඳව අපි කථා කළා. අද අපි මේ ඉදිරිපත් කරනු ලබන වාර්තා දවසකින් දෙකකින් හදන ලද ඒවා නොවෙයි. ඒ ආයතනවල නිලධාරීන් පාර්ලිමේන්තුවට ගෙන්වා විමර්ශනය කරලායි අපි ඒ වාර්තාව ඉදිරිපත් කරන්නේ. නමුත්, කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම සඳහා අපට ලැබෙන්නේ විනාඩි දෙක, තුනක කාලයක්. ඒ වාගේම මම හිතන්නේ මේ ඉදිරිපත් කරනු ලබන වාර්තා පිළිබඳ විවාදයක් පාර්ලිමේන්තුවේදී සිද්ධ වන්නේ නැහැ. ගරු කථානායකතුමනි, එම නිසා අපි ඉදිරිපත් කරනු ලබන මේ වාර්තා පිළිබඳව ඔබතුමාගේත්, පක්ෂ නායක සියලුදෙනාගේත් අවධානය මා යොමු කරවනවා. විශේෂයෙන්ම මේ වාර්තාවල ඇතුළත් වෙලා තිබෙන්නේ ඉතා වැදගත් අනාවරණ සහ විමර්ශන. රටේ ඉදිරි දියුණුව වෙනුවෙන් විශාල පිටුවහලක් වන කරුණු, නිර්දේශ මේවාට ඇතුළත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කරනවා.

තොරතුරු පද්ධතිය සම්බන්ධ කර ගෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව 2015දී මේ කටයුත්ත ආරම්භ කරන කොට තිබුණු ප්‍රධානතම ප්‍රශ්නයක් තමයි, අවුරුදු ගණනාවක් පසු වූ - පෙර වර්ෂවල - ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම සාමාන්‍ය සම්ප්‍රදායක් බවට පත්ව තිබීම. ඒ අනුව 2015දී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විධියට අපි මේ පාර්ලිමේන්තුවට කිව්වා, පෙර වර්ෂයේ ගිණුම් පිළිබඳ වාර්තා ඊළඟ වර්ෂයේ ඉදිරිපත් කරනවා කියලා. ඒ අනුව, 2018 වර්ෂයට අදාළ රාජ්‍ය ආයතන 844කට අදාළ ගිණුම් පිළිබඳව විමර්ශනය නොකරන ලද, එහෙත් තොරතුරු පද්ධතිය හරහා ගත් වාර්තා තමයි අද අප ඉදිරිපත් කරන්න කටයුතු කළේ කියන කාරණය ඉතාම සතුටින් සඳහන් කරන්න ඕනෑ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මා ඇතුළු, සියලු දේශපාලන පක්ෂ නියෝජනය කරන සියලු මන්ත්‍රීතුමන්ලාගේ කැපවීම මත අද අපට පුළුවන්කමක් ලැබිලා තිබෙනවා, පාර්ලිමේන්තුවේ ඒ වගකීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විධියට හරිහැටි ඉටු කරන්න. අපි ලබන 28වැනි දා 2018 වර්ෂයට අදාළ රාජ්‍ය ආයතන 100කට ආසන්න ප්‍රමාණයකට අදාළව ඇගැයීමේ වැඩසටහනක් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුව තුළදී සිදු කරනවාය කියන කාරණයත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

ඊට අමතරව, අපේ රටේ ප්‍රථම වතාවට විගණකාධිපතිවරයා විසින් එක් ආයතනයකට අදාළ කරුණු පමණක් නොවෙයි, යම් ක්ෂේත්‍ර පිළිබඳව කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ සම්ප්‍රදාය දෙවන වාර්තාව තුළින් අපි හඳුන්වා දුන්නා. ඒ අනුව, අපි මේ ඉදිරිපත් කළ වාර්තාවේ නිර්දේශ නැති වුණත් ක්ෂේත්‍ර නවයක කාර්ය සාධන වාර්තා පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳව කරුණු ඇතුළත් වෙලා තිබෙනවා.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳව, කොළඹ මහ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය පිළිබඳව, සිරකරුවන්ට ආරක්ෂාව සහ රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව, විලත්තිකුලම් රක්ෂිත වනාන්තරය අවභාවිතය පිළිබඳව, උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය සිදු කරනු ලබන වෛද්‍ය සැපයීම් ක්‍රියාවලිය පිළිබඳව, ආබාධිත පුද්ගලයන් අධ්‍යාපනික හා වෘත්තීය වශයෙන් සවිබල ගැන්වීම වෙනුවෙන් රාජ්‍ය ආයතනවල මැදිහත් වීම කියන මේ ක්ෂේත්‍රවල කාර්ය සාධන සම්බන්ධයෙන් ඉදිරිපත් කරපු නිර්දේශය පිළිබඳවත් විමර්ශන මේ දෙවැනි වාර්තාව තුළ ඇතුළත් වෙලා තිබෙනවා. ඉතාම වැදගත් නිර්දේශ කීපයක්ම මේ වාර්තා තුළ ඇතුළත් වෙලා තිබෙනවා. ඉතාම කඩිනමින් මේ පිළිබඳව කටයුතු කළ යුතුයි. දැන් නම් ඒ සඳහා කාල වේලාවක් නැති වෙයි. නමුත් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම් කාර්යාලයත්, පාර්ලිමේන්තුවත් ඒ වාර්තා සකස් කිරීමේදී ලබා දෙන සහයෝගය හා දායකත්වය මේ අවස්ථාවේදී මම කෘතවේදීව සිහිපත් කරන්න ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව

அரசாங்கப் பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை

REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, අටවැනි පාර්ලිමේන්තුවේ, සිව්වැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව මම සභාවට ඉදිරිපත් කරනවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගරු කථානායකතුමනි, මේ වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර ආයතන 10ක කරුණු අඩංගු කර තිබෙනවා. විශේෂයෙන්ම මහජන බැංකුව, ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව, රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව, සමාජ ආරක්ෂණ අරමුදල ආදී වශයෙන් වැදගත් ආයතන කිහිපයක කරුණු එහි අඩංගුවෙලා තිබෙනවා.

මම මීට කලිනුත් අවස්ථා ගණනාවකදී මේ සභාවේදී මතු කරපු කාරණයක් කෙරෙහි මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමාගේ මැදිහත් වීමෙන්, පාර්ලිමේන්තුවේ හැම දෙනාගේම එකඟතාවෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේත් කටයුතුවල සජීවී විකාශයක් ලබාදීමට ජනමාධ්‍යවලට අවස්ථාව ලබාදීම, පාර්ලිමේන්තුව පොදු ජනතාවගේ ඇගැයීමට ලක් වෙන කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා. නමුත් මේ වාර්තාවලින් අපි එළිදරවු කරන කරුණු අනුව, ඒවාට වගකිව යුතු පුද්ගලයන් නීතිය හමුවට කැඳවීම අදටත් ප්‍රමාද වෙලා තිබෙනවා. ඒ නිසා එම කටයුතු දකින ජනතාවම ඔබතුමා ගැනත්, පාර්ලිමේන්තුවේ අපේ ක්‍රියාකාරීත්වය ගැනත් යළි ප්‍රශ්න කරනවා, එම කරුණු හොයා ගත්තාට, ඒවාට ලැබෙන ප්‍රතිඵලය මොකක්ද කියලා. ඒ නිසා විශේෂයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පාර්ලිමේන්තු කාලය අවසන් වෙන්න කලින්වත් මේ කාරක සභාවල කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා නීතිමය නිලධාරීන් -නීතිපතිතුමාගේ නිලධාරීන් එහෙම නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ අදාළ නීති කටයුතු කරන නිලධාරීන්- සෘජුව, නිරීක්ෂණ මට්ටමින් හෝ සහභාගි කරවන්න කැඳවන්න කියලා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට හෝ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට හෝ නීතිමය බලතල නැහැ තමයි. හැබැයි, මේ කරුණු ඇහින් දුටු සාක්ෂි බවට පත් කර ගන්න නීති නිලධාරීන්ම මේ කාරක සභාවල නිරීක්ෂණයට ඉන්නවා නම්, ඒක අදාළ නිලධාරීන් අධිකරණයට සෘජුව කැඳවන්න විශාල පිටිවහලක් වෙනවාය කියා මා හිතනවා. මේ වාර්තාව තුළින් අද අපි පෙන්නුම් කරන නිලධාරීන් මේ වන විට retire වෙලා, රට ගිහිල්ලා, ආයතන මහ හැරලා ගිහිල්ලා එළියේ ඉඳගෙන අපට හිනා වෙනවා. ඒක තමයි ඇත්ත. ඒවාට වග කිව යුතු අය අපෙන් අහනවා, "ඔයගොල්ලන් මේවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, අප අල්ල ගත්තාද?" කියලා. මොකද, ඒ අය ආයතන මාරු කරලා යනවා; ආණ්ඩු මාරු වෙනකොට ඒ ගොල්ලන් ආයතන මාරු කරනවා; retire වෙනවා; රට යනවා. එතකොට මහජන මුදල් විනාශ කරපු ඒ මිනිසුන් නීතිය ඉදිරියට කැඳවන්න බැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ කාරක සභා දෙකේ නිරීක්ෂණය සඳහා සෘජුව නීති නිලධාරීන් කැඳවන්න. ඒ සඳහා ජාත්‍යන්තර වශයෙන් වෙන රටවල ආදර්ශ ඕනෑ තරම් තිබෙනවා. මම ඒක මේ පාර්ලිමේන්තුවේ කියලා තිබෙනවා. මම ඒ කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමාගේ ධුර කාලය අවසන් වෙන්න කලින්වත් මේ කටයුත්තට මුල පුරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ ගැන මම දැනටමත් අවධානය යොමු කරලා තිබෙනවා. නමුත් ඒ අය ටික කාලයක් ඉල්ලුවා, නිලධාරීන්ගේ අඩුකම නිසා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015 වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(v) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, “2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග” සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on International Relations on,

(i) Annual Reports of the Sri Lanka Convention Bureau for the years 2013-2017;

(ii) Annual Report of the Sri Lanka Tourism Development Authority for the year 2016;

(iii) Annual Report of Tourism Development Fund for the year 2016;

(iv) Annual Performance Report and Accounts of the Ministry of Tourism Development and Christian Religious Affairs for the year 2018;

(v) Annual Performance Report of the Ministry of Foreign Affairs for the year 2016; and

(vi) Performance Report of the Ministry of Foreign Employment for the year 2017,

which were referred to the said Committee.

Sir, I also wish to take this opportunity to thank all the Members and the staff of the Sectoral Oversight Committee on International Relations.

Thank you.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව පිළිගැන්වීම, එම කාරක සභාවේ සභාපති ගරු හර්ෂණ රාජකරුණා මැතිතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (විදුලිබල රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - மின்சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - State Minister of Power)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මොකක් ගැනද? මේ කටයුතු අවසානයේ අවස්ථාව දෙන්නම්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය;

(ii) 2013 සහ 2018 වර්ෂ සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(iii) 2018 වර්ෂය සඳහා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iv) 2018 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2016 සහ 2017 වර්ෂ සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(vi) 2018 වර්ෂය සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(vii) 2018 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2018 වර්ෂය සඳහා ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ix) 2018 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(x) 2016 වර්ෂය සඳහා සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව;

(xi) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(xii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(xiii) 2017 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(xiv) 2017/18 වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මමම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

ගරු කථානායකතුමනි, කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015 වර්ෂය සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

ගරු කථානායකතුමනි, කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සකස් කරන ලද

[ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය]

"පවුල් නීති ප්‍රතිසංස්කරණය" සම්බන්ධයෙන් වූ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, දීර්ඝ කාලයක් තුළ සමාජයේ විවිධ පාර්ශ්ව අතරින් ඉස්මතු වූ කරුණු අනුව, මෙම වාර්තාව මඟින් පහත ක්ෂේත්‍ර කෙරෙහි අවධානය කර ඇත.

ඒවා නම්, පොදු විවාහ නීතියක් ස්ථාපිත කිරීම හා ළමා විවාහ වැළැක්වීම, විවාහ වීමේ අවම වයස 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත සඳහා යෝජිත සංශෝධන, 1999 අංක 37 දරන නඩත්තු පනත සඳහා යෝජිත සංශෝධන සහ උප්පැන්න සහතිකයේ සංශෝධන සිදු කිරීම, උප්පැන්න සහතිකයේ 6වන කොටස තුළ ඇති "මවුපියන් විවාහක ද" යන්න ඉවත් කිරීමට පියවර ගැනීම ආදියයි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න. ප්‍රශ්න අංක 1, ගරු බුද්ධික පතිරණ මැතිතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ප්‍රධාන කටයුතුවලට යන්න ඉස්සර වෙලා ඔබතුමාට අවස්ථාව දෙන්නම්. දැන් අවස්ථාව දුන්නොත්, මේ යන පිළිවෙළ කැඩෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මෙය පොඩි ප්‍රශ්නයක්. විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක් ගැනද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, අටවන පාර්ලිමේන්තුවේ සිව්වැනි සැසිවාරයේ, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවන වාර්තාව හැටියට තමයි ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා Forensic Audit එක පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. පාර්ලිමේන්තුවේ COPE එකේ සභාපතිවරයා හැටියට තමයි එතුමා මේ වාර්තාව ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, මම මේ කාරණය අහන්නේ පැහැදිලි කර ගැනීමක් සඳහායි. මොකද, COPE එක කැඳවලා අපි මේ පිළිබඳ තවම විවාදයක් කරලාත් නැහැ; මේ පිළිබඳ සාකච්ඡා කරලාත් නැහැ; මේ පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය ප්‍රකාශ කරලාත් නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය තිබෙන්නේ පාර්ලිමේන්තුව සතුවයි කියලා. ඒ නිසා අදාළ පරීක්ෂා කිරීම් කරලා, විගණකාධිපතිවරයාගේ මතයත් විමසලා තමයි අපි පාර්ලිමේන්තුවට මෙය ඉදිරිපත් කරන්න ඕනෑ. මා කියන්නේ, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ නමින් මේ යෝජනාව ඉදිරිපත් කළා නම්, ඒකේ ප්‍රශ්නයක් නැහැ කියන එකයි. COPE එකට මේ වාර්තාව කැඳවන්නේ නැතිව, COPE එක මේ පිළිබඳව විභාග කරන්නේ නැතිව, විගණකාධිපතිවරයාගේ මතය විමසන්නේ නැතිව COPE එකේ සභාපතිවරයා හැටියට මේ යෝජනාව ඉදිරිපත් කරන එක හරිද කියන එකයි මම ඔබතුමාගෙන් අහන්නේ.

ගරු කථානායකතුමනි, ඊළඟ ප්‍රශ්නය තමයි මේ කියන ආයතනය ඉන්දියාවේ ban කරපු ආයතනයක්. මෙය, විශාල වංචා සිදු වෙච්ච ආයතනයක්. රාජ්‍ය සංස්ථා ඇතුළු විවිධ ආයතනවල ගිණුම් පරීක්ෂා කරන්නේ COPE එක. එහෙම නම්, එම කමිටුව ඉදිරිපත් කරන වාර්තා සම්බන්ධයෙන් යම් ගෞරවයක් තිබෙනවා. ඉතින් එහි සාමාජිකයකු හැටියට පැහැදිලි කර ගැනීමක් සඳහායි මා මෙය අහන්නේ. මේ යෝජනාව ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරලා විවාදයට ගියාට ගැටලුවක් නැහැ, ගරු කථානායකතුමනි. මම අහන්නේ COPE එකේ සභාපතිවරයා හැටියට මේ යෝජනාව ඉදිරිපත් කරන එක හරිද කියන කාරණය විතරයි. මම මෙය අහන්නේ මට පැහැදිලි කර ගන්නයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදයේදී ඒ ගැන කරුණු පැහැදිලි කරන්න පුළුවන් නේද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, එතුමාට වැරදීමක් වෙලා තිබෙන නිසා මම නිවැරදි කරන්න ඕනෑ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවේ සඳහන් වාර්තාව වෙනත් එකක්. මම අද ඉදිරිපත් කළ වාර්තාව, COPE එකේ දී ඔබතුමන්ලා -අපි කලින් සාකච්ඡා කරපු, ආයතන 10ක් ගැන විගණකාධිපතිතුමා කරුණු ඉදිරිපත් කරලා, කාරක සභාව අනුමත කරපු වාර්තාවක්.

"අට වන පාර්ලිමේන්තුවේ සිව්වන සභාවාරය..." යනුවෙන් සඳහන් කරමින් මා ඉදිරිපත් කළේ, ගරු ඇමතිතුමන්ලා ඉදිරිපත් කරනවා වාගේම, කාරක සභාවේ කලින් සාකච්ඡා කරලා පාර්ලිමේන්තුවේ සභාගත කරන්න තිබුණු, භාෂා පරිවර්තන කටයුතු අවසන් කරපු වාර්තාවක්. ඒක Forensic Audit එකට සම්බන්ධ එකක් නොවෙයි. [බාධා කිරීමක්] අද දින සභාව කල් තැබීමේ යෝජනාව මා ඉදිරිපත් කරන්නේ මන්ත්‍රීවරයකු හැටියට. ඒ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන වෙලාවේදී ඔබතුමාට ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. ගරු කථානායකතුමනි, මා ඉදිරිපත් කරන, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවේ සඳහන් වාර්තාව, COPE එකේ සාකච්ඡා නොවූ, දැන් වන විට ඔබතුමා සෘජුව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙන ව්‍යවහාරික විගණන වාර්තාවයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මම අපේ පක්ෂය වෙනුවෙන් ඒ වාර්තාවට අදාළව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරනවා. මා හිතන විධියට ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මට තිබෙන වරප්‍රසාදයක්, අයිතියක්. ගරු

කථානායකතුමනි, ඒක ඔබතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ මහ බැංකුවේ වෝහාරික විගණන වාර්තාව. ඒ නිසා ඒක තවදුරටත් COPE එක තුළ තිබෙන වාර්තාවක් නොවෙයි. ඒක COPE එක හරහා පාර්ලිමේන්තුවට ආවා නම් හොඳයි කියා මාත් හිතනවා. නමුත්, එය දැන් සෘජුව අප 225දෙනාම පරිහරණය කරන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මටත් පරිහරණය කිරීමේ අයිතිය තිබෙන වාර්තාවක්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ ගැන විරෝධයක් තිබෙනවා නම්, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළාම ඔබතුමාගේ විරෝධය ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමනි, එහෙම නම් ඒ කාරණය අවසන් කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, මෙවර ඔබතුමා කෝප් එකේ සභාපති ධුරයට යෝජනා කරන්නත් මුල් වුණු කෙනෙක්, මම. ඒ නිසා මට ඔබතුමා එක්ක මේ සභාව තුළ පෞද්ගලික ගැටුමක් නැහැ; ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඔබතුමා සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වුණත්, ඔබතුමා අපේ COPE එකේ සභාපතිතුමා. මේ යෝජනාව ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ගෙනාවා නම්, ගැටලුවක් නැහැ. ඔබතුමා COPE එකේ සභාපතිවරයා හැටියට අද පස් වරු 02.00ට COPE එක කැඳවනවා. අපි මේ ගැන කථා කරලා, විගණකාධිපතිවරයාගෙන් මේ ගැන මතයත් අහලා, මූල්‍ය වංචාවට සම්බන්ධ වුණු ආයතනයක් පිළිබඳව වත්මන් COPE එකේ සභාපතිවරයා මේ යෝජනාව ගෙනෙන එක හොඳද කියන කාරණයයි මා ඇහුවේ. ඔබතුමා එයට එකඟ නම්, එච්චරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න. ප්‍රශ්න අංක 1, ගරු බුද්ධික පතිරණ මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මට කෙටි අවස්ථාවක් දෙන්න. මේ වාර්තා කිහිපය COPE එකට ඉදිරිපත් කළා. නමුත්, සිද්ධ වූ දේ තමයි පාර්ලිමේන්තු සැසිවාරය කල් තැබීමත් එක්ක COPE එක අහෝසි වීම. COPE එක නැවත පිහිටුවීම සඳහා යම් කාලයක් ගත වුණා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ කාලය ඇතුළත මේ පාර්ලිමේන්තුවේදී ඔබතුමන්ලාගේ පාර්ශ්වයත්, -ඔබතුමන්ලාගේ පැත්තෙන් නම් වැඩිය හඬ නැඟුවේ නැහැ- මේ පැත්තේ අයත් -හැමදෙනා- කියා සිටියා, COPE එකට ඉදිරිපත් කරන ලද මේ විගණන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. එතකොට, ඒවා තවදුරටත් COPE එක ඇතුළේ තිබෙන ලේඛන නොවෙයි. වෙනදා සිද්ධ වුණු දේ තමයි COPE එක තුළ සාකච්ඡාවකින් පසුව ඒවා පාර්ලිමේන්තුවට ඒම. හැබැයි, මේ ලේඛන, COPE ක්‍රියාකාරිත්වය අක්‍රිය වීම හේතුකොටගෙන කෙළින්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණු ලේඛන.

අද මේ විවාදය පැවැත්වෙන්නේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ ලේඛන පිළිබඳවයි. ඒ අනුව තමයි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා මේ විවාදය පැවැත්වෙන්නේ COPE එකට ඉදිරිපත් වුණු ලේඛන පිළිබඳව නොවෙයි. මේ විගණන වාර්තා මේ සභාවට ඉදිරිපත් කරලා අවසන්. [බාධා කිරීම්]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 - 15/2020 - (1), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 - 56/2020 - (1), ගරු චමින්ද විජේසිරි මහතා - [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 3 - 83/2020 - (1), ගරු හේෂා විතානගේ මහතා - [සභා ගර්භය තුළ නැත.]

බිංගිරිය අපනයන සැකසුම් කලාපය: පවරාගත් ඉඩම්
பிங்கிரிய ஏற்றுமதி தயாரிப்பு வலயம்: கையகப்படுத்தப்பட்ட காணிகள்
BINGIRIYA EXPORT PROCESSING ZONE: LANDS ACQUIRED

94/2020

4. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එසේ පවරාගත් ඉඩම් අයත් වී තිබූ ආයතන කවරේද;

(iii) එම භූමි පවරාගත් දිනය කවරේද;

(iv) ඉඩම් සඳහා ගෙවන ලද වටිනාකම හා එම වටිනාකම තක්සේරු කළ ක්‍රමවේදය කවරේද;

(v) දැනට එම ඉඩම්වල ඇති පොල් වගාවේ නඩත්තුව හා එළදාව ලබා ගැනීම සිදු කරනු ලබන ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சரும் புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வீடமைப்பு வசதிகள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பிங்கிரிய ஏற்றுமதி தயாரிப்பு வலயத்திற்காக இலங்கை முதலீட்டுச் சபையினால் கையகப் படுத்தியுள்ள காணியின் அளவு யாது;

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

(ii) அவ்விதமாக கையகப்படுத்தியுள்ள காணிகள் எந்நிறுவனங்களுக்குச் சொந்தமான இருந்தன;

(iii) மேற்படி நிலப்பரப்புகள் கையகப்படுத்தப்பட்ட திகதி யாது;

(iv) காணிகளுக்காக செலுத்தப்பட்ட பெறுமதிகள் மற்றும் அப்பெறுமதி மதிப்பீடு செய்யப்பட்ட முறையியல் யாது;

(v) தற்போது மேற்படி காணிகளில் உள்ள தென்னஞ் செய்கையின் பராமரிப்பு மற்றும் விளைவுகளை பெற்றுக்கொள்ளலை மேற்கொள்கின்ற நிறுவனம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister, Minister of Finance, Economy and Policy Development, Minister of Buddhasasana, Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities:

(a) Will he inform this House -

(i) the extent of land that has been acquired by the Board of Investment of Sri Lanka for the Bingiriya Export Processing Zone;

(ii) the institutions to which those lands belonged;

(iii) the dates on which those lands were acquired;

(iv) the amounts paid for those lands and the methodology adopted to assess their value; and

(v) the institutions that maintain the coconut cultivation on those lands at present and obtain their harvest?

(b) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2019 ජුනි මස 03වන දින පළ කරන ලැබූ අංක 2126/12 දරන ගැසට් පත්‍රය මඟින් පහත ඉඩම් ප්‍රමාණ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට විකිණීමෙන් පවරා දී ඇත.

ඉඩමේ නම	අක්	රූඩ්.	පර්.	පිඹුරු අංක
වතු වත්ත හෙවත් ජර්මන් වත්ත	157	3	12.29	1655
ගොරකගස් අගාර හෙවත් කොවුල් වැව වත්ත	282	3	0.38	1659

(ii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිතිව තිබූ ඉහත ඉඩම්වල භුක්තිය 1977 වසරේ සිට ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් භුක්ති විඳිමින් සිටින ලදී.

(iii) 2019 ජුනි මස 03 දිනැති අංක 2126/12 දරන ගැසට් නිවේදනය මඟින් පවරා ගෙන ඇත.

(iv) රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත පදනම්ව,

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත - රු. මිලියන 112.0

(ඉඩම සඳහා වන තක්සේරු වටිනාකම)

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත - රු. මිලියන 167.1

(ඉඩමේ සංවර්ධන කටයුතු සඳහා වන තක්සේරු වටිනාකම)

මුළු මුදල - රු. මිලියන 279.1

(v) ආයෝජන වෙත ලබාදුන් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කරන තෙක් පවත්නා පොල් වගාවේ නඩත්තුව හා ඵලදාව භුක්ති විඳීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත අවසර ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, බිංගිරිය අපනයන සැකසුම් කලාපය පිළිබඳව මම අහපු ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් ලබාදීම සම්බන්ධව අපේ ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාට මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. යම් කිසි කාල රාමුවක් තුළ මේ ව්‍යාපෘතියේ වැඩ අඩාළවෙලා තිබිලා නැවතත් පටන් ගැනීම සම්බන්ධව මේ ව්‍යාපෘතිය පිළිබඳව දන්නා පුද්ගලයකු විධියට, මේ ව්‍යාපෘතිය ගෙනෙන්න කටයුතු කළ හිටපු නියෝජ්‍ය ඇමතිවරයා විධියට මා සතුටු වෙනවා. මා මේ විෂය භාර නියෝජ්‍ය අමාත්‍ය ධුරය දැරූ අවසාන කාලය වන විට ව්‍යාපෘති 6ක් සඳහා ගිවිසුම් අත්සන් කරලා තිබුණා. සමහර විට ඔබතුමාට මේ ගැන එකපාරටම පිළිතුරක් දෙන්නට බැරිව ඇති. එම ව්‍යාපෘති පිළිබඳව ඔබතුමන්ලා දක්වන උනන්දුව පිළිබඳව, ඔබතුමන්ලා ඒ පිළිබඳව සොයා බලන ආකාරය පිළිබඳව පුළුවන් නම් මට පිළිතුරක් ලබා දෙන්න.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අපේ රජය කිසිම අවස්ථාවක ආයෝජකයකුට නරකක් වෙන්නට ඉඩ දෙන්නේ නැහැ. යම් ආයෝජකයකු ආවොත් එම ආයෝජකයාට අවශ්‍ය පහසුකම් ලබාදීලා රට වෙනුවෙන් ඒ කටයුතු කරන්නට අපි සූදානමින් ඉන්නවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. සමහර අය හිතාගෙන හිටියා මේ ව්‍යාපෘති කෙරෙන්නේ නැතිව අඩාළ වෙයි කියලා. අනෙක් කාරණය තමයි, ගරු ඇමතිතුමාගේ උත්තරයෙන්ම පැහැදිලි වෙනවා නිසි ක්‍රමවේදය අනුව මේ ඉඩම් පවරාගෙන තිබෙන බව. ඒ ගෙවීම් කටයුතු සියල්ලක්ම කරලා තිබෙනවා, ඒ වාගේම ගැසට් කිරීම් සියල්ලත් කරලා තිබෙනවාය කියන එක පැහැදිලි වෙනවා. ඒ වාගේම, මේ පොල් එළදාව දැනටමත් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ලබා ගන්නවා. සමහරු කිව්වා, පොල් ගස් ලක්ෂ ගණනක් කැපීම නිසා විශාල විනාශයක් සිදුවුණා වාගේ කථාවක්. නමුත්, ඔබතුමාගෙන් මේ ගැන පැහැදිලි උත්තරයක් ලැබිලා තිබෙනවා.

අක්කර 450කට ආසන්න මේ ඉඩම් ප්‍රමාණය සංවර්ධනය කිරීමට ඔබතුමා දක්වන උනන්දුව ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මේ ව්‍යාපෘති ගැන සොයා බලන්නට ඔබතුමා පෞද්ගලිකවම මැදිහත් වී කටයුතු කරනවාද, එහෙම නැත්නම් නිලධාරි මණ්ඩලයක් යොදවා මේ ගැන සොයා බලනවාද කියන කාරණයත් ඔබතුමාගෙන් මා දැනගන්නට කැමැතියි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, තිබෙන පොල් ගස්වල නඩත්තුව සහ ආදායම ලබා ගැනීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අවසර ලබා දී තිබෙන බව පිළිතුර ලබා දීමේ දී මා පැහැදිලිව කිව්වා. ඒ වාගේම, මේ ඉඩමෙන් කපපු පොල් ගස් ගණන පිළිබඳව නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා, ගරු කථානායකතුමනි. සමහරු මේ සම්බන්ධව පෙත්සම් පවා එවලා තිබෙනවා, එවකට සිටි ඇමතිවරු මේ පොල් ගස් කපාගෙන ගියා කියලා. මම ඒ අයගේ නම් ගම් කියන්නට යන්නේ නැහැ, ඒ තොරතුරු අසත්‍ය නම් ඒක ඒ අයට කරන අසාධාරණයක් වන නිසා. විශාල වශයෙන් පොල් ගස් කපා තිබෙනවා, ආයෝජන ප්‍රවර්ධනය වෙනුවෙන්. අපි මේ රටේ තාවකාලික භාරකරුවන් පමණයි. නමුත්, පැමිණෙන ආයෝජකයන්ට රට වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ලබා දීමට රජයක් හැටියට අප බැඳී සිටිනවා. ඒ සම්බන්ධව පෞද්ගලික බැඳීමක් ඇති කර ගත යුතු නැහැ, රජයේ වැඩ පිළිවෙළ තුළ අපි ක්‍රමානුකූලව ඒ කටයුතුවලට සහයෝගය ලබා දෙනවා.

පොලිස් කොස්තාපල් එල්.පී.යූ. කරුණාරත්න: හිඟ වැටුප්

பொலிஸ் கான்ஸ்டபிள் எல்.பீ.யூ. கருணாரத்ன: நிலுவைச் சம்பளம்

POLICE CONSTABLE L.P.U. KARUNARATHNA: SALARY ARREARS

114/2020

5. **ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආධුනික පොලිස් කොස්තාපල් නිල අංක 31470 එල්.පී.යූ. කරුණාරත්න මහතා 1990.11.04 දින පොලිස් සේවයට බැඳී කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ මූලික පුහුණුව ලබමින් සිටියදී 1991.03.04 දින සිට ඔහුගේ එම පත්වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරනු ලැබූ බව දන්නේද;

(ii) එම පත්වීම අවලංගු කිරීමට හේතු කවරේද;

(iii) ඔහුගේ අභියාචනය සලකා බලා 1997.04.11 දින සිට නිල අංක 12271 යටතේ යළි ඔහු සේවයට බඳවා ගත් බව දන්නේද;

(iv) ඔහුගේ පත්වීම අවලංගු කර තිබූ වසර 06ක කාලයට ඔහුට ලැබිය යුතු උසස්වීම්, නොලැබීමට හේතු කවරේද;

(v) එම කාලයට අදාළව ඔහුට හිමි හිඟ වැටුප් ලබාදීමට කටයුතු නොකරන්නේ මන්ද;

(vi) ඔහුගේ උපන් දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகாவலி, கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சர் மற்றும் உள்ளக வர்த்தக, உணவுப் பாதுகாப்பு மற்றும் பாவனையாளர் நலனோம்புகை அமைச்சர் மற்றும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரிடம் கேட்ட வினா:

(அ) (i) உத்தியோகபூர்வ இலக்கம் 31470 கொண்ட பயிலுநர் பொலிஸ் கான்ஸ்டபிள் திரு.எல்.பீ.யூ. கருணாரத்ன 1990.11.04 ஆம் திகதி பொலிஸ் சேவையில் இணைந்து களுத்துறை பொலிஸ் பயிற்சிக் கல்லூரியில் ஆரம்பப் பயிற்சியை பெற்றுக்கொண்டிருக்கையில் 1991.03.04 ஆம் திகதி முதல் இவரின் நியமனம் உடனடியாக நடைமுறைக்கு வரும் வகையில் இரத்து செய்யப்பட்டதென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) அந்நியமனத்தை இரத்து செய்தமைக்கான காரணம் யாதென்பதையும்;

(iii) இவரின் மேன்முறையீட்டினை பரிசீலனை செய்து 1997.04.11 ஆம் திகதி முதல் உத்தியோகபூர்வ இலக்கம் 12271 இன் கீழ் இவர் மீண்டும் சேவையில் இணைத்துக் கொள்ளப்பட்டார் என்பதை அறிவாரா என்பதையும்;

(iv) இவரின் நியமனம் இரத்து செய்யப்பட்டிருந்த 06 வருட காலத்தில் இவருக்கு கிடைக்கவேண்டிய பதவியுயர்வு கிடைக்காமைக்கான காரணங்கள் யாவையென்பதையும்;

(v) அக்காலம் தொடர்பில் அவருக்குரித்தான நிலுவைச் சம்பளத்தினை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளாமைக்கான காரணம் யாதென்பதையும்;

(vi) இவரின் பிறந்த திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Mahaweli, Agriculture, Irrigation and Rural Development and Minister of Internal Trade, Food Security and Consumer Welfare and State Minister of Defence:

(a) Will he inform this House -

(i) whether he is aware that Mr. L. P. U. Karunarathna bearing official number 31470 joined the Police Service as an

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

apprentice Police Constable on 04.11.1990 and his appointment was cancelled on 04.03.1991 with immediate effect while receiving basic training at the Kalutara Police Training School;

(ii) the reasons for cancelling that appointment;

(iii) whether he is aware that he was reinstated under official number 12271 with effect from 11.04.1997 upon considering his appeal;

(iv) the reasons for not receiving the promotions he should have received during the six years of cancellation of appointment;

(v) as to why arrangements are not made to pay the arrears of salary relevant to that period; and

(vi) his date of birth?

(b) If not why?

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) පොලිස් කොස්තාපල් 31470 එල්.පී.යූ. කරුණාරත්න නිලධාරියා 1990.11.04 වන දින ශ්‍රී ලංකා පොලීසියට බඳවාගෙන ඇති අතර, බඳවා ගැනීමෙන් පසු මොහුගේ ඥාතීන් එවකට තහනම් සංවිධානයක් වන ජනතා විමුක්ති පෙරමුණට සබඳතා ඇති බවට කරුණු අනාවරණ වීමෙන් පසු එවකට පොලිස්පති විසින් 1991.03.16 වන දින පත්වීම අවලංගු කර ඇත.

(iii) ඔව්.

(iv) නිලධාරියාගේ ආධුනික කාලය තුළදී එනම්, 1991.03.04 දින සිට ඔහුගේ පත්වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇති අතර, 1997.04.11 දින නවක නිලධාරියෙකු ලෙස සේවයට බඳවා ගෙන ඇත. ඒ අනුව පත්වීම අවලංගු කර සිටි කාලය සඳහා නිලධාරියාට උසස්වීම් ලබාදීම සිදු නොකරන බව වාර්තා කර ඇත.

(v) 1991.03.04 දින සිට නිලධාරියාගේ පත්වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇති බවත්, 1997.04.11 දින නවක නිලධාරියෙකු ලෙස සේවයට බඳවා ගෙන ඇති අතර, පත්වීම අවලංගු කර සිටි කාලය සඳහා වැටුප් ගෙවීම් සිදුකර නැත.

(vi) 1969.12.08

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම ගැන මා ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාට තේරෙනවා ඇති, මම ඔහුගේ උපන් දිනය ඇහුවේ මොකද කියලා. එල්.පී.යූ. කරුණාරත්න මහතා 1969 දෙසැම්බර් මාසයේ ඉපදිලා තිබෙන්නේ. ඒ සිදුවීමට සම්බන්ධ වෙලා තිබෙන්නේ ඔහු නොවෙයි. ඔහුගේ වයස ඒ වන විට අවුරුදු එකහමාරයි. 1971දී වයස අවුරුදු එකහමාරක් වූ කෙනාගේ මාමා ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධයි කියලා අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ සිදුවීම පදනම් කරගෙන ඊට අවුරුදු 27කට පස්සේ මේ පුද්ගලයාගේ වැඩ තහනම් කර තිබෙනවා. මේක, ඒ කාලයේ හිටපු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කරපු වැඩක්. 1990 සේවයට බැඳුණු කෙනාගේ වැඩ තහනම් කරනවා, ඒ සිදුවීම වෙලා අවුරුදු 20කට පස්සේ. 1997දී තමයි නැවත පත්වීම ලබා දෙන්නේ. මේක බරපතළ අසාධාරණයක් කියලා ඔබතුමාට තේරෙනවා ඇති. මේකට සම්බන්ධ ඔහුත් නොවෙයි; ඔහුගේ මාමා යැයි කියන කෙනෙක්. ඒ කාලයේ මේ කෙනාගේ වයස අවුරුදු එකහමාරයි. ඔහු පක්ෂයට සම්බන්ධද, නැද්ද කියලා නොවෙයි තිබෙන්නේ. එහෙම නම් දැන් ඔබතුමන්ලාගේ සභාපතිවරයා වෙලා ඉන්න මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් ඒ කාලයේ අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා. මේකෙන් බරපතළ අසාධාරණයක් මේ පුද්ගලයාට සිදු වෙලා තිබෙනවා කියලා ඔබතුමා පිළිගන්නවා ඇතැයි මම සිතනවා. ඒක නිසා ඔහුට සාධාරණයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, ඔබතුමා පොලීසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයා විධියට දන්නවා ඇති, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 39,000ක් පමණ සේවය කරන බව. ඔවුන්ට තවමත් අනෙකුත් රජයේ සේවකයන්ට වැඩිවන වැටුප් වැඩිවීම් ලබා දීලා නැහැ. දැනටමත් සමහර අයට රුපියල් 1,800 ඉඳලා ඉහළට එකතු වෙන්න නියමිත වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි වැටුප් විෂමතා සොයා බැලීම සඳහා පත් කළ ජනාධිපති කොමිසම මඟින් පොලීසියේ සහ හමුදාවල අයගේ වැටුප් විෂමතාව නිවැරැදි කිරීම මේ අයට අදාළව නිවැරැදි වෙලාත් නැහැ. ඔවුන්ගෙන් වැන්දඹු හා අනත්දරු අරමුදලට සියයට හය ගණනේ කැපුණාට ඒ අංක ලැබිලාත් නැහැ. ඒ වාගේම, ඔවුන් වෙනත් රාජ්‍ය ආයතනවල සේවය කරන කොට දවසකට රුපියල් 500 ගණනේ ලැබිලා තිබුණා. ඒක දැන් ලැබෙන්නේත් නැහැ. ලැබිච්ච කාලයේ නියමිත වෙලාවට ලැබිලාත් නැහැ. ආහාර දීමනාව හැටියට රුපියල් 700ක් දෙනවා කියලා ඔබතුමන්ලා කියලා තිබෙනවා. කලින් ඒ සඳහා රුපියල් 350යි දුන්නේ. දැන් ඒ රුපියල් 350වත් හරියට ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මේ ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරන්න. මේවා කඩිනමින් නිරාකරණය කර ගත යුතු ප්‍රශ්න කියලා අපි හිතනවා, ගරු අමාත්‍යතුමනි. එම ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා අමාත්‍යවරයා හැටියට ඔබතුමා ගන්නා පියවර මොනවාද?

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු කථානායකතුමනි, ඒ සියලුදෙනා වෙනුවෙන් සාධාරණය ඉටු කිරීම සඳහා දැනටමත් සාකච්ඡා කරගෙන යනවා. ඔවුන්ගේ ඉල්ලීම් හැකි ඉක්මනින් ලබා දෙන්න කටයුතු කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. උදයංග වීරතුංග මහතා දැන් රිමාන්ඩ් බන්ධනාගාර ගත වෙලා ඉන්නවා. කොහොම වුණත් අපි ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා, උදයංග වීරතුංග වාගේ කෙනෙකුට එන්න හිතෙන රටක් හදපු එක ගැන. ඔහු රිමාන්ඩ් බන්ධනාගාරගතවෙලා, ඒ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාදාමය දියත් වනකොට, අද දවසේ පුවත් පත්වල වාර්තාවෙලා තිබෙනවා,

මේ පිළිබඳව අවුරුදු 5ක් තිස්සේ පරීක්ෂණ සිදු කළ CID නිලධාරියා මාරු කර තිබෙනවා කියලා. අලුත් නිලධාරියෙක් උසාවියට ඇවිල්ලා කියනවා, "මම මේ ගැන මොනවත් දන්නේ නැහැ" කියලා. ඔහු උසාවියෙන් අහලා තිබෙනවා, "උදයංග වීරතුංගට චෝදනා ගොනු කරන්නේ මොන පනත යටතේද?" කියලා. මෙහෙම තමයි CID එක උසාවියට උත්තර දෙන්නේ. ඒ නිලධාරියා මේ file එක ගැන දන්නෙත් නැහැ. අඩු ගණනේ, උදයංග වීරතුංග රජයට ඩොලර් මිලියන 7ක් පාඩු කිරීම සම්බන්ධයෙන් චෝදනා ගොනු කරන්නේ මොන පනත යටතේද කියාවත් ඔහු දන්නේ නැහැ. ඒ නිසා දැන් CID එක "බබා" වෙලාද, එහෙම නැත්නම් තමුන්නාන්සේලා CID එක "බබා" කරලාද කියන එක තමයි අපට අහන්න වෙන්නේ.

මේ රටේ ජනතාවගේ ඩොලර් මිලියන 7ක් වංචා කළ පුද්ගලයකු සම්බන්ධයෙන් CID එකේ හැසිරීම ගැන මහේස්ත්‍රාත්වරයා ප්‍රසිද්ධියේ දෝෂාරෝපණය කරලා තිබුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමා යටතේ සිටින නිලධාරියකු මේ ආකාරයට හැසිරෙන එක ගැන අපි කනගාටු වෙනවා. උසාවියේදී මේ ආකාරයෙන් ළද බොළඳ විධියට හැසිරෙන අය පිළිබඳව, විශේෂයෙන්ම මේ පරීක්ෂණය පිළිබඳව ඔබතුමාට කියන්න තිබෙන්නේ මොකක්ද?

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ වෙනත් කාරණයක්. අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ, ප්‍රශ්නයට දෙන පිළිතුරෙන් පැන නගින කරුණු පිළිබඳවයි. නමුත් එතුමා ඇසූ ප්‍රශ්නය ඉතාම වටිනවා. මේ පිළිබඳව කරුණු සොයා බලා, අධ්‍යයනය කර තමයි නිවැරදි පිළිතුරක් දෙන්න වෙන්නේ. එක එක්කෙනා පැමිණිලි ගොතන ආකාරය, ලියන ආකාරය ගැන මටත් පොඩි දැනුමක් තිබෙනවා; හොඳ අත්දැකීමක් තිබෙනවා. පැමිණිල්ලක් කළ පළියට කෙනකුට චෝදනා කරන්න බැහැ. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන්න ඕනෑ. ඒ පරීක්ෂණ සාධාරණව කෙරෙන්න ඕනෑ. ඉන් පසුව තමයි ඉතිරි කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා පැමිණිල්ලක් කළ පළියටම කෙනෙකු වරදකරුවකු වනවා කියලා මා හිතන්නේ නැහැ. CID එකේ යම් නිලධාරින් පැමිණිලි විභාග කර තිබෙන ආකාරය පිළිබඳව තවත් පැමිණිලි රාශියක් තිබෙනවා; සමහර වෙලාවට පොලීසියේ නිලධාරින් විසින්ම පැමිණිලි කරනවා. ඒ පිළිබඳවත් පරීක්ෂණ පවත්වන්න ඕනෑ. ඔබතුමා කියපු කරුණු පිළිබඳව මා සොයා බලන්නම්.

වැඩිහිටි දීමනාව ගෙවීම: ප්‍රමාදය
முதியோர் கொடுப்பனவு வழங்கல்: தாமதம்
PAYMENT OF ELDERS' ALLOWANCE: DELAY

121/2020

6. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමිගෙන් ඇසූ ප්‍රශ්නය - (1);

(අ) (i) අවුරුදු 70ට වැඩි පුරවැසියන්ට ගෙවනු ලබන වැඩිහිටි දීමනාව අයදුම් කළ විශාල පිරිසකට මේ වනතෙක් එම දීමනා ලැබී නොමැති බවත්;

(ii) මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් විමසන විට දැනට දීමනාව ලබන පුද්ගලයන්ගෙන් ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉතිරි අයට ගෙවීම් කිරීමට කටයුතු කරන බව පවසන බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) වර්තමාන විෂය භාර අමාත්‍යවරිය අමාත්‍ය ධුරයට පත්වීමෙන් පසු වැඩිහිටි දීමනාව ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට අයදුම්කර ඇති එහෙත්, මෙතෙක් එම දීමනාව ලැබී නොමැති වැඩිහිටියන්ට එම දීමනාව ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 70 வயதுக்கு மேற்பட்ட பிரசைகளுக்கு செலுத்தப்படுகின்ற முதியோர் கொடுப்பனவுக்கு விண்ணப்பித்துள்ள பலருக்கு இற்றைவரை அக் கொடுப்பனவு கிடைக்கவில்லை என்பதையும்;

(ii) இது தொடர்பாக பிரதேச செயலகங்களிடம் வினவும் போது தற்போது கொடுப்பனவை பெறுகின்றவர்களில் ஏற்படுகின்ற வெற்றிடங்களின் எண்ணிக்கையின் பிரகாரம் எஞ்சியோருக்கு கொடுப்பனவை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமென தெரிவிக்கப்படுகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) விடயத்துக்கு பொறுப்பான தற்போதைய அமைச்சர், அமைச்சுப் பதவியை ஏற்ற பின்னர் முதியோர் கொடுப்பனவு வழங்கப்பட்ட ஆட்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) ஏற்கெனவே விண்ணப்பித்துள்ள நிலையில் இதுவரை அக்கொடுப்பனவு கிடைக்காத முதியோர்களுக்கு அக்கொடுப்பனவை வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) ஆமெனில், அது எத்திகதியிலிருந்து என்பதையும்;

அவர் இந்த கௌரவ சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Women and Child Affairs and Social Security:

(a) Is she aware that -

(i) a large number of individuals who applied for the Elders' Allowance, which is provided to the citizens above 70 years, has not received the said allowance up to now; and

(ii) when inquiries are made in this regard at the Divisional Secretariats, it is stated that arrangements would be made to provide the allowance to the remaining individuals as per the number of vacancies created among those who are already provided with the Elders' Allowance?

(b) Will she inform this House-

(i) the number of individuals who have been provided with the Elders' Allowance after

[ගරු බිමල් රත්නායක මහතා]

the appointment of the incumbent subject Minister;

(ii) whether arrangements would be made to provide the Elders' Allowance to those who have applied but not hitherto received the allowance; and

(iii) if so, with effect from which date will it be done?

(c) If not, why?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரும் சுகாதாரம் மற்றும் சுதேச வைத்தியச் சேவைகள் அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Women and Child Affairs and Social Security and Minister of Healthcare and Indigenous Medical Services)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ වන විට ලැබී ඇති ප්‍රතිපාදන සීමාව තුළ දිවයින පුරා සුදුසුකම් ලබා ඇති ප්‍රතිලාභීන් 416,667 දෙනෙකු වෙත මෙම දීමනාව ලබා දී ඇත.

එමෙන්ම ලැබී ඇති තොරතුරු අනුව, සුදුසුකම් ලබා, දීමනාව ලබා ගැනීමට අපේක්ෂාවෙන් පොරොත්තු ලේඛනගතව සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නියෝජනය කරමින් 137,711 දෙනෙකු සිටින අතර, ඉදිරියේදී එම අයටද දීමනාව ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ii) ඔව්.

දැනට ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී ඇති ප්‍රතිපාදන සීමා තුළ දීමනාව ලබාදිය හැකි ප්‍රතිලාභීන් සංඛ්‍යාව තීරණය වී ඇති අතර, අදාළ ලේඛනයේ පුරප්පාඩු වන සංඛ්‍යාව අනුව පොරොත්තු ලේඛනයෙන් සුදුසුකම්ලාභියකු ඇතුළු කරනු ලැබයි.

(ආ) (i) ප්‍රතිලාභීන් 416,667කි.

(ii) ඔව්.

මේ සම්බන්ධව 2020 අය වැය ඇස්තමේන්තු තුළට ඇතුළත් කර ඇති අතර, ඉදිරියේදී එය ලබා දීමට අපේක්ෂා කෙරේ.

(iii) පොරොත්තු ලේඛනයේ ප්‍රතිපාදන වෙන් වූ පසු ගෙවීමට කටයුතු කරමි.

(ඇ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමියනි, ඇත්තටම මම පසුගිය රජයේ අමාත්‍යවරයාට යොමු කළ ප්‍රශ්නය තමයි දැන් මේ ඔබතුමියට යොමුවෙලා තිබෙන්නේ. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමියත් දන්නවා ඇති, මෙම වැඩිහිටි දීමනාවෙන් නීති විරෝධී ආකාරයට මාසිකව රුපියල් 100 බැගින් කපා ගන්නා බව. හිටපු අමාත්‍යවරයා, මෙසේ කපා ගන්නා ලද මුදල්වලින් වැඩි ප්‍රමාණයක් අම්පාර දිස්ත්‍රික්කයේ වැඩිහිටි සමිතිවලට කියලා වෙන් කර තිබෙනවා. ඊට අමතරව, එතුමා දන්නා කියන තැන්වලට බස් රථ -මම දන්නා විධියට බස් රථ පනස් ගණනක්- ගන්නත් එයින් මුදල් වෙන්කර තිබෙනවා. මේ සම්බන්ධව ඇසූ ප්‍රශ්නයකට එතුමා මේ පාර්ලිමේන්තුවේදී උත්තර දුන්නා.

ගරු ඇමතිතුමියනි, ඔබතුමිය තමයි වර්තමානයේ මේ විෂයය භාරව කටයුතු කරන්නේ. වැඩිහිටියන් සඳහා ලබා දෙන රුපියල් 2,000ක් පමණ වන මෙම දීමනාවෙන් රුපියල් 100 බැගින් කපා ගන්න එක නතර කරන්න ඔබතුමිය කටයුතු කරනවාද කියලා මම දැන ගන්න කැමැතියි. මා දන්නා විධියට COPE එකෙනුත් තීන්දුවක් ලබා දීලා තිබෙනවා, ඒක නතර කරන්න කියලා. හිටපු ඇමතිවරයා රුපියල් මිලියන දෙදහස් ගණනක් වැඩිහිටියන්ගෙන් ගසා කාලා, ඒ මුදල් අවභාවිත කර තිබෙනවා. මේ විධියට මුදල් කපන එක නතර කරන්න ඔබතුමිය කටයුතු කරනවාද?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු මන්ත්‍රීතුමනි, සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කරලා, ඒ සඳහා ගන්නා පියවර මොකක්ද කියලා ඉදිරියේදී පාර්ලිමේන්තුවට දැනුම් දෙන්නම්. Vote on Account එකේ තිබෙන සල්ලි මත තමයි, දැනට එම මුදල පාවිච්චි කිරීමක් සිද්ධ වෙනවා නම් වැඩිහිටියන්ට අදාළ යම් යම් කාරණා සඳහා පාවිච්චි වෙන්නේ. ඉදිරියේදී අපට ආංශික අධීක්ෂණ කාරක සභාවේදී හෝ එවැනි තැනකදී කථා කරලා මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමියනි, දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් මම අහන්නේ මේ දිනවල විශාල ආන්දෝලනයකට තුඩු දී තිබෙන කරුණක් ගැනයි. එයත් ඔබතුමියගේ විෂයයට අදාළ කාරණයක්. ඒ තමයි, අවුරුදු හයක දැරියක් ලිංගික අපයෝජනයට ලක් කිරීම සම්බන්ධයෙන් වූ පරීක්ෂණ යටපත් වීම පිළිබඳ කාරණය. මේ සම්බන්ධයෙන් "යුනිසෙෆ්" ආයතනයට පවා පැමිණිලි ඉදිරිපත් වෙලා තිබෙනවා. බලන්න බැරි තරම් දරුණු විධියට හය හැවිරිදි දියණියක් දූෂණය කරන වීඩියෝ පටයක් ප්‍රචාරය වෙනවා. නමුත් ඒ සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් අත්අඩංගුවට නොගැනීම සම්බන්ධවත්, විශේෂයෙන්ම රහස් පොලීසිය පැත්තෙන් වාගේම ළමා ආරක්ෂක අධිකාරිය පැත්තෙන් ඒ පිළිබඳ පරීක්ෂණ කටයුතු සතුටුදායක මට්ටමින් නොකෙරෙන බවත් දන්වමින් පැමිණිලි ඉදිරිපත් කර තිබෙන Committee for Protecting Rights of Prisoners වාගේ ආයතන කරුණු දක්වා තිබෙනවා. හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා එයට අදාළ ලිපි මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මා කියන කරුණ ගැන ගරු ඇමතිතුමියට අවබෝධයක් ඇති කියලා මා හිතනවා. අපයෝජනයට ලක් වී සිටින මෙම කුඩා දැරිය සම්බන්ධ පරීක්ෂණ කටයුතු වේගවත් කර, මේ අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමට ඔබතුමිය නිශ්චිත වශයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද කියා මා දැන ගන්න කැමැතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අද අසා තිබෙන්නේ වැඩිහිටි දීමනා සම්බන්ධ ප්‍රශ්නයක්. ඔබතුමා දැන් අතුරු ප්‍රශ්නයෙන් ඇසුවේ ළමා ආරක්ෂක අධිකාරිය ගැනයි. මේ සම්බන්ධයෙන් අපට ගත හැකි සියලු පියවර අරගෙන, ඉදිරියේදී පාර්ලිමේන්තුවට දීර්ඝ කරුණු පැහැදිලි කිරීමක් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -127/2020- (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -133/2020- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -16/2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -57/2020- (1), ගරු චමින්ද විජේසිරි මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 -84/2020- (1), ගරු හේෂා විතානගේ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12 -95/2020- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

"සුපිළිපන් මන්ත්‍රණය" උත්සවය: විස්තර
"நேர்மை திறன் மாநாடு": விபரம்
"INTEGRITY CONFERENCE": DETAILS

115/2020

13.ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1):

(අ) (i) 2019 මාර්තු 18 දින කොළඹ, ෂැන්ග්‍රි-ලා හෝටලයේ පැවති "සුපිළිපන් මන්ත්‍රණය" නමැති රාජ්‍ය සේවයේ අල්ලස් තුරන් කිරීම සඳහා පස් අවුරුදු සැලැස්ම එළි දැක්වීමට පැවති උත්සවය සංවිධානය කරන ලද ආයතනය කවරේද;

(ii) එම උත්සවය සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(iii) එම උත්සවයට සහභාගි වූ ආරාධිතයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා මුදල් වියදම් කළ ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சர் மற்றும் நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சர், புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சர் மற்றும் நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வீடமைப்பு வசதிகள் அமைச்சரு மானவரைக் கேட்ட வினா:

(அ) (i) 2019 ஆம் ஆண்டு மார்ச்சு 18 ஆம் திகதியன்று, கொழும்பு செங்கிரிலா ஹோட்டலில் நடைபெற்ற "நேர்மை திறன் மாநாடு" எனப்படும் அரச சேவையில் இலஞ்சத்தை ஒழிப்பதற்கான ஐந்தாண்டு திட்டத்தை வெளியிடுவதற்காக நடைபெற்ற விழாவை ஏற்பாடு செய்த நிறுவனம் யாதென்பதையும்;

(ii) அவ்விழாவுக்கு செலவான முழுத் தொகை எவ்வளவென்பதையும்;

(iii) அவ்விழாவில் பங்கேற்ற அழைப்பு விருந்தினர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) அதற்கான செலவை ஏற்ற நிறுவனம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister, Minister of Finance, Economy and Policy Development, Minister of Buddhasasana, Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities:

(a) Will he inform this House-

(i) the institution which organized the ceremony "Integrity Conference", which was conducted at Shangri-La Hotel, Colombo on 18th March, 2019 to launch the five-year plan for eradication of bribery in the Public Service;

(ii) the expenditure incurred on the aforesaid ceremony;

(iii) the number of invitees who took part in the aforesaid ceremony; and

(iv) the institution that bore the expenses of the event?

(b) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(ආ) (i) මෙම උත්සවය සංවිධානය කරන ලද්දේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසිනි.

(ii) නොදනී.

(iii) 1,250ක් පමණ.

(iv) අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිත ආයතනය (USAID)

(ඇ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය ඔබතුමා මඟින් ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කරනවා, එතුමාගේ විෂය පථයට ජල සම්පාදන කොටසත් අයිති නිසා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා ඇති හැම අවුරුද්දකම පෙබරවාරි සහ මාර්තුවල පොඩි පැවිල්ලක් එනකොටම කළුතර, බේරුවල, වාද්දුව, මතුගම යනාදී ප්‍රදේශ ආශ්‍රිතව පානීය ජලයට කරදිය මිශ්‍ර වෙන බව. මේක 2009 ඉඳන් ඇති වෙන ප්‍රශ්නයක්. සමහර අවුරුදුවල වාර දෙකක් මේක සිද්ධ වෙනවා. මා මේ සම්බන්ධව පාර්ලිමේන්තුවේදී විවිධ අවස්ථාවලදී කථා කරලා තිබෙනවා. පසුගිය ආණ්ඩුවත් කිව්වා, ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා කියලා. නමුත් ගරු වාසුදේව නානායක්කාර රාජ්‍ය අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නයට තවමත් උත්තරයක් ලැබිලා නැහැ. දැනුත් කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව පීඩාවට පත් වෙනවා. ඒ වතුර බොන්න බැහැ. දැන් මේ ප්‍රශ්නය තව තව උග්‍ර වෙනවා. දැන් කරන්නේ බවුසර් මඟින් වතුර බෙදා හරින එක පමණයි. මේ සඳහා නිශ්චිතවම පිළිතුරක් ලබා දෙන්නට ඔබතුමන්ලා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. නමුත්, මේ ව්‍යාපෘතිය අවසන් වෙන්නේ කවදාද කියලා මා දැනගන්න කැමතියි. අඩු ගණනේ ලබන අවුරුද්දේ මාර්තු වෙනකොටවත් හොඳ ජලය අපට බොන්න පුළුවන් වෙයිද? කළු ගඟ පෙනෙන තෙක් මානයේ මිනිස්සු කරදිය බොනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர்வழங்கல் வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - State Minister of Water Supply Facilities)
සැබැවින්ම, ගරු මන්ත්‍රීතුමා කියන කාරණය,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමාද ඒ අතුරු ප්‍රශ්නයට පිළිතුර දෙන්නේ?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ඒ අතුරු ප්‍රශ්නය, අහලා තිබෙන ප්‍රශ්නයට අදාළ නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමා කැමති නම් එයට උත්තර දෙන්න පුළුවන්. නමුත් අහලා තිබෙන ප්‍රශ්නයට මේ අතුරු ප්‍රශ්නය අදාළ වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා පිළිතුර දෙනවාද? ගරු මන්ත්‍රීතුමනි එහෙම හොඳයි ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
හොඳයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු මන්ත්‍රීතුමනි, ජලය හිඟවන කාලයට මේ කරදිය උඩට එන්න පටන් ගන්නවා. ඒ නිසා දැන් ජලය ගන්නා වූ තැනින් ලබාගන්නා ජලයට කරදිය මුසු වෙනවා. ඇත්තටම මෙතැන කරදිය කඩනයක් නැහැ. ඒක තිබෙන එක් ප්‍රශ්නයක්. කැලණි ගඟේ කරදිය කඩනයක් තිබෙනවා. මේ තත්ත්වය තුළ ගනු ලැබූ තීරණයක් අනුව අගලවත්තේ ඉඳලා කළු ගඟෙන් ගන්නා වූ ජලය පාරට බෙදා හැරීමේ ඒ ව්‍යාපෘතියේ කටයුතු සියයට 60කට වඩා සිදු වී තිබෙනවා කියන එකයි මට ලැබුණු තොරතුර. මම හිතන හැටියට, 2021 ආරම්භයේදී බීමට සුදුසු ජලය අගලවත්තෙන් ලබා ගෙන කළුතර, පානදුර, දෙහිවල, රත්මලාන පමණ දක්වා පහළට බෙදා හරින්න පුළුවන් වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තවත් අතුරු ප්‍රශ්න තිබෙනවාද, ගරු මන්ත්‍රීතුමා?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් ගරු අගමැතිතුමා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හරහා ගරු අග්‍රාමාත්‍යතුමාට ඉදිරිපත් කරන්න කැමතියි, එතුමාට නාගරික සංවර්ධනය ගැන විෂයයත් තිබෙන නිසා. හොරණ, මිල්ලෑව වත්ත නාගරික සංවර්ධන අධිකාරිය පවරා ගෙන එහි කර්මාන්ත ව්‍යාපෘතියක් කරනවා කියලා ඒ මිනිසුන්ට දැන් කිරි කපන්න දෙන්නෙත් නැහැ. ඒ මිනිසුන්ට සාධාරණ මුදලක් ලැබෙන්නෙත් නැහැ. ඒ කිරි ටික ගන්නවා UDA එකෙන්. මේ ගැන අපි සාකච්ඡා වට කිහිපයක් කළා. මෙන්න මේ ප්‍රශ්නයට විසඳුමක් දීලා ඒ වත්තේ ඉන්න සිංහල සහ දෙමළ මිනිසුන්ගේ ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය මැදිහත්වීමක් කඩිනමින් කරන්න ආණ්ඩුව සූදානම්ද කියලා මම අහන්න කැමතියි. මේ ප්‍රශ්නය දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් දන්නවා. එතුමාගේ අවිස්සාවේල්ල කොට්ඨාසයටත් මෙය අයිතියි. මේක UDA එක සම්බන්ධ ප්‍රශ්නයක්. මෙය ගරු අගමැතිතුමාට යොමු කරලා උත්තරයක් අරගෙන දුන්නත් ඇති.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මේ අතුරු ප්‍රශ්නයත් අසා තිබෙන ප්‍රශ්නයට අදාළ නැහැ. මැතිවරණය ළං වෙලා නිසා එතුමා මේ කාලය ප්‍රයෝජනයට ගන්නවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. කළුතර දිස්ත්‍රික්කය ගැනයි එතුමා කථා කරන්නේ. මම මෙම ප්‍රශ්නය ගරු අගමැතිතුමාට යොමු කරලා සාධාරණයක් ඉටු කරලා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14-122/2020-(1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15-128/2020- (1), ගරු ආනන්ද අලුත්ගමගේ මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

හෙරොයින් ආශ්‍රිත වැරදි: අත්අඩංගුවට ගත් පුද්ගලයන්
ஹெரோயின் சம்பந்தமான தவறுகள்: கைதுசெய்யப்பட்ட ஆட்கள்
OFFENCES RELATED TO HEROIN: PERSONS ARRESTED

15/2020

1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. Gayantha Karunatileka on behalf of the Hon. Buddhika Pathirana)
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාව සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) 2016 හා 2017 යන වර්ෂවලදී හෙරොයින් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) වැඩිම පුද්ගලයන් සංඛ්‍යාවක් අත්අඩංගුවට පත් දිස්ත්‍රික්ක කවරේද;
(iii) උක්ත වර්ෂ දෙකේදී හෙරොයින් වැරදි සඳහා අත්අඩංගුවට පත්වීමේ ප්‍රවණතාව ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් කොපමණද;
(iv) ඉහත (i) හි සඳහන් පුද්ගලයන් අතරින් මහා පරිමාණ ලෙස හෙරොයින් නීතිවිරෝධීව ගෙන්වීම හා බෙදා හැරීම සිදුකළ පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වර්ෂයකට මෙරටට නීතිවිරෝධීව ගෙන්වනු ඇතැයි සැලකෙන ඇස්තමේන්තුගත හෙරොයින් ප්‍රමාණය කොපමණද;
(ii) මෙරටට හෙරොයින් පැමිණෙන මාර්ග කවරේද;
(iii) උක්ත මාර්ග අවහිර කිරීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;
(iv) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;
(v) ශ්‍රී ලංකාවට වැඩිපුරම හෙරොයින් ගෙන එනු ලබන රටවල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மகாவலி, கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சர் மற்றும் உள்ளக வர்த்தக, உணவுப் பாதுகாப்பு மற்றும் பாவனையாளர் நலனோம்புகை அமைச்சர் மற்றும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் ஹெரோயின் போதைவஸ்து சம்பந்தமான தவறுகளுக்காக கைதுசெய்யப்பட்ட ஆட்களின் எண்ணிக்கை தனித்தனியே யாது என்பதையும்;
(ii) கூடுதல் எண்ணிக்கையான ஆட்கள் கைது செய்யப்பட்டுள்ள மாவட்டங்கள் யாவை என்பதையும்;
(iii) மேற்படி இரண்டு வருடங்களில் ஹெரோயின் தவறுகளுக்காக கைது செய்யப்படுகின்ற போக்கு சனத்தொகையில் ஓர் இலட்சத்தில் எத்தனை பேர் என்பதையும்;
(iv) மேலே (i) இல் குறிப்பிடப்பட்டுள்ள ஆட்களில் பாரியளவில் ஹெரோயினைக் கொண்டுவருதல் மற்றும் விநியோகத்தை மேற்கொண்ட ஆட்களின் எண்ணிக்கை தனித்தனியே யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இந்நாட்டுக்கு ஒரு வருடத்தில் சட்ட விரோதமாகக் கொண்டுவரப்படுவதாகக் கருதப் படுகின்ற மதிப்பீடு செய்யப்பட்ட ஹெரோயி னின் அளவு யாது என்பதையும்;
(ii) இந்நாட்டுக்கு ஹெரோயின் கொண்டுவரப் படுகின்ற வழிமுறைகள் யாவை என்பதையும்;
(iii) மேற்படி வழிமுறைகளைத் தடுக்க அரசாங்கம் நடவடிக்கை மேற்கொண்டுள்ளதா என்பதையும்;
(iv) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவை என்ப தையும்;
(v) எந்த நாடுகளிலிருந்து இலங்கைக்கு அதிகமாக ஹெரோயின் கொண்டுவரப்படுகின்றதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mahaweli, Agriculture, Irrigation and Rural Development, Minister of Internal Trade, Food Security and Consumer Welfare and State Minister of Defence:

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(a) Will he inform this House-

(i) separately, the number of persons arrested on offences related to heroin in 2016 and 2017;

(ii) the districts from where the highest number of persons were arrested;

(iii) the arrest rate per one hundred thousand persons on offences related to heroin in the said two years; and

(iv) separately, the number of persons who engaged in large-scale smuggling in and distribution of heroin, out of the persons mentioned in (i) above?

(b) Will he also inform this House-

(i) the amount of heroin estimated as smuggled into this country per annum;

(ii) the routes through which heroine arrives in this country;

(iii) whether the Government has taken measures to block the said routes;

(iv) if so, what those measures are; and

(v) the countries from which the biggest amount of heroin is brought to Sri Lanka?

(c) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2016 හා 2017 හෙරොයින් මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත් අඩංගුවට ගත් පුද්ගලයින් පිළිබඳ විස්තර

වර්ෂය	අත් අඩංගුවට පත් පුද්ගලයින් සංඛ්‍යාව
2016	27458 (විසිහත්දහස් හාරසිය පනස් අටයි)
2017	29288 (විසිනමදහස් දෙසිය අසූ අටයි)

(ii) වැඩිම පුද්ගලයින් සංඛ්‍යාවක් අත් අඩංගුවට පත් දිස්ත්‍රික්ක

අනු අංකය	දිස්ත්‍රික්කය	අත් අඩංගුවට ගත් පුද්ගලයින් ගණන
01	කොළඹ	35386
02	ගම්පහ	5612
03	කුරුණෑගල	2266
04	ගාල්ල	2121
05	නුවර	2036

(iii) හෙරොයින් වැරදි සඳහා අත් අඩංගුවට පත්වීමේ ප්‍රවණතාව ජනගහනයෙන් ලක්ෂයකට,

2016 - පුද්ගලයන් 128

2017 - පුද්ගලයන් 137

(iv) මහා පරිමාණ ලෙස හෙරොයින් නීතිවිරෝධීව ගෙන්වීම හා බෙදා හැරීම සිදු කළ පුද්ගලයින් සංඛ්‍යාව

2016 - පුද්ගලයන් 12

2017 - පුද්ගලයන් 10

(ආ) (i) වර්ෂයකට මෙරටට නීති විරෝධීව ගෙන්වනු ඇතැයි සැලකෙන හෙරොයින් ප්‍රමාණය සම්බන්ධයෙන් නිශ්චිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට නොහැක.

(ii) මෙරටට හෙරොයින් පැමිණෙන මාර්ග

මුහුදු මාර්ග ඔස්සේ වරාය හරහා

නීති විරෝධී මුහුදු මාර්ග

ගුවන් මාර්ග

තැපැල් භාණ්ඩ

(iii) ඔව්

(iv) උක්ත මාර්ගයන් අවහිර කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග

- නාවික හමුදා නිලධාරින් සහ පොලිස් නිලධාරින් යොදවා හෙරොයින් රැගෙන එන මාර්ග ආවේක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරින් සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරින් යොදවා සෝදිසි කිරීම.
- පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව එක්ව නීති විරෝධී මුහුදු මාර්ගවලින් හෙරොයින් ගෙන ඒම වැළැක්වීම සඳහා ඒකාබද්ධ මෙහෙයුම් දියත් කිරීම.
- පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ කටුනායක ගුවන් තොටුපොළ ඒකකය හා ගුවන් තොටුපොළ රේගු නිලධාරින් යොදවා වැටලීම් සිදු කිරීම.
- පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය මඟින් විවිධ ප්‍රදේශවල ඒකක පිහිටුවා මෙහෙයුම් දියත් කිරීම.
- රේගු නිලධාරින් යොදවා වරායට ඇතුළුවන බහාලුම් පරීක්ෂා කර මත්ද්‍රව්‍ය වැටලීම් සිදු කිරීම.
- ප්‍රාදේශීය පොලිස් ස්ථාන නිලධාරින් යොදවා මෙහෙයුම් දියත් කිරීම.

(v) ශ්‍රී ලංකාවට වැඩිපුරම හෙරොයින් ගෙනෙන රටවල්

- ඇෆ්ගනිස්ථානය
- ඉරානය
- පකිස්ථානය
- ඉන්දියාව

(ඇ) පැන නොනඟී.

ලියාපදිංචි ක්‍රීඩා සංගම්: විස්තර
பதிவு செய்யப்பட்ட விளையாட்டுச் சங்கங்கள்: விபரம்
REGISTERED SPORTS CLUBS: DETAILS

56/2020

2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Gayantha Karunatileka on behalf of the Hon. Chaminda Wijesiri)

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියා පදිංචි ක්‍රීඩා සංගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩා සංගම්වල නම් කවරේද;

(iii) එම ක්‍රීඩා සංගම් අතරින් දැනට වාර්ෂික ගිණුම් ඉදිරිපත් කර ඇති සහ ඉදිරිපත් කර නොමැති සංගම් කවරේද;

(iv) මේ වනවිට වාර්ෂික නිලවරණ පවත්වා ඇති සහ පවත්වා නොමැති සංගම් කවරේද;

(v) වාර්ෂික නිලවරණ පවත්වා නොමැති සංගම්වල නිලවරණ පැවැත්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) விளையாட்டுத்துறை அமைச்சின் கீழ் பதிவு செய்யப்பட்டுள்ள விளையாட்டுச் சங்கங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி விளையாட்டுச் சங்கங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி விளையாட்டுச் சங்கங்களில் தற்போது வருடாந்த கணக்குகளைச் சமர்ப்பித்துள்ள மற்றும் சமர்ப்பிக்காத சங்கங்கள் யாவை என்பதையும்;

(iv) இதுவரை வருடாந்தம் அலுவலர் தெரிவுக்கான தேர்தல்கள் நடாத்தப்பட்டுள்ள மற்றும் நடாத்தப் படாதுள்ள சங்கங்கள் யாவை என்பதையும்;

(v) வருடாந்தம் அலுவலர் தெரிவுக்கான தேர்தல் களை நடத்தாத சங்கங்களின் அலுவலர் தெரிவுக் கான தேர்தல்களை நடத்துவதற்கு அமைச்சு மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sports and Youth Affairs:

(a) Will he inform this House-

(i) the number of sports clubs registered under the Ministry of Sports;

(ii) the names of aforesaid sports clubs;

(iii) the sports clubs which have submitted annual accounts by now and the sports clubs which have not done so;

(iv) the sports clubs which have held annual elections of office bearers and the sports clubs which have not done so; and

(v) the measures that will be taken by the Ministry to hold annual elections of office bearers in the sports clubs in which no elections have been held?

(b) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)

(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ජාතික ක්‍රීඩා සංගම් සංඛ්‍යාව 70 කි.

(ii)

1. ශ්‍රී ලංකා දුනුවිදීමේ සංගමය
2. ශ්‍රී ලංකා මෙසපන්දු සංගමය
3. ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය
4. ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය
5. ශ්‍රී ලංකා ජූඩෝ සම්මේලනය
6. ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනය
7. ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය
8. ශ්‍රී ලංකා සවි එසවීමේ සම්මේලනය
9. ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය
10. ශ්‍රී ලංකා ජාතික රයිෆල් සංගමය
11. ශ්‍රී ලංකා හොකී සම්මේලනය
12. ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය
13. ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය
14. ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය
15. ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය
16. ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමය
17. ශ්‍රී ලංකා ගොල්ෆ් සංගමය
18. ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය
19. ශ්‍රී ලංකා මෝටර් ක්‍රීඩා සංගමය
20. ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය
21. ශ්‍රී ලංකා ආධුනික මළල ක්‍රීඩා සංගමය
22. ශ්‍රී ලංකා ටෙනිස් සංගමය
23. ශ්‍රී ලංකා බ්‍රිජ් සම්මේලනය
24. ශ්‍රී ලංකා කැරම් සම්මේලනය
25. ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය
26. ශ්‍රී ලංකා බොක්සිං සංගමය
27. ශ්‍රී ලංකා ආධුනික බිලියඩ් සහ ස්නූකර් සංගමය
28. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය
29. ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය
30. ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනය
31. ශ්‍රී ලංකා චෙස් සම්මේලනය
32. ශ්‍රී ලංකා ආධුනික ඔරු පැදීමේ සංගමය
33. ශ්‍රී ලංකා ස්කොෂ් සම්මේලනය
34. ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය
35. ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමය
36. ශ්‍රී ලංකා ආධුනික කබඩි සංගමය
37. ශ්‍රී ලංකා පැරාලිම්පික් ක්‍රීඩා සංගමය
38. ශ්‍රී ලංකා මෝටර් සයිකල් ක්‍රීඩා සංගමය
39. ශ්‍රී ලංකා බේස්බෝල් සංගමය
40. ශ්‍රී ලංකා වුෂු සම්මේලනය
41. ශ්‍රී ලංකා තුරඟ තරග සංගමය (ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමය)
42. ශ්‍රී ලංකා කඹ ඇදීමේ සම්මේලනය
43. ශ්‍රී ලංකා හෑන්ඩ්බෝල් සම්මේලනය
44. ශ්‍රී ලංකා ජාතික වෙඩි තැබීමේ සම්මේලනය
45. ශ්‍රී ලංකා ෆෙන්සින් සංගමය
46. ශ්‍රී ලංකා පාරම්පරික කරාතේ සම්මේලනය
47. ශ්‍රී ලංකා යුනිෆයිට් සම්මේලනය
48. ශ්‍රී ලංකා කුඩෝ සම්මේලනය
49. ශ්‍රී ලංකා ජු ජිට්සු සම්මේලනය
50. ශ්‍රී ලංකා සැම්බෝ සම්මේලනය
51. ශ්‍රී ලංකා මොඩර්න් පෙන්ටැත්ලෝන් සම්මේලනය
52. ශ්‍රී ලංකා කැනොයින් සහ කායකින් සංගමය
53. ශ්‍රී ලංකා බෝල්රූම් ඩාන්සර්ස් සම්මේලනය
54. ශ්‍රී ලංකා රෝල් බෝල් සම්මේලනය
55. ශ්‍රී ලංකා සුමෝ සම්මේලනය
56. ශ්‍රී ලංකා ජාතික රෝද සපත්තු සංගමය
57. ජාතික අංගම්පොර සම්මේලනය
58. ජාතික කදු නැගීමේ සංගමය
59. ශ්‍රී ලංකා මුයි තායි සංගමය
60. ශ්‍රී ලංකා කෝ -කෝ සංගමය
61. ශ්‍රී ලංකා ක්‍රිකට්
62. ශ්‍රී ලංකා ත්‍රෝබෝල් සම්මේලනය
63. ශ්‍රී ලංකා සෙපැක්ටොක්ට්‍රෝ සම්මේලනය
64. ශ්‍රී ලංකා ස්කැබල් සම්මේලනය
65. ශ්‍රී ලංකා පවර් බෝට් සංගමය
66. ශ්‍රී ලංකා බොල් බැඩ්මින්ටන් සංගමය
67. ශ්‍රී ලංකා සර්ෆින් සම්මේලනය
68. ශ්‍රී ලංකා ප්‍රංශ සවාට් සම්මේලනය
69. ශ්‍රී ලංකා ලෝන් බෝල් සම්මේලනය
70. ශ්‍රී ලංකා ඊ ස්පෝර්ට්ස් සංගමය

(iii) 2020 වර්ෂයේ දී ඉදිරිපත් කළ යුත්තේ 2019 වර්ෂයේ ගිණුම් වාර්තා වේ. මෙම ගිණුම් වාර්තා විගණකාධිපතිවරයා වෙත භාර දිය යුත්තේ ක්‍රීඩා රෙගුලාසි ප්‍රකාරව 2020 පෙබරවාරි මස 29 වන දිනට පෙර වේ.

ඒ අනුව,

<u>2019 වර්ෂයේ විගණනය සඳහා 2018 වර්ෂයේ ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇති ජාතික සංගම්.</u>

1. ශ්‍රී ලංකා දුනුවිදීමේ සංගමය
2. ශ්‍රී ලංකා මෙසපන්දු සංගමය
3. ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය
4. ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය
5. ශ්‍රී ලංකා ජූඩෝ සම්මේලනය
6. ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනය
7. ශ්‍රී ලංකා සවි එසවීමේ සම්මේලනය
8. ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය
9. ශ්‍රී ලංකා ජාතික රයිෆල් සංගමය
10. ශ්‍රී ලංකා හොකී සම්මේලනය
11. ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය
12. ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය
13. ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය
14. ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය
15. ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමය
16. ශ්‍රී ලංකා ගොල්ෆ් සංගමය
17. ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය
18. ශ්‍රී ලංකා මෝටර් ක්‍රීඩා සංගමය
19. ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය
20. ශ්‍රී ලංකා ආධුනික මළල ක්‍රීඩා සංගමය
21. ශ්‍රී ලංකා ටෙනිස් සංගමය
22. ශ්‍රී ලංකා බ්‍රිජ් සම්මේලනය
23. ශ්‍රී ලංකා කැරම් සම්මේලනය
24. ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය
25. ශ්‍රී ලංකා බොක්සිං සංගමය
26. ශ්‍රී ලංකා ආධුනික බිලියඩ් සහ ස්නූකර් සංගමය
27. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය
28. ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය
29. ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනය
30. ශ්‍රී ලංකා චෙස් සම්මේලනය
31. ශ්‍රී ලංකා ආධුනික ඔරු පැදීමේ සංගමය
32. ශ්‍රී ලංකා ස්කොෂ් සම්මේලනය
33. ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය
34. ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමය
35. ශ්‍රී ලංකා ආධුනික කබඩි සංගමය
36. ශ්‍රී ලංකා පැරාලිම්පික් ක්‍රීඩා සංගමය
37. ශ්‍රී ලංකා මෝටර් සයිකල් ක්‍රීඩා සංගමය
38. ශ්‍රී ලංකා බේස්බෝල් සංගමය
39. ශ්‍රී ලංකා වුෂු සම්මේලනය
40. ශ්‍රී ලංකා තුරඟ තරග සංගමය (ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමය)
41. ශ්‍රී ලංකා කඹ ඇදීමේ සම්මේලනය
42. ශ්‍රී ලංකා ජාතික වෙඩි තැබීමේ සම්මේලනය
43. ශ්‍රී ලංකා ෆෙන්සින් සංගමය
44. ශ්‍රී ලංකා පාරම්පරික කරාතේ සම්මේලනය
45. ශ්‍රී ලංකා කුඩෝ සම්මේලනය
46. ශ්‍රී ලංකා ජු ජිට්සු සම්මේලනය
47. ශ්‍රී ලංකා සැම්බෝ සම්මේලනය
48. ශ්‍රී ලංකා මොඩර්න් පෙන්ටැත්ලෝන් සම්මේලනය
49. ශ්‍රී ලංකා කැනොයින් සහ කායකින් සංගමය
50. ශ්‍රී ලංකා රෝල් බෝල් සම්මේලනය
51. ශ්‍රී ලංකා සුමෝ සම්මේලනය
52. ශ්‍රී ලංකා ජාතික රෝද සපත්තු සංගමය
53. ජාතික කදු නැගීමේ සංගමය
54. ශ්‍රී ලංකා මුයි තායි සංගමය
55. ශ්‍රී ලංකා කෝ - කෝ සංගමය
56. ශ්‍රී ලංකා ක්‍රිකට්
57. ශ්‍රී ලංකා ත්‍රෝබෝල් සම්මේලනය
58. ශ්‍රී ලංකා සර්ෆින් සම්මේලනය

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

2019 වර්ෂයේ ගිණුම් වාර්තා විගණකාධිපතිවරයා වෙත භාර දී නොමැති ජාතික ක්‍රීඩා සංගම්

1. ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය
2. ශ්‍රී ලංකා හෑන්ඩ්බෝල් සම්මේලනය - 2018 වර්ෂයේ ගිණුම ක්‍රියාත්මක වී නැත.
3. ශ්‍රී ලංකා සෙපැක්ටෝක්‍රෝ සම්මේලනය
4. ජාතික අංගම්පොර සම්මේලනය - ගිණුමක් ආරම්භ කර නොමැත.
5. ශ්‍රී ලංකා බෝල්රූම් ඩාන්සර්ස් සම්මේලනය
6. ශ්‍රී ලංකා යුනිෆයිට් සම්මේලනය
7. ශ්‍රී ලංකා ස්ක්‍රැබල් සම්මේලනය
8. ශ්‍රී ලංකා පවර් බෝට් සංගමය

පහත සඳහන් ජාතික ක්‍රීඩා සංගම් 2019 වර්ෂයේ ලියාපදිංචි වී ඇති බැවින් ගිණුම් වාර්තා විගණකාධිපතිවරයා වෙත 2020 වර්ෂයේ සිට භාර දිය යුතුය.

1. ශ්‍රී ලංකා බෝල් බැඩ්මින්ටන් සංගමය
2. ශ්‍රී ලංකා ප්‍රංශ සවාට් සම්මේලනය
3. ශ්‍රී ලංකා ලෝන් බෝල් සම්මේලනය
4. ශ්‍රී ලංකා ඊ ස්පෝර්ට්ස් සංගමය

(iv) මේ වන විට අදාළ වර්ෂයේ නිලවරණ පවත්වා ඇති සංගම්

1. ශ්‍රී ලංකා දුනුවිදීමේ සංගමය
2. ශ්‍රී ලංකා මේසපන්දු සංගමය
3. ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය
4. ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය
5. ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනය
6. ශ්‍රී ලංකා ජාතික රයිෆල් සංගමය
7. ශ්‍රී ලංකා හොකී සම්මේලනය
8. ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය
9. ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය
10. ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය
11. ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමය
12. ශ්‍රී ලංකා ගොල්ෆ් සංගමය
13. ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය
14. ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සංගමය
15. ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය
16. ශ්‍රී ලංකා ආධුනික මළල ක්‍රීඩා සංගමය
17. ශ්‍රී ලංකා ටෙනිස් සංගමය
18. ශ්‍රී ලංකා බ්‍රිජ් සම්මේලනය
19. ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය
20. ශ්‍රී ලංකා බොක්සිං සංගමය
21. ශ්‍රී ලංකා ආධුනික බිලියඩ් සහ ස්නූකර් සංගමය
22. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය
23. ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය
24. ශ්‍රී ලංකා ආධුනික ඔරු පැදීමේ සංගමය
25. ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමය
26. ශ්‍රී ලංකා ආධුනික කබඩි සංගමය
27. ශ්‍රී ලංකා මෝටර් සයිකල් ක්‍රීඩා සංගමය
28. ශ්‍රී ලංකා වුෂු සම්මේලනය
29. ශ්‍රී ලංකා තුරඟ තරග සංගමය (ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමය)
30. ශ්‍රී ලංකා කඹ ඇදීමේ සම්මේලනය
31. ශ්‍රී ලංකා ජාතික වෙඩි තැබීමේ සම්මේලනය
32. ශ්‍රී ලංකා ෆෙන්සින් සංගමය
33. ශ්‍රී ලංකා පාරම්පරික කරාතේ සම්මේලනය
34. ශ්‍රී ලංකා කූඩෝ සම්මේලනය
35. ශ්‍රී ලංකා ජූ ජිට්සු සම්මේලනය
36. ශ්‍රී ලංකා සැම්බෝ සම්මේලනය
37. ශ්‍රී ලංකා මොඩර්න් පෙන්ටැත්ලෝන් සම්මේලනය
38. ශ්‍රී ලංකා කැනොයින් සහ කායකින් සංගමය
39. ශ්‍රී ලංකා බෝල්රූම් ඩාන්සර්ස් සම්මේලනය
40. ශ්‍රී ලංකා සුමෝ සම්මේලනය
41. ශ්‍රී ලංකා ජාතික රෝද සපත්තු සංගමය
42. ජාතික අංගම්පොර සම්මේලනය
43. ශ්‍රී ලංකා මුයි තායි සංගමය
44. ශ්‍රී ලංකා කෝ - කෝ සංගමය
45. ශ්‍රී ලංකා ක්‍රිකට්
46. ශ්‍රී ලංකා ත්‍රෝබෝල් සම්මේලනය
47. ශ්‍රී ලංකා ස්කැබල් සම්මේලනය
48. ශ්‍රී ලංකා බොල් බැඩ්මින්ටන් සංගමය
49. ශ්‍රී ලංකා සර්ෆින් සම්මේලනය
50. ශ්‍රී ලංකා ප්‍රංශ සවාට් සම්මේලනය
51. ශ්‍රී ලංකා ලෝන් බෝල් සම්මේලනය
52. ශ්‍රී ලංකා ඊ ස්පෝර්ට්ස් සංගමය

මේ වන විට නිලවරණ කැඳවා ඇති ජාතික ක්‍රීඩා සංගම්

1. ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය
2. ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය
3. ශ්‍රී ලංකා කැරම් සම්මේලනය
4. ශ්‍රී ලංකා ජූඩෝ සම්මේලනය
5. ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනය
6. ශ්‍රී ලංකා සවිඑසවීමේ සම්මේලනය
7. ශ්‍රී ලංකා පැරාලිම්පික් ක්‍රීඩා සංගමය
8. ශ්‍රී ලංකා බේස්බෝල් සංගමය
9. ශ්‍රී රෝල් බෝල් සම්මේලනය

අනෙකුත් ජාතික ක්‍රීඩා සංගම් සඳහා නිලවරණ කැඳවීමට කාලය ඇති බැවින් ඔවුන් විසින් 2020 මැයි 31 දිනට පෙර නිලවරණ පැවැත්වීමට කටයුතු කරනු ඇත.

නිලවරණ කැඳවා නොමැති ජාතික ක්‍රීඩා සංගම්

1. ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය
2. ශ්‍රී ලංකා චෙස් සම්මේලනය
3. ශ්‍රී ලංකා ස්කෝෂ් සම්මේලනය
4. ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය
5. ශ්‍රී ලංකා හෑන්ඩ්බෝල් සම්මේලනය
6. ශ්‍රී ලංකා සෙපැක්ටොක්‍රෝ සම්මේලනය
7. ජාතික කඳු නැගීමේ සම්මේලනය
8. ශ්‍රී ලංකා යුනිෆයිට් සම්මේලනය
9. ශ්‍රී ලංකා පවර්බෝට් සංගමය

(v) නිලවරණ කැඳවා නොමැති සංගම් සඳහා දැනටමත් නිලවරණ කැඳවීමට උපදෙස් ලබා දී ඇති අතර එම උපදෙස් අනුව නිලවරණය නොපැවත් වූයේ නම් එම ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීමටත්, පසුව විශේෂ මහා සභා රැස්වීමක් පවත්වා නිලවරණ කමිටුවක් පත් කොට එමඟින් නිලවරණය කැඳවීමටත්, ක්‍රියාකාරීත්වය නොමැති සංගම්වල ලියාපදිංචිය අවලංගු කිරීමටත් කටයුතු සිදු කෙරේ.

(ආ) පැන නොනඟී.

** [මෙම ලියවිල්ල පුස්තකාලයේ ද තබා ඇත.]*
[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This Document is also placed in the Library.]

දකුණු ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා තරගාවලියේ ජයග්‍රාහකයන්: මූදල් ත්‍යාග

தெற்காசிய கனிஷ்ட மெய்வல்லுநர் விளையாட்டுப் போட்டியில் வெற்றிபெற்றோர்: பணப் பரிசு

WINNERS AT SOUTH ASIAN JUNIOR ATHLETICS CHAMPIONSHIP: FINANCIAL GIFTS

83/2020

3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)
(The Hon. Gayantha Karunatileka on behalf of the Hon. Hesha Withanage)

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය දා නිමාවට පත් වූ දකුණු ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා තරගාවලියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හා නිලධාරින්ගේ සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද;

(ii) එම තරගාවලියේදී ශ්‍රී ලංකාව ජයග්‍රහණය කළ පදක්කම් සංඛ්‍යාව හා එම පදක්කම් දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නම් කවරේද;

(iii) එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මූල්‍යමය තිළිණයක් ලබාදීමට අමාත්‍යාංශය තීරණය කර තිබේද;

(iv) එසේ නම්, මෙතෙක් මූල්‍යමය තිළිණ ලබා දුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හා පුහුණුකරුවන්ගේ නම් කවරේද;

(v) මෙතෙක් මූල්‍යමය තිළිණ ලබා නොදුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට එම තිළිණ කඩිනමින් ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த தினம் நிறைவுற்ற தெற்காசிய கனிஷ்ட மெய்வல்லுநர் விளையாட்டுப் போட்டியில், இலங்கையைப் பிரதிநிதித்துவப்படுத்தியவாறு பங்கேற்ற விளையாட்டு வீரர்கள், வீராங்கனைகள் மற்றும் உத்தியோகத்தர்களது எண்ணிக்கை மற்றும் அவர்களது பெயர்கள் யாவை;

(ii) மேற்குறிப்பிட்ட போட்டியில் இலங்கை வென்றெடுத்த கேடயங்களின் எண்ணிக்கை மற்றும் குறிப்பிட்ட கேடயங்களை வென்றெடுத்த விளையாட்டு வீரர்கள் மற்றும் வீராங்கனைகளது பெயர்கள் யாவை;

(iii) மேற்படி விளையாட்டு வீரர்கள் மற்றும் வீராங்கனைகளுக்கு நிதிசார் அன்பளிப்பினை வழங்குவதற்கு அமைச்சு தீர்மானித்துள்ளதா;

(iv) ஆமெனில், இதுவரை நிதிசார் அன்பளிப்புக்கள் வழங்கப்பட்டுள்ள விளையாட்டு வீரர்கள், வீராங்கனைகள் மற்றும் பயிற்சியாளர்களது பெயர்கள் யாவை;

(v) இதுவரையில், நிதிசார் அன்பளிப்புகள் வழங்கப் படாதுள்ள விளையாட்டு வீரர்கள் மற்றும் வீராங்கனைகளுக்கு இந்த அன்பளிப்புக்களை விரைவில் வழங்குவதற்கு அமைச்சு மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sports and Youth Affairs:

(a) Will he inform this House-

(i) the number and the names of sportsmen, sportswomen and the officials who participated in the recently concluded South Asian Junior Athletics Championship representing Sri Lanka;

`(ii) the number of medals won by Sri Lankans in this championship and the names of the sportsmen and sportswomen who won those medals;

(iii) whether the Ministry has decided to offer a financial gift to the aforesaid sportsmen and sportswomen;

(iv) if so, the names of the sportsmen, sportswomen and their coaches who have been awarded such financial gifts by now; and

(v) the actions that will be taken by the Ministry to award the aforementioned financial gifts to those who have not been awarded with such gifts yet?

(b) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නිලධාරීන් සංඛ්‍යාව - 16

ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව - 84

<u>දකුණු ආසියානු කණිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ ක්‍රීඩකයන්</u>

01. චනුක සන්දීප
02. ටී.එම්. සුරාජ් දිනුෂ
03. වයි.සී.එම්. යෝදසිංහ
04. එස්. අරුණ ධර්ෂණ
05. පබසර නිකු
06. චමිඳු ප්‍රභාත්
07. පී.එම්.පී.එල්. කොඩිකාර
08. ඩී.එම්.එච්.එස්. කරුණාරත්න
09. ඉසුරු ලක්ෂාන්
10. සී. අරවින්දන්
11. එස්.වී.පී. පූර්ණ සඳමිත්
12. කේ.ඒ.කේ. මධුෂංක
13. ජී.ආර්. ධම්මික විජේසූරිය
14. එස්. කින්තුසාන්
15. එස්.ජී.වී.එස්.එස්. ඩෙන්සිල්
16. එච්. ගයාන් කුමාර
17. ජනිඳු ලක්විජය
18. ශෙහාන් කාරියවසම්
19. ආර්.එන්. කුමාරගේ
20. නවෝදා සන්කල්ප
21. ශෙහාන් බියන්විල
22. එස්.ඒ. තරිඳු දසුන්
23. එස්.ටී. අමරසිංහ
24. කේ.ඔ.ජී.ජී.ටී.සී.එල්. මෙන්ඩිස්
25. ප්‍රමෝද් මදුභාෂ
26. හිරුෂ හෂාන්
27. ඩබ්ලිව්.ඩී. සසිඳු නුවින්ද
28. ජෙරමි ස්ටැනිස්ලස්
29. කාලිංග ජයබන්ඩාර
30. පී.වී. කනිෂ්ක ඉමේෂ්
31. ඩී.එස්. හපුආරච්චි
32. එන්.පී. රහිරු කෙෂාන්
33. ඩබ්ලිව්.එම්.ඒ.එම්. මලින්ත
34. එස්. පිරගස්රාජ්
35. ශවින් රුමෙෂ්ක
36. ආර්.ඩී.පී. ප්‍රසන්න රණවක
37. ඩබ්ලිව්.එස්. අංජන ෆොන්සේකා
38. තෂ්මිණ ක්‍රිස්මාල්
39. යොහාන් ධනුෂ්ක සිල්වා
40. කවිඳු රාජකරුණා
41. කවිඳු බණ්ඩාර
42. කේ.පී.ටී. රවිෂ්ක ඉන්ද්‍රජිත්
43. ඩී.එම්.එච්.එස්. කරුණාරත්න
44. ඩී.එම්. බෝගොඩ

<u>දකුණු ආසියානු කණිෂ්ඨ මළල ක්‍රීඩා තරඟාවලියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ ක්‍රීඩිකාවන්</u>

01. ඩී.ටී. අමාෂා ද සිල්වා
02. ශෙලින්දා ජැන්සන්
03. ශර්මිලා ජැන්
04. කේ.ජී.ඩී.එම්. සමාලි කුමාරසිංහ
05. සචිනි දිව්‍යාංජලී
06. රොමේෂි ඉෂාරා අත්තිඩිය
07. කේ.එම්.පී. වසන්ති මාරිස්ටෙලා
08. ශානිකා ලක්ෂානි
09. එච්.එම්.සී. සමුදිකා හේරත්
10. කේ.එම්.ජේ. මේනකා කනගරත්න
11. ඩබ්ලිව්.එම්. හසන්ති මදුමාලි
12. එන්.ජී.පී.ආර්. ගුණතිලක
13. එම්.ඒ. භාග්‍යා නිල්මිණි
14. ඩබ්ලිව්.ඒ. සෙනුරි අනුත්තරා
15. එස්.ඒ. කාවින්ද්‍යා තත්යරණි
16. ආර්.ඒ.ටී.එන්. රණසිංහ
17. ඩබ්ලිව්.එම්.පී.එන්. කුමාරි වනිගරත්න
18. පී.පී.අයි.එන්. පල්ලෙගම
19. ශෙනාලි වීරප්පෙරුමගේ
20. කෝෂිලා අමරසිංහ
21. කේ.කේ. රිද්මා නිෂාදි
22. කේ.එච්. නෙත්මි මේගවර්ණා
23. එස්.ආර්.පී.එන්. මදූවන්ති
24. රන්දි කුරේ
25. කේ.වී.වී. සත්සරා සන්දීපනී
26. ඩී.ආර්. නිරෝධා
27. ශරීෂා ගුණසේකර
28. රෙහානා ඩේවිඩ්
29. ඔවිනි චන්ද්‍රසේකර
30. ඩබ්ලිව්.කේ. හේෂානි මහේෂිකා
31. කේ.එම්.කේ. හෙෂාරා රත්නායක
32. පූර්ණිමා පෙරේරා
33. ඩී.එම්.අයි. හසන්ති
34. හස්නා මිරාෂා ඩීන්
35. එන්. උත්‍යවානි
36. එච්.එස්. යමික්
37. ටී.එම්.එම්.පී. වීරසූරිය
38. සදීපා හෙන්ඩර්සන්
39. කවින්දි එදිරිසිංහ
40. යූ.කේ.එස්.සී.පී. බණ්ඩාර

<u>දකුණු ආසියානු කණිෂ්ඨ මළල ක්‍රීඩා තරඟාවලියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ නිලධාරීන්</u>

01. අනිල් වීරසිංහ මහතා - කළමණාකරු
02. අයි.ඩී. ප්‍රේමසිරි මහතා - සහකාර කළමණාකරු
03. අයිරාංගනී රූපසිංහ මිය - Lady Chaperon
04. ලක්නා වරවිට මිය - Assistant Lady Chaperon
05. සමීර ලක්රුවන් පෙරේරා මයා - Recorder & Team Analysist
06. භද්‍රා ගුණවර්ධන මිය - පුහුණුකරු (Sprints & Hurdles)
07. අමිල ප්‍රසන්න මයා - පුහුණුකරු (Sprints & Hurdles)
08. සුසන්ත ප්‍රනාන්දු මයා - පුහුණුකරු (Middle & Long Distance)
09. එස්. චන්දිමාල් නිරෝෂණ මයා - පුහුණුකරු (Jumps – Horizontal))
10. ලාල් විජේවික්‍රම මයා - පුහුණුකරු (Middle & Long Distance)
11. ගාමිණී ඩයස් මයා - පුහුණුකරු (Sprints & Hurdles)
12. ජේ.එස්. වීරක්කොඩි මයා - පුහුණුකරු (Sprints & Hurdles)
13. අසන්ක රාජකරුණා මයා - පුහුණුකරු (Sprints & Hurdles)
14. දමින්ද බණ්ඩාර මයා - පුහුණුකරු (Sprints & Hurdles)
15. පියල් වීරසේකර මයා - පුහුණුකරු (Jumps - Vertical)
16. සුමේධ ජයකොඩි මයා - පුහුණුකරු (Jumps - Vertical)

(ii).

රන් පදක්කම් - 12
රිදී පදක්කම් - 10
ලෝකඩ පදක්කම් - 19

රන් පදක්කම් දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් - 12

	නම	ක්‍රීඩා ඉසව්ව
01	එස්. අරුණ දර්ශන	මීටර් 200 - පිරිමි
02	එස්. අරුණ දර්ශන	මීටර් 400 - පිරිමි
03	ඩී.එම්.එච්.එස්. කරුණාරත්න	මීටර් 800 - පිරිමි
04	පී.එම්.පී.එල්. කොඩිකාර	මීටර් 400 කඩුළු පැනීම - පිරිමි
05	එස්.ඒ. තරිඳු දසුන්	උස පැනීම - පිරිමි
06	පසිඳු කොඩිකාර, පබසර නිකු, ටී. රවිශ්ක, අරුණ දර්ශණ	4x100m Regiment - පිරිමි
07	ඩී.ටී. අමාෂා ද සිල්වා	මීටර් 100 - කාන්තා
08	ඩී.ටී. අමාෂා ද සිල්වා	මීටර් 200 - කාන්තා
09	කේ.ජී.ඩී.එම්. ශ්‍යාමලී කුමාරසිංහ	මීටර් 400 - කාන්තා
10	කේ.ජී.ඩී.එම්. ශ්‍යාමලී කුමාරසිංහ	මීටර් 800 - කාන්තා
11	ශෙලින්ඩා ජැන්සන්, ශර්මිලා ජැන්ස්, ශෆියා යැමික්, අමාෂා ද සිල්වා	4x100m Unit - කාන්තා
12	දිල්ෂි කුමාරසිංහ, අමාෂා ද සිල්වා, රොමේෂි ඉෂාරා අත්තිඩිය, සචිනි දිව්‍යාංජලී	4x400m Unit - කාන්තා

රිදී පදක්කම් දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් - 10

	නම	ක්‍රීඩා ඉසව්ව
01	බී.ඩී. චනුක සන්දීප	මීටර් 100 - පිරිමි
02	පී.එම්.පී.එල්. කොඩිකාර	මීටර් 400 - පිරිමි
03	ආර්.පී. ඉසුරු ලක්ෂාන්	මීටර් 800 - පිරිමි
04	එස්.ටී. අමරසිංහ	උස පැනීම - පිරිමි
05	එන්.පී. ලහිරු කෙශාන් පතිරණ	කවපෙත්ත විසි කිරීම - පිරිමි
06	ආර්.ඩී. ප්‍රගති ප්‍රසන්න රණවක	හෙල්ල විසි කිරීම - පිරිමි
07	ශර්මිලා ජැන්	මීටර් 200 - කාන්තා
08	පී.පී.අයි.එන්. පල්ලෙගම	උස පැනීම - කාන්තා
09	කේ.කේ. රිද්මා නිශාදි අබේරත්න	දුර පැනීම - කාන්තා
10	ඩී.එම්.අයි. හසන්ති	හෙල්ල විසි කිරීම - කාන්තා

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

ලෝකඩ පදක්කම් දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් - 19

	නම	ක්‍රීඩා ඉසව්ව
01	ජී.ඩී.කේ.කේ. පබසර නිකු	මීටර් 400 - පිරිමි
02	කේ.ඒ.කේ. මදූෂන්ක	මීටර් 1500 - පිරිමි
03	එස්. කින්තුසාන්	මීටර් 5000 - පිරිමි
04	ශෙෂාන් දිලූෂ කාරියවසම්	මීටර් 110 - කඩුළු පැනීම - පිරිමි
05	කේ.ටී. ප්‍රමෝද් මධුභාෂ	දුර පැනීම - පිරිමි
06	ජෙරම් ස්ටැනිස්ලස්	තුන්පිම්ම - පිරිමි
07	ඩබලිව්.එම්.ඒ. මනීෂ් මලින්ත	යගුලිය දැමීම - පිරිමි
08	ඩබලිව්.එස්. අන්ජන ෆොන්සේකා	හෙල්ල විසි කිරීම - පිරිමි
09	ෂෙලින්ඩා ජැන්සන්	මීටර් 100 - කාන්තා
10	ෂෙලින්ඩා ජැන්සන්	මීටර් 200 - කාන්තා
11	කේ.එම්.ජේ.එම්. කනගරත්න	මීටර් 1500 - කාන්තා
12	එච්.එම්.සී.එස්. හේරත්	මීටර් 3000 - කාන්තා
13	එන්.ජී.පී.ආර්. ගුණතිලක	මීටර් 100 කඩුළු පැනීම - කාන්තා
14	එස්.ඒ. කාවින්දාා තත්සරණී	මීටර් 400 කඩුළු පැනීම - කාන්තා
15	කේ.එච්. නෙත්මි මේගවර්ණා	දුර පැනීම - කාන්තා
16	රන්දි කුරේ	තුන්පිම්ම - කාන්තා
17	සරිෂා ගුණසේකර	යගුලිය දැමීම - කාන්තා
18	ඩබලිව්.කේ. හේෂානි මහේෂිකා	කවපෙත්ත විසි කිරීම - කාන්තා
19	එන්. උත්‍යවානි	හෙල්ල විසි කිරීම - කාන්තා

(iii). නොමැත.

(iv). අදාළ නොවේ.

(v). පියවර ගැනීමට නීතිමය හෝ මූල්‍යමය හෝ ප්‍රතිපාදන නොමැත.

(ආ). පැන නොනඟී.

** [මෙම ලියවිල්ල පුස්තකාලයේ ද තබා ඇත.]*
[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This Document is also placed in the Library.]

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය: කාර්මික ජනපද හා ස්වයං රැකියා ප්‍රවර්ධනය
இலங்கை கைத்தொழில் அபிவிருத்திச் சபை: கைத்தொழில் பேட்டைகள் மற்றும் சுயதொழில் மேம்பாடு
CEYLON INDUSTRIAL DEVELOPMENT BOARD: INDUSTRIAL ESTATES AND SELF-EMPLOYMENT PROMOTION

127/2020

7. ගරු ඩී. වී. චානක මහතා (ගරු ආනන්ද අලුත්ගමගේ මහතා වෙනුවට)
(மாண்புமிகு டி.வீ. சானக - மாண்புமிகு ஆனந்த அலுத்கமகே சார்பாக)
(The Hon. D. V. Chanaka on behalf of the Hon. Ananda Aluthgamage)

කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1) :

(අ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත්,
   (i) කාර්මික ජනපද සංඛ්‍යාව;
   (ii) බිම් ඒකක සංඛ්‍යාව;
   (iii) කාර්මික ජනපදවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව;
   (iv) කාර්මික ජනපදවල සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2017 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මධ්‍යම පළාත වෙනුවෙන්,
   (i) ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කළ වැඩසටහන්;
   (ii) එම වැඩසටහන් පැවැත් වූ ස්ථාන;
   (iii) ලබා දී ඇති උපකරණ;
   (iv) ප්‍රතිලාභීන් තෝරාගත් පදනම;
   (v) සිදු කරනු ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් ව්‍යාපාර සිදු කිරීමේ හැකියාව ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා ද විවෘතව පවතින නමුත්, ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් පරිදි ලබා දී නොමැති බව පිළිගන්නේද;
   (ii) මෙම දැනුම විධිමත්ව ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வழங்கல் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கை கைத்தொழில் அபிவிருத்திச் சபைக்குச் சொந்தமான,
   (i) கைத்தொழில் பேட்டைகளின் எண்ணிக்கை;
   (ii) நில அலகுகளின் எண்ணிக்கை;
   (iii) கைத்தொழில்பேட்டைகளில் இயங்கிவருகின்ற தொழிற்சாலைகளின் எண்ணிக்கை;
   (iv) கைத்தொழில் பேட்டைகளில் தொழில்புரிகின்ற வர்களின் எண்ணிக்கை;

என்பவற்றை தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2017 ஆண்டில் இலங்கை கைத்தொழில் அபிவிருத்திச் சபையினால் மத்திய மாகாணத்திற்காக,
   (i) சுயதொழில் மேம்பாட்டுக்காக மேற்கொள்ளப் பட்ட நிகழ்ச்சிகள்;
   (ii) மேற்படி நிகழ்ச்சிகள் நடாத்தப்பட்ட இடங்கள்;
   (iii) வழங்கப்பட்டுள்ள உபகரணங்கள்;
   (iv) நன்மைபெறுனர்கள் தெரிவுசெய்யப்பட்ட அடிப் படை;
   (v) மேற்கொள்ளப்பட்ட தொழில்நுட்ப பயிற்சி நிகழ்ச்சிகள்;

யாவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) நிகழ்காலத்தில் இணையத்தளத்தின் ஊடாக இலத்திரனியல் வியாபார முயற்சிகளை மேற் கொள்ளும் ஆற்றல் கிராமிய பிரதேசங்களில் வசிக்கின்ற ஆட்களுக்கும் திறந்ததாக உள்ள போதிலும் அதற்கு அவசியமான அறிவு போதுமான அளவில் வழங்கப்படவில்லை என்பதை ஏற்றுக்கொள்கிறாரா;
   (ii) இந்த அறிவினை முறைசார்ந்தவகையில் வழங்க நடவடிக்கை எடுப்பாரா;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Industries and Supply Chain Management:

(a) Will he inform this House-
   (i) the number of industrial estates;
   (ii) the number of plots of land;
   (iii) the number of factories operating in the industrial estates; and
   (iv) the number of employees in the industrial estates;

that belong to the Ceylon Industrial Development Board, separately?

(b) Will he state in regard to the programmes conducted by the Ceylon Industrial Development Board in the Central Province in the year 2017-

(i) the number of self-employment promotion programmes;

(ii) the places where the aforesaid programmes were held;

(iii) the equipment provided;

(iv) the basis on which the beneficiaries were selected; and

(v) the number of technological training programmes conducted?

(c) Will he also state-

(i) whether he accepts the fact that even though the opportunity of engaging in electronic businesses through the Internet is open even to the persons living in rural areas at present, the knowledge required for it has not been sufficiently provided; and

(ii) whether action will be taken to provide this knowledge in a systematic manner?

(d) If not, why?

ගරු විමල් වීරවංශ මහතා (කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය සහ කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමා)

(மாண்புமிகு விமல் வீரவங்ச - சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்துறை மற்றும் தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சரும் கைத்தொழில் மற்றும் வழங்கல் முகாமைத்துவ அமைச்சரும்)

(The Hon. Wimal Weerawansa - Minister of Small and Medium Business and Enterprise Development and Minister of Industries and Supply Chain Management)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත්

i. කාර්මික ජනපද සංඛ්‍යාව - 18
ii. බිම් ඒකක සංඛ්‍යාව - 726
iii. කාර්මික ජනපදවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව - 392
iv. කාර්මික ජනපදවල සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව - 8752

(ආ) 2017 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මධ්‍යම පළාත වෙනුවෙන්,

(i) 2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලද කළමනාකරණ හා තාක්ෂණය පුහුණු වැඩසටහන්

2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලද කළමනාකරණ හා තාක්ෂණය පුහුණු වැඩසටහන් - මහනුවර දිස්ත්‍රික්කය	
1	සිමෙන්ති පාදක නිෂ්පාදන තාක්ෂණ පුහුණුව
2	ඵලදායිතා පුහුණු වැඩසටහන
3	බේකරි නිෂ්පාදන පුහුණු වැඩසටහන
4	අපනයන සංසදය
5	IYB කළමනාකරණ වැඩසටහන
6	සත්ව ආහාර නිෂ්පාදන තාක්ෂණ පුහුණු වැඩසටහන
7	ජලනල ශිල්පය පිළිබඳ තාක්ෂණ පුහුණු වැඩසටහන
8	ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීම පිළිබඳ තාක්ෂණය
9	පෙදරේරු තාක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන
10	පරිසර හිතකාමී බෑග් නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ පුහුණුව
11	ආහාර ඇසුරුම්කරණ තාක්ෂණ පුහුණු වැඩසටහන
12	ගණකාධිකරණ පුහුණු වැඩසටහන
13	GMP පුහුණු වැඩසටහන
14	ආහාර නිෂ්පාදනය පුහුණු වැඩසටහන (දිවියට උදානය)

2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලද කළමනාකරණ හා තාක්ෂණය පුහුණු වැඩසටහන් - මාතලේ දිස්ත්‍රික්කය	
1	ඇසුරුම් සංවර්ධන වැඩසටහන
2	විදුලි රැහැන් ස්ථාපනය පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන
3	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන
4	කළමනාකරණ ප්‍රවර්ධන වැඩසටහන
5	කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන
6	දිවියට උදානය උපදේශන වැඩසටහන
7	දිවියට උදානය උපදේශන වැඩසටහන
8	දිවියට උදානය උපදේශන වැඩසටහන
9	කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන
10	ආහාර නිෂ්පාදන වැඩසටහන
11	ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන
12	උපාය මාර්ගික කළමණාකරන වැඩසටහන
13	බෑග් නිෂ්පාදන වැඩසටහන
14	කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන
15	ත්‍රිරෝද රථ අළුත්වැඩියාව පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන
16	ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන
17	යහපත් නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ උපදේශන වැඩසටහන
18	කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන
19	කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන
20	ව්‍යාපෘති වාර්තා සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන
21	කිර රෙදි සෑදීමේ වැඩසටහන
22	නිවාස නවාතැන් කළමනාකරණ වැඩසටහන
23	කාන්තා ඇඳුම් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන
24	බෑග් නිෂ්පාදන වැඩසටහන
25	කාර්මික ආරක්ෂාව පිළිබඳ පුහුණු වැඩසටහන
26	කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන

2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලද කළමනාකරණ හා තාක්ෂණය පුහුණු වැඩසටහන් නුවර එළිය දිස්ත්‍රික්කය	
1	ඇසුරුම්කරණ වැඩසටහන
2	බේකරි නිෂ්පාදන සහ කෙටි ආහාර තාක්ෂණ හුවමාරු වැඩසටහන
3	පරිසර හිතකාමී මාළු නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන
4	"දිවියට උදානය ජාතික වැඩසටහන" බේකරි නිෂ්පාදන
5	"දිවියට උදානය ජාතිකවැඩසටහන" කේක් නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන
6	"දිවියට උදානය ජාතික වැඩසටහන" රස කැවිලි නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන
7	"දිවියට උදානය ජාතික වැඩසටහන" බයිටස් නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන
8	"දිවියට උදානය ජාතික වැඩසටහන" ව්‍යාපාර කළමනාකරණය සහ ඵලදායිතා වැඩසටහන
9	"දිවියට උදානය ජාතික වැඩසටහන" ව්‍යාපාර කළමනාකරණය සහ ඵලදායිතා වැඩසටහන
10	"දිවියට උදානය ජාතික වැඩසටහන" කාන්තා ඇඳුම් පැළඳුම් නිෂ්පාදන වැඩසටහන
11	"දිවියට උදානය ජාතික වැඩසටහන" කාන්තා ඇඳුම් පැළඳුම් නිෂ්පාදන වැඩසටහන
12	"දිවියට උදානය ජාතික වැඩසටහන" අත් යන්ත්‍ර රෙදිපිළි ඇසුරින් බෑග් නිපදවීම (2017 දෙසැම්බර් 27 සහ 28)
13	"දිවියට උදානය ජාතික වැඩසටහන" රසායනික නිෂ්පාදන ආශ්‍රිත තාක්ෂණ හුවමාරු වැඩසටහන (2017 දෙසැම්බර් 29 සහ 30)

[ගරු විමල් වීරවංශ මහතා]

(ii) එම වැඩසටහන් පැවැත්වූ ස්ථාන

2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලදකළමනාකරණහා තාක්ෂණ පුහුණු වැඩසටහන් - මහනුවර දිස්ත්‍රික්කය		
	වැඩසටහන	පුහුණුස්ථානය
1	සිමෙන්ති පාදක නිෂ්පාදන තාක්ෂණ පුහුණුව	වික්ටෝරියා ව්‍යාපෘති කාර්යාලය, දිගන 2017-03-09 සහ 30
2	ඵලදායිතා පුහුණු වැඩසටහන	සමුපකාර ගොඩනැගිල්ල, පොල්ගොල්ල 2017-05-06 සහ 07
3	බේකරි නිෂ්පාදන පුහුණු වැඩසටහන	වික්ටෝරියා ව්‍යාපෘති කාර්යාලය, දිගන 2017-03-17 සහ 18
4	අපනයන සංසදය	ක්වීන්ස් හෝටලය, මහනුවර 2017-06-13
5	IYB කළමනාකරණ වැඩසටහන	වික්ටෝරියා ව්‍යාපෘති කාර්යාලය, දිගන 2017-07-05,06,07
6	සත්ව ආහාර නිෂ්පාදන තාක්ෂණ පුහුණු වැඩසටහන	සත්ව ආහාර හා විද්‍යා දෙපාර්තමේන්තුව - ගන්නෝරුව 2017-06-27 සහ 28
7	ජලනල ශිල්පය පිළිබඳ තාක්ෂණ පුහුණු වැඩසටහන	කොලොන්ගහවත්ත මහාලි ප්‍රජාශාලාව 2017-06-30 සහ 07-01
8	ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීම පිළිබඳ තාක්ෂණය	කොලොන්ගහවත්ත මහලි ප්‍රජාශාලාව 2017-09-20,21,22,23,24
9	පෙදරේරු තාක්ෂණපිළිබඳපුහුණුවැඩසටහන	අඹකොටේ ප්‍රජාශාලාව, කුණ්ඩසාල 2017-10-05,06,07,08,09
10	පරිසර හිතකාමී බෑග් නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ පුහුණුව	ජාතික මෝස්තර මධ්‍යස්ථානය 2017-11-07,08,09,10
11	ආහාර ඇසුරුම්කරණ තාක්ෂණ පුහුණු වැඩසටහන	සමුපකාර ගොඩනැගිල්ල, පොල්ගොල්ල 2017-11-29 සහ 30
12	ගණකාධිකරණ පුහුණු වැඩසටහන	සමුපකාර ගොඩනැගිල්ල, පොල්ගොල්ල 2017-12-14 සහ 15
13	GMP පුහුණු වැඩසටහන	සමුපකාර ගොඩනැගිල්ල, පොල්ගොල්ල 2017-12-19
14	ආහාර නිෂ්පාදනය පුහුණු වැඩසටහන (දිවියට උදානය)	එදඬුවාව ගොවිජන සේවා මධ්‍යස්ථානය

2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලද කළමනාකරණ හා තාක්ෂණය පුහුණු වැඩසටහන් - මාතලේ දිස්ත්‍රික්කය		
	වැඩසටහන	පුහුණු ස්ථානය
1	ඇසුරුම් සංවර්ධන වැඩසටහන	ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ
2	විදුලි රැහැන් ස්ථාපනය පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන	ගුරුවෙල මහවැලි අධිකාරි කාර්යාලය
3	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	මහවැලි නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය, දඹුල්ල
4	කළමනාකරණ ප්‍රවර්ධන වැඩසටහන	ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ
5	කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාතලේ
6	දිවියට උදානය උපදේශන වැඩසටහන	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - විල්ගමුව
7	දිවියට උදානය උපදේශන වැඩසටහන	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාතලේ
8	දිවියට උදානය උපදේශන වැඩසටහන	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රත්තොට
9	කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -යටවත්ත
10	ආහාර නිෂ්පාදන වැඩසටහන	මහවැලිනේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය, දඹුල්ල
11	ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන	වමින් නිකේතනය, මාතලේ
12	උපාය මාර්ගික කළමණාකරන වැඩසටහන	ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ
13	බෑග් නිෂ්පාදන වැඩසටහන	ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ
14	කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	මහවැලි අධිකාරි කාර්යාලය, ගල්කිරියාගම
15	ත්‍රිරෝද රථ අළුත්වැඩියාව පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන	මහවැලි අධිකාරි කාර්යාලය, ගල්කිරියාගම
16	ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන	උදහපුවිද ප්‍රජාශාලාව, රත්තොට
17	යහපත් නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ උපදේශන වැඩසටහන	ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ
18	කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -ලග්ගල
19	කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	මහවැලි අධිකාරි කාර්යාලය, ගල්කිරියාගම
20	ව්‍යාපෘති වාර්තා සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන	මහවැලි අධිකාරි කාර්යාලය, ගල්කිරියාගම
21	තිරරෙදි සෑදීමේ වැඩසටහන	නගර සභා ශාලාව , දඹුල්ල
22	නිවාස නවාතැන් කළමනාකරණ වැඩසටහන	මහවැලි කාර්යාලය, සීගිරිය
23	කාන්තා ඇඳුම් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	මහවැලි අධිකාරි කාර්යාලය, කළුන්දාව
24	බෑග් නිෂ්පාදන වැඩසටහන	විදාතා මධ්‍යස්ථානය - මාතලේ
25	කාර්මික ආරක්ෂාව පිළිබඳ පුහුණු වැඩසටහන	ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ
26	කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	මහවැලිකාර්යාලය, සීගිරිය

2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලද කළමනාකරණ හා තාක්ෂණය පුහුණු වැඩසටහන්-නුවරඑළිය දිස්ත්‍රික්කය		
	වැඩසටහන	පුහුණුස්ථානය
1	ඇසුරුම්කරණ වැඩසටහන (2017 මාර්තු 28)	සමුපකාර හෝටලය - නුවරඑළිය
2	බේකරි නිෂ්පාදන සහ කෙටි ආහාර තාක්ෂණ හුවමාරු වැඩසටහන (2017 අගෝස්තු 04 සහ 05)	සමුපකාර හෝටලය - නුවරඑළිය
3	පරිසර හිතකාමී මාළු නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන (2017 නොවැම්බර් 23, 24 සහ 25)	සමුපකාර හෝටලය - නුවරඑළිය
4	"දිවියට උදානය ජාතික වැඩසටහන" බේකරි නිෂ්පාදන (2017 දෙසැම්බර් 14)	සමුපකාර හෝටලය - නුවරඑළිය
5	"දිවියට උදානය ජාතික වැඩසටහන" කේක් නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන (2017 දෙසැම්බර් 15)	සමුපකාර හෝටලය - නුවරඑළිය
6	"දිවියට උදානය ජාතික වැඩසටහන" රසකැවිලි නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන (2017 දෙසැම්බර් 16)	සමුපකාර හෝටලය - නුවරඑළිය
7	"දිවියට උදානය ජාතික වැඩසටහන" බයිට්ස් නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩසටහන (2017 දෙසැම්බර් 17)	සමුපකාර හෝටලය - නුවරඑළිය
8	"දිවියට උදානය ජාතිකවැඩසටහන" ව්‍යාපාර කළමනාකරණය සහ ඵලදායිතා වැඩසටහන (2017 දෙසැම්බර් 19) "	සමුපකාර හෝටලය - නුවරඑළිය
9	"දිවියට උදානය ජාතික වැඩසටහන" ව්‍යාපාර කළමනාකරණය සහ ඵලදායිතා වැඩසටහන (2017 දෙසැම්බර් 19)	සමුපකාර හෝටලය - නුවරඑළිය
10	"දිවියට උදානය ජාතික වැඩසටහන" කාන්තා ඇඳුම් පැළඳුම් නිෂ්පාදන වැඩසටහන (2017 දෙසැම්බර් 21 සහ 22)	සමුපකාර හෝටලය - නුවරඑළිය
11	"දිවියට උදානය ජාතික වැඩසටහන" කාන්තා ඇඳුම් පැළඳුම් නිෂ්පාදන වැඩසටහන (2017 දෙසැම්බර් 21 සහ 22)	සමුපකාර හෝටලය - නුවරඑළිය
12	"දිවියට උදානය ජාතික වැඩසටහන" අත් යන්ත්‍ර රෙදිපිළි ඇසුරින් බෑග් නිපදවීම (2017 දෙසැම්බර් 27 සහ 28)	සමුපකාර හෝටලය - නුවරඑළිය
13	"දිවියට උදානය ජාතික වැඩසටහන" රසායනික නිෂ්පාදන ආශ්‍රිත තාක්ෂණ හුවමාරු වැඩසටහන (2017 දෙසැම්බර් 29 සහ 30)	සමුපකාර හෝටලය - නුවරඑළිය

(iii) ලබා දී ඇති උපකරණ

2017 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මහනුවර දිස්ත්‍රික්කයට සඳහා සිදු කළ කළමනාකරණ පුහුණු වැඩසටහන් වලින් පෙදරේරු තාක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහනෙහි ප්‍රතිලාභීන් සඳහා මේසන් හැදි ලබා දී ඇත. මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්කවල පැවත්වූ වැඩසටහන් සඳහා උපකරණ ලබා දී නොමැත.

(iv) ප්‍රතිලාභීන් තෝරාගත් පදනම

2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලද කළමනාකරණ හා තාක්ෂණය පුහුණු වැඩසටහන් - මහනුවර දිස්ත්‍රික්කය		
	වැඩසටහන	ප්‍රතිලාභීන් තෝරාගත් පදනම
1	සිමෙන්ති පාදක නිෂ්පාදන තාක්ෂණ පුහුණුව	මහවැලි අධිකාරිය විසින් තෝරා ගෙන ඇත - 15
2	ඵලදායිතා පුහුණු වැඩසටහන	කර්මාන්තකරුවන් විසින් ඉල්ලුම් කරන ලදි - 52
3	බේකරි නිෂ්පාදන පුහුණු වැඩසටහන	මහවැලිඅධිකාරිය විසින්තෝරාගෙන ඇත - 23
4	අපනයන සංසදය	කර්මාන්තකරුවන් විසින් කරන ලද ඉල්ලීම - 113
5	IYB කළමනාකරණ වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා ගෙන ඇත - 22
6	සත්ව ආහාර නිෂ්පාදන තාක්ෂණ පුහුණු වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා ගෙන ඇත - 15
7	ජලනල ශිල්පය පිළිබඳ තාක්ෂණ පුහුණු වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා ගෙන ඇත - 19
8	ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීම පිළිබඳ තාක්ෂණය	මහවැලි අධිකාරිය විසින්තෝරා ගෙන ඇත - 19
9	පෙදරේරු තාක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන	මහවැලි අධිකාරිය විසින්තෝරාගෙන ඇත - 10
10	පරිසර හිතකාමී බෑග් නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ පුහුණුව	කර්මාන්තකරුවන් විසින් කරන ලද ඉල්ලීම -26
11	ආහාර ඇසුරුම්කරණ තාක්ෂණ පුහුණු වැඩසටහන	කර්මාන්තකරුවන් විසින් ඉල්ලීම් කරන ලදි - 26
12	ගණකාධිකරණ පුහුණු වැඩසටහන	කර්මාන්තකරුවන් විසින් ඉල්ලා ඇත - 27
13	GMP පුහුණු වැඩසටහන	කර්මාන්තකරුවන් විසින් ඉල්ලීම් කරන ලදි - 30
14	ආහාර නිෂ්පාදනය පුහුණු වැඩසටහන (දිවියට උදානය)	දිවියට උදානය වැඩසටහන සඳහා තෝරාගත් කර්මාන්තකරුවන්

2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලද කළමනාකරණ හා තාක්ෂණ පුහුණු වැඩසටහන් - මාතලේ දිස්ත්‍රික්කය		
	වැඩසටහන	ප්‍රතිලාභීන් තෝරාගත් පදනම
1	ඇසුරුම් සංවර්ධන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 33
2	විදුලි රැහැන් ස්ථාපනය පිළිබඳ තාක්ෂණ නුවමාරු වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා එවනලදි - 15
3	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා එවනලදි - 15
4	කළමනාකරණ ප්‍රවර්ධන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 22
5	කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	ප්‍රාදේශීය ලේකම් කාර්යලය විසින් තෝරා එවන ලදි - 14
6	දිවියට උදානය උපදේශන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 22
7	දිවියට උදානය උපදේශන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 40
8	දිවියට උදානය උපදේශන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 35
9	කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	ප්‍රාදේශීයලේකම් කාර්යලය විසින් තෝරා එවන ලදි - 36
10	ආහාර නිෂ්පාදන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 27
11	ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 13
12	උපාය මාර්ගික කළමණාකරන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 39
13	බැග් නිෂ්පාදන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 25
14	කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	ශ්‍රීලංකා සමෘද්ධි අධිකාරිය තෝරා එවන ලදි - 31
15	ත්‍රීරෝද රථ අළුත්වැඩියාව පිළිබඳ තාක්ෂණ නුවමාරු වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා එවන ලදි - 21
16	ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන	ශ්‍රීලංකා සමෘද්ධි අධිකාරිය තෝරා එවන ලදි - 50
17	යහපත් නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ උපදේශන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 66
18	කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	ප්‍රාදේශීය ලේකම් කාර්යලය විසින් තෝරා එවන ලදි - 13
19	කිරිආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා එවන ලදි - 14
20	ව්‍යාපෘති වාර්තා සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා එවන ලදි - 10
21	නිරරෙදි සැදීමේ වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 32
22	නිවාස නවාතැන් කළමනාකරණ වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා එවන ලදි - 15
23	කාන්තා ඇඳුම් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	මහවැලි අධිකාරිය විසින් තෝරා එවන ලදි - 22
24	බැග් නිෂ්පාදන වැඩසටහන	සේවා ලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 17
25	කාර්මික ආරක්ෂාව පිළිබඳ පුහුණු වැඩසටහන	සේවාලාභීන් විසින් ඉල්ලුම් කරන ලදි - 51
26	කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	මහවැලිඅධිකාරිය විසින් තෝරා එවන ලදි - 32

2017 ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කරන ලද කළමනාකරණ හා තාක්ෂණය පුහුණු වැඩසටහන් - නුවරඑළිය දිස්ත්‍රික්කය		
	වැඩසටහන	ප්‍රතිලාභීන් තෝරාගත් පදනම
1	ඇසුරුම්කරණ වැඩසටහන	ප්‍රතිලාභීන් විසින් සිදුකල ඉල්ලීම අනුව - 14
2	බේකරි නිෂ්පාදන සහ කෙටි ආහාර තාක්ෂණ නුවමාරු වැඩසටහන	ප්‍රතිලාභීන් විසින් සිදුකල ඉල්ලීම අනුව - 17
3	පරිසර හිතකාමී මාළු නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ නුවමාරු වැඩසටහන	ප්‍රතිලාභීන් විසින් සිදුකල ඉල්ලීම අනුව - 26
4	"දිවියට උදානය ජාතික වැඩසටහන" බේකරි නිෂ්පාදන	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදන අංශ අනුව තෝරාගන්නා ලදි - 33
5	"දිවියට උදානය ජාතික වැඩසටහන" කේක් නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ නුවමාරු වැඩසටහන	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදන අංශ අනුව තෝරාගන්නා ලදි - 26
6	"දිවියට උදානය ජාතික වැඩසටහන" රසකැවිලි නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ නුවමාරු වැඩසටහන	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදනඅංශ අනුව තෝරාගන්නා ලදි - 32
7	"දිවියට උදානය ජාතික වැඩසටහන" බයිට්ස් නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ නුවමාරු වැඩසටහන	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදනඅංශ අනුව තෝරාගන්නා ලදි -30
8	"දිවියට උදානය ජාතික වැඩසටහන" ව්‍යාපාර කළමනාකරණය සහ ඵලදායිතා වැඩසටහන	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදන අංශ අනුව තෝරාගන්නා ලදි - 37
9	"දිවියට උදානය ජාතික වැඩසටහන" ව්‍යාපාර කළමනාකරණය සහ ඵලදායිතා වැඩසටහන	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදනඅංශ අනුව තෝරාගන්නා ලදි - 44
10	"දිවියට උදානය ජාතික වැඩසටහන" කාන්තා ඇඳුම් පැළඳුම් නිෂ්පාදන වැඩසටහන	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදනඅංශ අනුව තෝරාගන්නා ලදි - 37
11	"දිවියට උදානය ජාතික වැඩසටහන" කාන්තා ඇඳුම් පැළඳුම් නිෂ්පාදන වැඩසටහන	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදනඅංශ අනුව තෝරාගන්නා ලදි - 30
12	"දිවියට උදානය ජාතික වැඩසටහන" අත් යන්ත්‍ර රෙදිපිළි ඇසුරින් බෑග් නිපදවීම	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදන අංශ අනුව තෝරාගන්නා ලදි - 28
13	"දිවියට උදානය ජාතිකවැඩසටහන" රසායනික නිෂ්පාදන ආශ්‍රිත තාක්ෂණ නුවමාරු වැඩසටහන	දිවියට උදාන වැඩසටහන් සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභින්ගෙන් නිෂ්පාදන අංශ අනුව තෝරාගන්නා ලදි - 35

(V) සිදු කරන ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන්

ඉහත ප්‍රශ්න අංක (ආ) (i) හි ඇතුලත් ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ඇතුලතම තාක්ෂණික පුහුණු වැඩසටහන්ද ඇතුලත්ව ඇත.

(ඇ) (i) ඔව්

(ii) (a) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් 2018 වසරේ දී ග්‍රාමීය ප්‍රදේශ වල සිටින්නන් ඇතුළුව ව්‍යවසායකයින් හට විද්‍යුත් ව්‍යාපාරකරණය පිළිබඳව වැඩසටහන් දෙකක් සාර්ථකව නිම කර ඇති අතර ඉදිරියේදී මෙම දැනුම දිස්ත්‍රික් මට්ටමින් ප්‍රචලිත කිරීම හා ග්‍රාමීය ප්‍රදේශ වාසීන් අතර ව්‍යාප්ත කිරීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය දිස්ත්‍රික් කාර්යාල මගින් ඉහත සඳහන් කල පරිදි වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

(b) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් 2020 වසරේදී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා විද්‍යුත් අලෙවිකරණ වෙළඳ ද්වාරයක් (E-Commerce Trade Portal) පිහිටුවීමට නියමිතය. එමගින් ග්‍රාමීය ප්‍රදේශ වල ජනතාවට තම අලෙවි පහසුකම් ඒ හරහා ඉටු කර ගැනීමට පහසුකම් සැලසෙනු ඇත. තවද ICTA ආයතනයේ සහය ඇතිව මෙම වසරේදී දිස්ත්‍රික් මට්ටමින් එම ක්‍රමය භාවිතා කරන අයුරු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් පැවැත්වීමටද නියමිතය.

(ඈ) අදාළ නොවේ.

[මෙම ලියවිල්ල පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This Document is also placed in the Library.]

ලංකා ඛණිජ වැලි සමාගමට බඳවා ගත් නිලධාරින්: විස්තර

இலங்கை கனிய மணல் கம்பனிக்கு ஆட்சேர்க்கப்பட்ட உத்தியோகத்தர்கள்: விபரம்

OFFICIALS RECRUITED TO LANKA MINERAL SANDS LTD.: DETAILS

133/2020

8. ගරු ඩී. වී. චානක මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)
(மாண்புமிகு டி.வீ. சானக - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக)
(The Hon. D. V. Chanaka on behalf of the Hon. Udaya Prabhath Gammanpila)

කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2015.09.18 සිට 2017.07.31 දක්වා කාලය තුළ ලංකා ඛණිජ වැලි සමාගමට බඳවා ගත් උපදේශකයන්ගේ, සම්බන්ධීකාරකවරයන්ගේ සහ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයන්ගේ,

(i) නම්;
(ii) අධ්‍යාපන සුදුසුකම්;
(iii) වෘත්තීය සුදුසුකම්;
(iv) වැටුප් සහ දීමනා;
(v) කාර්ය මණ්ඩල පහසුකම්;
(vi) වාහන ඇතුළු වෙනත් පහසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வழங்கல் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015.09.18 தொடக்கம் 2017.07.31 வரையான காலப்பகுதியில் இலங்கை கனிய மணல் கம்பனிக்கு ஆட்சேர்க்கப்பட்ட ஆலோசகர்கள், இணைப்பாளர்கள் மற்றும் கருத்திட்ட பணிப்பாளர்களின்;

(i) பெயர்கள்;
(ii) கல்வித் தகைமைகள்;
(iii) தொழில்சார் தகைமைகள்;
(iv) சம்பளம் மற்றும் கொடுப்பனவுகள்;
(v) பணியாட்டொகுதி வசதிகள்; மற்றும்
(vi) வாகனங்கள் உள்ளிட்ட ஏனைய வசதிகள்;

யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industries and Supply Chain Management:

(a) Will he inform this House-

(i) the names;
(ii) the educational qualifications;
(iii) the professional qualifications;
(iv) the salaries and allowances;

[ගරු ඩී. වී. චානක මහතා]

(v) the facilities for the staff; and

(vi) the other facilities including vehicles;

of the advisers, coordinators and project directors recruited to the Lanka Mineral Sands Ltd. during the period of 18.09.2015 to 31.07.2017?

(b) If not, why?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(ආ) (i)

අනු අංකය	නම	තනතුර	සේවය කළ කාලසීමාව	පත්වීම් ලිපි වල පිටපත්
01	ආර්. ඩී. එස්. ඒ. වික්‍රමසූරිය මහතා	උපදේශක (මානව සම්පත් කළමනාකරණ)	2017.03.06 සිට 2017.12.21 දක්වා	ඇමුණුම 01, ඇමුණුම 02, ඇමුණුම 03, ඇමුණුම 04
02	චූලා මඩුගල්ල මහතා	උපදේශක (මූල්‍ය)	2017.05.15 සිට 2017.12.21 දක්වා	ඇමුණුම 05, ඇමුණුම 06, ඇමුණුම 07, ඇමුණුම 08
03	සුනිල් සී. එස්. වික්‍රමසිංහ මහතා	උපදේශක (නිෂ්පාදන)	2017.04.17 සිට 2017.12.21 දක්වා	ඇමුණුම 09, ඇමුණුම 10, ඇමුණුම 11, ඇමුණුම 12, ඇමුණුම 13

(ii)

අනු අංකය	නම	අධ්‍යාපන සුදුසුකම්	අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කල ලියකියවිලි වල පිටපත්
01	ආර්. ඩී. එස්. ඒ. වික්‍රමසූරිය මහතා	• අ.පො.ස. (සා.පෙළ) සමත් බව ඔහු විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන්ව ඇත. • අධ්‍යාපන සහතික මානව සම්පත් අංශය වෙත ලබා දී නොමැති බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් දැනුම් දී ඇත.	අධ්‍යාපන සහතික ඉදිරිපත් කර නැත. ඔහු විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත ඇමුණුම 14 වශයෙන් අමුණා ඇත.
02	චූලා මඩුගල්ල මහතා	අධ්‍යාපන සහතික මානව සම්පත් අංශය වෙත ලබා දී නොමැති බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය දැනුම් දී ඇත.	ඉදිරිපත් කර නැත
03	සුනිල් සී. එස්. වික්‍රමසිංහ මහතා	අධ්‍යාපන සහතික මානව සම්පත් අංශය වෙත ලබා දී නොමැති බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය දැනුම් දී ඇත.	ඉදිරිපත් කර නැත

(iii)

අනු අංකය	නම	වෘත්තීය සුදුසුකම්	වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කල ලියකියවිලි වල පිටපත්
01	ආර්. ඩී. එස්. ඒ. වික්‍රමසූරිය මහතා	• වෘත්තීය සුදුසුකම් වලට අදාළ සහතිකපත් මානව සම්පත් අංශය වෙත ලබා දී නොමැති බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය දැනුම් දී ඇත. • ඔහු විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි පහත සඳහන් තනතුරු වල සේවය කර ඇති බව සඳහන් කර ඇත. 1. සහකාර වතු අධිකාරි සහ ජ්‍යෙෂ්ඨ සහකාර වතු අධිකාරි ලෙස 1977 සිට 1984 දක්වා පහත සඳහන් වතු වල සේවය කර ඇත. i. සහකාර වතු අධිකාරි - හෝලිරූඩ් ස්ටේට් ප්ලාන්ටේෂන් - තලවකැලේ ii. සහකාර වතු අධිකාරි - පත්සලතැන්න ස්ටේට් ප්ලාන්ටේෂන් - උකුවෙල iii. සහකාර වතු අධිකාරි - මොරේ ස්ටේට් ප්ලාන්ටේෂන් - මස්කෙලිය iv. ජ්‍යෙෂ්ඨ සහකාර වතු අධිකාරි සහ සහකාර වතු අධිකාරි - බෘන්ස්වික් ස්ටේට් ප්ලාන්ටේෂන් - මස්කෙලිය v. ජ්‍යෙෂ්ඨ සහකාර වතු අධිකාරි - කල්ලෙබොක්ක ස්ටේට් ප්ලාන්ටේෂන් - මඩුල්කැලේ 2. 1984 වසර සිට පහත සඳහන් පරිදි සේවය කර ඇත. i. කළමනාකරු - වූඩ් ස්ටේට් ප්ලාන්ටේෂන් - මැද මහනුවර ii. කළමනාකරු - රත්වත්ත ස්ටේට් ප්ලාන්ටේෂන් - උකුවෙල iii. කළමනාකරු - ඇල්කඩුව ස්ටේට් ප්ලාන්ටේෂන් - ඇල්කඩුව iv. කළමනාකරු - ලොයිනෝන් ස්ටේට් ප්ලාන්ටේෂන් - ඇල්කඩුව 3. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ඇල්පිටිය වැවිලි සමාගම - 1992 වසර සිට 4. සාමාන්‍යාධිකාරී (පාලන) - ඇල්පිටිය වැවිලි සමාගම, 1997 5. සාමාන්‍යාධිකාරී - ස්ටේට් ප්ලාන්ටේෂන් කෝපරේෂන් -2009 අගෝස්තු සිට 2010 මැයි දක්වා 6. සභාපති - ඇල්කඩුව ප්ලාන්ටේෂන් ලිමිටඩ් - 2010 මැයි මස සිට 2012 දක්වා	ඉදිරිපත් කර ඇති අයදුම්පත ඇමුණුම 14 වශයෙන් අමුණා ඇත.

අනු අංකය	නම	වෘත්තීය සුදුසුකම්	වෘත්තීය සුදුසුකම් වල පිටපත්
		7. 2017 වර්ෂයේදී ලෝක බැංකුව යටතේ ක්‍රියාත්මක වී ඇති " Management and Governance of Regional Plantation Company's" and " The Marketing and Auction System of Sri Lanka Teas" ව්‍යාපෘතියේ උපදේශක වශයෙන් කටයුතු කර ඇත.	
02	චූලා මඩුගල්ල මහතා	සහතිකපත් මානව සම්පත් අංශය වෙත ලබා දී නොමැති බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය දැනුම් දී ඇත.	ඉදිරිපත් කර නැත
03	සුනිල් සී. එස්. වික්‍රමසිංහ මහතා	• වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමට අදාළ ලියකියවිලි මානව සම්පත් අංශය වෙත ලබා දී නොමැති බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් දැනුම් දී ඇත. • ඔහු විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි පහත සඳහන් තනතුරු වල සේවය කර ඇති බව සඳහන් කර ඇත. 1. වැවිලි කළමනාකරු - වැවිලි අංශය (තේ සහ පොල්) - 1970 අප්‍රේල් සිට 1982 අගෝස්තු 2. කිරි නිෂ්පාදන සංවර්ධන විශේෂඥ - නෙස්ලේ ලංකා ලිමිටඩ් - 1982 සිට 1986 ජූලි 3. කෘෂිකර්ම සේවා ප්‍රධානී - නෙස්ලේ ලංකා ලිමිටඩ් - 1986 ජූලි සිට 1990 මාර්තු 4. ෆැක්ට්‍රි කළමනාකරු - නෙස්ලේ ලංකා ලිමිටඩ් - 1990 මාර්තු සිට 1994 මැයි 5. ජාතික විකුණුම් කළමනාකරු - නෙස්ලේ ලංකා ලිමිටඩ් - 1994 ජූනි සිට 2002 ජනවාරි 6. විකුණුම් අධ්‍යක්ෂ - නෙස්ලේ ලංකා ලිමිටඩ් - 2002 පෙබරවාරි සිට 2005 ජූනි 7. විකුණුම් හා අලෙවි අධ්‍යක්ෂ - නෙස්ලේ පැසිපික් අයිලන්ඩ් - 2005 ජූලි සිට 2008 පෙබරවාරි 8. සාමාන්‍යාධිකාරී - නෙස්ලේ, පැපුවා නිව් ගිනියා - 2008 මාර්තු සිට 2010 මාර්තු 9. සභාපති - මිල්කෝ ප්‍රයිවට් ලිමිටඩ් - 2010 ජූනි සිට 2015 පෙබරවාරි 10. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - සෙන්ට්‍රල් ෆිනෑන්ස් - 2011 වසර සිට 11. කළමනාකරණ අධ්‍යක්ෂ - නයිමා ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රි ප්‍රයිවට් ලිමිටඩ් - 2016 අගෝස්තු සිට	ඉදිරිපත් කර ඇති අයදුම්පත ඇමුණුම 15 වශයෙන් අමුණා ඇත.

(iv)

අනු අංකය	නම	දීමනා	ගෙවීම් ලේඛණ වල පිටපත්
01	ආර්. ඩී. එස්. ඒ. වික්‍රමසූරිය මහතා	උපදේශක දීමනාව - රු:100,000/= ප්‍රවාහන දීමනාව - රු: 30,000/=	ඇමුණුම 16
02	චූලා මඩුගල්ල මහතා	උපදේශක දීමනාව - රු: 70,000/= ප්‍රවාහන දීමනාව - රු: 30,000/=	ඇමුණුම 17
03	සුනිල් සී. එස්. වික්‍රමසිංහ මහතා	උපදේශක දීමනාව - රු: 70,000/= ප්‍රවාහන දීමනාව - රු: 30,000/=	ඉදිරිපත් කර නැත

(v)

අනු අංකය	නම	ලබා දී තිබූ කාර්ය මණ්ඩල පහසුකම්
01	ආර්. ඩී. එස්. ඒ. වික්‍රමසූරිය මහතා	කාර්ය මණ්ඩල පහසුකම් ලබා දීමක් සිදු කර නොමැති බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් වාර්තා කර ඇත.
02	චූලා මඩුගල්ල මහතා	කාර්ය මණ්ඩල පහසුකම් ලබා දීමක් සිදු කර නොමැති බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් වාර්තා කර ඇත.
03	සුනිල් සී. එස්. වික්‍රමසිංහ මහතා	කාර්ය මණ්ඩල පහසුකම් ලබා දීමක් සිදු කර නොමැති බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් වාර්තා කර ඇත.

(vi)

අනු අංකය	නම	ලබා දී තිබූ වාහන ඇතුළු වෙනත් පහසුකම්	ගෙවීම් ලේඛණ වල පිටපත්
01	ආර්. ඩී. එස්. ඒ. වික්‍රමසූරිය මහතා	ගමන් වියදම් වෙනුවෙන් මාසිකව රු. 30,000/= ක දීමනාවක් ගෙවා ඇත.	ඇමුණුම 16
02	චූලා මඩුගල්ල මහතා	ගමන් වියදම් වෙනුවෙන් මාසිකව රු. 30,000/= ක දීමනාවක් ගෙවා ඇත.	ඇමුණුම 17
03	සුනිල් සී. එස්. වික්‍රමසිංහ මහතා	• ගමන් වියදම් වෙනුවෙන් මාසිකව රු. 30,000/= ක දීමනාවක් ගෙවා ඇත. • ඊට අමතරව පුල්මුඩේ යන්ත්‍රාගාරයට යාමට සහ නැවත ප්‍රධාන කාර්යාලයට පැමිණීම සඳහා ආයතනයේ වාහනයක් ලබා දී ඇත.	ඉදිරිපත් කර නැත

(ආ) අදාළ නොවේ.

** මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]*
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

කුඩා ජල විදුලි බලාගාර: විස්තර
சிறிய நீர் மின் உற்பத்தி நிலையங்கள்: விபரம்
SMALL HYDROPOWER PLANTS: DETAILS

16/2020

9. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. Gayantha Karunatileka on behalf of the Hon. Buddhika Pathirana)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන කුඩා ජල විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එමගින් ජාතික විදුලිබල පද්ධතියට සැපයෙන විදුලිය ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

(iii) මෙම බලාගාර තුළින් සිදුවන පාරිසරික බලපෑම පිළිබඳව අධ්‍යයනය කරන්නේද;

(iv) එසේ නම්, කොපමණ කාලයකට වරක් එම අධ්‍යයනය සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2017 වර්ෂය තුළදී නව කුඩා ජල විදුලි බලාගාර සඳහා අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) නව බලපත්‍ර ලබා දීමේදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල නිර්දේශ සලකා බලන ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் இயங்கிவருகின்ற சிறிய நீர் மின் உற்பத்தி நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவற்றின் மூலம் தேசிய மின்சக்திக் கட்டமைப்புக்கு வழங்கப்படுகின்ற மின்சாரத்தின் அளவு விகிதாசார அடிப்படையில் யாது என்பதையும்;

(iii) மேற்படி மின் உற்பத்தி நிலையங்களின் ஊடாக இடம்பெறுகின்ற சுற்றாடல் தாக்கங்கள் பற்றிய கற்கைகள் மேற்கொள்ளப்படுகின்றனவா என்பதையும்;

(iv) ஆமெனில், எவ்வளவு காலத்திற்கு ஒரு தடவை மேற்படி கற்கை மேற்கொள்ளப்படுகின்றது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2017 ஆம் ஆண்டில் புதிய சிறிய நீர் மின் உற்பத்தி நிலையங்களுக்கு அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வெண்ணிக்கை யாது என்பதையும்;

(iii) புதிய உரிமப்பத்திரங்களை வழங்கும் போது மாவட்ட மற்றும் பிரதேச ஒருங்கிணைப்பு குழுக்களின் விதப்புரைகளைக் கவனத்தில் கொள்ளும் முறையியல் ஒன்று தயார் செய்யப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அது எவ்வாறு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House-

(i) the number of small hydropower plants operating in Sri Lanka;

(ii) the amount of electricity added to the National Energy Grid through it as a percentage;

(iii) whether the effect made to the environment by these power plants is studied; and

(iv) if so, how often this study is made?

(b) Will he also inform this House-

(i) whether approval was granted for small hydropower plants in the year 2017;

(ii) if so, the aforesaid number of hydropower plants to which approval was granted;

(iii) whether a methodology will be prepared to consider the recommendations of the District and Divisional Coordination Committees when granting new licences; and

(iv) if so, the manner in which it is done?

(c) If not, why?

ගරු මහින්ද අමරවීර මහතා (ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - போக்குவரத்துச் சேவைகள் முகாமைத்துவ அமைச்சரும் மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Transport Service Management and Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2019.12.31 දිනට බලාගාර 208කි.

(ii) සම්පූර්ණ වාර්ෂික විදුලි ජනන ඒකක ප්‍රමාණයෙන් සියයට 8ක් පමණ වේ. (2018 වසරේ දත්ත අනුව.)

(iii) ඔව්.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් බලශක්ති බලපත්‍රය නිකුත් කිරීමට ප්‍රථම මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලත් උපදේශකයෙකු ලවා විස්තරාත්මක පරිසර අධ්‍යයනයක් සිදු කළ යුතු අතර, එම පරිසර ඇගයීම් වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඇතුළු අනෙකුත් අදාළ ආයතනයන්හි නිර්දේශ ලබා ගැනීමෙන් පසුව පමණක් අනුමත කරනු ලබයි.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම අදාළ ව්‍යාපෘතිය සඳහා පාරිසරික අනුමැතිය සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලශක්ති බලපත්‍රය (Energy Permit) ලබාගෙන ඇත්දැයි තහවුරු කර ගනු ලබයි.

(iv) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කරන කාල සීමාවේදී ඉහත කී සියලු ආයතනයන් සමඟ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකොට පරිසර අනුමැතිය සහ අදාළ අනෙකුත් අනුමැතීන්ගෙන් නිර්දේශයන්ට අනුකූලව ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන්නේ ද යන්න ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නිරීක්ෂණය කරනු ලැබේ. ඊට අමතරව ව්‍යාපෘතිය ජාලගත කිරීමෙන් අනතුරුව අවස්ථානුකූලව ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. තවද, පාරිසරික ජල ප්‍රවාහය ක්‍රමවත් පරිදි නිදහස් කරන්නේ ද යන්න අධ්‍යයනය කිරීම සඳහා මාර්ගගත (Online) පද්ධතියක් සකස්කොට ඇත.

(ආ) (i) ඔව්.

(ii) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2017 වර්ෂයේදී ව්‍යාපෘති 09ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(ඇ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතට අනුව දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල අනුමැතිය ලබාගත යුතු නොවේ. කෙසේ වෙතත් අදාළ ප්‍රාදේශීය ලේකම් අනුමැතිය ලබා දෙන අවස්ථාවේදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල අනුමැතිය සලකා බලන අවස්ථා ඇත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 - 57/2020 - (1), ගරු වමින්ද විජේසිරි මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ගරු වමින්ද විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 11 - 84/2020 - (1), ගරු හේෂා විතානගේ මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පුස්සැල්ලාව නගරයේ ඇති බෞද්ධාගමික ස්ථාන: සංවර්ධනය
புஸ்ஸல்லாவ நகரிலுள்ள பௌத்த மதவழிபாட்டு நிலையங்கள்: அபிவிருத்தி
PLACES OF BUDDHIST RELIGIOUS WORSHIP IN PUSSELLAWA TOWN: DEVELOPMENT

128/2020

15.ගරු ඩී. වී. චානක මහතා (ගරු ආනන්ද අලුත්ගමගේ මහතා වෙනුවට)
(மாண்புமிகு டி.வீ. சானக - மாண்புமிகு ஆனந்த அலுத்கமகே சார்பாக)
(The Hon. D. V. Chanaka on behalf of the Hon. Ananda Aluthgamage)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුස්සැල්ලාව නගරයේ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආගමික ස්ථානවල නම් කවරේද;

(iii) යහ පාලන රජය විසින් එම ආගමික ස්ථාන සංවර්ධනය කිරීම සඳහා ගත් ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சர் மற்றும் புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புஸ்ஸல்லாவ நகரத்தில் அமைந்துள்ள பௌத்த மதவழிபாட்டு நிலையங்களின் எண்ணிக்கை எவ்வளவு;

(ii) மேற்படி மதவழிபாட்டு நிலையங்களின் பெயர்கள் யாவை;

(iii) நல்லாட்சி அரசாங்கத்தினால் மேற்படி மத வழிபாட்டு நிலையங்களை அபிவிருத்தி செய்வதற்காக மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddhasasana, Cultural and Religious Affairs:

(a) Will he inform this House-

(i) the number of Buddhist religious places of worship situated in Pussellawa Town;

(ii) the names of the aforesaid places of religious worship; and

(iii) the action that had been taken by the Government for the development of the aforesaid places of religious worship after the Good Governance Government came into power?

(b) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පුස්සැල්ලාව නගරයේ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන සංඛ්‍යාව එකකි. (01)

(ii) පුස්සැල්ලාව සිරි මන්තින්දාරාමය

(iii) ඇමුණුම මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම 01

යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා පුස්සැල්ලාව සිරි මන්තින්දාරාම විහාරස්ථානය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග;

i. 2019 වර්ෂය සඳහා පුස්සැල්ලාව සිරි මන්තින්දාරාමයේ දහම් පාසල් පන්ති කාමර සංවර්ධනය සඳහා රුපියල් ලක්ෂ තුනක මුදලක් (රු.300,000.00) ලබා දී ඇත.

ii. පුස්සැල්ලාව සිරි මන්තින්දාරාම විහාරස්ථානයේ දහම් පාසලට උපකරණ සැපයීම සඳහා රු.250,000.00 ක මුදලක් ලබා දී ඇත.

iii. පුස්සැල්ලාව සිරි මන්තින්දාරාම විහාරස්ථානයේ පිරිවෙනට ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදි කිරීම සඳහා රුපියල් මිලියනයක් (රු.1,000,000.00) වෙන් කර ඇත.

iv. පුස්සැල්ලාව සිරි මන්තින්දාරාම විහාරස්ථානය සඳහා සූර්ය බල පහසුකම් ලබා දීමට ටෙන්ඩර් කැඳවා ඇත.

තවද, බුද්ධශාසන අමාත්‍යාංශය වෙත කිසිදු ඉල්ලීමක් උක්ත විහාරස්ථානය මඟින් ඉදිරිපත් වී නොමැති බැවින් සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ඉන්ධන මිල පහත දැමීම
எரிபொருள் விலையைக் குறைத்தல்
REDUCTION OF FUEL PRICES

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ගණන් අඩු වන අවස්ථාවලදී දේශීය ඉන්ධන මිල ගණන් අඩුකොට භාණ්ඩ හා සේවාවල මිල ගණන් මනා පාලනයකින් යුක්තව පවත්වාගෙන යමින් ජනතාවට සහන ලබා දීම සඳහා නිසි ක්‍රමවේදයක් පසුගිය රජය සමයේදී ක්‍රියාත්මක කරනු ලැබුවා. හැකි සෑම විටම ජනතාවට සහන ලබා දී ඔවුන්ගේ ජීවන වියදම පාලනය කිරීමත්, ව්‍යාපාර කටයුතු සාර්ථකව පවත්වාගෙන යෑමට අවශ්‍ය පහසුකම් සැලසීමත් එහි ප්‍රධානතම අරමුණු බවට පත් වුණා.

මෙම රජය බලයට පත්වීමෙන් අනතුරුව මේ වන තෙක් ඉන්ධන මිල ගණන් සංශෝධනය කිරීමට කටයුතු කොට නොමැති අතර, 2020 ජනවාරි මස 15වෙනි දින කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදී සම කැබිනට් ප්‍රකාශක ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා ප්‍රකාශ කර සිටියේ, ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ගණන් ඉහළ ගියහොත් දේශීය ඉන්ධන මිල තවත් ඉහළ දැමීමට සිදු වන බවයි. ඒකට අදාළ ඇමුණුම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

කෙසේ වුවද, නව කොරෝනා වෛරසයේ බලපෑම මත ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ගණන් විශාල වශයෙන් පහත වැටී තිබෙනවා. ජාත්‍යන්තර මාධ්‍ය විසින් වාර්තා කර තිබෙන අන්දමට විශේෂයෙන්ම පසුගිය මාසය තුළ සැලකිය යුතු ප්‍රමාණයකින් ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ගණන් පහත වැටී තිබෙනවා. මිල ගණන් පහත වැටීම කෙතරම්ද කිවහොත් ස්ථාවර මිලක් පවත්වා ගැනීමේ අරමුනින් ඔපෙක් සංවිධානය තෙල් සැපයුම සීමා කිරීමටද අවශ්‍ය පියවර ගනිමින් සිටින බව රොයිටර් පුවත් සේවය වාර්තා කොට තිබෙනවා. එම වාර්තාවත් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවලට අනුව අවසන් වරට ඉන්ධන මිල සංශෝධනය කරන ලද 2019 සැප්තැම්බර් මස 10වෙනි දිනට සාපේක්ෂව 2020 පෙබරවාරි මස 14වෙනි දින වන විට ලෝක වෙළෙඳ පොළේ බොරතෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 62.65 සිට ඇමෙරිකානු ඩොලර් 56.41ක් දක්වා, සියයට 10කින් පහත වැටී ඇති අතර සිංගප්පූරු වෙළෙඳ පොළේ පෙට්‍රල් බැරලයක මිල සියයට 5.9කින් ද, ඩීසල් බැරලයක මිල සියයට 11.8කින් ද පහත වැටී තිබෙනවා.

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

[ගරු සජිත් ප්‍රේමදා මහතා]

ගරු කථානායකතුමනි, අපි රටක් හැටියට ගෙන්වන්නේ Brent crude oil නොවෙයි. අපි ගෙන්වන්නේ, Murban කියන ඕමානයේ බොරතෙල් වර්ගයක්. දැන් ඕමානයේ Murban නැමැති බොරතෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 51 දක්වා පහත වැටී තිබෙනවා.

ඔපෙක් වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 56.73 දක්වා පහත වැටී තිබෙනවා. ඒ වාගේම ඇමෙරිකානු වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල ඩොලර් 51.67 දක්වා පහත වැටී තිබෙනවා. මම ඒ කරුණු කාරණා සඳහන් ලේඛනය හැන්සාඩ් වාර්තාවේ පළ කිරීම සඳහා **සභාගත*** කරනවා.

මෙවැනි තත්ත්වයක් යටතේ දී හෝ ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල පහත වැටීමේ වාසිය මෙරට පාරිභෝගිකයාට ලබා දීමට රජය ක්‍රියා නොකිරීමෙන් පැහැදිලි වන්නේ ආර්ථිකය කළමනාකරණය කිරීමට රජයට ඇති නොහැකියාවයි. දේශීය මෙන්ම ආනයනික පාරිභෝගික භාණ්ඩවල මිල අසීමිත ලෙස ඉහළ ගොස් ඇති මෙවැනි මොහොතක ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිලේ අඛණ්ඩ අඩු වීමේ වාසිය ජනතාවට ලබා නොදීමෙන් සිදුව ඇත්තේ ජනතාව තවත් පීඩාවට පත්වීමයි. එසේම, ඉන්ධන මිල ගණන් මෙලෙස පවත්වාගෙන යැමෙන් ගම්‍ය වන්නේ රජය මහ මැතිවරණය තෙක් ඉහළ මිල ගණන් පවත්වාගෙන ගොස් මැතිවරණ සමය එළඹීමත් සමඟ මිල ගණන් අඩු කිරීමක් සිදුකොට මැතිවරණයේදී අයුතු වාසියක් ලබා ගැනීමට උත්සාහ කරන බවයි. මෙම තත්ත්වය යටතේ පහත සඳහන් කරුණු පිළිබඳව රජයෙන් නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් බලාපොරොත්තු වෙනවා.

(1) දැනට මාසයකට වැඩි කාලයක් මුළුල්ලේ ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ගණන් අඛණ්ඩව පහත වැටෙමින් තිබුණද, මෙතෙක් එම වාසිය ජනතාවට ලබා නොදීම රජයේ දුර්වල ආර්ථික කළමනාකරණයේ ප්‍රතිඵලයක් බව රජය විසින් පිළිගනු ලබන්නේද? නොඑසේ නම් ඉන්ධන මිල ගණන් මෙතෙක් පහත නොදැමීමට හේතු මොනවාද?

(2) ලෝක වෙළෙඳ පොළේ වර්තමාන ඉන්ධන මිල ගණන් සැසඳීමේදී අඩුම තරමින් ඩීසල් ලීටරය රුපියල් 104 සිට රුපියල් 91.92 දක්වාත්, ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරය රුපියල් 137 රුපියල් 124.30 දක්වාත්, භූමිතෙල් ලීටරය රුපියල් 70 සිට 58.80 දක්වාත් අඩුකොට ජනතාවට සහනයක් ලබා දීමේ හැකියාව පවතින බව රජය විසින් පිළිගනු ලබන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

(3) ඉන්ධන මිල ගණන් පහත දැමීම ජාතික වගකීමක් බැවින් ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල පහත වැටීමට සාපේක්ෂව වහාම දේශීය ඉන්ධන මිල ගණන් පහත දැමීමට රජය කටයුතු කරන්නේද? එසේ පහත දමන්නේ නම් කොපමණ ප්‍රමාණයකින්ද, එය ඉටු කරනු ලබන දිනය කවදාද?

(4) රජය විසින් ඉන්ධන මිල අඩුකොට ජනතාවට සහනයක් ලබා නොදී අයුතු ලාභයක් ලබමින් කටයුතු කිරීම ජනතාවගේ ජීවන වියදම දරා ගත නොහැකි මට්ටමකට පත් වීමට හේතුවන බවත්, ජනතාවට හා ව්‍යාපාර මත අනවශ්‍ය බරක් පැටවීමක් බවත්, එම තත්ත්වය සමස්ත ජන සමාජයටම අහිතකර අන්දමින් බලපාන බවත් රජය විසින් පිළිගනු ලබන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

බොහොම ස්තුතියි.

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

ගරු මහින්ද අමරවීර මහතා (ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - போக்குவரத்துச் சேவைகள் முகாமைத்துவ அமைச்சரும் மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Transport Service Management and Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා දීර්ඝ ප්‍රකාශයක් කළා. එහිදී එතුමා අහපු ප්‍රශ්නවලට මුලින් පිළිතුරු ලබා දී, ඉන් අනතුරුව කෙටි පැහැදිලි කිරීමක් සඳහා ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා.

(1) නැත.

2019 සැප්තැම්බර් මස සිට 2020 ජනවාරි මස දක්වා ක්‍රමිකව ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඇමෙරිකානු ඩොලර් 58 සිට ඇමෙරිකානු ඩොලර් 69 දක්වා වැඩි විය. 2019 සැප්තැම්බර් මස සිට ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඉහළ ගියද, ජීවන වියදම සලකා බලා දේශීය ඉන්ධන මිල ගණන් සංශෝධනය නොකරන ලදී. කෙසේ වුවද, නව කොරෝනා වෛරසය හේතුවෙන් මාසයක පමණ කාලයක් තුළ ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ගණන් තාවකාලික අඩු වීමක් දක්නට ලැබුණද, නැවත වැඩිවීමේ ප්‍රවණතාවක් පෙබරවාරි මස දෙවැනි සතියේ සිට පෙන්නුම් කෙරේ. මෙම තාවකාලික තත්ත්වය හමුවේ ඉන්ධන මිල සංශෝධනය කිරීම අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරමි.

(2) නැත. ඉහත (1) හේතුවලට අමතරව, දැනටමත් රජය විසින් ඩීසල් සහ භූමිතෙල් සඳහා සහනාධාරයක් ලබා දේ.

(3) අවසන් වරට ඉන්ධන මිල ගණන් සංශෝධනය කළ වකවානුව තුළ ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල හා සමාන අගයක වර්තමාන ලෝක වෙළෙඳ පොළේ මිල ගණන් පවතින බැවින් හා පසුගිය මාස කිහිපය තුළ ලෝක වෙළෙඳ පොළ තුළ ඉන්ධන මිල ගණන් ඉහළ යැමේදී ද සංශෝධනය නොකළ බැවින් ඉන්ධන මිල සංශෝධනයක් කිරීමේ අවශ්‍යතාවක් දැනට පැන නොනගී. කෙසේ වුවද, ලෝක වෙළෙඳ පොළේ මිල ගණන් අනුව ඉදිරියේදී දේශීය වෙළෙඳ පොළේ මිල ගණන් ද සංශෝධනය කරමින් එහි වාසිය ජනතාවට ලබාදීමට රජය සැම විටම අපේක්ෂා කරයි.

(4) නැත.

ජාතිය ගොඩනැගීමේ බද්ද හා ආර්ථික සේවා ගාස්තු ඉවත් කිරීම, උපයන විට ගෙවීමේ බදු ඉවත් කිරීම, වැට් බදු අනුපාතය අඩු කිරීම වැනි ප්‍රතිපත්ති මඟින් ජීවන වියදම අඩු කරලීමට මේ වන විටත් විශාල සහන ලබාදී ඇත. කොරෝනා වෛරසය සමඟ ඇති වුණු තත්ත්වය තුළ ඉන්ධන මිල අඩු වුවද ඉදිරියේදී නැවත ඇමෙරිකානු ඩොලර් 65-70 අගයකට පත්වීමේ ප්‍රවණතාවක් දැකිය හැක.

ඒ අනුව නව ප්‍රවණතා තවදුරටත් අධ්‍යයනය කර දේශීය ඉන්ධන මිල ගණන් සංශෝධනය කිරීමට ඉදිරියේදී අපේක්ෂා කෙරේ.

ගරු කථානායකතුමනි, පසුගිය ජනවාරි මාසයේදීත් ඉන්ධන මිලෙහි වැඩි වීමක් කළ යුතුව තිබුණා. ඩීසල් ලීටරයක මිල රුපියල් 12කින් වැඩි කළ යුතු වුවත් ඒ සම්පූර්ණ පාඩුව රජය විසින් දරාගත්තා. මිල සූත්‍රය ක්‍රියාත්මක වුණා නම්, තිබුණු මිලට වඩා ඉහළ මිලකට ජනවාරි මාසයේදී ලබාදෙන්න සිදුවෙනවා. ඒ වාගේම රුපියල් 70ක පාඩුවක් විඳගෙන තමයි භූමිතෙල් ලබාදුන්නේ. ඒ ආකාරයෙන්ම පාඩු විඳගෙන තමයි පසුගිය කාලය

තුළ පෙට්‍රල් ලබාදුන්නේ. ඒ වාගේම, පසුගිය රජය කාලයේ අවුරුදු 4ක් ඉන්ධන ලබාදීමෙන් ඇති වුණු ණය ප්‍රමාණය -ඉන්ධන මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම ඇතුළු ක්‍රමවේද නිසා ඇති වුණු ණය ප්‍රමාණය- පමණක් රුපියල් බිලියන 592ක් පමණ තිබෙනවා. මිල සූත්‍රය අනුව ඉන්ධන මිල වැඩි කළ යුතු වුවත්, එසේ මිල වැඩි නොකර ස්ථාවර මිලකට පවත්වාගෙන යෑම නිසා රුපියල් මිලියන 12ක පමණ වාසියක් අප මේ රටේ ජනතාවට ලබාදුන්නා. සෑම මාසයේම ඉන්ධන මිල වැඩි කර හෝ අඩු කර සංශෝධනය කිරීම තුළින් ජනතාව අසීරුතාවට පත් කරන්න රජය බලාපොරොත්තු වන්නේ නැහැ. ඔබතුමාත් දන්නා කාරණයක් තමයි, ඉන්ධන මිල වැඩි වනවිට ඒ හා සමානව ප්‍රවාහන ගාස්තු, ගමනාගමන ගාස්තු, බස් රථවල ගාස්තු, ත්‍රිරෝද රථ ගාස්තු ආදී සියල්ල වැඩි කරන බව. නමුත්, ඉන්ධන මිල මාස්පතා අඩුවෙමින් යන වෙලාවට එම වාසිය ජනතාවට ලැබුණේ නැහැ. නමුත් අද වනතෙක්, ඉන්ධන මිල වැඩි වී තිබෙන වෙලාවේ වුණත්, රජය ඒ බරත් දරාගෙන ප්‍රවාහන ක්ෂේත්‍රයට වාගේම මගීන්ගෙන් අය කරන මුදල වැඩි කිරීමට කිසිදු ආකාරයකින් ඉඩ ලබා නොදී, ත්‍රිරෝද රථ ගාස්තු ද වැඩි කිරීමට ඉඩ ලබා නොදී සමාන මට්ටමක පවත්වාගෙන යන්න හැකියාව ලැබුණා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් භාණ්ඩ ප්‍රවාහනයේදී මිල ගණන් වැඩිවීමේ අවාසිය ජනතාවට විඳීමට සිදුවෙනවා. ඒ නිසා ඉන්ධන මිල ස්ථාවරව පවත්වාගෙන යෑම තුළ ජනතාවට ඒ බර දැනෙන්නට ඉඩ නොදී රජය විසින් ඒ බර දරාගෙන තමයි පසුගිය කාලයේ කටයුතු කළේ. දැනට ඉන්ධන මිලෙහි සුළු අඩුවීමක් තිබෙන බව අප පිළිගන්නවා. ඒ පිළිබඳව දැනට අපි සමාලෝචනය කරනවා. එහෙත් අද දවස වනවිට නැවත ඉන්ධන මිලෙහි වැඩිවීමක් සිදුවී තිබෙනවා. ඊයේට වඩා අද වැඩිවීමක් තිබෙනවා. ඒ නිසා විපක්ෂ නායකතුමා කියපු කාරණා සම්බන්ධ සමහර ගණන්-හිලව් පිළිගන්න බැරි හේතු රාශියක් තිබෙනවා. මම මේ පාර්ලිමේන්තුවේ කාලය ඒ වෙනුවෙන් වැය කරන්න සූදානම් වන්නේ නැහැ. නමුත් අද අපට පෙනෙනවා ඉදිරියේදී මිල වැඩිවීමක් සිදුවන බව. එය අර්ථකථනය කර තිබෙනවා. නමුත් යම් ආකාරයකින් මේ මිල පහළ මට්ටමක තිබුණොත් අනිවාර්යයෙන්ම ජනතාවට ඒ සහනය ලබාදෙනවා. මේ රජය කිසිසේත් ජනතාවට ජීවන බරින් පීඩිත වෙන්න ඉඩ දෙන්නේ නැහැ. ජනතාවගේ ජීවන වියදම අඩු කිරීමට රජය විධියට ගත හැකි සියලු ක්‍රියා මාර්ග ගන්නවා. තවමත් භූමිතෙල් රුපියල් 70 ගණනේ තමයි ලබාදෙන්නේ. අනිවාර්යයෙන්ම අනෙකුත් ඉන්ධන සම්බන්ධ සහනය ජනතාවට ලබාදෙනවා. මේ ආයතනවල විශාල පාඩුවක් තිබෙනවා. නමුත් ඒ පාඩුව ජනතාවගේ කර මතින් නොයවා, අප මේ සියලු ආයතන ජනතාවට බරක් නොවන ආයතන විධියට පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය පියවර ගන්නා බවත් ඔබතුමාට කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මගේ ඉල්ලීම අනුව මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය දිනක පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් වුණු ප්‍රශ්නයකට පිළිතුරු විධියට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා වාර්තාවක් ඉදිරිපත් කළා, පසුගිය ආණ්ඩුව කාලයේ මැති ඇමතිවරුන් පාවිච්චි කළ වාහන පිළිබඳව. ගරු කථානායකතුමනි, එහිදී මහවැලි සංවර්ධන සහ පරිසර රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් 2016දී වාහනයක් මිලදී ගත් කාරණයක් පිළිබඳව පැහැදිලි කරලා තිබුණා. ඒ පිළිතුරේත් පොඩි අඩුවක් තිබෙනවා. 2016 වර්ෂය වන විට මහවැලි සංවර්ධන සහ පරිසර රාජ්‍ය අමාත්‍යවරයකු සිටියේ නැහැ. ඒ වාගේම, 2017 වර්ෂයේ මැයි මාසයේ 30 වෙනි දා තමයි මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විධියට මා වැඩ භාර ගත්තේ. ඊට පෙර සිටියේ නියෝජ්‍ය අමාත්‍යවරු. මා ඒ අමාත්‍යාංශයේ වැඩ භාර ගත්තාට පස්සේ කිසිදු වාහනයක් අරගෙන නැහැ; ඉන්ධන අරගෙනත් නැහැ. ඒ කිසිදු වරප්‍රසාදයක් මා නොගත් අතර, අවුරුදු 10කට ආසන්න කාලයක් තුළ කිසිදු වාහන මිලදී ගැනීමකුත් කරලා නැහැ. මා විවිධ අමාත්‍යාංශවල අමාත්‍ය ධුර දරා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් එම වාර්තාව ඉදිරිපත් කළ දිනම රාත්‍රියේ ප්‍රවෘත්ති නාලිකාවලත්, ඒ වාගේම ඊට පසු දින තිබුණු පුවත් පත්වලත් මගේ පින්තූරය පළ කරමින් Mercedes-Benz වර්ගයේ රුපියල් ලක්ෂ 420ක වාහනයක් මා ගෙනා බවට සඳහන් වුණා. ඒක ඇත්තටම පාර්ලිමේන්තුවේ දීපු පිළිතුරම නොවෙයි. ඒක පළ වුණේ මාධ්‍යවල. මහ මැතිවරණයක් පවත්වන්න ආසන්නව තිබෙන වෙලාවේ මා විශ්වාස කරනවා, මේක මට අහිතකර ප්‍රවෘත්තියක් වෙයි කියලා. එම නිසා මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා දැනටමත් අපරාධ විමර්ශන අංශයටත් මේ ප්‍රශ්නය මා යොමු කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ වර්ගයේ වාහනයක මගේ ජීවිත කාලයටම නැගලා ගිහිල්ලාවත්, මෙවන් වාහනයක් ඇස්වලට දැකලාවත් නැහැ. මේ වාගේ වාහනයක් ගෙනැල්ලා තිබෙනවාද, එහෙම නැත්නම් ඒ වාහනය අතුරුදන් වෙලාද, එහෙම නැත්නම් ඒ වාහනයේ මුදල් කාගේවත් සාක්කුවට අරගෙන තිබෙනවාද කියන එක පිළිබඳව රහස් පොලීසිය මඟින් දැන් පරීක්ෂණයකුත් සිද්ධවනවා කියලා මට ආරංචියි.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම මේ පාර්ලිමේන්තුව තුළ පැහැදිලිව කියන්න කැමැතියි, මෙවන් වාහනයක් මිලදී ගැනීමක් හෝ මගේ නමින් ගෙන ඒමක් හෝ එක් දිනක් හෝ පාවිච්චි කර නැති බවත්. ඒ වාගේම මේ ප්‍රවෘත්තිය හරියාකාරව නිවැරදි කිරීමක් මේ වනතෙක් සිදු කරලාත් නැහැ. ගරු කථානායකතුමනි, ප්‍රවෘත්ති මඟින් කරුණු නිවැරදි කර පළ කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මා කියන කරුණත් මේ සිද්ධිය හා සම්බන්ධම එකක්. පාර්ලිමේන්තුවේදී අසන ලද ප්‍රශ්නයකට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා උත්තරයක් දුන්නා; අපේ නම් කිව්වේ නැහැ. නමුත්, මගේ නම සඳහන් කරලා රුපියල් ලක්ෂ 430ක් වටිනා Range Rover වර්ගයේ වාහනයක් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට ගෙනාවා කියලා ප්‍රවෘත්තියක් පළ කර තිබුණා. ස්වදේශ කටයුතු ඇමතිවරයා විධියට මා කවදාවත් සිටියේත් නැහැ. මා අමාත්‍යාංශ පහක කටයුතු කරලා තිබෙනවා. එකම එක වාහනයක්වත් මා වෙනුවෙන් අලුතින් ගෙනැල්ලා නැහැ. නමුත්, ඒ සම්බන්ධව ප්‍රවෘත්ති නාලිකා කිහිපයක බොහොම නරක විධියට ප්‍රචාරය කළා. මා ඉල්ලා සිටිනවා, මේවා නිවැරදි කරන්න කියලා. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ මගේ නියෝජ්‍ය ඇමතිවරයාට බෙන්ස් රථයක් ගෙනැල්ලා තිබෙනවා, ඒ දවස්වල. මේ වාගේ අසත්‍ය ප්‍රකාශ කරන එකෙන් අප ගැන වැරදි අවබෝධයක් එනවා. මම ඒ අවුරුදු හතරහමාර තුළම පාවිච්චි කළේ පරණ වාහන. කරුණාකරලා මේ වැරදි තොරතුරු නිවැරදි කරන්න. ඒ ප්‍රවෘත්ති නාලිකාවලට කියන්න, මේ ප්‍රවෘත්තිය නිවැරදි කර විකාශ කරන්න කියලා. මම හිතන්නේ මහින්ද අමරවීර මැතිතුමාට සිදු වූ දේම තමයි මටත් වෙලා තිබෙන්නේ. මේ වෙලා තිබෙන්නේ බොහොම නරක දෙයක්. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා ඒ ගැන අවධානය යොමු කරන්නම්. අපට ඒ නාලිකා දැනුවත් කරන්න පුළුවන්.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මා ළඟ තිබෙනවා, එහෙම දෙයක් වෙලා නැහැයි කියලා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා මහ ලේකම්ට එවා තිබෙන ලියුමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද රැස්වීම් අවසන් වීමෙන් පසුව මහ ලේකම්වරයාට පුළුවන්, ඒ සම්බන්ධයෙන් අදාළ නාලිකා දැනුවත් කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මම කියන කරුණත් ඊටම සම්බන්ධයි. එදා රාත්‍රි ප්‍රවෘත්ති ප්‍රකාශයේ මගේ ඡායාරූපත් දමා තිබුණා. මම ඒ අවුරුදු හතරහමාර තුළ අමාත්‍යාංශ දෙකක සිටියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ රූපවාහිනී නාලිකාව මොකක්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, වගකීමක් ඇතිව ඒ විස්තර ටික හරියටම මා ඔබතුමාට පසුව කියන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මා ජනමාධ්‍ය ඇමති විධියට කටයුතු කළ කාලයේ පාවිච්චි කළේ කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා පාවිච්චි කළ වාහනමයි. ඒවාම තමයි ඉඩම් ඇමති හැටියටත් පාවිච්චි කළේ. ඒවා භාර දීලා අපි ආවා. නමුත්, නියෝජ්‍ය ඇමතිවරයකුට ගත් වාහනයක් තිබෙන්න පුළුවන්. නමුත්, අපේ පින්තූර තමයි ඒවාටත් පළ වන්නේ. මේ ප්‍රවෘත්ති තුළින් ජනතාව තුළ අපි ගැන වැරදි අවබෝධයක් එන්න පුළුවන්.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු කථානායකතුමනි, ඒ විධියේම සිද්ධියක් මටත් වෙලා තිබෙනවා. නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යවරයා විධියට මාත් වාහනයක් ගෙන්වූවා කියලා "හිරු" නාලිකාව මඟින් මගේ ඡායාරූප පළ කර ප්‍රසිද්ධ කළා. මගේ කාලයේ මම වාහනයක් ගෙනාවේ නැහැ. මා රාජ්‍ය ඇමතිවරයා විධියට පත් වුණාට පසුව මාස,-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සියඹලා තිබුණේම නැද්ද?

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලකී ජයවර්ධන මැතිතුමනි, ඔබතුමා පැහැදිලි කරන්න.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
වාහනයක් මම ගෙන්වලාත් නැහැ. මා රාජ්‍ය ඇමති විධියට 2018 ජූලි මාසයේ පත් වුණාට පසු හිටපු රාජ්‍ය ඇමතිතුමිය පාවිච්චි කරපු වාහනයවත් මට මාස හයක් යනතුරු ලැබුණේ නැහැ. මට භාණ්ඩාගාරයෙන් උපදෙස් ලැබුණා, වාහනයක් මිලදී ගන්න කියලා. ඒත් මා වාහනයක් මිලදී ගෙන නොතිබියදීත්- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට පැහැදිලි කරන්න අවස්ථාව ලබා දෙන්න, ගරු මහින්දානන්ද අලුත්ගමගේ රාජ්‍ය ඇමතිතුමනි. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මගේ නමටත් වාහනයක් බැර කරලා මේ අපහාසය මටත් ඇති කරලා තිබෙනවා. එය නිවැරදි කරන්න කියලා මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluwihare)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් අලුවිහාරේ මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් ඒ ප්‍රශ්නයමද?

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluwihare)
ගරු කථානායකතුමනි, මටත් ඒ ප්‍රශ්නයම තමයි තිබෙන්නේ. අවුරුද්දයි මට අමාත්‍යාංශයේ වැඩ කරන්න ලැබුණේ. හිටපු රාජ්‍ය ඇමතිතුමාගේ වාහන දෙක තමයි අපි පාවිච්චි කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ දෙනෙකු මේ කාරණය ගැන කථා කළා. අපි ඒ ගැන අදාළ මාධ්‍ය ආයතන දැනුවත් කරන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පැන නැඟුණේ, මම අහපු ප්‍රශ්නයකට අගමැතිතුමා වෙනුවෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන

සංවිධායකතුමා දීපු උත්තරය මත. දැන් මේ ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු කථා කරමින් එතුමන්ලා වෙනුවෙන් ගෙනාපු වාහනය පාවිච්චි කළේ නැහැ කියලා කියනවා නම්, මතු වන පළමුවැනි ප්‍රශ්නය තමයි දැන් මේ වාහන කොහේද තිබෙන්නේ කියන එක. ඒ වාහන පිළිබඳව හොයන්න ඔබතුමා CID එකෙන් වෙනම පරීක්ෂණයක් ඉල්ලන්න ඕනෑ. රුපියල් මිලියන 2,870ක වාහන ගෙනැල්ලා, මේ අය එක් එක්කෙනා නැගිටලා තමන් ඒ වාහන පාවිච්චි කළේ නැහැ කියලා කිව්වත්, ඒ වාහන ටික තිබෙනවා නේ. ඒ වාහන ගෙනැල්ලා තිබෙන්නේ ඒ අයගේ නමට; අමාත්‍යාංශයටවත් නොවෙයි, අමාත්‍යවරයා වෙනුවෙන්. අමාත්‍යවරයා වෙනුවෙන් ගෙනාපු වාහන පාවිච්චි කළේ නැහැ කියලා කියනවා නම්, කවුරු ළඟද ඒ වාහන තිබුණේ, පාවිච්චි කළේ කවුද, ඒ වාහනවලට දැන් මොකක්ද වෙලා තිබෙන්නේ කියලා හොයන්න ඕනෑ.

ඊළඟ ප්‍රශ්නය තමයි, දැන් මේ වාහන පාවිච්චි කරන්නේ කවුද කියන එක. අලුත් ඇමතිවරුන්ට දැන් වාහන ඕනෑ නැහැ; වාහන තිබෙනවා. ඒ නිසා මේ ගැන හොයන්න පාර්ලිමේන්තුව හැටියට අපට වගකීමක් පැවරී තිබෙනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු ලේඛනයක් සම්බන්ධයෙන් තමයි අපි මේ කථා කරමින් ඉන්නේ. මෙහිදී මන්ත්‍රීවරුන්ට අපහාසයක් වුණාද නැද්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. රටේ ජනතාවගේ බදු මුදල් තමයි මේ වියදම් වෙලා තිබෙන්නේ. කරුණාකරලා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අන්තිම දවසේ හෝ වාහනවලට මොකද වුණේ කියන කාරණය පාර්ලිමේන්තුවට වාර්තා කරන්න කියලායි මම කියන්නේ. මොකද, ඒ ලේඛනය ඉදිරිපත් කිරීමේ පොඩි ගැටලුවක් තිබෙන බව ඇත්ත. එහි අමාත්‍යාංශය වශයෙන් සඳහන් කරලා තිබෙන්නේ අන්තිමට තිබුණු අමාත්‍යාංශයේ නම. ඒ නිසා අදාළ ඇමතිවරයා කවුද කියලා නිශ්චිතවම සඳහන් කළා නම් තමයි හොඳ. සමහර අමාත්‍යාංශවල ඇමතිවරු තුන් දෙනෙකු විතර ඒ කාලයේ ඉඳලා තිබෙනවා. කරුණාකරලා 20 වැනි දා හෝ පාර්ලිමේන්තුව අවසාන වෙලාවේ හෝ අදාළ ඇමතිවරයාගේ නමයි, වාහනයයි, මුදලයි, වාහනය ගත්ත දිනයයි කිව්වා නම් ඔය ප්‍රශ්නට විසඳෙනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, එතුමා කියපු කාරණයට අදාළව මම මේ කාරණයත් කියන්න කැමැතියි. මම මේ සම්බන්ධව රහස් පොලිසියෙන් පරීක්ෂණයක් ඉල්ලා තිබෙනවා. ඒ තොරතුරු ලැබුණාම වඩා හොඳයි. අපේ නමට කිසිම ආකාරයකින් වාහනයක් ඉල්ලලා නැහැ. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ ගෙන්වපු වාහන දැන් කොහේද තිබෙන්නේ ආදී වශයෙන් තව තොරතුරු තිබෙනවා නම් එම තොරතුරුත් ලබා දෙන්න කියලා. එම තොරතුරු ලබා දීලා අප නිවැරදි කරන්න. මොකද, අපි වාහන ඉල්ලා හෝ වාහන පාවිච්චි කරලා නැහැ; එවැනි වාහනයක නැඟලා ගිහිල්ලාත් නැහැ.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, මේ වාහන සම්බන්ධයෙන් කථා කිරීමේදී මම මේ කාරණය කියන්න කැමතියි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉදිරිපත් කරපු ඒ ලැයිස්තුවට අනුව මගේ පින්තූරයක් දාලා, මම වාහනයක් ගත්තාය කියලා මාධ්‍ය කීපයකම පළ වුණා. මා නියෝජ්‍ය ඇමතිවරයා හැටියට පත් වුණේ 2017දී බව ඔබතුමාට කියන්න කැමැතියි. ඊට පසුව 2018 හා 2019 අවුරුදුවල මම රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත් කටයුතු කළා. මම පාවිච්චි කරපු වාහනය 2010ට පෙර ගෙනාපු එකක්. මම කිසිම අලුත් වාහනයක් පාවිච්චි කරලා නැහැ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු කථානායකතුමනි, වාහන ප්‍රශ්නය සම්බන්ධව ගත්තොත් මා හිටපු අමාත්‍යාංශයේ නමත් සඳහන් කරලා ප්‍රවෘත්ති පළ වෙලා තිබුණා. වාහන ගෙන්වන කොට ඒ මුදලින් සියයට 60ක් ආපසු භාණ්ඩාගාරයට යනවා. රුපියල් කෝටි 4ක් නම් රුපියල් කෝටි 3ක් භාණ්ඩාගාරයට යනවා. එහෙම ගණන හදා ගන්න ඕනෑ. මේ වාහන අපේ ආණ්ඩුව පමණක් ගෙනාවා කියලා කියන්න හදනවා. ඊට පෙර ආණ්ඩුවලිනුත් වාහන ගෙනාවා. මගේ අමාත්‍යාංශය, [බාධා කිරීමක්] මහින්දානන්ද අලුත්ගමගේ රාජ්‍ය ඇමතිතුමනි, පොඩ්ඩක් අහගන්න, බාධා කරන්නේ නැතිව. මුදලින් සියයට 60ක් භාණ්ඩාගාරයට යනවා. මේ වාහන අපි ගෙදර අරගෙන යන්නේ නැහැ; ආපහු දීලා යනවා. එතුමා කියපු විධියට ඒ වාහන තිබෙන්නේ කොහේද කියලා හොයලා බලන්න. ආණ්ඩුව සතුව නේ තිබෙන්නේ. මගේ අමාත්‍යාංශය පිළිබඳවත් මම කියන්න කැමැතියි. මේගොල්ලන් අලුතින් සන්ධානයක් හදාගෙන ඉන්නවා නේ. සන්ධානයේ සභාපති කවුද? හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. එතුමාගේ නියෝජ්‍ය ඇමති සහ රාජ්‍ය ඇමති හැටියට ෆවුසි මැතිතුමා සහ සෙයියිඩ් අලි සාහිර් මවුලානා මැතිතුමා හිටියා. අවසානයේදී මගේ අමාත්‍යාංශයට ඒවා සම්බන්ධ කර ගත්තා. ඒ නිසා මගේ නමට ඒකත් ඇතුළත් වෙනවා.

අනෙක් එක, මම ඇමති ධුරය භාර ගත්තේ 2015 අවුරුද්දේ. නමුත් 2016 අවුරුද්ද පහු වෙලා, 2017 අවුරුද්දේ තමයි මම වාහනයක් ගත්තේ. ඒ ඇයි? ගරු වාසුදේව නානායක්කාර රාජ්‍ය මැතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා පාවිච්චි කරපු පරණ වාහනය තමයි මම පාවිච්චි කළේ. ඒ වාහනයේ condition එක ගැන එතුමාත් දන්නවා. 2017 අවුරුද්දේ යාපනයේදී මගේ ඒ වාහනය නැවතුණා. ඒ වෙලාවේ මම පැයක් මහ පාරේ හිටියා. පසුව මගේ අමාත්‍යාංශයේ ලේකම් කියපු නිසා තමයි මම වෙනත් වාහනයක් ගත්තේ. 2017 අවුරුද්ද අවසන් කාලයේ තමයි ඒ වාහනය ගත්තේ. අපි එහෙමයි වැඩ කරලා තිබෙන්නේ. කැබිනට් ඇමතිවරයකු විධියට මට කොළඹින් නිවසක් ගන්න පුළුවන්කම තිබුණා. I am entitled to a house. හැබැයි, මම එහෙම ගත්තේ නැහැ. මගේ නිවසේමයි මම ඉන්නේ. ගරු ඇමතිතුමනි, කරුණාකරලා මගේ නම සවුත්තු කරන්න එපා කියලා කියන්න.

ගරු ඇමතිතුමනි, මේවා ගැන ටිකක් හොයලා බලන්න. අපි හොරු නොවෙයි. අපි හොරු විධියට සලකලා පත්තරවල, වෙනත් මාධ්‍යවල ප්‍රවෘත්ති පළ කරන්න එපා. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, කරුණාකර ඒ ගැන සොයා බලන්න. එතුමාට කියන්න, කියනවා නම්, ඒ නම් සඳහන් කරලාම කියන්න කියලා.

මම නැවත කියන්න කැමැතියි, වාහනයේ මුදල්වලින් සියයට 60ක් ආපහු භාණ්ඩාගාරයට යනවාය කියන එක.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්] අපේ මන්ත්‍රීතුමා එදා අහපු ප්‍රශ්නයකටයි මම උත්තර දුන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න. [බාධා කිරීම්] ගරු වාසුදේව නානායක්කාර රාජ්‍ය අමාත්‍යතුමනි, ගරු ඇමතිතුමාට ඒක ගැන පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඒ මන්ත්‍රීතුමාට කරන සාධාරණයක් වශයෙන් ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ඇහුවාම, අදාළ අමාත්‍යාංශ ගැන කියලා මා දීපු උත්තරය තුළ කිසිම ඇමතිවරයකුගේ නමක් කියැවුණේ නැහැ. එදා ඔබතුමාත් සිටියා. මුදල් අමාත්‍යාංශයෙන් අදාළ කාල පරිච්ඡේදය කියා එවලා තිබුණා, අහවල් අහවල් අමාත්‍යාංශවලින් වාහන ගෙනැල්ලා තිබෙනවා කියලා. ඒක විතරයි මා කියෙව්වේ. මම කිසිදු ඇමතිවරයකුගේ නමක් ප්‍රකාශ කළේ නැහැ.

ආණ්ඩුවේ වාහනයක් නැති වෙලා තිබෙනවා නම්, අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන් ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරලා, ඒ ගැන හොයන්න ඕනෑ. මේ වාහන නැති වුණා කියලා වාර්තා වෙලා නැහැ. එහෙම එකක් තිබෙනවා නම්, වහා සොයා බැලිය යුතුයි. ගරු මනෝ ගනේසන් මැතිතුමා කිව්වා, යාපනයේ යද්දී එතුමාගේ වාහනය කඩාගෙන වැටුණා කියලා. එහෙම නම්, එතුමාට සලකා නැහැ, පසු ගිය ආණ්ඩුව. එතකොට රුපියල් ලක්ෂ 28,000ක වාහන ගත්තේ කවුද? ඒවා අපි ගත්ත වාහන නොවෙයි නේ. ඒවා පසු ගිය ආණ්ඩුව ගත්ත වාහන. රුපියල් ලක්ෂ 28,000ක වාහන අරගෙන තිබෙනවා. ඒවාට අදාළ දත්ත තිබෙනවා. ඒ දත්ත ගැන මොනවා හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම්- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම්, ඒක ගැන හොයලා බලලා පැහැදිලි කරන්න.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඒ ගැන හොයලා බලලා අපි කියමු. ඉල්ලාගෙන කන්න හොඳ නැහැ. දැන් ඔබතුමන්ලා කැවා ඇති. මේ ගැන අහ අහා, හාර හාරා ඉල්ලාගෙන කනවාට වැඩිය හොඳයි, මේ ගැන කියන එක නතර කර ගන්නා එක. [බාධා කිරීම්]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, ඔබතුමා ඒ ලබා දුන්නේ ප්‍රශ්නයකට උත්තරයක් බව මම දන්නවා. ගරු කථානායකතුමනි, හැබැයි, මාධ්‍ය විසින් අපේ පින්තූර දමමින් මෙපමණ ගණන්වලට- [බාධා කිරීමක්] ඇත්ත වශයෙන්ම, අපි වාහනයක් ඉල්ලුවේ නැහැ. මගේ නියෝජ්‍ය ඇමතිතුමන්ලාට වාහන දෙකක් අරගෙන තිබෙනවා. මගේ මුහුණ තමයි මාධ්‍යවල පළ වන්නේ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. දැන් මේ වාහන පාවිච්චි කරන්නේ ඔබතුමන්ලාගේ අමාත්‍යවරු. ඒ වාහන රටට බරක් නම්, ප්‍රසිද්ධ වෙන්දේසියක් දමලා, ඒ වාහන විකුණලා රජයට සල්ලි ගන්න. එතකොට වැඩේ ඉවරයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අපි අද දිනට නියමිත ප්‍රධාන වැඩ කටයුතුවලට යමු.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මේකට තමයි කියන්නේ ආණ්ඩු බලය තිබියදී ඔළුව වැඩ කරන්නේ නැහැ කියලා; මොළේ නැහැ කියලා. පැරදුණාම තමයි auction කරන්න මතක් වෙන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී ප්‍රධාන යෝජනා. [බාධා කිරීම්] Order, please! අද දින ප්‍රධාන වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා මට අවසර දෙන්න. [බාධා කිරීම්]

අද දින න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා අංක 1 ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 (5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
தெதிகம ஸ்ரீ மைத்திரீ பிரக்ஞார்த்த பௌத்த கல்வி தஹம் சபாவ (கூட்டிணைதல்) சட்டமூலம்
DEDIGAMA SRI MAITHRI PRAGNARTHA BOUDDHA EDUCATIONAL DAHAM SABHAWA (INCORPORATION) BILL

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி பிரதம அமைச்சரும் நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சரும் புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வீடமைப்பு வசதிகள் அமைச்சருமானவருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 52(6), to the Prime Minister, Minister of Finance, Economy and Policy Development,Minister of Buddhasasana,Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities for report.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දිනට නියමිත කටයුතු.
යෝජනා අංක 1 සිට 21 දක්වා අනුමත කිරීමට

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත: නියෝග
தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம்: ஒழுங்குவிதிகள்
NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT: REGULATIONS

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகப் பாதுகாப்பு அமைச்சரும் சுகாதாரம் மற்றும் சுதேச வைத்தியச் சேவைகள் அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Women and Child Affairs and Social Security and Minister of Healthcare and Indigenous Medical Services)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 3(ඔ) වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ සායනික පරීක්ෂණ සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 21 දිනැති අංක 2146/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත: නියෝගය
இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்: கட்டளை
SRI LANKA EXPORT DEVELOPMENT ACT: ORDER

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 02 දිනැති අංක 2143/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015/2016)
களுபோவிட்டியான தேயிலைத் தொழிற்சாலை லிமிரெட்: ஆண்டறிக்கை மற்றும் கணக்குகள் (2015/2016)
KALUBOVITIYANA TEA FACTORY LTD.: ANNUAL REPORT AND ACCOUNTS (2015/2016)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

"2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2018.08.08 දින ඉදිරිපත් කරන ලද, 2016.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.07.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)
தேசிய பெருந்தோட்டக் கைத்தொழில் முகாமைத்துவ நிறுவனம்: ஆண்டறிக்கை மற்றும் கணக்குகள் (2016)
NATIONAL INSTITUTE OF PLANTATION MANAGEMENT: ANNUAL REPORT AND ACCOUNTS (2016)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ පනතේ 23 වැනි වගන්තිය යටතේ 2018.08.08 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.05.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)
தேயிலை சிறு பற்றுநிலங்கள் அபிவிருத்தி அதிகாரசபை: ஆண்டறிக்கை மற்றும் கணக்குகள் (2015)
TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY: ANNUAL REPORT AND ACCOUNTS (2015)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 14 - 1A වගන්තිය යටතේ 2018.05.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.05.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)
தேயிலை சிறு பற்றுநிலங்கள் அபிவிருத்தி அதிகாரசபை: ஆண்டறிக்கை மற்றும் கணக்குகள் (2016)
TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY: ANNUAL REPORT AND ACCOUNTS (2016)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 14 - 1A වගන්තිය යටතේ 2018.09.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.05.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)
இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை: வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2016)
SRI LANKA EXPORT DEVELOPMENT BOARD: ANNUAL REPORT AND ACCOUNTS (2016)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වැනි වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසට අනුව 2019.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.07.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)

இலங்கை துறைமுக அதிகாரசபை: வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2015)

SRI LANKA PORTS AUTHORITY: ANNUAL REPORT AND ACCOUNTS (2015)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.01.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

இலங்கை துறைமுக அதிகாரசபை: வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2016)

SRI LANKA PORTS AUTHORITY: ANNUAL REPORT AND ACCOUNTS (2016)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.07.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

இலங்கை கமத்தொழில் ஆய்வுக் கொள்கைக்கான சபை: ஆண்டறிக்கையும் கணக்குகளும் (2016)

SRI LANKA COUNCIL FOR AGRICULTURAL RESEARCH POLICY: ANNUAL REPORT AND ACCOUNTS (2016)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය යටතේ 2018.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.07.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ලංකා පොස්පේට් සමාගම: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016/2017)

இலங்கை பொஸ்பேட்டு லிமிடட்: ஆண்டறிக்கையும் கணக்குகளும் (2016/2017)

LANKA PHOSPHATE COMPANY LTD.: ANNUAL REPORT AND ACCOUNTS (2016/2017)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

"2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED 12, පරිච්ඡේද අංක 6.5.3 යටතේ 2018.06.21 දින ඉදිරිපත් කරන ලද, 2017.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.01.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)

அறுவடைக்குப் பிந்திய தொழில்நுட்ப நிறுவகம்: ஆண்டறிக்கையும் கணக்குகளும் (2015)

INSTITUTE OF POST-HARVEST TECHNOLOGY: ANNUAL REPORT AND ACCOUNTS (2015)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වැනි වගන්තිය යටතේ 2018.08.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.01.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වී අලෙවි මණ්ඩලය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013)

நெல் சந்தைப்படுத்தும் சபை: ஆண்டறிக்கையும் கணக்குகளும் (2013)

PADDY MARKETING BOARD: ANNUAL REPORT AND ACCOUNTS (2013)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වැනි වගන්තිය යටතේ 2018.09.18 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.03.16 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை: ஆண்டறிக்கையும் கணக்குகளும் (2016)

AGRICULTURE AND AGRARIAN INSURANCE BOARD: ANNUAL REPORT AND ACCOUNTS (2016)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 27 වැනි වගන්තිය යටතේ 2018.09.18 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.03.16 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

ஹெக்டர் கொப்பேகடுவ விவசாய ஆராய்ச்சி மற்றும் பயிற்சி நிறுவகம்: ஆண்டறிக்கையும் கணக்குகளும் (2016)

HECTOR KOBBEKADUWA AGRARIAN RESEARCH AND TRAINING INSTITUTE: ANNUAL REPORT AND ACCOUNTS (2016)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2018.10.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.03.16 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වී අලෙවි මණ්ඩලය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014)

நெல் சந்தைப்படுத்தும் சபை: ஆண்டறிக்கையும் கணக்குகளும் (2014)

PADDY MARKETING BOARD: ANNUAL REPORT AND ACCOUNTS (2014)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වැනි වගන්තිය යටතේ 2019.05.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.07.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)

தேசிய போக்குவரத்து வைத்திய நிறுவகம்: வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2015)

NATIONAL TRANSPORT MEDICAL INSTITUTE: ANNUAL REPORT AND ACCOUNTS (2015)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2018.07.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015)

இலங்கை சிவில் விமானச் சேவைகள் அதிகாரசபை: வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2015)

CIVIL AVIATION AUTHORITY OF SRI LANKA: ANNUAL REPORT AND ACCOUNTS (2015)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2017.11.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016)

இலங்கை சிவில் விமானச் சேவைகள் அதிகாரசபை: வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2016)

CIVIL AVIATION AUTHORITY OF SRI LANKA: ANNUAL REPORT AND ACCOUNTS (2016)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2018.10.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රීලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014)

இலங்கை போக்குவரத்துச் சபை: வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள் (2014)

SRI LANKA TRANSPORT BOARD: ANNUAL REPORT AND ACCOUNTS (2014)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2019.01.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙයික්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தி னின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ වෝහාරික විගණන වාර්තා

பிணைமுறி விநியோகம் பற்றிய தடயவியல் கணக்காய்வறிக்கைகள்

FORENSIC AUDIT REPORTS ON ISSUANCE OF TREASURY BONDS

[අ.භා. 3.03]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සහ බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ ජනාධිපති කොමිසමේ නිර්දේශ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ බැඳුම්කර නිකුත් කිරීමට අදාළ වෝහාරික විගණන වාර්තා 05ක් සහ එහි ඇමුණුම් මේ වන විට මේ ගරු පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

මෙම වාර්තා මගින් රජයට, මහ බැංකුවට සහ අර්ථසාධක අරමුදලට දැවැන්ත මූල්‍යමය පාඩු සිදු කර ඇති බව අනාවරණය කර ඇත. එසේම එම ගනුදෙනු හරහා මූල්‍ය වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට ද, රටේ පොලී අනුපාතයටද බලපාන අයථා කටයුතු විශාල ප්‍රමාණයක් ද සිදුවී ඇත. එසේම රාජ්‍ය මූල්‍ය පාලනයේදී පැවතිය යුතු නොවන ඥාතිත්වයේ බැඳියාවන් සහ නිලධාරීන්ගේ මැදිහත්වීම් මෙම බැඳුම්කර ක්‍රියාවලියේදී පැවැති ඇති බවද හෙළිදරව් වී ඇත. එම නිසා පාර්ලිමේන්තුවේ මේ වන විට සභාගත කර ඇති බැඳුම්කර නිකුත් කිරීමට අදාළ වෝහාරික විගණන වාර්තා පිළිබඳ මෙම ගරු පාර්ලිමේන්තුව පුළුල් ලෙස සාකච්ඡා කළ යුතු බවද, එම වාර්තාවලින් අනාවරණය වන රජයට පාඩු සිදු කළ පුද්ගලයන් වහා අධිකරණය හමුවට පමුණුවා රටේ මහජනතාව වෙනුවෙන් ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරවන ලෙසටත්, රජයට අහිමි කළ එම මුදල් නැවත අය කර ගැනීමට කටයුතු කරන ලෙසටත් විෂයභාර අමාත්‍යවරයා ලෙස මුදල් අමාත්‍යවරයාට මෙම ගරු පාර්ලිමේන්තුව යෝජනා කර සිටී."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෑත කාලයේ පාර්ලිමේන්තුව තුළත්, මහ ජනතාව අතරේත් වැඩිපුරම සාකච්ඡාවට ලක් වුණු මාතෘකාවක් තමයි, මහ බැංකු බැඳුම්කර කොල්ලය පිළිබඳ සාකච්ඡාව. මේ සාකච්ඡාවේ ඊළඟ අදියරක් හැටියට තමයි තිබෙන්නේ, මේ වෝහාරික විගණන වාර්තා.

ඇත්තටම මාත් හිතනවා, මේ වෝහාරික විගණන වාර්තා නියමිත ක්‍රියාවලිය අනුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් වෙලා, එහිදී සාකච්ඡා කරලා, කාරක සභාව මඟින් සාරාංශගත ලේඛනයක් මේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීතුමන්ලාට ලබා දීලා, ඒ මත පදනම් වෙලා මේ වාර්තා පිළිබඳ පුළුල් සාකච්ඡාවක්, සංවාදයක් හැදුණා නම් හොඳයි කියලා. ඒකට හේතුව මොකක්ද? මම පාර්ලිමේන්තුවේ පුස්තකාලයෙන් මේ ගැන සොයලා බැලුවා. මේ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළාට පස්සේ මන්ත්‍රීවරුන් 71දෙනෙකු පමණයි දැනට පාර්ලිමේන්තු පුස්තකාලයෙන් මේවා අරගෙන තිබෙන්නේ. එතකොට, 225දෙනාගෙන් 71දෙනෙකුගේ අතට තමයි මේ වාර්තාව ගිහිල්ලා තිබෙන්නේ. මේ පිළිබඳව විධිමත්, පුළුල් සාකච්ඡාවක් මේ විවාදයේදී පවා සිදු කරන්න පුළුවන් වෙයිද කියන සැකය තිබෙනවා. මොකද, මේක ටිකක් විෂය බද්ධ කාරණාවක් නිසා. මේක සාමාන්‍යයෙන් ගමේ රටේ සිදු වන හොරකමකට, මංකොල්ලයකට එහා ගිය, දැනුම, බුද්ධිය, බලය සහ වෘත්තිමය නිපුණතාව භාවිත කරලා සිදු කරපු මහා මංකොල්ලයක්. එම නිසා මේ ගැන මීට වඩා පුළුල් සාකච්ඡාවක් සමාජගත කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේ වෝහාරික විගණන වාර්තාව ගැන, බැඳුම්කර වාර්තාව ගැන මතු වී තිබෙන මූලික කාරණා මොනවාද? මූලික කාරණාවලින් එකක් හැටියට, මේක ගනුදෙනුවක් විතරයි, මේක වංචාවක් නොවෙයි කියන එක, එක පැත්තකින් සාකච්ඡා වෙනවා. අනෙක් පැත්තෙන් කියනවා, මේ වෝහාරික විගණන වාර්තාවලින් හොයන්නේ පාඩු විතරයි, ලාභ ගැන කථා කරන්නේ නැහැ, මේ කාල වකවානුවලම ලාභ ලබපු ඒවා මේ වාර්තාවේ නැහැ කියලා.

ඊළඟට, තවත් විවාදයක් තිබෙනවා, මේ විගණන සමාගම් තෝරා ගැනීම සහ එම සමාගම්වල සුදුසුකම් පිළිබඳව. ඒවා වෘත්තිමය සුදුසුකම් තිබෙන ආයතන නොවෙයි කියලා විවාදයක් තිබෙනවා.

ඊළඟට, තව කාරණාවක් තිබෙනවා, මේ වෝහාරික විගණන වාර්තාව දැන් වැඩක් නැහැ, මේ සම්බන්ධයෙන් ආයෙත් වතාවක් පොලිසියට පැමිණිලි කරලා සීඅයිඩී එක හරහා පොලිස් වාර්තා හැටියට වාර්තාව එන්න ඕනෑ කියලා. මේවා තමයි මූලික වශයෙන් මේ ගැන කියන්නේ. ප්‍රධාන වශයෙන් මේ වෝහාරික විගණනය ගැන එක්කෝ දැනුවත්ව විකෘති කිරීම් සිදු වෙනවා. එහෙම නැත්නම් නොදැන විකෘති කිරීම් සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මා මුලින්ම කියන්නට ඕනෑ මේ වෝහාරික විගණනය කියන්නේම අධිකරණයට කරුණු, සාක්ෂි වාර්තා කිරීම සඳහා තිබෙන විගණනයක් බව. අපි දන්නා හැටියට වෝහාරික වෛද්‍ය විද්‍යාව, අධිකරණ වෛද්‍ය විද්‍යාව කියලා තිබෙනවා. එතකොට ඇත්තටම මේකත් අධිකරණයට සාක්ෂි සැපයීමක්. ඒ සාක්ෂිවල නිරවද්‍යතාව, ඒ සාක්ෂි ඉදිරිපත් කරන විගණකවරුන්ගේ නිරවද්‍යතාව, සුදුසුකම් යන ඒවා ඇත්තටම සාකච්ඡා වෙන්න ඕනෑ තැන වන්නේ මෙතැනටත් වඩා අධිකරණයයි. මොකද, මේ හදලා තිබෙන්නේ අධිකරණයට කරුණු සපයන වාර්තාවක් වන නිසා. මේ වාර්තාව පාර්ලිමේන්තුවේ කෝප් එකට හදන්න බැරි වුණේ ඇයි, මේ වාර්තාව විගණකාධිපතිවරයාට හදන්න බැරි වුණේ ඇයි කියන ප්‍රශ්නය දැන් තිබෙනවා. මම නැවත වතාවක් මේ කෝප් එකේ නිර්දේශ **සභාගත*** කරනවා.

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කෝප් එකේ නිර්දේශ අනුව විගණකාධිපතිතුමාගේ නිර්දේශ මේ වාර්තාවේ තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට 2016 ඔක්තෝබර් 28වන දා ඉදිරිපත් කරපු බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ කෝප් වාර්තාවේ විගණකාධිපතිතුමා මෙහෙම කියනවා.

"මෙම වාර්තාව පිළියෙළ කිරීමේදී විගණකාධිපති වෙත හිමි බලතල හා විෂය සීමාව තුළ කටයුතු කර ඇති බව අවධාරණය කරනු ලැබේ. ඉන් ඔබ්බට..."

ඒ කියන්නේ, මේ කෝප් වාර්තාවෙන් ඔබ්බට, "සාපරාධී හෝ විගණකාධිපතිට නිගමනය කළ නොහැකි මට්ටමේ නීති විරෝධී කටයුතු සිදු වී ඇත්දැයි යන්න පරීක්ෂාවට ලක් නොවුණු හෙයින්, එවැනි පරීක්ෂාවක් අවශ්‍ය යයි හැඟී යන්නේ නම් ඒ සඳහා විශේෂිත වූ ආයතනවල සහාය ලබා ගැනීමට සුදුසු බව නිගමනය කරනු ලබයි" කියලා.

මේ තමයි විගණකාධිපතිවරයා කෝප් එකට ඉදිරිපත් කළ වාර්තාවේ නිගමනය. කෝප් එකේ නිගමනය නොවෙයි, විගණකාධිපතිතුමාගේ නිර්දේශය. ඒකත් එක්ක කෝප් එකේ නිර්දේශවලින් අපි මෙන්න මේ නිර්දේශය ඉදිරිපත් කරනවා. "ප්‍රශ්නගත බැඳුම්කර ගනුදෙනුවට සම්බන්ධ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස ඉතා කෙටි කාලයක් තුළ අධික ලාභයක් ලබා ඇති අතර, එසේ ලාභ ඉපැයීමේ ක්‍රියාවලිය පිළිබඳව පූර්ණ බලැති යාන්ත්‍රණයක් මඟින් පරීක්ෂණයක් කළ යුතු අතර, එමඟින් ඔවුන්ගේ කටයුතු හරහා මහ බැංකුවට හා රජයට මූල්‍යමය පාඩු සිදු වී ඇත්දැයි ඉතා කඩිනමින් අනාවරණය කර ගැනීම මහ බැංකුවේ වගකීමක් ලෙස කාරක සභාව තරයේ විශ්වාස කරයි."

මේක තමයි අපි නිගමනය කළේ. අන්න ඒ විධියට පුළුල්ව, විධිමත්ව, මේ ගනුදෙනුවේ මූල්‍යමය අපරාධයක්, සාපරාධී අපරාධයක්, අධිකරණමය වශයෙන් සාක්ෂි අනාවරණ කරන අපරාධයක් සිදු වෙලා තිබෙනවාද කියන එක තමයි වෝහාරික විගණනයෙන් සිදු කරලා තිබෙන්නේ. ඒකට ජනාධිපති කොමිසමත් -ජනාධිපතිවරයා විසින් පත් කළ කොමිසමෙනුත්- කාරණා සනාථ කරලා කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා, මේ වෝහාරික විගණනය කරන්න කියලා. මහ බැංකුව, මහ බැංකුවේ වග කීමක් හැටියට - අද ඉන්න, හෙට ඉන්න කවුරු වුණත්- මේ දේ කරන්න ඕනෑ. ඒ ආයතනගත ව්‍යුහය තමයි මහ බැංකුව.

මා හිතන විධියට මහ බැංකුව මේ කටයුතු කරලා තිබෙන්නේ, රජය පිළිගත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව, කැබිනට් මණ්ඩලය අනුමත කළ ප්‍රසම්පාදන කමිටුවකින් තෝරා ගත් ජාත්‍යන්තර මිල කැඳවීම් කරලායි. ඒ කරුණු මම අද ඉදිරිපත් කළ වාර්තාවේත් තිබෙනවා. මම අද ඉදිරිපත් කළ කෝප් වාර්තාවේත් තිබෙනවා, මේ සඳහා ආයතන 14කින් මිල කැඳවීම් කරලා තිබෙනවාය කියලා. අපි ඊට පසුවත් මහ බැංකුව කැඳවලා මේ ගැන ඇහුවා, කොහොමද මේ කටයුතු කරන්නේ කියලා. එහිදී ඒ අය කිව්වා, ජාත්‍යන්තර මිල කැඳවීම් කරලා තමයි ඒ කටයුතු කරන්නේ කියලා. එම නිසා මේ වාර්තාවේ අන්තර්ගතය වෙනුවට, පිට කවරයේ අලංකාරය ගැන හොයන්න යන එකෙන් වෙන්නේ, අන්තර්ගතය තුළින් අනාවරණ කරන වංචා, දූෂණ සහ හොරුන් නිදහස් කරන එකයි.

මා ඒකට හොඳ උදාහරණයක් කියන්නම්. දැන් මේ වෝහාරික විගණන වාර්තාව ගැන ඉදිරිපත් වුණු එක තර්කයක් තමයි "මේක හරි යන්නේ නැහැ, ඉතිහාසයටත් අදාළ කරලා බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව හොයනවා. මේකට අයිති නැති කාලයක් ගැනත් හොයනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ආපසු පොලිසියට පැමිණිලි කරන්න ඕනෑ" කියලා. නමුත්, මුදල්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මණ්ඩලයේ විෂය පථය හැටියට බැඳුම්කර ක්‍රියාවලිය ගැනම හොයන්න තීරණය කරනවා නම්, ඒකේ තිබෙන වැරැද්ද මොකක්ද කියන එකයි අපි අහන ප්‍රශ්නය. ඒක ඇතුළේ තමයි මේ මුළු ක්‍රියාවලියම හඳුනා ගන්න පුළුවන් වෙන්නේ.

මෙහිදී 2005 සිට 2015 දක්වා රාජපක්ෂ පාලනය, 2015 සිට 2016 දක්වා රනිල් වික්‍රමසිංහ පාලනය කියලා බෙදා ගන්න එපා. ඒක වැරැදියි. මෙතැන බෙදීම තිබෙන්නේ ඒ සම්බන්ධයෙන් නොවෙයි. 2005 - 2015 කියන්නේ, මහ බැංකුව බැඳුම්කර නිකුත් කරපු එක ක්‍රමවේදයක්. මහ බැංකුවේ මෙහෙයුම් අත්පොත - manual - අනුව මහ බැංකුවට පවරා තිබෙනවා, බැඳුම්කරවලින් රජයට මුදල් සම්පාදනය කිරීමේ ක්‍රම කිහිපයක්. එයින් එක ක්‍රමයක් තමයි ඍජු - Direct Placement - ක්‍රමයට බැඳුම්කර මිලදී ගන්න පුළුවන්කම තිබීම. 2005 සිට 2015 දක්වා මහ බැංකුව, මුදල් මණ්ඩලය කටයුතු කළේ, ඍජු ක්‍රමයට මිලදී ගැනීමේ ක්‍රමවේදය තුළයි. 2015න් පස්සේ නිසි අනුමැතියක් නැතිව, නිසි අවබෝධයක් නැතිව, රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නේ නැතිව තමයි අර්ජුන මහේන්ද්‍රන්ලා වෙන්දේසි ක්‍රමයට ඍජුව මාරු වුණේ. ඒ වෙන්දේසි ක්‍රමය තමයි 2015 ඉඳලා 2016 දක්වා ක්‍රියාත්මක කළේ. මේ වාර්තා සකස් කරද්දී විගණකවරු මේ කාලසීමාව තමයි කොටස් දෙකකට බෙදා ගෙන තිබෙන්නේ. ඒ නිසා වාර්තා 5ක් තිබෙනවා. ඒ වාර්තා 5න් එකක් තමයි 2002 - 2015 කාලයට අදාළ වාර්තාව. දෙවැනි එක, 2015 - 2016 කාලයට අදාළ වාර්තාව. තුන්වැනි එක අර්ථසාධක අරමුදල පිළිබඳ වාර්තාව. හතරවැනි එක අර්ථසාධක අරමුදල කොටස් වෙළෙඳ පොළට යෙදවීම පිළිබඳ වාර්තාව. පස්වැනි එක තමයි මේ සමස්ත ක්‍රියාවලිය පිළිබඳ වාර්තාව.

ඒ නිසා ආණ්ඩු පක්ෂය, විපක්ෂය හැටියට බෙදෙන්නේ නැතිව, පක්ෂ හැටියට බෙදෙන්නේ නැතිව, මේක රටේ සිදු වුණු මූල්‍ය අපරාධයක් හැටියට හිතන්න කියලා මා ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. ඒක රාජපක්ෂ පාලනයද, රනිල් වික්‍රමසිංහ පාලනයද කියලා බෙදා ගන්න එකෙන් සිද්ධ වෙන්නේ මේ පරීක්ෂණයට බරපතළ හානියක් සිදු වීමයි.

හොඳයි, අපි එහෙම බෙදා ගන්නවා කියලා හිතමුකෝ. එහෙම නම් මා ඔබතුමන්ලාට යෝජනාවක් කරනවා. රජය හැටියට ඔබතුමන්ලා මහජනතාවට වූ පොරොන්දුවක් තිබෙනවා, "බැඳුම්කර හොරුන්ට දඬුවම් දෙනවා" කියලා. ඒ පොරොන්දුව අනුව කටයුතු කිරීම සඳහා ඔබතුමන්ලා ගන්න මේ හතරවැනි වාර්තාව. එහි තිබෙන්නේ, 2015 පෙබරවාරි 01 දින සිට 2016 මාර්තු 31 දක්වා කාලයට අදාළ බැඳුම්කර වංචාව ගැනයි. එහෙම නම් මේ කාලයට අදාළ අධිකරණ ක්‍රියාවලිය පටන් ගන්න. මේක, මේ විවාදයේදී අපට එකඟතාවට එන්න පුළුවන් කාරණාවක්. 2015දී අර්ජුන මහේන්ද්‍රන් මහ බැංකු අධිපතිවරයා හැටියට කටයුතු කරද්දී සිද්ධ වූ මහ බැංකු බැඳුම්කර කොල්ලය සම්බන්ධ සිද්ධියට ප්‍රමුඛතාව දීලා අවශ්‍ය කටයුතු කරන්න පටන් ගන්න. ඒ සඳහා අවශ්‍ය කරන සියලු සාක්ෂි මේ වාර්තාවේ තිබෙනවා. මේ වාර්තා කාල සීමාවකට අදාළ කරලා මනින්න එපා. මේ වාර්තාවලින් ආණ්ඩුවට ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා ආණ්ඩුව හිතනවා නම් අපි ඔබතුමන්ලාට යෝජනා කරනවා, අර්ජුන මහේන්ද්‍රන්ගේ කාලයට අදාළව මහ බැංකු කොල්ලය සම්බන්ධයෙන් පරීක්ෂණ පටන් ගන්න කියලා. මොකද, ඒක කරන්න පුළුවන්. ඒකට අවශ්‍ය කරන සාක්ෂි සියල්ල කෝප් කමිටුව දී සාකච්ඡා වුණා; ඩිව් ගුණසේකර සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති අනු කමිටුවේ දී සාකච්ඡා වුණා. ඒ සාක්ෂි සටහන් ඔක්කෝම එක්ක පිටු 3,000ක විතර වාර්තාවක් මම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ ගැන ජනාධිපති කොමිසමේ සාකච්ඡා වුණා. එහිදීත් කරුණු අනාවරණ වුණා. විගණක සමාගම් විසින් සිද්ධ කළ මේ චෝහාරික විගණනයේ එක තැනකවත් අපේ කිසිම සාක්ෂියක් ප්‍රතික්ෂේප කරලා නැහැ. මේ හතරවැනි චෝහාරික විගණන වාර්තාවට ඒ සියලු සාක්ෂි අරගෙන තිබෙනවා; ජනාධිපති කොමිසමේ සාක්ෂි අරගෙන තිබෙනවා; කෝප් කමිටුවේ සාක්ෂි අරගෙන තිබෙනවා; ලංකාවේ විගණකාධිපතිවරයාගේ සාක්ෂි අරගෙන තිබෙනවා; CID වාර්තා සියල්ල අරගෙන තිබෙනවා. දැන් ඔබතුමන්ලාට අවශ්‍ය කරන සාක්ෂි සියල්ල තිබෙනවා. මෙතැනදී කවුරු හෝ කියනවා නම් ආපසු පොලීසියේ පැමිණිල්ලක් දාලා වටෙන් එන්න ඕනෑය කියලා, ඒක නාසය කෙළින් අල්ලන්න තිබියදී ඔළුව වටේ අත දාලා අල්ලනවා වාගේ වැඩක්.

5වැනි චෝහාරික විගණන වාර්තාවේ 23වැනි පිටුව කෙරෙහි මා ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. වෙන්දේසිය සිද්ධ වූ දිනය, Bond series එක, ඒකට තැරැව්කරුවන් හැටියට පෞද්ගලිකව සම්බන්ධ වුණු ආයතන, පුද්ගලයන්ගේ සම්බන්ධතාව - individual involvement - ආදී සියලු විස්තර එහි සඳහන් වෙනවා. අර්ජුන මහේන්ද්‍රන්, former Governor, කසුන් පලිසේන, CEO of PTL. මෙහි minimum loss එක මිලියන 1,106ක් කියලා මේ අය ගණන් හදලා තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතකොට රනිල්ගේ නම නැහැ?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පොඩ්ඩක් ඉන්න. මේ විගණන වාර්තාවේ තිබෙන ඒවායි මම මේ කියන්නේ. [බාධා කිරීමක්] රනිල්ගේ නමත් දමාගන්න. එතකොට අනික් අයගේ නමත් දමාගන්න වෙනවා. මම එතැනට එන්නම්. මට බාධා කරන්න එපා. මේ වාර්තාවේ කියනවා, ".......based on review of call log records provided by the CID. Available copies of voice recording provided by the PDs - Primary Dealers....." කියලා. එතකොට, මේ විගණන වාර්තාව සකස් කරන්න CID වාර්තා අරගෙනයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කියන්නේ 5වන වාර්තාවේ 162වන පිටුවේ සඳහන් වන කාරණා. එම පිටුවේ, potential conflict of interest පිළිබඳව මෙසේ සඳහන් වනවා: ".....during the review, following four instances were noted wherein Kasun Palisena ....." ඔහුගේ ටෙලිෆෝන් අංකය තිබෙනවා. ".....had shared confidential information to the official email ID of Arjuna Mahendran, Governor@cbsl.lk" යනුවෙන් එහි තවදුරටත් සඳහන් වනවා.

පෙබරවාරි 27වන දා සිද්ධ වූ ගනුදෙනුවෙන් පස්සේ, 2016 අප්‍රේල් 04වන දා හවස 17.21ට කසුන් පලිසේන යැවූ ඊ-මේල් පණිවුඩය පිළිබඳ මෙසේ සඳහන් වනවා: "...was noted wherein Kasun Palisena wrote to Arjuna Mahendran that all transactions are settled and cleared. He also apologized for some difficulties caused for Arjuna Mahendran because of him". තමන් නිසා අර්ජුන මහේන්ද්‍රන්ට සිද්ධ වුණු අපහසුතා ගැන කනගාටුව පළ කරනවා කියලා කසුන් පලිසේන ඊ-මේල් පණිවුඩයක් යවනවා. කාටද? අර්ජුන මහේන්ද්‍රන්ට. එතකොට, අර්ජුන මහේන්ද්‍රන්ගේ බෑනාගේ කොම්පැනියේ ප්‍රධාන විධායක නිලධාරියා තමයි කසුන් පලිසේන. මේවා ඉතා පැහැදිලිව මේ වාර්තාවේ සඳහන් කරනවා, "conflict of interest අනාවරණ වුණු

අවස්ථා" කියලා. ඒ නිසා අපි ඔබතුමන්ලාට, මේ ගරු පාර්ලිමේන්තුවට යෝජනා කරන්නේ මේකයි. මේක මහා මුදල් කොල්ලයක් කියලා ඔබතුමන්ලා පිළිගන්නවා නම්, මේ ගනුදෙනුවේ අග මුල හොයාගෙන යන්න; ඥාති සම්බන්ධතා හොයා ගෙන යන්න; පවුල් සම්බන්ධතා හොයා ගෙන යන්න. මෙවැනි මූල්‍ය අපරාධයක් නැවත අපේ රටේ සිද්ධ නොවෙන්න ඕනෑ කියලා ඔබතුමන්ලා විශ්වාස කරනවා නම්, එය පටන් ගන්න 2015 - 2016 වාර්තාවෙන්. මේ සිද්ධිය ගේන්න, අධිකරණයට. මේ ගැන නැවත පොලිසියේ පැමිණිලි දමන්න ඕනෑ නැහැ; CID එකේ තිබෙන පැමිණිලි ගැන හොයන්න යන්න ඕනෑ නැහැ. CID records අරගෙන තමයි මේ වෝහාරික විගණනය සිද්ධ කරලා තිබෙන්නේ. ආයතනයේ ඉන්න සියලු අයගෙන් ලබා ගත් සාක්ෂි සටහන් සියල්ල මේ වාර්තාවේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය ආපස්සට යනවා කියන්නේ, මොකක් හෝ අවශ්‍යතාවකට කල් අරගෙන, මේ තොරතුරු වහන්න යම් උත්සාහයක් දරනවා කියන එකයි. මම විශේෂයෙන්ම ඒ කාරණය අවධාරණය කරනවා. මම ඒ කාරණය කිව්වේ මේ නිසායි. මේ සම්බන්ධයෙන් දැන් ලොකු මතයක් හදනවා, නැවත පොලිසියට පැමිණිලි කරලා, CID එකට පැමිණිලි කරලා මුල ඉඳලා එන්න ඕනෑ කියලා.

විගණන සමාගම් තෝරා ගත් ආකාරයේ වැරැද්දක් තිබෙනවා නම් අපට පුළුවන්, ඒ ගැන හොයන්න. BDO ආයතනය හෝ KPMG එක තෝරා ගත්ත ක්‍රමවේදයේ වැරැද්දක් තිබෙනවා නම්, මහ බැංකුව කැඳවා ඒ ගැන ප්‍රශ්න කරන්න අපට හෙට දිනයේත් COPE එකේ ඉඩ තිබෙනවා. හැම විගණන ආයතනයක්ම තමන්ගේ කීර්ති නාමය සම්බන්ධ ප්‍රශ්නයකට යනවා. මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාවලිය පටන් ගත්තාට පස්සේ, මේ ආයතන අධිකරණයට ඇවිල්ලා, තමන් ගත්ත සාක්ෂි, ලේඛන ගැන අධිකරණයට කරුණු වාර්තා කරන්න ඕනෑ. විගණන සමාගමකට බැහැ, තමන්ට ඕනෑ ඕනෑ දේවල් ලියලා අත සෝදාගෙන නිකම් ඉන්න. ඒ නිසා ඒ විගණන සමාගම්වල වැරැද්දක් තිබෙනවා නම් ඒවා එතැනදී හෙළි වෙනවා. ඒ විගණන සමාගම් අධිකරණයට වාර්තා කරන්න ඕනෑ, තමන්ගේ විගණනයේදී සාක්ෂි අනාවරණ කළේ කොහොමද කියලා. ඔවුන් ඒකට බැඳිලා ඉන්නවා.

ඊළඟට, මේ ලාභ පාඩු ගැන සාකච්ඡාව බලමු. ඇත්තටම, විගණකවරයකුගේ කාර්ය භාරය මොකක්ද? විගණකවරයෙකුගේ කාර්ය භාරය තමයි, තමන්ගේ විගණනයේදී රජයට හෝ රජයේ ආයතනයට පාඩු සිද්ධ වෙන ආකාරයට ඒ ආයතනය කටයුතු කර තිබෙනවාද කියලා හොයන එක. ආයතනයක කළමනාකාරිත්වයේ වගකීම තමයි ලාභ උපයන එක. පෞද්ගලික ආයතනයක වෙන්න පුළුවන්, රජයේ ආයතනයක වෙන්න පුළුවන් විගණනයක් කරනකොට ඒ ආයතනය ලාභ ලැබුවාද කියන එක හොයා ගන්න තිබෙන එකම ක්‍රමය තමයි, ලාභ අලාභ ගිණුම. ඒකට කාර්ය සාධන ඇගැයීමක් කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහ බැංකුවේ මූලික වගකීම මොකක්ද? අපි අපේ විමර්ශනයේදීත් සොයා බැලුවේ ඒකයි. විගණකාධිපතිතුමා හොයන්නේ, බැඳුම්කර නිකුත් කිරීමේදී මහ බැංකුවට, රජයට අවම පිරිවැයක් - minimum loss for the State - සිද්ධ වෙන ආකාරයට ඒ ගනුදෙනුව කර තිබෙනවාද කියන එකයි. ඒක ඇතුළේ, ලාභ ලැබීම ගැන අමුතුවෙන් සොයන්න දෙයක් නැහැ. පාටියක් දමලා, ලාභ හොයපු ඒවා ගැන කට්ටියට සතුටු වෙන්න තමයි තිබෙන්නේ. ඒක කරන්න පුළුවන්. "ඇයි මේ පාඩු ගැන විතරක් හොයන්නේ, ලාභ ගැන කියන්නේ නැත්තේ ඇයි?" කියලා කෙනෙක් තර්ක කරන්න පුළුවන්. ලාභ අලාභ ගිණුමේ ඒක සඳහන් වෙලා තිබෙනවා; වාර්ෂික ගිණුම්වල ඒ ලාභය පෙන්නුම් කරනවා. ඒක ගැන නොවෙයි, මේ විගණනය කරලා තිබෙන්නේ. නිශ්චිතව හඳුනාගත් පාඩුවක් සම්බන්ධයෙන් තමයි මේ විගණනය කර තිබෙන්නේ. "කෝප්" එක හඳුනාගත් පාඩුවක් තිබෙනවා. විගණකාධිපතිවරයාත් ඒ පාඩුව හඳුනාගෙන තිබෙනවා. ඒ සඳහා බලපාන ලද හේතු, ඒ සඳහා බලපාන ලද ඥාතිත්වයේ සම්බන්ධතා, නිලධාරින්ගේ මැදිහත්වීම් ගැනයි මේ හොයලා තිබෙන්නේ. "මගේ කාලයේ ලාභත් ලැබුවා" කියලා කවුරු හෝ කියනවා නම්, ඒ ගැන අපට සතුටුයි. "මගේ කාලයේ ලාභත් ලැබුවා" කියලා අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා කියනවා නම්, "බොහොම ස්තුතියි" කියලා තමයි එතුමාට කියන්න තිබෙන්නේ. හැබැයි, ලාභ ලැබීම පිළිබඳව නොවෙයි මේ විගණනයෙන් හොයලා තිබෙන්නේ. මේ විගණනයේ පදනමම තමයි, පාඩුව ගැන සෙවීම.

බැඳුම්කර නිකුත් කිරීමේදී රජයට අවම පිරිවැයක්, අවාසියක් සිද්ධ වෙන ආකාරයෙන් ඒක කළාද, ඇයි එහෙම කළේ, විකල්ප අවස්ථා - opportunity cost - තිබුණේ නැද්ද, ඒ හැර වෙනත් අවස්ථා තිබුණේ නැද්ද කියන එක ගැනයි මේ හොයලා තිබෙන්නේ. ඒ වාගේම, ඒක එහෙම කරන්න බලපෑ අභ්‍යන්තර හේතු තියෙනවාද, අර්ජුන මහේන්ද්‍රන් තමන්ගේ බෑනාගේ සමාගමට අභ්‍යන්තර තොරතුරු ලබාදීම නිසා මහ බැංකුවට පාඩුවක් සිද්ධ කළාද කියන එකයි මේ සොයන්නේ. බිලියනයක් නිකුත් කරලා, ඔහු බිලියන විස්සක්ම ගන්න කියලා කිව්වේ මොන හේතු මතද? බිලියන 10ක් ගන්න ගියේ මොන හේතු මතද? අන්න එතැනදී තමයි අපි හොයන්නේ, බිලියනයක් නිකුත් කරලා, බිලියනයම ගත්තා නම් වෙන්න තිබුණු පාඩුව සහ බිලියනයක් නිකුත් කරලා බිලියන 10ක්ම ගත්ත නිසා වූ අවාසිය ගැන. අපි ඒක හොයන්නේ ඇයි? ලාභය නොවෙයි, පිටතට තොරතුරු leak කළ එක ඒ අවාසියට බලපෑවාද කියන එකයි මේ හොයන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ගොඩක් කරුණු කියන්න තිබෙනවා. ඒ වුණත්, මම මේ කාරණය කියලා කථාව අවසන් කරන්නම්.

විශේෂයෙන්ම මේ නිසා අද ප්‍රධාන පාඩුව සිද්ධ වෙලා තිබෙන්නේ අර්ථසාධක අරමුදලටයි. අර්ථසාධක අරමුදලට මේ පාඩුව සිද්ධ වෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි. 2013.06.05වන දින ආයෝජන කමිටුව තීරණය කරනවා, අර්ථසාධක අරමුදලේ ආයෝජනවල වැඩි ප්‍රමුඛතාව ප්‍රාථමික වෙළෙඳ පොළේ සිට ද්විතීයික වෙළෙඳ පොළට දෙන්න ඕනෑය කියලා. ඒ කියන්නේ, ප්‍රාථමික වෙළෙඳ පොළෙන් සෘජුව මහ බැංකුවට මුදල් සම්පාදනය කරලා දෙන්න පුළුවන් අවස්ථාවක් අර්ථසාධක අරමුදලට තිබෙනවා. ඒ වාගේම තමයි, 2008දී ගත්ත තීරණයක් තිබුණා, අර්ථසාධක අරමුදලෙන් මහ බැංකුවට සෘජුව මුදල් සම්පාදනය කරනවා නම් five basis point කියන පදනමින් දශම බිංදුවයි පහක පොලියක් අර්ථසාධක අරමුදලට දෙනවා කියලා. ඒක අනික් තැරැව්කරුවන්ට තිබෙන අවස්ථාවක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අවස්ථාව අර්ථසාධක අරමුදලට ලැබුණාම, ඒ ප්‍රතිලාභය අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට ලැබෙනවා. හැබැයි, five basis point කියන පදනම උල්ලංඝනය වීම නිසා, අජිත් නිවාඩ් කබ්රාල්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මහත්මයාගේ තීරණයක් නිසා, ඒක නතර කරනවා. ආයෝජන කමිටුවට ඔහු කියනවා, අර්ථසාධක අරමුදල කටයුතු කරන්න ඕනෑ ප්‍රාථමික වෙළෙඳ පොළේ නොවෙයි, ද්විතීයික වෙළෙඳ පොළේ වැඩිපුර මුදල් යෙදවීමෙන් කියලා. මේ වාර්තාවේ පිටු අංක 178 සිට 189 දක්වා බලන්න. එම කොටසේ ඒ සඳහා සාක්ෂි තිබෙනවා. ඒ නිසා වූ පාඩුව කොපමණද? අර තිබුණු ප්‍රතිලාභය අහිමිවීම නිසා අර්ථසාධක අරමුදලට වූ පාඩුව බිලියන 9ක් -මිලියන 9,000ක්- කියලා කියනවා. මෙහි පාඩුව ගණනය වෙලා තිබෙන්නේ එහෙමයි. ඒ විස්තර ඇතුළත් ලේඛනය මා සභාගත කළා. විශේෂයෙන් එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

අර්ථසාධක අරමුදලේ මුදල් තිබෙද්දී, එම අරමුදල ගනුදෙනුවලට යන්නේ නැහැ. ඒක ඉතාම අසාධාරණයි. තැරැව්කරුවන්ට ඒ අවස්ථාව ලබාදීලා පසුව තැරැව්කරුවන් හරහා තමයි අර්ථසාධක අරමුදල මිලදී ගන්නේ. එතකොට අර්ථසාධක අරමුදලට තිබෙන අවස්ථාව නැති වෙනවා. ඒ නිසා අරමුදලට පාඩු සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා මෙන්න මේ ගැන හිතන්න. අර්ථසාධක අරමුදලේ ඉන්න නිලධාරින් හතරදෙනෙක් කොටස් වෙළෙඳ පොළේ ගනුදෙනු කරලා තිබෙනවා. අර්ථසාධක අරමුදලින් කොටස් මිලදී ගෙන තිබෙනවා. අර්ථසාධක අරමුදලින් කොටස් මිලදී ගන්නවාද කියලා තීරණය කරන්නෙත් ඒ අයමයි. ඒ ගොල්ලන් තීරණය කරලා, ඒ ගොල්ලන්ම කොටස් මිලදී ගන්නවා. කවුරු හෝ කෙනෙක් මේ වංචාව වහන්න හදනවා නම්, ඒ නිලධාරින් අද සතුටු වෙනවා ඇති, "අන්න, පාර්ලිමේන්තුවේ ඉන්න දේශපාලනඥයන් අපේ හොරකම් වහනවා" කියලා.

මම ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ මෙච්චරයි. මේකෙන් මට නම් කිසි කෙනෙක් ගැන හංගන්න දෙයක් නැහැ; වහන්න දෙයක් නැහැ. මම ඔබතුමන්ලාට විවෘතව කියන්නම්. ස්වාධීන අධිකරණයකට මේ නඩුව ගේන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වෙනුවෙන්ම අධිකරණයක් පිහිටුවා, එවැනි ස්වාධීන අධිකරණයක මේ බැඳුම්කර ක්‍රියාවලිය පිළිබඳ නඩුව අසමින්, එය සජීවීව විකාශය කරන්න. මේ "හඩ පට" සිද්ධි නොවෙයි, සජීවීව විකාශය කරමින් රටටම ඇහෙන්න මේ නඩුව අහන්න. අන්න එදාට හැමදෙනාටම තේරෙයි, අපි මේ හැම වචනයක්ම කථා කළේ මේ රටේ ජනතාවගේ කෝටි ගණනක මුදල් ඉතිරි කරන්න කියලා. අනාගතයේදීත් එහෙමයි. අද සේවක අර්ථ සාධක අරමුදලට පොලී දෙන්න බැරි වෙලා තිබෙන්නේ මොකද? සියයට 13ක පොලී දීපු ඒවා අද අඩු වෙලා තිබෙන්නේ මොකද? ඒ මේ මහා කොල්ලය නිසා; මේ මහා කොල්ලය බේරපු නිසා; මේ කොල්ලය අනාවරණ කරපු නිසා. මේ කොල්ලය හෙළිදරව් කරපු නිසා අද රටේ පොලී අනුපාතය අඩු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විවිධ තර්ක-විතර්ක තිබුණත්, විවිධ බලපෑම් තිබුණත්, මගේ දැනුමෙන්, ඔබතුමන්ලාගේ දැනුමෙන්, මේ කාරක සභාවේ දැනුමෙන්, අප කාටත් එකතු වෙලා පක්ෂ භේදයෙන් තොරව මේ පිළිබඳව කටයුතු කරන්නට හැකිවීම ගැන මහ ජන නියෝජිතයකු හැටියට මා ආඩම්බර වෙනවා. කසුන් පලිසේනලා, ඇලෝසියස්ලා අපේ මන්ත්‍රීවරු සල්ලිවලට ගන්න උත්සාහ කරපු අවස්ථා තිබුණා. නමුත්, සත්‍යය ජයග්‍රහණය කරලා තිබෙනවා. සත්‍යය ජයග්‍රහණය කර තිබෙන නිසා තමයි අද මේ චෝදනා විගණන වාර්තාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ. හැබැයි, මේ පාර්ලිමේන්තුව විසුරුවන්න කලින් මේ ගැන අධිකරණයට වාර්තා කරන්න කියලා මේ පාර්ලිමේන්තුව තීරණයක් ගන්න. අධිකරණයට වාර්තා කරලා, මේ වෙනුවෙන් අධිකරණයක් පිහිටුවලා, මේ නඩුව හරියට ඇහුවොත් මෙතැන අග මුල ඔක්කෝම හොයා ගන්න ඔබ සැම දෙනාටම පුළුවන්ය කියන විශ්වාසය සනාථ කරමින්, මේ යෝජනාව ඉදිරිපත් කරමින් මගේ කරුණු දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Motion is to be seconded by the Hon. (Dr.) Nalinda Jayathissa.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මහ බැංකු බැඳුම්කර වංචාවට අදාළ සභාව කල් තැබීමේ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Mahindananda Aluthgamage.

[අ.භා.3.27]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (විදුලිබල රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - மின்சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - State Minister of Power)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්දියානු සමාගමක් විසින් කරන ලද චෝදනා විගණනය සම්බන්ධ විවාදය ගැනයි අපි අද සාකච්ඡා කරන්නේ. මේ යෝජනාව ඉදිරිපත් කරන ලද සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, "දෙපැත්තක් බෙදෙන්නේ නැතුව මේ වංචාව වෙනුවෙන් අපි සියලු දෙනා එකට එක්කාසු වෙලා සටන් කරමු" කියලා. අපි අත් දෙකම උස්සලා, "එය කළ යුතුයි" කියනවා. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා තමයි COPE එකේ සභාපතිවරයා. මෙවර අපේ ආණ්ඩුවෙන් ඔබතුමා ඒ කමිටුවේ සභාපති කළා. COPE එකට මහ බැංකුව කැඳවන්න. පසුගිය කාලයේ COPE එකට මහ බැංකුව කැඳවන්න යනකොට, ඔබතුමා කථානායක කාමරයට ගෙන්වලා මහ බැංකු අධිපති ගෙන්වන්න එපා කිව්වා; මහ බැංකුවට ගියාම තොරතුරු දෙන්න එපා කිව්වා; පරීක්ෂණ නවත්වන්න කිව්වා. හැබැයි, අපි COPE එකට බලකරලා ඒ කමිටුවට මහ බැංකු අධිපති ගෙනාවා; පරීක්ෂා කළා; දඬුවම් දුන්නා. ඔබතුමාට පුළුවන්, නැවතත් COPE එකට කැඳවලා, - [බාධා කිරීමක්]

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන්ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

පුළුවන්.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
මෙවැනි හෙළිදරව්වක් කරන්න හැකි වුණේ අපි අලුත් සම්ප්‍රදායක් ඇති කළ නිසායි; විපක්ෂයේ මන්ත්‍රීවරයකුට COPE එකේ සභාපතිත්වය භාර දුන්න නිසායි. මීළඟ පාර්ලිමේන්තුවේත් ඔබතුමන්ලා ඒ විධියට කටයුතු කරනවාද කියලා අපට පොරොන්දුවක් දෙන්න කෝ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ පාර්ලිමේන්තුවේ පත් කිරීම් සම්බන්ධව අපි ඊළඟට කියන්නම්. ඊළඟ පාර්ලිමේන්තුවේ අපි ඔබතුමාට තනතුරක් දෙනවා. ඔබතුමාට දෙන්නේ, ජලසම්පාදන මණ්ඩලයේ සිදු වූ දේ පිළිබඳව හොයා බලන්නයි. ගරු මන්ත්‍රීතුමනි, ඒකේ Access Company එකෙන් දීපු commission ටික පිළිබඳව හොයා බලන්න පරීක්ෂණයක් තියනවා.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ඒකට ආණ්ඩුවක් ගන්න එපා යැ!

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආ! ඒක අපි කරගන්නම්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමනි, අපි ඔබතුමාට කියනවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට මහ බැංකුව කැඳවන්න කියලා. අද ඔබතුමා කැඳවලා තිබුණේ, විදේශ සේවා නියුක්ති කාර්යාංශය. ඔබතුමා මේ දවස් තුනේම මහ බැංකුව කැඳවන්න. එහෙම කැඳවලා මේ පිළිබඳ සියලු තොරතුරු ගන්න. ඒ වාගේම, විගණකාධිපති ගෙන්වන්න. මේ සියල්ල පිළිබඳව පරීක්ෂා කරන්න. ඒකට අපි ඔබතුමාට සම්පූර්ණ සහයෝගය දෙනවා. මේකට වැරදිකාරයෝ ඉන්නවා නම් දඬුවම් දෙන්න, අධිකරණයට ඉදිරිපත් කරන්න, නීතිය ක්‍රියාත්මක කරන්න කියලා නියෝග කරන්න විගණකාධිපතිට බලය තිබෙනවා. ඒ සියලු තැන අපි ඉන්නවා.

ඒ විතරක් නොවෙයි, මේ මහ බැංකු වංචාවේ පළමුවැනි චූදිතයාට, රනිල් වික්‍රමසිංහ මහත්තයාට අද දඬුවම් දීලා නැහැ. පසුගිය කාලයේ මේ දඬුවමට ලක් වුණේ කවුද? වැරදි කරපු අයද දඬුවමට ලක් වුණේ? නඩු දැම්මේ කාටද? නඩු දමලා තිබෙන්නේ ඇලෝසියස්ටයි, පලිසේනටයි. නඩු දමන්න ඕනෑ ඒ දෙන්නාට විතරද? නඩු දමන්න ඕනෑ රනිල් වික්‍රමසිංහ මහත්තයාට. මේ වෙනුවෙන් නඩු දමන්න ඕනෑ ඇමතිවරුන්ට, COPE එකේ සාමාජිකයන්ට. ඒ ගොල්ලන්ට නඩු දැම්මාද? "ෆුට්නෝට්" කල්ලියට නඩු දැම්මාද? අද "ෆුට්නෝට්" කල්ලිය පාර්ලිමේන්තුවේත් නැහැ. අද මොන නෝට්වත් නැහැ. අපි පිළිගන්නවා මේකට සම්බන්ධ වැරදිකරුවන්ට දඬුවම් දෙන්න ඕනෑ කියලා. අපට මේ කාරණයේදී කවුරුවත් හෝදන්න ඕනෑ නැහැ. අපටත් මේ ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ මහා සංවිධානාත්මක බැඳුම්කර කොල්ලයේ, වංචාවේ පළමුවැනි චූදිතයාට යුඇන්පී ආණ්ඩුව යටතේ නඩු දැම්මේ නැහැ. ඒක වැරදියි. මේක රාජ්‍ය අනුග්‍රහයකින් සිදු වූ වංචාවක්. පසුගිය ආණ්ඩුවේ අගමැතිවරයා, ඇමතිවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, COPE එකේ සාමාජිකයන්, එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරු, ඒ සියලුදෙනාම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳ පරීක්ෂා කරන්න. අපට ඒ පිළිබඳ කිසිම ගැටලුවක් නැහැ. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලීම කරන්නේ මේ පිළිබඳ පරීක්ෂණයක් පිළිබඳ නොවෙයි. වරදක් වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳව විධිමත් ආකාරයක පරීක්ෂණයක් තියන්න ඕනෑය කියලා අපි පිළිගන්නවා. විධිමත් ආකාරයට පරීක්ෂණයක් කරලා, ඒ පරීක්ෂණයෙන් පසු අදාළ පුද්ගලයා නීතිය හමුවට ගෙනයන්න ඕනෑ. ඔබතුමා දන්නවා, මේ නීත්‍යනුකූල නොවන වාර්තාවේ සඳහන් වෙලා තිබෙන්නේ රාජ්‍ය මුදල් අවභාවිතාවක් පිළිබඳව කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය මුදල් අවභාවිතාවක් නම්, රාජ්‍ය මුදල් අවභාවිතාව පිළිබඳව සොයා බැලිය හැක්කේ විගණකාධිපතිවරයාටයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 158වන ව්‍යවස්ථාවේ විගණකාධිපතිවරයාට තිබෙන බලය කුමක්ද කියලා පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. විගණකාධිපතිවරයාට තමයි පුළුවන්, රාජ්‍ය මුදල් අවභාවිතාවක් තිබෙනවා නම් ඒ පිළිබඳව සොයා බලන්න. පාර්ලිමේන්තුවේ COPE එකට පුළුවන්, කැඳවලා මේ පිළිබඳව පරීක්ෂා කරන්න; මේ පිළිබඳව විගණනය කරන්න; මේ පිළිබඳව දඬුවම් කරන්න. මේ සියල්ල කරන්න COPE එකට බලය තිබෙනවා. හැබැයි, පාර්ලිමේන්තුවේ COPE එකට කැඳවන්නේ නැතුව, විගණකාධිපතිවරයාගේ මතය විමසන්නේ නැතුව, විගණකාධිපතිවරයාගේ අනුමැතියකින් තොරව මහ බැංකුව විසින් මේ විගණනය සිදු කරනවා. මේ විගණනය සිදු කළේ මොකටද? හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහන්න. මේ විගණනය මහ බැංකුව කළේ ඇයි? මේ විගණනය කළේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ රෙදි හෝදන්න. ඒක තමයි ඇත්ත. මේ විගණනය කරන්න කියලා කවුද කිව්වේ? මේ වෝහාරික විගණනය කරන්න කියලා කිව්වේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව. රනිල් වික්‍රමසිංහ මහත්මයා වෙනුවෙන් පෙනී හිටපු නීතිඥයන් කිව්වා, මේ කාලයේ සිදු වූ ගනුදෙනු පිළිබඳව විතරක් නොවෙයි, පෙර කළ ගනුදෙනු පිළිබඳවත් හොයන්න කියලා. තමන්ගේ හොරකම වහන්න වෙන ඒවාත් හොයන්න කියලා කිව්වා. ඒ අනුව තමයි මහ බැංකුව විසින් මේ වෝහාරික විගණනය කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෝහාරික විගණනයක් කියන්නේ මොකක්ද? අධිකරණයට සාක්ෂි සපයන කමිටුවක්, කොමිසමක්. මේ වෝහාරික විගණනයෙන් තමයි අපි නඩු දාන්න ඕනෑ. රුපියල් මිලියන 200ක් වැය කරලා දැන් මේ කරලා තිබෙන වෝහාරික විගණනයෙන් සිදු වූ කිසිම දෙයක් නැහැ. මේකේ කිසිම නීත්‍යනුකූල පදනමක් නැහැ. මේ වාර්තාව ඉදිරිපත් කරන සමාගම කියනවා මේක පාවිච්චි කරන්න පුළුවන් මහ බැංකුවට පමණයි කියලා. මෙහි කියනවා, මුදල් මණ්ඩලයට විනා අන් කිසිවකුට මේක පාවිච්චි කරන්න බැහැ කියලා.

විගණකාධිපතිවරයා රාජ්‍ය ආයතන 54ක් විගණනය කරනවා. ඔහු රාජ්‍ය ආයතන 54 වෙනුවෙන් වියදම් කරන්නේ රුපියල් මිලියන 11යි. නමුත් මේ හරහා එක ආයතනයකට රුපියල් මිලියන 200ක් වැය කරනවා. රුපියල් මිලියන 200ක් වැය කළත් මේ වාර්තාවේ කිසිම නීත්‍යනුකූලභාවයක් නැහැ. මේ රාජ්‍ය මුදල් අවභාවිතාව පිළිබඳව නඩු දමන්න මට බැහැ. ඇයි මෙපමණ මුදලක් වැය කළේ? මේ සල්ලි වැය කළේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ රෙදි හෝදන්න. මේක විගණකාධිපතිවරයාට විගණනය කරන්න කියන්න තිබුණා. විගණකාධිපතිවරයා මේ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

විගණනය කරලා, පරීක්ෂා කළා නම්, මේ වරදට නඩු දාන්න තිබුණා. මේ වෙනුවෙන් ගත කරන කාලය අපරාධයක්. අපි මේ ගැන පාර්ලිමේන්තුවේ විවාද කරන මේ කාලයත් අපරාධයක්. අපි කියන්නේ ඒකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනාව පාර්ලිමේන්තුවේ COPE එකේ සභාපතිවරයා විසින් ගෙන ඒමයි අපට තිබෙන ප්‍රශ්නය. එතුමා මන්ත්‍රීවරයකු වුණාට මේ යෝජනාව ගෙනෙන්නේ පාර්ලිමේන්තුවේ COPE එකේ සභාපතිවරයා විධියටයි. COPE එකේ සභාපතිවරයා කියන්නේ රාජ්‍ය මුදල් පිළිබඳව සොයන කමිටුවේ සභාපතිවරයා. විගණකාධිපතිවරයාගේ මතය විමසන්නේ නැතුව, කිසිම නීත්‍යානුකූල බලයක් නොමැති වාර්තාවක් COPE එකේ සභාපතිවරයා මේ පාර්ලිමේන්තුවට ගෙනෙනවා කියන එකම වැරැදියි; මම කියන්නේ මේක conflict of interest; මේක වැරැදියි. මේක රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ මඩ හෝදන වාර්තාවක්. ඇයි, මේ යෝජනාව ජනතා විමුක්ති පෙරමුණෙන් ගෙනෙන්නේ? ඒකයි, අපට තිබෙන ප්‍රශ්නය. මේ යෝජනාව අපේ වෙන මන්ත්‍රීතුමෙක් ගෙනාවා නම්, මම මේ ගැන කථා කරන්නේ නැහැ. රුපියල් මිලියන 200ක් වැය කරලා ඉන්දියාවේ දූෂිත සමාගමක් විසින් සකස් කළ නීත්‍යානුකූල පදනමක් නැති මෙවැනි වාර්තාවක්, රටේ මූල්‍ය බලය පරීක්ෂා කරන ආයතනයේ සභාපතිවරයා හැටියට COPE එකේ සභාපතිවරයා ඉදිරිපත් කිරීම වැරැදියි කියන එකයි මගේ පෞද්ගලික මතය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කියන්නේ මේ පිළිබඳව ඔබතුමන්ලා පරීක්ෂා කරන්න කියලායි.

ආයතන 1,105ක් මේ පරීක්ෂණයේදී විගණනයට ලක් කරලා තිබෙනවා අප දැක්කා. ආයතන 1,105ක් විගණනයට ලක් කරලා, මෙහි පාඩුව බිලියන 10කට ආසන්න ප්‍රමාණයක් කියලා ඔබතුමන්ලා කියලා තිබුණා. ඒ වාගේම මේ කාලය තුළ තවත් ගනුදෙනු 2,783ක් තිබෙනවා. මේ ගනුදෙනු 2,783න්ම ලාභ ලබා තිබෙනවා. විගණනයකින් පෙන්වන්නේ පාඩුව විතරයි කියන එක අප පිළිගන්නවා. ඒ වාගේම මේ පාඩුව ගිහිල්ලා තිබෙන්නේ කොහේටද කියන එක පිළිබඳව අපි ඔබතුමාටට කියන්න ඕනෑ. මේ පාඩුව ගිහිල්ලා තිබෙන්නේ රාජ්‍ය බැංකුවලට. මේ සල්ලි ඇලෝසියස්ගේ ගිණුමට ගිහින් නැහැ, යූඑන්පී සංවිධායකවරුන්ට ඡන්ද පෝස්ටර් ගහන්න මේ සල්ලි දීලා නැහැ. මේ ලාභය ගිහින් තිබෙන්නේ ; EPF එකට, ETF එකට, ලංකා බැංකුවට, මහජන බැංකුවට, ජාතික ඉතිරි කිරීමේ බැංකුවට. මෙහි පාඩුව මහ බැංකුවට සිදු වුණත් ඒ ලාභය ගිහින් තිබෙන්නේ රාජ්‍ය ආයතනවලට.

ඉතින්, මොකක්ද වංචාව කියලා කියන්නේ? වංචාව කියන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015 පෙබරවාරි මාසයේ 27වැනි දා සිදු වූ වංචාව. වංචාව ඒක තමයි, නියම වංචාව ඒක තමයි. ඒක රාජ්‍ය අනුග්‍රහයෙන් සිද්ධ වුණු, අගමැතිගේ මූලිකත්වයෙන් මහ බැංකු අධිපතිගේ සංවිධානත්වයෙන් සිද්ධ වුණු වංචාවක්. ආණ්ඩුවට සල්ලි නැහැ කියන්න අපේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමන්ලා භාණ්ඩාගාරයට ගියානේ . රජයට සල්ලි නැහැ, අපට මූල්‍ය අර්බුදයක් තිබෙනවා කියලා කතන්දරයක් හදාගෙනනේ, සිහින මාළිගාවක් හදාගෙනනේ ඩීල් එක දැම්මේ. එහෙමනේ කළේ. ඇමතිවරු ගියා. මලික් සමරවික්‍රම ඇමතිතුමා ගියා. ගිහින් මහ බැංකුවට කිව්වා, "අපට සල්ලි නැහැ. විශාල මූල්‍ය අර්බුදයක් තිබෙනවා. ඒ මූල්‍ය අර්බුදයෙන් අපට ගොඩ එන්නට ඕනෑ. ඒ නිසා කරුණාකරලා අපට මේ සල්ලි ටික දෙන්න" කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ගියේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා ගියේ නැහැ නේද? සමා වෙන්න, සමා වෙන්න. ඔබතුමා ගියේ නැහැ, ඔබතුමා දලු එක්කහු කරන්නයි ගියේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාට කියාගෙන ගිය ආකාරයට ඒක තමයි වංචාව කියන්නේ, ඒක තමයි සංවිධානාත්මක කොල්ලය කියලා කියන්නේ. සංවිධානාත්මක කොල්ලයක් තමයි සිදු වුණේ. මෙතැන බැඳුම්කර ගනුදෙනු දෙකක් තිබෙනවා. ඒක පටලවා ගන්න එපා. 2005 සිට 2015 දක්වා වූ බැඳුම්කර ගනුදෙනුවේදී මහ බැංකුවට වූ පාඩුවක් තිබෙනවා. 2015 - 2020දී බැඳුම්කර විකිණීමේදී රාජ්‍ය අනුග්‍රහයෙන් සිදු වූ වංචාවක් තිබෙනවා. මේ දෙක පටලවා ගන්න එපා. රාජ්‍ය අනුග්‍රහයෙන් සිදු වූ වංචාවයි, ශ්‍රී ලංකා මහ බැංකුව තීන්දු ගැනීමේදී වූ පාඩුවයි අතර වෙනසක් තිබෙනවා. අපට මේකේදී "X" ද, "Y" ද, "Z" ද කියන එක අදාළ නැහැ. කවුරුන් හෝ වංචාවක් කරලා තිබෙනවා නම්, වැරැද්දක් කරලා තිබෙනවා නම් විගණකාධිපතිවරයා හරහා විගණනය කරලා කරුණු ඉදිරිපත් කරන්න අපි ලෑස්තියි. ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ මේ වංචාව සිදු වුණා. ඔබතුමන්ලාගේ කාලයේ මේ ගැන ජනාධිපති කොමිසමක් පත් කළා. ඔබතුමන්ලාගේ කාලයේ නීතිපති නඩු දැම්මා. නමුත්, නිවැරදි වූදිතයන්ට නඩු දැම්මාද? මම ඒ ගැන කියලා ඔබතුමන්ලා අපහසුතාවට පත් කරන්නට කැමැති නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයෙන් සංවිධායකවරු පස් දෙනෙකු අපට දිවුරුම් ප්‍රකාශ දුන්නා, "සිරිකොතට ගෙනැල්ලා සල්ලි බෙදුවා. ලක්ෂ 50 ගානේ සල්ලි දුන්නා. ලක්ෂ 10 ගානේ සල්ලි දුන්නා. ඇලෝසියස් සල්ලි දුන්නා. ඇලෝසියස්ගේ සල්ලිවලින් තමයි අපි ඡන්ද කළේ. එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් සල්ලි බෙදුවා; පෙට්ටිවලින් ගෙනාවා. ඇලෝසියස්ගේ වාහනයෙන් සිරිකොතට සල්ලි ආවේ. ඒ සල්ලි ගෙනැල්ලා බෙදුවා. බෙදලා තමයි ඡන්ද කළේ" කියලා. එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරු එහෙම කියනවා. ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් අපට කිව්වා, "මටත් දුන්නා ලක්ෂ 50ක්" කියලා. එක්සත් ජාතික පක්ෂයේ හිටපු මන්ත්‍රීවරයකු වශයෙන් එතුමාත් පිළිගන්නවා.

තමුන්නාන්සේලා 2015 ජනවාරි 08වෙනි දා දිනලා, - හොරකම නවත්වනවා කියලා බලයට පත්වෙලා- මොකද කළේ? ඊළඟ මහ මැතිවරණයෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති කරන්න, මැතිවරණයට සල්ලි හොයන්න ඔබතුමන්ලා ඉස්සෙල්ලාම ඔය ඩීල් එක දමන්න ගියේ share market එකට; ඉස්සෙල්ලාම කොටස් වෙළෙඳ පොළට ගහන්න තමයි ගියේ. ඒක කරන්න එපා කිව්වා. ඊට පස්සේ තමයි බැඳුම්කරයට වැඩේ දුන්නේ. ඒ සඳහා තමයි ශ්‍රී ලංකා මහ බැංකුව අගමැතිවරයා යටතට ගත්තේ. ඒ සඳහා තමයි ඇලෝසියස් පිට රට ඉඳලා ගෙන්වා ගත්තේ. ඒ සඳහා තමයි ඇලෝසියස්ගේ බෑනාට ගනුදෙනුව දුන්නේ. ඒ සඳහා තමයි ශ්‍රී ලංකා මහ බැංකු ටෙන්ඩර් එක විනාඩි 15කට කල් දැම්මේ. ඒ සඳහා තමයි මහ බැංකු අධිපතිතුමා පහළ කාමරයට ගියේ. ඒ විතරක් නොවෙයි, වැඩිපුර දෙන්න කියලා මහ බැංකුවේ මහත්මියකට නියෝග කළා. ඒ කරුණු සියල්ලම COPE එකේ සටහන්වෙලා තිබෙනවා. ඔබතුමන්ලා කියන්නේ, "පසුගිය කාලයේ, -මේ මහා වාර්තාව ආවාට පසුව කථා කළේ- 2005 - 2015 කාලය තුළ අපි මහ බැංකුවේ බැඳුම්කර ගනුදෙනු කරලා ඒක කොල්ල කෑවා, ඒකෙන් හොරකම් කළා, ඒක ඉවර කළා, ඒක විනාශ කළා" කියලානේ. එහෙම තමයි කථා කළේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ වංචාව ගැන කවුරුත් කථා කළේ නැහැ. මේ සංවිධානාත්මක කොල්ලය ගැන කවුරුත් කථා කරන්නේ නැහැ.

අපි ඔබතුමන්ලාට කියනවා මේ පිළිබඳව අවංකව කථා කරන්න කියලා. දෛවයේ සරදමක්ද මන්දා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ රෙදි සෝදන යෝජනාව ජනතා විමුක්ති පෙරමුණෙන් ගේනවා. මේක දෛවයේ සරදමක්ද මන්දා. මොකක්ද මේ කරන්නේ? අපි ඔබතුමන්ලාට කියනවා, බැඳුම්කර වංචාව පිළිබඳව තමුන්නාන්සේලා නීත්‍යානුකූලව පරීක්ෂා කරන්න කියලා. ඒ පිළිබඳව අපේ ගැටලුවක් නැහැ. අපි කවුරුවත් ඒකට විරුද්ධ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි කාගේවත් විරෝධතාවක් ඒකට නැහැ. අපි පැහැදිලිව පිළිගන්නට ඕනෑ, බැඳුම්කර ගනුදෙනුවලදී ලාභ ලබනවා. අපි "හෙජින්" ගනුදෙනුව කළා. ඒක හරි ගියා නම් "හෙජින්" එක අපට ලාභයි, වැරදුණාම පාඩුයි.

අපේ කාලයේ බැඳුම්කර නිකුත් කිරීමේදී රාජ්‍ය ආයතනවලටයි සියයට 95ක් නිකුත් කරලා තිබෙන්නේ. ඒ ගැන මේ වාර්තාවේ තිබෙනවා. අපි දීලා තිබෙන්නේ EPF එකට, ETF එකට, ලංකා බැංකුවට, මහජන බැංකුවට සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට. අපි බෑනාට දීලා නැහැ. අපේ හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහත්තයා දීලා නැහැ එයාගේ බෑනාට, ලේලිට හෝ මස්සිනාට. එතුමා දීලා තිබෙන්නේ රාජ්‍ය ආයතනවලට. රාජ්‍ය ආයතනවලට බැඳුම්කර නිකුත් කිරීමේදී යම් පාඩුවක් වෙලා තිබෙනවා. හැබැයි, ඒ ලාභය රාජ්‍ය බැංකුවලටයි ගිහින් තිබෙන්නේ. ශ්‍රී ලංකා මහ බැංකුව පාඩු වෙනකොට, අනෙක් පැත්තෙන් ලාභ ලබන්නේ රාජ්‍ය බැංකු. ඔබතුමන්ලාගේ ගනුදෙනුවේදී එහෙම නැහැ. මහ බැංකුව පාඩු විඳිනකොට ලාභ ලබන්නේ ඇලෝසියස්; හිටපු මහ බැංකු අධිපතිගේ බෑනා. ඒ සල්ලි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ බැංකු ගිණුම්වලටයි යන්නේ. තමුන්නාන්සේලා සම්බන්ධව CID පරීක්ෂණ තිබෙනවා. තව ටික දවසක් යනකොට ඒවා එළිවෙයි. පොඩ්ඩක් ඉන්න. තමුන්නාන්සේලා කොළඹ 07න් ගෙවල් ගත්ත ඒවා ගැන පරීක්ෂණ තිබෙනවා. ඒ වාගේම, මන්ත්‍රීවරුන්ගේ ගිණුම්වලට සල්ලි ඇවිල්ලා තිබෙනවා. මන්ත්‍රීවරුන්ගේ ගිණුම්වලට ඇලෝසියස් මහත්තයා සල්ලි දමලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම COPE එකේ සාමාජිකයෙක්. මේ බැඳුම්කර ගනුදෙනුව ගැන අපි COPE එකේදී සාකච්ඡා කළා. බැඳුම්කර ගනුදෙනුව ගැන පරීක්ෂණ පවත්වනකොට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට calls එනවා. "Okay. I will tell like that." කියලා කියනවා. එහා පැත්තේ අර්ජුන් ඇලෝසියස්, මෙහා පැත්තේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු. මොකක්ද මේ? ලජ්ජා නැද්ද? COPE එකේ සාමාජිකයන් අර්ජුන් ඇලෝසියස්ට කථා කරලා ඔහුගෙන් උපදෙස් ගන්නවා, COPE එකට උත්තර දෙන්න. "Footnote" කල්ලිය මොකක්ද කළේ? අගමැතිතුමාගේ ඉල්ලීමටයි footnotes දැම්මේ. තමුන්නාන්සේලා වෝහාරික විගණනය කළේත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා බේරන්නයි. එතුමා බේරන්න ඉන්දියාවටත් බැරි වුණා. ඉන්දියාවටත් බැරි වුණා, මේ වංචාවෙන් එතුමා බේරන්න. ඒ නිසා ඔබතුමන්ලාට කියන්න ඕනෑ, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව, එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායම කර තිබෙන වංචාව වහන්න වෙනත් දේවල් ගෙනෙන්න එපා කියලා. වැරැදි කරලා තිබෙනවා නම් දඬුවම් දෙන්න.

තමුන්නාන්සේලා පසුගිය කාලයේ මිග් යානා ගනුදෙනුව පිළිබඳව කථා කළා. තමුන්නාන්සේලාට ඔහු ගෙන්වන්න බැරි වුණා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Okay. විනාඩි දෙකකින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

දැන් ඔහු ගෙන්වා අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ කාලයේදී ඔහු ගෙනෙන්න පුළුවන් වුණාද? නැහැ. අපේ ආණ්ඩුව කාලයේ ඔහුට යම් චෝදනාවක් තිබුණත් ඔහු තවම වැරැදිකරුවකු වෙලා නැහැ. හැබැයි ඔහු චූදිතයෙක්. දැන් ඔහු ගෙන්වා තිබෙනවා. අපි ඔහු ගෙන්වූයේ ඇයි? ආණ්ඩු බලය පාවිච්චි කරලා අපට ඔහු නොගෙන්වා ඉන්න තිබුණා. ඒක තමයි විනිවිදභාවය කියන්නේ. මේ වෝහාරික විගණනය හරහා තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙන්නේ වෙන දෙයක් නොවෙයි. මෙය ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා බේරාගන්න ගෙනෙන ලද යෝජනාවක්. මෙයට රුපියල් මිලියන 200ක් වැය කළා. අපි කියන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුව වැය කර තිබෙන මේ මුදල පිළිබඳව වෙනම පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ කියලායි. වෝහාරික විගණන වාර්තාවක් කියන්නේ මොකක්ද? මේ වාර්තාවෙන් නඩු පවරන්න පුළුවන්ද? අඩු ගණනේ කොමිෂන් සභා වාර්තාවක තිබෙන වටිනාකමක්වත් මේ වෝහාරික විගණන වාර්තාවට නැහැ. මොකක්ද Forensic Audit Report එකක් කියලා කියන්නේ? අධිකරණයට අවශ්‍ය සාක්ෂි සපයන වාර්තාවක්. මේ වාර්තාවෙන් එහෙම දෙයක් සිද්ධ වෙනවාද? මේ වාර්තාවෙන් කියනවා, කිසිම දෙයකට මේ වාර්තාව භාවිත කරන්න බැහැයි කියලා. ඒ නිසා නිරපරාදේ රුපියල් මිලියන 200ක් වැය කරලා සකස් කරන ලද වටිනාකමක් නැති ලියකියවිල්ලක් පිළිබඳවයි නිරපරාදේ දින දෙකක් වැය කරමින් අපි මේ විවාද කරන්නේ. සමහර විට ඔබතුමන්ලා කියයි, අපේ රෙදි සෝදාගන්නයි මෙහෙම විවාද කරන්නේ කියලා. නැහැ. අපි මේ විවාදයට සහභාගි වෙනවා. අපි මේ විවාදයේදී කථා කරනවා. අපි මේ විවාදයේදී ඇත්ත කියනවා.

ඔබතුමන්ලා කියන්න, අවුරුදු 10ක අපේ පාලන කාලය තුළදී පෞද්ගලික ආයතනයකට එක් බැඳුම්කරයක් හෝ නිකුත් කර තිබෙනවාද කියලා? එක පෞද්ගලික මුදලාලි කෙනකුගේ සාක්කු පුරවා තිබෙනවාද කියලා ඔබතුමන්ලා කියන්න. තමුන්නාන්සේලාගේ අගමැතිතුමා ශ්‍රී ලංකා මහ බැංකුව එතුමා යටතට පවරා ගැනීමේ සිට, අර්ජුන මහේන්ද්‍රන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට පත් කිරීමේ සිට ඒ සියල්ල සැලසුම් කරලා එක්සත් ජාතික පක්ෂය කර තිබෙන මහා වංචාවක් තමයි, මේ බැඳුම්කර වංචාව. ඔබතුමන්ලා කළ වංචාවෙන් ගැලවෙන්න හදන්න එපා. තමුන්නාන්සේලා මහ දවල් ශ්‍රී ලංකා මහ බැංකුව කොල්ල කාලා, අද එනවා පෙර දේවල් ගැන සොයන්න. ඒ නිසා අපි කියනවා, COPE එක කැඳවා විගණකාධිපතිවරයාට කියමු, 2005 - 2015 දක්වා කාලය පිළිබඳව පරීක්ෂා කරලා, ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. ඊට පස්සේ පාර්ලිමේන්තුවේදී ඒ සම්බන්ධයෙන් විවාද කරමු. වැරැදි තිබෙන බවට ඒ වාර්තාවේ සඳහන් වනවා නම් එයට විරුද්ධව කටයුතු කරමු. ඒ නිසා මා නැවතත් ඉල්ලනවා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ රෙදි සෝදන්න ගෙනෙන ලද මෙවැනි වාර්තා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ විවාදයට ගන්න එපාය කියලා. බොහොම ස්තුතියි.

[අ.භා.3.44]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මා කියන්න කැමැතියි, වෝහාරික විගණන වාර්තාව සම්බන්ධයෙන් ඉස්සෙල්ලාම යෝජනා කළේ COPE එකෙන් කියලා. විපක්ෂයේ

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

මන්ත්‍රීවරයකු, ප්‍රධාන පක්ෂයට සම්බන්ධ නැති මන්ත්‍රීවරයකු COPE එකේ සභාපති වශයෙන් හැම දාම පත් කළේ රනිල් වික්‍රමසිංහ මැතිතුමායි. මට මතකයි, 2002 ආණ්ඩුව කාලයේදීත් COPE එකේ සභාපති වශයෙන් ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා පත් කළ බව. නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේදීත්, ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේදීත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු තමයි COPE එකේ සභාපති ධුරයට පත් කළේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි එක්සත් ජාතික පක්ෂයට එහි සභාපති ධුරය ලබාගන්නේ නැතුව ජනතා විමුක්ති පෙරමුණට එහි සභාපති ධුරය ලබා දුන්නේ. ඇත්ත වශයෙන්ම - [බාධා කිරීමක්] ඒක අර්ථ නිරූපණයක්.

ගරු වාසුදේව නානායක්කාර රාජ්‍ය ඇමතිතුමා දන්නවා, වෝහාරික විගණන වාර්තාවක් අවශ්‍යයි කියලා ජනාධිපති කොමිසමෙන් නිර්දේශ වුණාය කියලා. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් ඉන්නේ ජනාධිපති කොමිසමේයි. ඒ නිසා කාටවත් කියන්න බැහැ, මේ කටයුත්ත අපේ වුවමනාවට කළ එකක් කියලා. ඒ වාගේම දැන් සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, what is your point of Order?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, මා එදා COPE එකේ සිටියා. COPE එක කිසිම නිර්දේශයක් ලබාදීලා නැහැ, වෝහාරික විගණනයක් කරන්න කියලා. එදා විගණකාධිපතිවරයා සිටියා. විගණකාධිපතිවරයා ඒ සම්බන්ධයෙන් නිර්දේශ කරලාත් නැහැ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නීතිඥයන් විසින් ජනාධිපති කොමිෂන් සභාවට කරන ලද ඉල්ලීමකට අනුව තමයි මේ කටයුත්ත සිද්ධ වෙන්නේ.

මම අද විගණකාධිපතිතුමාගෙන් ඇහුවා. විගණකාධිපතිතුමා කිසිදු අනුමැතියක් දීලාත් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා දැන් කිව්වා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ පෞද්ගලික මතය; COPE කමිටුවේ මතය නොවෙයි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
වෝහාරික විගණන වාර්තාව ගැනද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
සමාවෙන්න. මාත් එම කමිටුවේ සාමාජිකයෙක්. අපි සියලුදෙනාම එම කමිටුවෙන් ඉල්ලීමක් කළා, වෝහාරික විගණන වාර්තාව හදන්න කියලා. I myself was there. We all approved it.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Forensic audit එකක් කරන්න ඕනෑ කියලා අපි කිව්වා. හැබැයි, ඒක forensic audit එකක් කරන්න කියලා COPE එකෙන් අනුමත කරපු නිසා කරපු ඉල්ලීමක් නොවෙයි.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අපි ඉල්ලීමක් කළා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් කළා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෙසේ හෝ වේවා ජනාධිපති කොමිසමේ නිර්දේශ අනුව වෝහාරික විගණන වාර්තාව හදලා තිබෙනවා. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කාල පරිච්ඡේද දෙකක් ගැන කිව්වා. ඒ, 2015ට කලින් සහ 2015ට පසු. අපි 2015ට කලින් තත්ත්වය ගැන කථා කරමු. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, මම කියන්න සතුටුයි, 2015ට කලින් සේවක අර්ථසාධක අරමුදල සම්පූර්ණයෙන්ම පාවිච්චි කළා. ඒක ඔබතුමා දන්නවා නේ. 2015ට කලින්, ඒ කියන්නේ 2002යි 2015යි අතර මොකක්ද වුණේ? ව්‍යාජ සමාගම් හැදුවා. Ceylon Grain Elevators කියන සමාගමේ share එකක වටිනාකම රුපියල් 30යි, 40යි. ඔය කබ්රාල්ගේ කණ්ඩායමේ 10දෙනෙක් විතර ඉන්නවා. ඒ අය එකතුවෙලා මේ share එක රුපියල් 40 ඉඳලා රුපියල් 205 දක්වා වැඩි කෙරෙව්වා. ඒවා ව්‍යාජ විධියට ඒ ගොල්ලන්ම ගන්නවා. ඒ ගැන ඔබතුමා දන්නවා. ඒ share එකක් රුපියල් 30ට, 40ට තිබුණේ. කබ්රාල්ගේ ගෝලයෙක් ඒ එක් කොටසක් රුපියල් 75 ගණනේ ගත්තා; තව කෙනෙක් ඒක රුපියල් 100ක් කළා; රුපියල් 150ක් කළා; රුපියල් 200ක් කළා; රුපියල් 205ක් කළා. 205ක් කරලා ඊට පස්සේ මොකක්ද කළේ? ඒවා සේවක අර්ථසාධක අරමුදලේ ඇඟේ ගැහුවා. වික්කේ නැහැ, බලෙන් ඇඟේ ගැහුවා. සේවක අර්ථසාධක අරමුදලට දීලා මාස කිහිපයක් යනකොට එම කොටස්වල වටිනාකම අඩු වුණා. මොකක්ද, ඒ අය කළේ? සේවක අර්ථසාධක අරමුදල වික්කා. එම හොර නඩය ඒ වාගේ සමාගම් 17ක් හදාගෙන කෘත්‍රිම විධියට - artificially - මේ කොටස්වල වටිනාකම වැඩි කළා. රුපියල් 30ට තිබුණු කොටස රුපියල් 205 දක්වා වැඩි කළා. ඒ කොටස් ඒ ගොල්ලෝම ගන්නවා, ඒ ගොල්ලෝම විකුණනවා; it was artificial. සේවක අර්ථසාධක අරමුදලට විකුණුවාට පස්සේ ඒවායේ මිල අඩුවුණා. ඔබතුමා දන්නවාද, 2015ට කලින් -2002

ඉඳලා- EPF එකට වූ පාඩුව කොච්චරද කියලා. රුපියල් බිලියන 9,830යි. නමුත් 2015න් පස්සේ සේවක අර්ථසාධක අරමුදලේ සල්ලි අපි පාවිච්චි කළේ නැහැ. ඒ නිසා සතයක අලාභයක් වුණේ නැහැ. මේ විධියට ව්‍යාජ සමාගම් 17ක් හදලා, කෘත්‍රිම විධියට කොටස්වල වටිනාකම වැඩි කරලා, ඒවා සේවක අර්ථසාධක අරමුදලේ ඇඟේ ගහලා, ටිකක් කල් යනකොට ඒවායේ මිල අඩු වුණාම විකිණීම නිසා 2015ට කලින් සේවක අර්ථසාධක අරමුදලේ අලාභය විතරක් රුපියල් බිලියන 9,830යි. ඒ වාගේම, 2002-2015 අතර කාලයේ භාණ්ඩාගාර බැඳුම්කර -Treasury Bonds - විකිණීම නිසා සිදු වූ පාඩුව රුපියල් බිලියන 10යි. එතකොට ඒ කාලය තුළ -2015ට කලින්- රුපියල් බිලියන 20,000කට ආසන්න මුදලක් පාඩුවෙලා තිබෙනවා, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි. එතකොට,- [බාධා කිරීමක්] Please, do not disturb me. - [*Interruption.]* No, before 2015, the loss to the EPF was Rs. 9,830 billion and on Treasury Bonds, the loss is Rs. 10 billion.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Treasury Bills or Treasury Bonds?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Treasury Bonds. 2015ට කලින් භාණ්ඩාගාර බිල්පත්වලින් වූ පාඩුව රුපියල් බිලියන 10යි, EPF එකේ පාඩුව රුපියල් බිලියන 9,830යි.

මේ පාඩුව පියවන්නේ කවුද කියලායි මම අහන්නේ. මේ පාඩුව කොහෙන්ද ගන්නේ? ගරු වාසුදේව රාජ්‍ය ඇමතිතුමනි, මේ පාඩුව කොහෙන්ද, ගන්නේ? ඔබතුමා අවංක මන්ත්‍රීවරයෙක්; මම ගරු කරන මන්ත්‍රීවරයෙක්. මට මතකයි, මම ඉස්සෙල්ලාම පාර්ලිමේන්තුවට ආපු දවසේ මම ඔබතුමා දැක්කේ-[බාධා කිරීමක්] මේ පාඩුව කාගෙන්ද අය කරගන්නේ? [බාධා කිරීමක්] ඒක තමයි. 2015න් පසුව අපේ කාලයේ සිදුවුණු පාඩුවක් ගැන කථා කළානේ. Auditor-General, එතුමාගේ වාර්තාවේ කියා තිබෙනවා, අපේ පාලන කාලයේ රුපියල් බිලියන දහයක - Rs. 10 billion - loss එකක් තිබුණා කියලා. හැබැයි, ඔබතුමා දන්නවාද, මේ වාර්තාවේත් - Forensic Audit Report එකේත්- කියා තිබෙනවා, හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් අද කිව්වා, අපේ කාලයේ වුණු පාඩුව මිලියන 1,100යි කියලා. මේ වාර්තාවේ තිබෙනවා, 2015න් පසුව අපේ කාලයේ වුණු පාඩුව ගැන. I can read it out to you. The Report states - this is during our period - "Therefore, it resulted in the minimum value of loss....."

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Minimum?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Yes, minimum. Auditor-General කියපු විධියට Rs. 10 billion නොවෙයි, මිලියන 1,000ක පාඩුවක් ගැන තමයි හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා අද කිව්වේ. It is Rs. 1,000 million. Forensic audit එකෙන් පසුව අපේ කාලයේ වෙච්ච පාඩුව සියයට 90කින් අඩු වෙලා තිබෙනවා.

මම කියන්නේ මේකයි. අපේ කාලයේත් කොහොම හෝ පාඩුවක් වුණා. [බාධා කිරීමක්] හරි. පාඩුවක් හෝ අලාභයක් හෝ වුණා. හැබැයි, මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, අපේ කාලයේ වෙච්ච පාඩුව අපට recover කරන්න පුළුවන් කියන එක. මොකද, අපි - [බාධා කිරීමක්] හරි. පාඩුව හෝ අලාභය හෝ මොකද, - [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව මිනිත්තු පහක කාලයක් ලබා දෙන්න. අපේ කාලයේ වෙච්ච පාඩුව අපට recover කරන්න පුළුවන්. මොකද, අපි ඇලෝසියස්ගේ bank account එක තහනම් කර තිබෙන නිසා. [බාධා කිරීමක්] No. එතැන Rs. 11 billion තිබෙනවා. ඇලෝසියස් මහත්මයාගේ bank account එක අපි seal තබා තිබෙනවා. එතැන බිලියන 11ක් තිබෙනවා. එතකොට අපේ කාලයේ වෙච්ච පාඩුව අපට recover කරන්න පුළුවන්. මම අහන්නේ මේකයි. 2015ට කලින් වෙච්ච පාඩුව වන බිලියන 20,000 කොහෙන්ද recover කරන්නේ? මට ඒ උත්තරය දෙන්න. ආණ්ඩුවට මම කියනවා, ඒ උත්තරය අපට දෙන්න කියලා. කොහොමද ඒ මුදල් recover කරන්නේ?

අනෙක් කාරණය, -[බාධා කිරීමක්] රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන කිව්වා. එතුමා මේ කොමිසමට ගිහින් සාක්ෂි දුන්නා. හැංගුණේ නැහැ නේ. එතුමා කොමිසමට ගිහින් සාක්ෂි දුන්නා. එතුමාට චෝදනාවක් තිබුණා නම්, එතුමා ඒ හැම දිනකම ගිහිල්ලා සාක්ෂි දුන්නා. බටලන්ද කොමිසමටත් ගියා භය නැතුව. බටලන්ද කොමිසමටත් ගිහින් සාක්ෂි දුන්නා, පැනලා ගියේ නැහැ. එතුමා මේ කොමිසමටත් ගියා. එතුමාගේ නම කොහේවත් සඳහන් වෙන්නේ නැහැ. එතුමාගේ සම්බන්ධයක් ගැන කිසිම සාක්ෂියක් නැහැ. මම ඒ ගැනත් කියන්න ඕනෑ.

අපේ කාලයේ වැරදි වෙලා තිබෙනවා නම් නඩු දමන්න. මේ චෝහාරික විගණන වාර්තාවේ - Forensic Audit Report එකේ - අපේ කාලයේ වෙච්ච පාඩුව ගැන සඳහන් කොටස මම ආයෙත් කියවනවා. "Therefore, it resulted in the minimum value of loss ... caused to the Government of Sri Lanka..." කියා මේ වාර්තාවේ සඳහන් කර තිබෙනවා. "Minimum value of loss" කියලා තිබෙන්නේ. බිලියන 10ක පාඩුවක් වුණා කියලා Auditor-General කිව්වාට, එය සියයට 90කින් අඩු කරලා තිබෙනවා. සියයට 90කින් අඩු කරලා, රුපියල් මිලියන 1,100ක් අපේ කාලයේ Treasury Bondsවලින් පාඩු වුණා කියලා තමයි පෙන්වා තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මහා කම්කරු නායකයා නේ. ඔබතුමා ලොකු කම්කරු නායකයෙක් නේ. අර්ථ සාධක අරමුදල අතපත ගානකොට ඔබතුමා මොකක්ද කෙරුවේ? [බාධා කිරීමක්] ඔබතුමා කම්කරු නායකයෙක් නේ. එතකොට ඔබතුමා මොකක්ද කළේ? ඔබතුමා හැම දාම රනිල් වික්‍රමසිංහට බණිනවා. [බාධා කිරීමක්] අර්ථ සාධක අරමුදලේ බිලියන 9,800ක් - [බාධා කිරීමක්] මොකද, නැත්තේ? Forensic Audit Report එක කියවන්න. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා මහ කම්කරු නායකයා. [බාධා කිරීමක්] මහ කම්කරු නායකයා. අර්ථ සාධක අරමුදලේ - it is not million, but billion - රුපියල් බිලියන 9,839ක් මගඩි ගහන කොට, ගරු වාසුදේව රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මොකක්ද කෙරුවේ? මහින්ද රාජපක්ෂගේ කැබිනට් එකේ ඉඳලා අත ඉස්සුවා. [බාධා කිරීමක්]

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, අපේ ආණ්ඩු කාලයේ අපි අර්ථ සාධක අරමුදල ඇල්ලුවේ නැති බව. අපි ඒක ඇල්ලුවේ නැහැ.

අර්ජුන මහේන්ද්‍රන් මහත්මයාට තිබෙන එකම චෝදනාව මොකක්ද? බැඳුම්කර නිකුත් කරන කොට, එතුමා ඉස්සෙල්ලාම මිලියන එකක බැඳුම්කර issue කරන්න කිව්වා. ඒ වාගේ විසි ගුණයක් ඉල්ලුවා. ඔහු වැරැද්දක් කළා. ඒ නිකුත් කළ බැඳුම්කරවලින් ඔහුගේ බෑනාට සියයට 90ක් දුන්නා. ඒකයි එතුමා කරපු වැරැද්ද. එතැනින් අලාභයක් වෙලා තිබෙනවා නම්, ඒක ලබා ගත්තාට ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ වාර්තාව කියනවා, ".... it resulted in the minimum value of loss aggregating to Rs. 6.03 million caused to the Government of Sri Lanka..." කියලා. අවම පාඩුවක් වෙලා තිබෙනවාය කියනවා. ඉතින් ඇත්ත වශයෙන්ම ව්‍යවහාරික විගණන වාර්තාවක් කියලා කියන්නේ උසාවියට ඉදිරිපත් කරන්න පුළුවන් වාර්තාවක්. "Forensic" කියන්නේ ඒකයි. අපි කියන්නේ අපේ කාලයේ වෙච්ච ඒවාටත් නඩු දාන්න, මේකටත් නඩු දාන්න කියලායි. [බාධා කිරීමක්] ඔබතුමා ඒකට විරුද්ධ ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ. නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක තමයි. අපි කියන්නේ, දෙගොල්ලන්ටම නඩු දාලා අවශ්‍ය කටයුතු කරන්න කියලායි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
විගණන වාර්තාවක්- [බාධා කිරීමක්] ලොක්කෙක්ගේ වාර්තාවක් නොවෙයි නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ forensic audit එකෙන් පෙන්වා තිබෙනවා විගණකාධිපති වාර්තාව වැරදියි කියලා. විගණකාධිපති වාර්තාව කිව්වේ අපේ කාලයේ රුපියල් බිලියන 10ක - Rs. 10 billion - loss එකක් කියලායි. නමුත් මේ වාර්තාව ඒක සියයට 90කින් අඩු කරලා Rs. 1 billion loss එකක මට්ටමට ගෙනැල්ලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
It is a classification about the internal condition. -[*Interruption*.]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Give me just one more minute, Sir.

දැන් footnote කල්ලිය ගැන කිව්වා. මම ගරු ශෙහාන් සේනසිංහ ඇමතිතුමාටයි මේ කියන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවාද, footnote කල්ලිය නිකුත් කරපු නිර්දේශය හරි කියලා ජනාධිපති කොමිසම කියලා තිබෙන බව? කියවන්න ඒ වාර්තාව. ඔබතුමා ඒ වාර්තාව කියවලා තිබෙනවාද? වාසුදේව නානායක්කාර ඇමතිතුමා වාගේ නොවෙයි, තරුණ ඇමතිවරයකු විධියට අපේ ශෙහාන් සේමසිංහ මැතිතුමා ඉගෙන ගන්න ආසයි. You agree with me about the footnote "*kalliya*", do you not? ඒක හරි කියලා ඒකේ තිබෙනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා (සංවර්ධන බැංකු හා ණය යෝජනා රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க - அபிவிருத்தி வங்கிகள் மற்றும் கடன் திட்டங்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Development Banking and Loan Schemes)
Footnote කල්ලිය ඔබතුමන්ලාට අවශ්‍ය විධියට කෝප් එකේ ඉඳගෙන ඒ footnotes ටික දාලා ඔබතුමන්ලාට ඕනෑ විධියට වාර්තා නිකුත් කරලා, ඔබතුමන්ලා අද කියනවා, ඒ වාර්තා හරි කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. අපි නොවෙයි කියන්නේ. Presidential Commission එකයි කියන්නේ. කියවන්න, Presidential Commission Report එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, Presidential Commission Report එකේ සඳහන් වෙනවා footnote කල්ලිය ගෙනාපු හැම නිර්දේශයක්ම හරි කියලා. ඒවා කියවන්න. ඒවා කියවන්නේ නැතිව මේ ස්ථානයට ඇවිල්ලා,-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කියෙව්වත්, නැතත් ඒ කාරණය වැරදියි. විගණකාධිපතිගේ වාර්තාවක්,- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මා කියන්නේ, අපේ කාලයේ වැරදි වෙලා තිබෙනවා නම් නඩු දාන්න කියලායි. හැබැයි මම කියනවා, අපේ කාලයේ වෙච්ච පාඩුව recover කරන්න පුළුවන් බව. මොකද, අපි ඇලෝසියස්ගේ සල්ලි freeze කරලා තිබෙන නිසා. බිලියන 11ක් තිබෙන ඔහුගේ account එක seal කරලා තිබෙනවා. ඔබතුමන්ලාගේ කාලයේ වෙච්ච පාඩුව රුපියල් බිලියන 20,000ක් - Rs. 20,000 billion- ඒ රුපියල් බිලියන 20,000 recover කරන්නේ කොහොමද කියලා පෙන්වන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. Shehan Semasinghe. Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Thenuka Vidanagamage to the Chair?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I propose that the Hon. Thenuka Vidanagamage do now take the Chair.

ගරු කංචන විජේසේකර මහතා (තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - தேயிலைக் கைத்தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera- State Minister of Tea Industry Development)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු තේනුක විදානගමගේ මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு தேனுக விதானகமகே அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. THENUKA VIDANAGAMAGE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා.3.59]

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නියමිත කාලයට රෝහිත අබේගුණවර්ධන රාජ්‍ය ඇමතිතුමාගේ මිනිත්තු 4ක කාලයත් එකතු කරන්න.

අද චෝහාරික විගණන වාර්තාව සම්බන්ධයෙන් කථා කෙරෙන මේ වෙලාවේ අදහස් ප්‍රකාශ කිරීමට මටත් අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මට ඉස්සෙල්ලා කථා කළ ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමා, මේ චෝහාරික විගණන වාර්තාව සම්බන්ධයෙන් සහ එයින් සොයා ගත් කරුණු සම්බන්ධයෙන් කථා කළා. මේ අනුව සම්පූර්ණ අලාභයක් හැටියට පෙන්වනවා රුපියල් බිලියන 20ක මුදලක්. ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමනි, රුපියල් බිලියන 20ක මුදල පෙන්වන්නේ, 2002 අවුරුද්දේ සිට 2016 මාර්තු දක්වා. 2002 අවුරුද්දේ ඉඳලා 2016 මාර්තු දක්වා සම්පූර්ණ රුපියල් බිලියන 20ක අලාභයක් සම්බන්ධයෙන් මේ චෝහාරික විගණන වාර්තාව පෙන්වනවා. බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002-2004 කාල පරිච්ඡේදය තුළ තොරතුරු හොයා ගන්න නැහැ. ඒ කියන්නේ, අවුරුදු තුනක කාල පරිච්ඡේදයක තොරතුරු හොයා ගන්න නැහැ කියන එකයි. 2002 සිට 2016 මාර්තු දක්වා කාල පරිච්ඡේදය තුළ රුපියල් බිලියන 20ක අලාභයක් වෙනවා.

2002-2005 දක්වා කාලයට අදාළ තොරතුරු කොහේවත් වාර්තා කරලා නැහැ. 2002-2005 දක්වා කාලයේ කාගේ ආණ්ඩුවක් ද තිබුණේ? ඒ කාලයේ තිබුණේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්. ඊළඟට, මේ වාර්තාවේ ඉතා පැහැදිලිව පෙන්වනවා, 2002 සිට 2015 දක්වා අලාභය රුපියල් බිලියන 10.4යි කියලා. මෙහි රුපියල් බිලියන 10.4ක අලාභයක් පෙන්වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 පෙබරවාරි මාසයේ 27වැනි දා ඉඳලා 2016 මාර්තු මාසය දක්වා අවුරුද්දකට ආසන්න කාලයක් තුළ පාඩුව රුපියල් බිලියන 9.7යි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සංඛ්‍යා ලේඛන හරි. හැබැයි, ඔබතුමාගේ සංඛ්‍යා ලේඛනවල කාල පරිච්ඡේදය මොකක්ද කියලා බලන්න. ඔබතුමන්ලා පාලනය කරපු අවුරුද්දකුත් මාසයකට ආසන්න කාලය තුළ අලාභය ගත්තොත් රුපියල් බිලියන 9.7යි. මේ බැඳුම්කර වංචා සිද්ධ වුණු සෑම අවස්ථාවකම ඒකට නායකත්වය අරගෙන තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විතරක් නොවෙයි. එම කාලවල අග්‍රාමාත්‍යවරයා හැටියට කටයුතු කරලා තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ මැතිතුමායි. 2002-2005 කාලය තුළත් එහෙමයි. මේ විගණනය සිදු වුණු 2015-2016 කාල පරිච්ඡේදය තුළත් එහෙමයි. එතකොට අපට උපකල්පනය කරන්න වෙන්නේ මැතිවරණයක් ආසන්න වෙද්දී එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව මෙහෙයවුවා නම්, ඒ මැතිවරණය මෙහෙයවීමට මේ රටේ බැඳුම්කර නිකුතුවක් කරලා, මහා වංචාවක් කරලා ඒ මුදල් එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයන් අතර බෙදා ගත්තා කියලායි. මේ ක්‍රමය තමයි 2005 ජනාධිපතිවරණයට මුදල් සොයා ගැනීම සඳහා එක්සත් ජාතික පක්ෂය භාවිත කළේ. ඒ වාගේම, 2015 මහා මැතිවරණය සඳහා තමන්ගේ අපේක්ෂකයන්ට, සංවිධායකයන්ට මුදල් ලබා දීමට කටයුතු කළේ මේ මහා බැඳුම්කර වංචාවෙන්. වංචාවක් කරපු අය ඒ වංචාව සම්බන්ධයෙන් විගණනය කරන්නේ නැතිව වෙනත් කාල පරිච්ඡේද සම්බන්ධයෙන් විගණනය කිරීම ගැන අපි පුදුම වෙනවා. හැබැයි, ඕනෑම සොයා ගැනීමක් තිබෙනවා නම්, ඒ කාරණා සම්බන්ධයෙන් නීතිය හමුවේ කටයුතු කිරීමට අපේ ආණ්ඩුව පසු බට වෙන්නේ නැහැ. මොන ආණ්ඩුවක් යටතේ, මොන නිලධාරින් යටතේ එය සිදු වුණා ද කියන කාරණාවත් අපට අදාළ වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි බැඳුම්කර වංචාව සිදු වන්නේ 2015 පෙබරවාරි මාසයේ 27වැනි දින. ඊළඟට, දෙවැනි බැඳුම්කර වංචාව සිදු වන්නේ 2016 වර්ෂයේ. ඒ වංචාව සිදු වෙන්නේ ඉතාම සංවිධානාත්මකවයි, ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි. මම මීට කලින් මේ ගැන පාර්ලිමේන්තුව තුළ ප්‍රකාශ කරලා තිබෙනවා. මුදල් ඇමතිවරයාට මහ බැංකුව අයත් නොවන්නේ කොහොමද? මුදල් ඇමතිවරයාට අයත් නොවන මහ බැංකුව හදිසියේම අග්‍රාමාත්‍යතුමා යටතට ගැසට් කරනවා. එතැනදී තමයි ඒ මහා පරිමාණ වංචාව සිදු වන්නේ. ඒ අය breakfast meeting එකක් පැවැත්වුවා. එතැනදී තමයි සැලසුම් කළේ. ඒකට එක්සත් ජාතික පක්ෂයේ සභාපතිතුමා ආවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා ඒ meeting එකට ඔබතුමා සම්බන්ධ වුණේ නැහැ කියලා. මලික් සමරවික්‍රම මැතිතුමා සම්බන්ධ වුණා. මම ප්‍රශ්න කරන කොට එතුමා කිව්වා, එවකට එතුමා මන්ත්‍රීවරයකු හැටියට පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ, එතුමා සහභාගි වුණේ අගමැතිතුමාගේ උපදේශකවරයකු හැටියටයි කියලා. කබීර් හෂීම් හිටපු ඇමතිතුමාත් ඒ රැස්වීමට සම්බන්ධ වුණා. ඒ වාගේම, මහ බැංකුවේ මේ හොරකම මෙහෙයවපු මහ බැංකු අධිපතිවරයාත් සම්බන්ධ වුණා. එතැනදී තමයි පළමුවැනි හොරකම සම්බන්ධයෙන් සැලැස්ම ක්‍රියාත්මක වුණේ. ඒ සම්බන්ධයෙන් මෙම විගණන වාර්තාව තුළ සඳහනක් වෙන්නේ නැහැ. මේවා බරපතළ කාරණා.

2015 අවුරුද්දේ ස්ථාවර ආණ්ඩුවක් බිහි වුණේ නැහැ; ආර්ථික ස්ථාවරත්වයක් මේ රට තුළ තිබුණේ නැහැ; දේශපාලන ස්ථාවරත්වයක් මේ රට තුළ තිබුණේ නැහැ. එහෙම ස්ථාවරත්වයක් නොමැතිව, අස්ථාවර ආණ්ඩුවක්, අස්ථාවර ආර්ථිකයක්, අස්ථාවර රජයක් යටතේ අවුරුදු තිහකට බැඳුම්කර නිකුතුවක් කිරීමට තීන්දු කරනවා. කිසිම රටක ස්ථාවරත්වයක්

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

නැතිව අවුරුදු 30කට බැඳුම්කර නිකුතුවක් සිදු වෙලා නැහැ. මෙන්න මේවා තමයි මේ වංචාවට සාධක වුණු කාරණා. දේශපාලන ස්ථාවරත්වයකුත් නැතිව, ආර්ථික ස්ථාවරත්වයකුත් නැතිව, අස්ථාවර රජයක්, අස්ථාවර ආර්ථිකයක් තුළ අවුරුදු 30කට බැඳුම්කර නිකුතුවක් කිරීමට ආණ්ඩුව තීන්දු කරනවා. එහිදී සාමාන්‍ය පොලිය වන සියයට 9.5 සියයට 12 දක්වා වැඩි කරනවා. එයින් සියයට 2.5ක අමතර අලාභයක් සිදු වෙනවා. අවුරුදු 30ක් දක්වා එමඟින් බලපෑමක් සිදු වෙනවා. මේ විධියට තමයි එක්සත් ජාතික පක්ෂය මැදිහත් වෙලා හොරකම් කරගෙන ගියේ.

සෘජු නිකුතුව සම්බන්ධයෙන් සහ වෙන්දේසි ක්‍රමය යටතේ බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔබතුමන්ලා නිතරම කථා කළා. Direct Placement System එක හොඳ නැහැ, එහිදී වංචාවක් සිදු වෙනවා කියලා කිව්වා. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ auction කිරීමට තීන්දු කළා. Auction ක්‍රමය යටතේ මේ හොරකම සිදු වුණේ නැහැ කියලා කිව්වා. අපි පැහැදිලිව කියනවා, ඔබතුමන්ලා මේ Auction System එක හඳුන්වා දීලා ක්‍රියාත්මක කළේ බැඳුම්කර වංචාව හරහා මේ ධනස්කන්ධය සූරාගෙන කන්නයි කියලා. තමුන්නාන්සේලාගේ දේශපාලන පැවැත්ම සඳහා තමයි මේ සූරාකෑම කරන්න එක්සත් ජාතික පක්ෂය විසින් Direct Placement System එක අයින් කරලා Auction System එක අරගෙන එන්නේ. ඉතා පැහැදිලිව මේ Forensic Audit Report එකේ 5.6.11 යටතේ කියනවා, පිළිගත් වගවිභාගයකින් තොරව තමයි සෘජු නිකුතුව අයින් කරලා Auction System එක අරගෙන එන්නේ කියලා. මේකත් බරපතළ කාරණාවක්. එක්සත් ජාතික පක්ෂයේ කුණු ටික හෝදා ගන්න ඔබතුමන්ලාම කරපු Forensic Audit Report එකේ 5.6.11 යටතේ කියනවා, පිළිගත් ක්‍රමවේදයක් යටතේ නොවෙයි මේ Direct Placement System එක අයින් කරලා තිබෙන්නේ කියලා. එතැනින් එහාට මේ පිළිබඳව කථා කරන්නේ මොනවාද? ඔබතුමන්ලාට කිසිම අවස්ථාවක එය තහවුරු කරන්න බැහැ. එය ඉතාම පැහැදිලියි. No. 5.6.11 of the Report states that the Governor has acted inappropriately to cancel the Direct Placements without a proper study on the pros and cons of the Direct Placements. මොකක්ද මේ සිදු වී තිබෙන්නේ? සිතා මතාම මහා වංචාවක් වෙනුවෙන් මේ මහ බැංකු බැඳුම්කර නිකුතුව සිදු කර තිබෙනවා.

අපේ රටේ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය මොකක්ද? අපේ රටේ විගණකාධිපතිවරයා සම්බන්ධයෙන් මේ රටේ ජනතාව සහ රජය තබන විශ්වාසයට මොකද වෙන්නේ? 2018 අවුරුද්දේ විගණකාධිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය පඩි-නඩි ගෙවා එය පවත්වාගෙන යෑම සඳහා ආණ්ඩුව විසින් රුපියල් මිලියන 1464ක් වෙන් කළා. 2018 අවුරුද්දට රුපියල් මිලියන 1464ක් වෙන් කළා. හැබැයි, එක්සත් ජාතික පක්ෂයේ කුණු හෝදන්න කරපු මේ forensic audit එකට; ඒ blacklist වෙච්ච සමාගම් විසින් කළ forensic audit එකට; ඉන්දියාවේදී කරනවාය කියලා ලංකාවේදීම කරපු forensic audit එකට, - ඉන්දියානු සමාගමකට ලබාදුන්නාට මේ forensic audit එක සිදුවන්නේ ලංකාවේ ඒ ආයතනවලදී - මේ ආයතනයට පමණක් මාස 7ක් සේවකයෝ 30කට රුපියල් මිලියන 275ක මුදලක් වෙන් කරනවා. කොහොමද මේ forensic audit එක සාධාරණව සිදු වුණා කියලා කියන්නේ? අපට මේ ව්‍යවහාරික විගණන වාර්තාව සිදු කළ ආකාරය පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. මෙය සිදු කළේ එක්සත් ජාතික පක්ෂයේ කුණු හෝදන්න කියන කාරණාව ගැනත් ඕනෑවටත් වඩා සාක්ෂි අද වනවිට රට තුළ තිබෙනවා. හැබැයි යම් කණ්ඩායමක් වංචාවකට සම්බන්ධ වෙලා ඉන්නවා නම් ඒ අයට දඬුවම් දෙන්න ඕනෑ. ඒ සඳහා අපි රජයක් හැටියට මූලිකත්වය ගන්නවා. අපි තමුන්නාන්සේලා වාගේ දේශපාලන වශයෙන් තෝරාගත් එක එක්කෙනාට දඬුවම් කරන්න සූදානම් නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කඩා වැටෙන්න මූලික හේතුව තමයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පොලීසියට දුන් target එක. පොලීසියට දීපු target එක මොකක්ද? රාජපක්ෂවරු සිරගත කරන්න පොලීසියට target එකක් දුන්නා. ආණ්ඩුවක් විසින් දේශපාලන වශයෙන් විරුද්ධ මත දරන අය දඬයම් කරන්න පොලීසියට target එකක් දෙන බව පළමුවැනි වතාවට තමයි අපි ඇහුවේ. පොලීසිය රාජපක්ෂවරු දඬයම් කරන target එකේ යනවා, පොලීසිය කොතෙක් දුරට ආණ්ඩුව දීපු target එකට ගියාද කියලා ආණ්ඩුව පරීක්ෂා කරනවා; නිරීක්ෂණය කරනවා. එතකොට රට සමස්තයක් හැටියට කඩා වැටෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙහෙයවපු මේ රටේ සියයට 6.8ක් වුණු සමස්ත ආර්ථිකය, සියයට 1.6ක් දක්වා වැටෙන්න මූලිකම හේතුව වුණේ මොකක්ද? අද මේ රටේ ජනතාවට ආර්ථික ගැටලුවක් නිර්මාණය වුණේ, තුන්වේලක් කාපු ජනතාවට අද තනි වේලකුත් අමාරුවෙන් කන පරිසරයක් මේ රට තුළ 2019 අවුරුද්ද වෙද්දී නිර්මාණය වෙන්න ප්‍රධාන හේතුව වුණේ මේ බැඳුම්කර ගනුදෙනුවේදී සිදුවුණු වංචාවයි. මේ නිසා තමයි ව්‍යාපාර කඩා වැටුණේ. පාර අයිනේ බුලත් විඩ විකුණන පෙට්ටි කඩය කළ ව්‍යාපාරිකයාගේ පවා ආර්ථිකය කඩා වැටුණා. තේ කඩයක් කළ පුද්ගලයාගේ පවා ආර්ථිකය කඩා වැටුණා.

තමුන්නාන්සේලා වැටුප් වැඩි කිරීම ගැන කථා කළා. තමුන්නාන්සේලා වැටුප් වැඩි කිරීම ගැන කථා කළාට අනෙක් පැත්තෙන් මේ රටේ පෞද්ගලික සහ රාජ්‍ය ආයතනවල වැඩ කරන සේවකයන්ගේ මිලදී ගන්න පුළුවන් හැකියාව ක්‍රමානුකූලව පහත වැටෙනවා. ඔවුන්ගේ භාණ්ඩ හා සේවා මිලදී ගන්න පුළුවන් ප්‍රමාණය සියයට 6ක් දක්වා පහත වැටෙනවා. මේ ඔබතුමන්ලාගේ කාලයේ මහ බැංකුව විසින් ලබා දුන් වාර්තා. ඒ නිසා මේ සිදු කළ බරපතළ අපරාධය සම්බන්ධයෙන් අපේ රටේ ජනතාව ඉදිරියට පවත්වනු ලබන සෑම මැතිවරණයකදීම එක්සත් ජාතික පක්ෂයට දඬුවම් දෙනවා.

තමුන්නාන්සේලා 2015දී බොරු කියලා ආණ්ඩුවක් අරගත්තා. තමුන්නාන්සේලා 2015 අගෝස්තු මාසයේ කුමන්ත්‍රණකාරීව ආණ්ඩුවක් පිහිටෙව්වා. හැබැයි, තමුන්නාන්සේලා 2015 අගෝස්තු මාසයේ පිහිටුවපු ආණ්ඩුවට 2018 වෙද්දි ආපහු ජන වරමක් ගන්න බැරි වුණා, කිරිඇල්ල මන්ත්‍රීතුමනි. අවුරුදු දෙකහමාරක් තමුන්නාන්සේලා රට බලහත්කාරයෙන් පාලනය කළා; අවිධිමත්ව රට පාලනය කළා; පළි ගනිමින්, හොරකමින් රට පාලනය කළා. අඩුම තරමින් මේ රටේ ජනතාවට සර්වජන ඡන්ද අයිතියවත් දුන්නේ නැහැ. පළාත් පාලන ආයතනයට තමන්ගේ නියෝජිතයා පත් කර ගන්න ජනතාවට අවුරුදු දෙකහමාරක් බලාගෙන ඉන්න වුණා. එක්සත් ජාතික පක්ෂය COPE එකට තමන්ගේ නියෝජිතයෝ පත් කළා. හැබැයි, එලෙස නියෝජිතයෝ පත් කළාට විටින් විට ඕනෑ අය අස් කර ගත්තා, විටින් විට ඕනෑ අය පත් කළා. හිටපු සමහර ඇමතිවරු පොත් ලිව්වා, "බැඳුම්කරයේ ඇත්ත නැත්ත" කියලා. ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, මේ බැඳුම්කරය සම්බන්ධයෙන් සිදු වූ දේවල්.

ඊ ළඟට, COPE එක ක්‍රියාත්මක වෙද්දි, COPE එකේ විමර්ශනය සිදුවෙද්දි එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයන් අර්ජුන් අලෝසියස්, අර්ජුන මහේන්ද්‍රන් එක්ක සංවාද පවත්වනවා අපි දැක්කා. මේ කවුරුවත් මේ වාර්තාව එළියට දමන්න සහයෝගය දුන්නේ නැහැ. අද මේ Forensic Audit Report එක වෙනුවෙන් කථා කරන එක්සත් ජාතික පක්ෂය ඩිව් ගුණසේකර වාර්තාව එළියට දමනකොට ගිහිල්ලා නඩු දැම්මා; එම වාර්තාව සභාගත කිරීමට විරුද්ධව නඩු දැම්මා. ඒ විතරක් නොවෙයි.

2015දී හිටපු ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැර පාර්ලිමේන්තු මැතිවරණය සඳහා යන්නට පාදක වූ කාරණාව තමයි රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම ආරක්ෂා කරගැනීම. එතුමා ප්‍රසිද්ධියේ ඒක කිව්වා. එවැනි තත්ත්වයකට මේ රට පත් වුණේ ඇයි? හොරකමක් වුණේ නැත්නම්, වංචාවක් සිදු වුණේ නැත්නම්, වංචාවක් සිදු වුණේ නැහැයි කියලා කියන්න පුළුවන් නම්, අගමැතිවරයා සහ ආණ්ඩුව බේරාගන්න පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ ඇයි? එම නිසා එක්සත් ජාතික පක්ෂයට මේ හරහා තමන්ගේ කුණු ටික හෝදා ගන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
EPF එකේ පාඩුව?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමනි, EPF එක විතරක් නොවෙයි. අපේ රටේ ඕනෑම රාජ්‍ය ආයතනයක වංචාවක් සිදුවෙලා තිබෙනවා නම්, ඒ වංචාව සොයා බලා අදාළ කණ්ඩායම්වලට දඬුවම් දෙන්න අපේ ආණ්ඩුව පසුබට වෙන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණු කාලයේ තමුන්නාන්සේලා එලෙස දඬුවම් දෙන්න පෙරමුණ ගත්තේ නැහැ. ඔබතුමන්ලා රාජපක්ෂවරුන්ට දඬුවම් කරන්න පෙරමුණ ගත් විධියට හොරුන්ට දඬුවම් කරන්නත් පෙරමුණ ගත්තා නම්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කඩා වැටෙන්නේත් නැහැ, තමුන්නාන්සේලාට මේ තරම් බොරුවක් කරන්න ඕනෑ වෙන්නේත් නැහැ. ජෝන් අමරතුංග වැනි හිටපු ඇමතිතුමන්ලා කීප සැරයක්ම ඔය වෙනුවෙන් පෙනී සිටියා. හැබැයි, තමුන්නාන්සේලාට ඒක කරන්න බැරි වුණා. ඒ ඇයි? එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පාලනය වුණේ kitchen Cabinet එකකින්. ආණ්ඩුව පාලනය කරන සමහර අය අඩුම ගණනේ පාර්ලිමේන්තුවේවත් සිටියේ නැහැ.

මේ වෝහාරික විගණන වාර්තාව හරහා යම් යම් කරුණු හෙළිදරව් වෙලා තිබෙනවා. අපි ඒක නැහැයි කියන්නේ නැහැ. ඒවා පක්ෂග්‍රාහී කරුණුය කියන එක ගැනයි අපි මේ කථා කරන්නේ. හැබැයි, ඒකත් අපට අදාළ වෙන්නේ නැහැ. බැඳුම්කර මගඩියට සම්බන්ධ වූ කණ්ඩායම්වලට මේ රටේ නීති පද්ධතිය තුළින් දඬුවම් කිරීම අනිවාර්යයෙන්ම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ සිදු වෙනවාමයි. ඒ නිසා ඒ විමර්ශන කටයුතු සිදු කරද්දී ඒකට සම්බන්ධ වූ අය, දුරකථන ඇමතුම් ලබා ගත් අය, ජනාධිපති කොමිසමේදී තමන්ට ඕනෑ විධියට ප්‍රශ්න අහගත් අය, පොත් ලියපු අය, බැඳුම්කර හොරු එක්ක email ගනුදෙනු කරපු අය, ජංගම දුරකථනයෙන් කථා කරපු අය, WhatsApp දුරකථන පණිවුඩ ගත් අය, ස්ථාවර දුරකථන පණිවුඩ ගත් අය ඇතුළු මේ සියලුදෙනාටම ඉදිරියේ දී රටේ නීතිය හමුවට පැමිණ දඬුවම් විඳින්න සිදු වෙයි. දැන් තමුන්නාන්නේසේලාට ජනතා අධිකරණයෙන් දඬුවම් දීලා තිබෙනවා. හැබැයි, මේ රටේ පවතින නීති පද්ධතිය තුළ ඒ සියලුදෙනාම දඬුවම් ලැබිය යුතුයි. ඒකයි අපි කියන්නේ. ඒ ගැන තමුන්නාන්සේලා කලබල වන්න එපා. මේ බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ යුගයේ සිදු වූ දේවල්වලටත් දඬුවම් විඳින්න සිදු වෙයි, ඊට පෙර කාලවල යම් යම් අක්‍රමිකතා සිදුවෙලා තිබෙනවා නම්, ඒ කණ්ඩායම්වලටත් දඬුවම් විඳින්න සිදු වෙයි.

හැබැයි අපි ඉතාම පැහැදිලිව කියනවා, සැලසුම් සහගතව වංචාවක් සිදු වීමයි, ගනුදෙනුවක් සිදු කරලා අලාභයක් සිදුවීමයි අතර වෙනසක් තිබෙන බව. හැබැයි, අලාභයක් සිදුවෙලා තිබෙන යම් තැනක වංචාවක් සිදු වෙලා තිබෙනවා නම්, අපි ඒ ගැනත් පරීක්ෂණ කරනවා. ඒ ගැන කිසිදු සැකයක් නැහැ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට දුන් ජන වරමත්, ඊළඟ අප්‍රේල් මාසයේ පවත්වන මහ මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ අගමැතිතුමාට ලැබෙන ජන වරමත්, මෙන්න මේ සියලු හොරකම්වලට දඬුවම් දෙන්න සහ ඒ සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණ කරන්න අවශ්‍ය ජන වරමක්. ඒ වාගේම මේ බැඳුම්කර වංචාවේදී footnotes ගහපු අය, phone calls දීපු අය, පොත් ලියපු අය, වාර්තා එළියට දමන්න එපා කියලා උසාවි ගිය අය කවුරුත් අද මේ සභාව තුළ අපි දකින්නේ නැහැ. හොරකම් කරලා, ඒ සල්ලි ටික තමන්ගේ මැතිවරණ ව්‍යාපාරයට බෙදා ගත්ත අය ඉන්නවා මීසක්, ඒ හොරකම සැලසුම් කරලා, හොරකම කරලා, ආර්ථිකය කඩා බිඳ දමන්න සෘජුව සම්බන්ධ වූ එක්සත් ජාතික පක්ෂයේ කිසිම කෙනෙකු මේ ගරු සභාව තුළ අද ඇත්තේ නැහැ.

එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ සමඟ එකතු වෙලා අපේ ආණ්ඩුව විවේචනය කරන්න යෝජනාවක් අරගෙන ආවාම, අඩුම ගණනේ ඒ හොරකමට සම්බන්ධ වූ අය මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉඳීවි කියලා අප හිතුවා. වාහන ගෙනාවේ නැති අය නැඟිට නැඟිට කිව්වා, "අප වාහන ගෙනාවේ නැහැ" කියලා. දැන් වැරැද්ද මොකක්ද? වාහන ගෙනාපු කාරණය නොවෙයි එතුමන්ලා කියන්නේ. ඒ වාහන සම්බන්ධයෙන් නිවේදනය කළ ප්‍රවෘත්ති නාළිකාවට විරුද්ධව තමයි ඒ සියලුදෙනා අද කථා කළේ. හොරකමක් කළේ නැත්නම්, ඒ හොරකමට සම්බන්ධත් නැහැ කියලා හෘදය සාක්ෂියට අනුව විශ්වාස නම්, -චෝදනා ලබපු අයගේ නම් මා කියන්න කැමති නැහැ.- එම චෝදනා ලබපු අය මේ ගරු සභා ගැබ තුළ අද රැඳී සිටීම ඉතාම වැදගත් වනවා. හැබැයි, ඒක අද සිදුවෙලා නැහැ.

මා මීට වඩා කථා කරන්නේ නැහැ. මේ වෝහාරික විගණන වාර්තාව සම්බන්ධයෙන් අපට කිසිම විශ්වාසයක් නැහැ. අප එම වෝහාරික විගණන වාර්තාව පිළිගන්න සූදානම් නැහැ. හැබැයි, විගණකාධිපතිතුමා විසින් නැවතත් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා, සත්‍ය තොරතුරු රට හමුවේ හෙළිදරව් කිරීම ඉතාම වැදගත් වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.16]

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප මේ පාර්ලිමේන්තුවේ විවාද කරන්නේ අතිශය වැදගත් කාරණයක් පිළිබඳවයි. අප සියලු

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

දෙනාම දන්නවා, මේ දූෂණය කියන එක මේ රටේ පළමුවැනි පාර්ලිමේන්තුව ආරම්භ වූ කාලයේ ඉඳලාම තිබුණු දෙයක් බව. විවිධාකාරයේ දූෂණ තිබෙනවා. කෙළින්ම, මුල්‍ය දූෂණ තිබෙනවා. රජයේ කිසියම් වැඩක් කර ගන්න ගියාම, බලපත්‍රයක් ගන්න ගියාම, කිසියම් මුදලකට ඒක හුවමාරු වනවා. ඊළඟට, ව්‍යාපාරිකයන් යම් යම් සංවර්ධන කටයුතු කරලා, ලාභාංශවලින් කොටස් යම් යම් ආකාරවලට ලබා දෙන දූෂණ තිබෙනවා. ඒවා, සෘජු මූල්‍ය දූෂණ.

ඊළඟට, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පිට පැනලා යම් යම් දෑ සිදු කරනකොට තෝරාගත් අයට පමණක් ඒ කොන්ත්‍රාත් ලබා දෙනවා. එතකොට ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කළමනාකරණ දූෂණ පවතිනවා. සාමාන්‍යයෙන් මේ රටේ විගණකාධිපතිවරයා විසින් විමර්ශනයට ලක් කරන්නේ අන්න ඒ ආකාරයේ ප්‍රසම්පාදනයේ පවතින දූෂණ පමණයි. හැබැයි, මේ රටේ ඉතාම බරපතළ ගැටලුව තමයි, මේ තිබෙන තාක්ෂණික දූෂණය. ඒ කියන්නේ, සාමාන්‍යයෙන් විගණකාධිපතිවරයාට, විගණනයේ නියැලී සිටින ගණකාධිකාරිවරුන්ට තමන්ගේ විශේෂඥතාවක් නැති ක්ෂේත්‍රයක් පිළිබඳව ඇති වන දැවැන්ත දූෂණ තමයි "තාක්ෂණික දූෂණ" කියලා අප හඳුනා ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ පැවති තාක්ෂණික දූෂණ පිළිබඳව මම "බලය සහ බලය" නමින් කෘතියක්ද ලියා තිබෙනවා. මේ රටේ විගණකාධිපතිටවත්, එහෙම නැත්නම් ඒ ක්ෂේත්‍රයට අදාළ නොවන අනිකුත් ක්ෂේත්‍රවලටවත් ඒ වංචා හෙළිදරව් කර ගැනීමට නොහැකි වෙලා තිබෙනවා. ඒ නිසා මේ වෝහාරික විගණන වාර්තාව අතිශය වැදගත්. මේ රටේ සිදු වෙමින් පැවතුණු බලගතු තාක්ෂණික දූෂණයක් හෙළිදරව් කළ වාර්තාවක් හැටියට මේ වෝහාරික විගණන වාර්තාව අප හඳුනා ගන්නවා.

මෙහි කොටස් දෙකක් තිබෙනවා. එක් කොටසක් තමයි, සේවක අර්ථසාධක අරමුදල, නැත්නම් වැඩ කරන ජනතාවගේ අරමුදල. ඒක "රජයේ අරමුදලක්" කියලා සමහරු හඳුන්වා තිබෙනවා. ඒක රජයේ අරමුදලක් නොවෙයි. එය ලක්ෂ 26ක පිරිසකට අයිති, ලක්ෂ 186ක ගිණුම් තිබෙන, වැඩ කරන ජනතාවගේ අරමුදලක්. ඒ නිසා සේවක අර්ථසාධක අරමුදලට යම්කිසි පාඩුවක් වනවා නම් ඒ පාඩුව වෙන්නේ වැඩ කරන ජනතාවට මිසක් රජයට නොවෙයි. මේ සේවක අර්ථසාධක අරමුදල හා ප්‍රාථමික ගැනුම්කරුවන් මැදිහත් වෙලා සිදු කරන ලද බැඳුම්කර ක්‍රියාදාමය පිළිබඳවත් විධිමත් අධ්‍යයනයක් මේ වාර්තාව තුළ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ බැඳුම්කර මඟින් රජයට අවශ්‍ය මුදල් සම්පාදනය කිරීම ආරම්භ වුණේ 1998 වසරේ ඉඳලායි. 1998 ඉඳලා ඇති වූ මේ ක්‍රියාවලිය අද තිබෙන තත්ත්වයත් එක්ක ගත්තාම, ඉතාම පොඩියට, සරලව සිදු වෙමින් පැවතුණු දෙයක්. මේ වෝහාරික විගණන වාර්තාවේ පෙන්වා දීලා තිබෙනවා, 2002 - 2004 කාලයේදී පවා මේ වාර්තාවට විගණනය කර ගැනීමට අවශ්‍ය ප්‍රමාණයටවත් තොරතුරු හරිහමන් ආකාරයට මහ බැංකුවේ නිලධාරින් පවත්වාගෙන ගියේ නැහැ කියලා. ඒ අනුව මුල් කාලයේදී එතරම් බරපතළ ප්‍රශ්නයක් තිබුණේ නැති බව අපට පෙනී යනවා. හැබැයි, 2008 සිට මේ බැඳුම්කර නිකුත් කිරීම මහා පරිමාණයෙන් රටට මුදල් උපයන, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට මුදල් සපයන ප්‍රධානම ක්‍රියාවලිය බවට පරිවර්තනය වුණා. ඒ පැත්තෙන් බැලුවාම, මේ වෝහාරික විගණන වාර්තාව අපට ඉතාම වැදගත් වනවා.

මේ වෝහාරික විගණන වාර්තාව හදපු ආයතන ගැන, ඒ අයගේ පැටිකිරිය ගැන අද සමහරු නොයෙක් කථා කියනවා. විශේෂයෙන්ම, මේ වෝහාරික විගණන වාර්තාව සකස් කළ KPMG ආයතනය ලෝකයේ තිබෙන විශාලතම ආයතන හතරෙන් එකක්, one of the Big Four. එහි මූලස්ථානයක් ඇමෙරිකා එක්සත් ජනපදයේ තිබෙනවා. ඊළඟට, BDO ආයතනය යුරෝපා සම්භවයක් සහිත ආයතනයක්. එය ලෝකයේ තිබෙන පස්වැනි විශාලතම විගණන ආයතනයයි. ඒ නිසා මේ විගණන ආයතනවල පැටිකිරිය සහ ඒවා කවර ගණයේ විගණන ආයතන ද කියා පෙන්වා දීමට උත්සාහ දැරීම තරම් විහිළුවක් තවත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වෝහාරික විගණන වාර්තාවෙන් වැදගත් කරුණු කීපයක් පෙන්වා දීලා තිබෙනවා. ඉන් පළමුවැන්න මෙයයි. මේ රටේ, ණය ආයෝජනය කරලා, ඒ ආයෝජනය කරන ණයවලින් යම් යම් දූෂණ සිදුවීම ගැන විතරයි අපි මෙපමණ කාලයක් අහලා තිබුණේ. නමුත්, අද මෙම වාර්තාව මඟින් ණය ලබා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳවත් එළිදරව් වෙලා තිබෙනවා. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මඟින් රජයේ අවශ්‍යතාවලට අවශ්‍ය කරන අරමුදල් සම්පාදනය කිරීමේදීත් දූෂණ සිදු වෙලා තිබෙනවාය කියන එක මේ වාර්තාවෙන් පෙන්වා දීලා තිබෙනවා.

මෙම වාර්තාවෙන් පෙන්වා දීලා තිබෙන ඉතාම වැදගත් කාරණය මේකයි. 2015 - 2016 කාලයේ මේ රටේ ජනතාව හඬ නඟපු එකම දෙය මොකක්ද?. ඒක බොරුවක් නොවෙයි. ඒක තමයි, 2015 පෙබරවාරි 27වන දාත්, 2016 මාර්තු 28වන දාත් මහ දවල් මහ බැංකුව කොල්ල කෑවාය කියන එක. මෙහි 4වැනි වාර්තාවේ ඒ පිළිබඳ විශේෂ කරුණු තිබෙනවා. මේ වෝහාරික විගණන වාර්තාවේ සමස්තය අරගෙන බැලුවාම, ඒ තුළින් අපට පෙන්වා දීලා තිබෙන්නේ මොකක්ද? මේක හුදෙකලා සිදුවීමක් නොවෙයි කියන එකයි ඔවුන් පෙන්වා දීලා තිබෙන්නේ. 2015 - 2016 කාලයේ වූ මේ සිදුවීම් දෙක හුදෙකලාව සිද්ධ වූ ඒවා නොවෙයි. 2008 වර්ෂයේ සිටම ලංකාවේ මේ ක්‍රියාදාමය සිද්ධ වෙලා තිබෙනවාය කියන එක මේ වාර්තාවේ බොහොම පැහැදිලිව පෙන්වා දීලා තිබෙනවා. ඒවා සිදු වූ ආකාරය පිළිබඳවත් මේ වාර්තාවෙන් පෙන්වා දීලා තිබෙනවා. මෙතැනදී, සේවක අර්ථසාධක අරමුදල -වැඩ කරන ජනතාවගේ අරමුදල- තමයි මේ අයගේ මහා නිධානය හැටියට යොදාගෙන තිබෙන්නේ. 2008 වර්ෂයේ සිට, රටේ පොලී අනුපාත පාලනය කරන්න, වැඩ කරන ජනතාවට ලැබෙන්න ඕනෑ ප්‍රතිදානය ලබා නොදී ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය විධියට පොලී අනුපාත කෘත්‍රිමව පවත්වාගෙන යන්න සේවක අර්ථසාධක අරමුදල යොදා ගත්තා. 2011 වර්ෂයේ ඉඳලා ප්‍රාථමික ගැනුම්කරුවන්ගේ ද්විතීයික වෙළෙඳ පොළෙන් මේවා මිලදී ගැනීමට සේවක අර්ථසාධක අරමුදල යොදා ගත්තා.

මෙතැනදී සමහර අය අහන ප්‍රශ්නයක් තිබෙනවා. ඒක තමයි, පාඩුවක් වුණා, වංචාවක් වුණේ නැහැ කියන එක. පාඩුව සහ වංචාව අතර වෙනස මොකක්ද? යම් කෙනෙක් චේතනාන්විතව පාඩුවක් කරලා, ඒකෙන් වෙනත් පිරිසකට ලාභයක් -වාසියක්- වෙන විධියට ක්‍රියාදාම අනුගමනය කරනවා නම්, ඒක හුදු පාඩුවක් නොවෙයි, පැහැදිලිවම වංචාවක්. 2003 - 2011 කාලයේදී, මහ බැංකුවේ එවකට සිටි අධිපතිවරයා, මහ බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විධිමත් ක්‍රියාදාමයට පිටින් ගිහිල්ලා, ආයතන ගණනාවක් ප්‍රාථමික ගැනුම්කරුවන් හැටියට බඳවා ගෙන තිබෙන බව මේ වාර්තාවෙන් පෙන්වා දීලා තිබෙනවා. ඒ වාගේම, ඒ හැම ප්‍රාථමික ගැනුම්කාර ආයතනයකම එතුමාගේ ඥාතීන් සේවය කරලා තිබෙනවා. ඒ සිදු වූ ක්‍රියාදාමය ගැන මේ වාර්තාවේ පෙන්වා දීලා තිබෙනවා. ඒ ආයතන මොනවාද, ඒ ආයතනවලින් ලබා ගත්ත ලාභය කාටද බෙදී ගියේ කියන එක සොයා බැලීමට

නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණය සහ පොලීසිය ක්‍රියාත්මක විය යුතුයි. එතැනින් තමයි වංචාව සොයා ගන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පොඩි උදාහරණයක් කියන්නම්. මේ බැඳුම්කර සිද්ධියට වඩා දැවැන්ත වංචාවක් කළ ආයතනයක් තමයි, Entrust Securities PLC (Sri Lanka) කියන්නේ. Entrust Securities PLC (Sri Lanka) ආයතනයේ වංචාව රුපියල් බිලියන 12යි. අද අපට පෙනෙනවා, වට්නා කාර් සේල් දමාගෙන, ඒ Entrust Securities PLC (Sri Lanka) ආයතනයේ මුදල් අයෝජනය වෙලා තිබෙන ආකාරය. පොලීසියේ, අධිකරණයේ, නීතිපති දෙපාර්තමේන්තුවේ වගකීම තමයි, මේ වෝහාරික විගණන වාර්තාව පදනම් කරගෙන, අර්ජුන් ඇලෝසියස්ගේ ලාභ බෙදී ගියා වාගේම, මේ ලබාගත් ලාභයත් කාටද බෙදී ගියේ කියන එක සොයා බැලීම. එය අත්‍යවශ්‍යයි.

සමහර අය කිව්වා, මෙහිදි පාඩුව විතරක් පෙන්වා තිබෙනවා, ලාභය පෙන්වා නැහැ කියලා. පාඩුව තමයි පෙන්වා දෙන්න ඕනෑ. මෙම විගණනය මඟින් 4,000කට අධික විවිධ ගනුදෙනු පරීක්ෂා කර බලා පෙන්වා දීලා තිබෙනවා, ඒවායින් 1,000ක් -සියයට 20ක් - පැහැදිලිවම වංචනික ආකාරයට සිදු වෙලා තිබෙන බව.

යහ පාලන ආණ්ඩුවෙන් කළාය කියලා අද මොනවාද මේ කථා කරන්නේ? සිද්ධ වූ ගනුදෙනු සිය ගණනකින් දෙකක් ගැන තමයි මේ කථා කරන්නේ. ඒ ගනුදෙනු දෙකෙන් නිශ්චිත පාඩුවක් හා වංචාවක් සිදු වූ බව අපිත් පිළිගන්නවා. ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගන්න කියලා අපි බල කරලා, ඒ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. දැන් මේ ආණ්ඩුවේ වගකීම තමයි, තමන්ගේ පාලන කාලය තුළ සිදු වුණු දහසකට අධික ගනුදෙනු පිළිබඳව හරියට හොයා බලා, ඒ අය සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීම. එසේ නොවනතාක් කල් අර්ජුන මහේන්ද්‍රන් ගැන කථා කරන්න සදාචාරාත්මක අයිතියකුත් නැහැ; අර්ජුන ඇලෝසියස් ගැන කථා කරන්න සදාචාරාත්මක අයිතියකුත් නැහැ. අජිත් නිවාඩ් කබ්රාල් සහ එවකට සිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම් පී.බී. ජයසුන්දර, මුදල් ඇමති මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු මේ අය මේකට සම්බන්ධද, නැද්ද කියන එක පිළිබඳව විධිමත් අධ්‍යයනයක් නොකොට එසේ චෝදනා කිරීමට සදාචාරාත්මක අයිතියක් නැහැ, මන්ත්‍රීවරුනි.

ඊළඟට මෙතැන තිබෙනවා ඉතාම බරපතළ ප්‍රශ්න ගණනාවක්. ඒ ගැන තමයි මම මේ ප්‍රකාශ කරන්නේ. මෙතැන තිබෙනවා, පැහැදිලි ව්‍යුහාත්මක ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය ගැන මේ ගරු පාර්ලිමේන්තුවේ අවධානය මා යොමු කරවනවා. ඒ මොකක්ද? රජයේ මුදල් අවශ්‍යතාව මුදල් අමාත්‍යාංශය විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට පවරනවා. එතකොට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව උත්සාහ කරන්නේ, හැකිතාක් අඩු පොලියට ණය ලබා ගන්නයි. අනෙක් පැත්තෙන් සේවක අර්ථසාධක අරමුදල බලන්නේ, තමන්ගේ ධනය හැකිතාක් වැඩි පොලියට ආයෝජනය කරන්නයි. කවුද මේ දෙකම පාලනය කරන්නේ? මේ දෙකම පාලනය කරන්නේ, මහ බැංකුව. මහ බැංකුව එක පැත්තකින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව හරහා පුළුවන් තරම් අඩු පොලියට ණය ගන්න බලනවා. අනෙක් පැත්තෙන් සේවක අර්ථසාධක අරමුදල පුළුවන් තරම් වැඩි පොලියට ණය දෙන්න බලනවා. මේ විසංවාදය පවතින තාක් කල්, මේ ව්‍යුහාත්මක ගැටලුව මහ බැංකුවේ පවතින තාක් කල් මේ අර්බුදය හැම දාම තිබෙනවා. මහ බැංකුවේ අධිපතිට ලැබෙනවා, අභිමතානුසාරී බලයක්. ඒ තමයි, අපේ රටේ තිබෙන විශාලතම අරමුදල වන විශ්‍රාම වැටුප් අරමුදලින් ට්‍රිලියන දෙකහමාරකට ආසන්න දැවැන්ත මුදලක් තමන්ට රුචි ආකාරයට පාවිච්චි කිරීමේ අවස්ථාව ලැබෙන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මම මේ පාර්ලිමේන්තුවට යෝජනා කරන්න කැමැතියි, මැලේසියාවේ, සිංගප්පූරුවේ පවතිනවා වාගේ සේවක අර්ථසාධක අරමුදල වෙනම ආයතනයක් මඟින් වෙනම ආකාරයකට පාලනය කරන්නත්, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව - Public Debt Department - මුදල් අමාත්‍යාංශය යටතේ පාලනය කරන්නත්, මහ බැංකුව මේ වෙන්දේසියේ කටයුතුවලට ස්වාධීන නිරීක්ෂකයකු හැටියට, නියාමකයකු හැටියට මැදිහත් වෙන ආකාරයට කටයුතු කරන්නත් අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 15ක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 12යි තිබෙන්නේ.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
නැහැ, නැහැ. විනාඩි 15ක් වෙන් කරලා තිබෙන්නේ. ඒ අනුව කථා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම මේ කාරණය කියන්න කැමැතියි. ඒ ව්‍යුහාත්මක වෙනස කරන්න මේ පාර්ලිමේන්තුවේත් ගැටලුවක් තිබෙනවා. අපේ රටේ ව්‍යවස්ථාවට අනුව මේ පාර්ලිමේන්තුව තමයි මූල්‍ය පිළිබඳව වැදගත්ම, බලගතුම, ප්‍රධානම ආයතනය. වෙන ආයතනවලට ඒ කටයුතු කරන්න බැහැ. මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කරපු මුදල්වලට වැඩිමනත් මුදලක් ලබා ගන්න කියලා මුදල් අමාත්‍යාංශයෙන් මහ බැංකුවට නියෝගයක් ලැබිලා තිබෙනවාද? ඒ වාගේම මහ බැංකුව විසින් හය මාසයකට පෙර බැඳුම්කර පිළිබඳව නිශ්චිත වාර්තා ඉදිරිපත් කරන්න ඕනෑ, මේ මේ දිනවල මේක වෙනවාය කියලා. එසේ පිටතින් මැදිහත් වීම් කරලා තිබෙනවාද මුදල් අමාත්‍යාංශය? එසේ පිටතින් මැදිහත් වීම් කරලා තිබෙනවාද මහ බැංකු අධිපතිවරයා? එසේ පිටතින් මැදිහත් වීම් කරලා තිබෙනවාද මුදල් මණ්ඩලය? මෙන්න මේවා පිළිබඳව විධිමත් අධ්‍යයනයක් අවශ්‍යයි.

මේ වෝහාරික විගණන වාර්තාවෙන් කරලා තිබෙන්නේ දත්ත පද්ධතියක් අපට ලබා දීම විතරයි. ඒ නිසා මේ පිළිබඳව වරදකරුවන් කවුද, වංචාව කළේ කවුද කියලා සොයා බැලීම සඳහා මේ පාර්ලිමේන්තුව ක්‍රියාත්මක විය යුතුයි කියන එක මම යෝජනා කරනවා. ඒ වාගේම, මින් ඉදිරියට රටේ ණය ගනුදෙනු පිළිබඳව, මේ ණය ගනුදෙනු සිදුකරන ආකාරය පිළිබඳව අභිමතානුසාරී බලයක්, තමන්ට නැති බලයක් මහ බැංකු අධිපතිවරු තමන් අතට අරගෙන, තමන් විතරක් දන්නා පුද්ගලික තොරතුරු පිටස්තරයන්ට ලබා දීලා ඒ හරහා දැවැන්ත අයථා ලාභ උපයන ඒ ක්‍රියාදාමයට තිත තැබිය යුතු යුගය ඇවිල්ලා තිබෙනවා. මේ වෝහාරික විගණන වාර්තාවෙන් මේ රටේ සුදු කර පටි අපරාධකාරයන් කවුද කියලා පෙන්වලා දීලා තිබෙනවා. මහත්වරු වාගේ ඉඳගෙන, ඉංග්‍රීසියෙන් කථා කරගෙන, විදේශ රටවල් සමඟ සබැඳියාවන් පවත්වාගෙන, මේ රට තුළ බොහොම වංසක්කාර පෙනුමක් තිබෙන, හැබැයි සුදු කරපටි අපරාධකාරයන් ටිකක් මේවා මෙහෙවලා තිබෙනවාය කියන එක පැහැදිලි වෙලා තිබෙනවා.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

ඒ විතරක් නොවෙයි. මේ ආර්ථික තීරණ ගැනීමේදී බැංකු පොලී අනුපාතය පවත්වාගෙන යන්න, රටේ මුල්‍ය පොලී අනුපාතය පවත්වාගෙන යන්න, ඒක තමන්ගේ අභිමතානුසාරී දෙයක්ද, වෙළෙඳ පොළ බලවේග විසින් කරනවාද, නැද්ද කියන එක පිළිබඳව තීරණය කිරීමට මැදිහත් වෙච්ච ආර්ථික ඝාතකයන් පිරිසක් ඉන්න විත්තියත් අපි මතක තියා ගන්න ඕනෑ. ඒ ප්‍රධාන ආර්ථික ඝාතකයා අද රටේ ප්‍රධානම නිලධාරියා. අද රටේ ප්‍රධානම පරිපාලන නිලධාරියා තමයි, රටේ ප්‍රධාන ආර්ථික ඝාතකයා හැටියට ක්‍රියාත්මක වෙච්ච පුද්ගලයා. අද රට වැටිලා තිබෙන ණය බරට, මේ ආණ්ඩුව අද වැටිලා තිබෙන ණය බරට ප්‍රධාන හේතුව තමයි ඉවක් බවක් නැතුව වාණිජ ණය ලබා ගත්ත එක. ඒ ආර්ථික ඝාතකයා මේ රට වට්ටපු තැන තමයි මේ. ඒ වාගේම මේ ඝාතකයන්ට, සුදු කරපටිකාරයන්ට රැකවරණය දෙන වංසක්කාර කොල්ලකරුවන් පිරිසක් ඉන්නවා. අන්න ඒ තුන් ගොල්ලන්ගේ එකතුවෙන් මේ ක්‍රියාදාමය සිදු වෙලා තිබෙනවා.

මේ වෝහාරික විගණනය කළ යුත්තේ මහ බැංකු බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් විතරක් නොවෙයි. මිග් යානා ගනුදෙනුවටත් වෝහාරික විගණනයක් අවශ්‍යයි. ඒ වාගේම ශ්‍රීලන්කන් ගුවන් සමාගමට ගුවන් යානා 10ක් ලබා ගත් සිද්ධිය සොයා බලන්නත් වෝහාරික විගණනයක් අවශ්‍යයි. බලශක්ති ක්ෂේත්‍රයේ, ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ ගනුදෙනු පිළිබඳව -[බාධා කිරීමක්] සොයා බැලීමට වෝහාරික විගණනයක් අවශ්‍යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන වශයෙන් කියනවා, මේ තුන් ආකාරයක හොරු රංචුව ගැන -සුදු කරපටි අපරාධකරුවන් ගැන, ආර්ථික ඝාතකයන් ගැන, ඒ වාගේම වංසක්කාර මංකොල්ලකාරයන් ගැන -මේ රටේ ජනතාව දැන ගත යුතුයි කියලා. මේ පාර්ලිමේන්තුවත්, කුමන පක්ෂය හෝ වේවා ඉදිරි රජයත් ගොඩ නඟා ගැනීමට මේ වෝහාරික විගණනයෙන් ඇස් ඇරීමක් කරලා තිබෙනවා. එම නිසා ඒ සඳහා කටයුතු කළ යුතු යැයි කියා සිටිමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මහින්ද අමරවීර මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.31]

ගරු මහින්ද අමරවීර මහතා (ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - போக்குவரத்துச் சேவைகள் முகாமைத்துவ அமைச்சரும் மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Transport Service Management and Minister of Power and Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් විවාදයකට සම්බන්ධ වෙන්න ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මේ විවාදයේදී මා පළමුවෙන්ම වෝහාරික විගණන වාර්තාව පිළිබඳව සිහිපත් කළ යුතුයි. බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් තමයි මේ වාර්තාව සකස් වී තිබෙන්නේ. මේ බැඳුම්කර සිද්ධිය මුල් වරට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට අරගෙන ගියේ මම. අල්ලස් කොමිසමට අරගෙන ගිහිල්ලා, ඒ පිළිබඳව ජනතා මතයක් නිර්මාණය කළාට පස්සේ මාධ්‍ය තුළිනුත්, ඒ වාගේම රටේත් එය කථා බහට ලක් වෙන්න පටන් ගත්තා. ඒ වෙලාවේ සමහර අය කිව්වා, "මේක සම්පූර්ණ බොරුවක්, මේ වාගේ දෙයක් වෙලා නැහැ" කියලා. ඒ වාගේම ඒ වෙලාවේ හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ සඳහා වෙනම කමිටුවක් පත් කළා. සිරිකොතේ වැඩ කරන කණ්ඩායමක් තමයි ඒ කමිටුව තුළ හිටියේ. ඒ ගොල්ලන් වාර්තාවක් දුන්නා, "මේකේ කිසිම වංචාවක් වුණේ නැහැ" කියලා. දැන් අපි අර්ජුන මහේන්ද්‍රන්, අර්ජුන් ඇලෝසියස් අල්ලන්න හොයනවා වාගේම, ඒ බොරු වාර්තාව දීපු කණ්ඩායමත් අල්ලලා, මේ වාගේ වාර්තාවක් සකස් කරන්න ඒ අයට සල්ලි දුන්නේ කවුද කියලා ප්‍රශ්න කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. එතැන නීතිඥයන් කණ්ඩායමක් තමයි හිටියේ. බොරු වාර්තාවක් සකස් කරලා දීලා මේ පාර්ලිමේන්තුවත්, ඒ වාගේම රටත් නොමඟ යවන තත්ත්වයට ඒ ගොල්ලන් කටයුතු කළා. ඊට පසුව ඒක කෝප් එකට ඉදිරිපත් කරලා, ඉන් අනතුරුව ජනාධිපති කොමිසමක් දක්වා ගෙනියලා අඛණ්ඩ පරීක්ෂණයකින් පසුව තමයි වැරදිකරුවන් පිළිබඳව හෙළිදරව් වෙන්න පටන් ගත්තේ. ඒ අතරේ අර්ජුන මහේන්ද්‍රන් මේ රටින් පනිනවා. ඔහු මේ රටින් යන්න යනකොට, මේ කාරණය සම්බන්ධව පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරනකොට එවකට හිටපු අග්‍රාමාත්‍යවරයා කිව්වා, "විවාහ උත්සවයකට යන්නේ, ගිහිල්ලා ඔහු ආපසු එනවා" කියලා. ඒ සහතිකය දුන්නා. ඔහුට යන්න ඉඩ දුන්නා. නමුත් අද වෙනකල් ඔහු අල්ලා ගන්න බැරි වෙලා තිබෙනවා. නමුත් ඔහු කොහේ හිටියත්, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව තුළින් අනිවාර්යයෙන්ම ඔහු අත් අඩංගුවට ගැනීමක් සිද්ධ වෙයි කියා මට ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ වෙලාවේ මේ වංචාව, දූෂණය නිවැරදි කර ගැනීම සඳහා විවිධ කණ්ඩායම් විවිධ උපක්‍රම යෙදුවා. එක පැත්තකින් footnotes දමමින් කට්ටිය එක එක දේවල් කරන්න ගත්තා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් පොත් ලියන්න ගත්තා. විවිධ අවස්ථාවල විවිධ විධියට ඒ වංචා, දූෂණවලට සම්බන්ධ වුණු කට්ටිය බේරා ගැනීම සඳහා විවිධ යාන්ත්‍රණ ක්‍රියාත්මක වුණා. අද මේ විවාදයේදීත් පෙනෙන්න තිබෙන්නේ මොකක්ද? දැන් කියනවා, "ඒ ගොල්ලන් වැරදි නම්, ඉස්සර ඊට වඩා වැරදිකාරයෝ ඉන්නවා, ඒ ගොල්ලන් අල්ලා ගන්නකල් මේ ගොල්ලන් අල්ලන්න එපා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියන්නේ, ඉස්සර වෙලා වැරැද්දක් කළත් වැරැද්ද වැරැද්දම තමයි. පස්සේ වැරැද්දක් කළා නම් ඊටත් වඩා වැරදියි. මොකද, පසුගිය ආණ්ඩුව කාලයේ, නැත්නම් 2015 වසරට පෙර තිබුණු ආණ්ඩුවේ වැරදි අල්ලන්න, ඒ වාගේම ඒ ආණ්ඩුවට විරුද්ධව, ඒ වංචා, දූෂණ හොයන්නම තමයි යහපාලන ආණ්ඩුව බලයට පත් වුණේ. ඒ ආණ්ඩුවේ කාර්ය භාරය තමයි ඒවා හොයා ගන්න එක. ඒවා හොයන එක පැත්තක තියලා, වංචා, දූෂණ, හොරු අල්ලන්න ආපු යහපාලන ආණ්ඩුව හොරකම් කරන්න පටන් ගත්තා. මහ බැංකුව මහ දවල් කොල්ල කෑවා. ඒ ගණන් හිලව් පිළිබඳව තවම හරි විස්තරයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගණන් හිලව් බලන්න බැහැ. මොකද, ඒ හරහා මූල්‍ය වෙළෙඳ පොළේ අස්ථාවර තත්ත්වයක් ඇති වුණා; විශ්වාසයක් නැති වුණා. රටේ ජනතාවට වාගේම ජාත්‍යන්තරවත් අපේ රට ගැන තිබුණු විශ්වාසය පලුදු වුණා. විදේශීය ආයෝජකයෝ මේ රටේ ආයෝජනය කිරීමෙන් වැළැකුණා. මහ බැංකුව පිළිබඳව විශ්වාසයක් නැති වුණාම දේශීය ආයෝජකයෝ මේ රට අත් හැරලා යන්න පටන් ගත්තා. වංචා, දූෂණ සිදු වුණාම, මහ බැංකුව පිළිබඳව විශ්වාසයක් නැති වුණාම, රට බංකොලොත් වෙනවා කියලා දකින කොට කවුරුවත් ආයෝජන කරන්නේ නැහැ. ඒ නිසා සිදු වුණු පාඩුව කොපමණක්ද කියලා හරියාකාරව

ගණනය කරන්න පුළුවන්කමක් නැහැ. මේ රට ප්‍රපාතයට යන්න මේ කරුණු හේතු වෙලා තිබෙනවා. මේ අවුරුද්ද වන කොට ණය වාරිකයයි, පොලියයි ගෙවා ගන්නවත් රාජ්‍ය ආදායම මදි වන තත්ත්වයට අපි පත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ රැකියා දසලක්ෂයක් ඉලක්ක කරගෙන යෝජනා ඉදිරිපත් වුණත්, මේ සිද්ධිය නිසාම රැකියා ලක්ෂයක් විතර නැති වුණා. මොකද, ලංකාවේ ආයෝජන කරපු අය ඒ ආයෝජන වෙනත් රටවලට ගෙන යන්න පටන් ගත්තා. ලංකාවේ ආයෝජන කරන්න ආයෝජකයන්ට විශ්වාසයක් නැති වුණා. ඒ වාගේම, මේ රටේ මූල්‍ය වෙළෙඳ පොළ ගැන තිබුණු විශ්වාසය කඩ වුණු නිසා ලංකාවේ ආයෝජන කරන්න ආපු විදේශිකයෝ ආපහු හැරිලා ගියා.

ඊළඟට, මේ කාරණය නිසා බැංකු පොලිය වැඩි වෙනවා. මහ භාණ්ඩාගාරයේ තැන්පත් කරන මුදල්වල පොලිය වැඩි වෙනවා. එතකොට මිනිස්සු කළේ මොකක්ද? එක පිරිසක් ආයෝජන කරන්නේ නැතිව සල්ලි ටික බැංකුවේ දමාගෙන හිටියා. තවත් අය ගිහිල්ලා වෙනත් රටවල ආයෝජන කරන්න පටන් ගත්තා. පසුගිය කාලය තුළ අපේ රටේ කී දෙනෙක් වෙනත් රටවලට ගිහිල්ලා ආයෝජන කළාද කියලා හොයා බලන්න. විවිධ ක්ෂේත්‍රවල හිටපු ව්‍යාපාරිකයෝ වාගේම ආයෝජකයෝ බංග්ලාදේශය, ඉන්දියාව, මියන්මාරය වැනි රටවලට ගිහිල්ලා කර්මාන්ත පටන් ගත්තා. ඒ රටවල ව්‍යාපාර පටන් ගත්තා. ඒ නිසා අපේ රට තුළ ආයෝජන කිසිම දෙයක් සිදු නොවන මට්ටමට ආවාය කියන එක අපි පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා මේ තත්ත්වය බොහොම සුළු කොට සලකා චෝදනා කළාට වැඩක් වෙන්නේ නැහැ. 2015ට පෙර මෙච්චර වුණාය කියලා ගණන් හිලව් කිව්වාට වැඩක් නැහැ. ඒ කාලයේ තිබුණා නම් ඒවා හොයා ගන්න තිබුණා. ඇයි, හොයා ගන්න බැරි වුණේ? ඒ කාලයේ තිබුණා නම් හොයලා දඬුවම් දෙන්න තිබුණානේ. ඒවා මොකක්වත් නොකර දැන් ඒක ගැන කිව්වාට වැඩක් නැහැ. ඒ කාලයේ වැරැද්දක් කළා නම් ඒ කාලයේ හොයන්න ඕනෑ. දැනුත් හෙව්වාට කමක් නැහැ, දඬුවම් දුන්නාට කමක් නැහැ, හෙළිදරවු කර ගන්නවාට අපි විරුද්ධ වෙන්නේ නැහැ. ඒ කාලයේ හොරකම් කළා නම් ඒකත් වැරැද්ද. ඊට පසු කාලීනව හොරකම් කළා නම් ඒකත් වැරැද්ද. මේ ආණ්ඩුව කාලයේ හොරකම් කරන්න යනවා නම් ඒකත් වැරැද්ද කියන එකයි මා කියන්නේ. මේ රටේ ජනතාව හොරකමට එරෙහිව සටන් කරන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා; එළියට ඇවිල්ලා තිබෙනවා. මේ වන විට පාර්ලිමේන්තුව පිළිබඳවත් විශ්වාසය නැති වෙලා තිබෙනවා. සහරාන් බෝම්බ ගහන කොට සමාජ මාධ්‍යවල පළ වුණේ මොනවාද? ඒ බෝම්බ පාර්ලිමේන්තුවට ගැහුවා නම් හොඳයි කියලායි කිව්වේ. මොකද, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු ගැන විශ්වාසය නැති වුණා. පාර්ලිමේන්තුවේ හිටපු 225දෙනාම හොරුද? මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාම හොඳ නැද්ද? එහෙම නොවෙයිනේ. කිහිප දෙනකු කරපු වැරැදි නිසා, විශේෂයෙන් මේ මහ බැංකු බැඳුම්කර සිද්ධිය වැනි දේවල්වලට ඒ හිටපු සමහර අයගේ තිබුණු සම්බන්ධතා නිසා ජනතාවගේ විශ්වාසය කඩ වුණා. ඒ වාගේම, සමහර අවස්ථාවලදී ඇතැම් අය පාර්ලිමේන්තුව තුළ හැසිරුණු ආකාරය දැකපු නිසා ජනතාවගේ විශ්වාසය කඩ වුණා. ඒ නිසාවෙන්ම පාර්ලිමේන්තුවට බෝම්බ ගහන්නය කියන තත්ත්වයට ජනතා මතයක් නිර්මාණය වෙමින් ආවා. නමුත්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අද ඉතාම දැඩි ලෙස පියවර අරගෙන තිබෙනවා මේ ආණ්ඩුව තුළ වංචා, දූෂණ නැති කරන්න. එතුමා එක පැත්තකින් නාස්තිය අවම කිරීම සඳහා කටයුතු කරනවා. එතුමා, තමන්ට ලැබුණු වරප්‍රසාද කප්පාදු කර ගත් නායකයෙක්. ජනාධිපතිවරයකු විධියට තමන්ට ලැබුණු වරප්‍රසාද කප්පාදු කර ගනිමින් කටයුතු කරනවා වාගේම, තමන්ට හිතවත්ද, මොන තරම් දේශපාලන සම්බන්ධයක් තිබෙනවාද කියන එක පිළිබඳව සැලකිලිමත් නොවී, වංචා දූෂණවලට සම්බන්ධ වුණු අයට දඬුවම් ලබා දෙන මට්ටමට එතුමා කටයුතු කිරීම නිසාම නැවත ජාත්‍යන්තරයේත්, මේ රටේත්, ආයෝජකයන්ගේත් විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා, මේ රට තුළ යමක් කරන්න පුළුවන් කියලා. ඒක හොඳ ලක්ෂණයක්.

අපට විශ්වාසයක් තිබෙනවා ඒ තත්ත්වය තුළ ඉදිරි කාලයේ මේ රටේ යම් වෙනසක් ඇති වේවි කියලා. මේ නායකයාට පුළුවන්කම ලැබුණා, තමන්ට ලැබුණු වරප්‍රසාද ජනතාව වෙනුවෙන් ප්‍රතික්ෂේප කරන්න. එතුමාට ලැබුණු නිල නිවස, එතුමාට ලැබුණු වාහන, ආරක්ෂාව -මේ ඔක්කෝම- ප්‍රතික්ෂේප කරමින් කටයුතු කරන නිසා තමයි අද ජනතාවගේ විශ්වාසය ගොඩ නැඟුණු නායකයා බවට එතුමා පත් වෙලා තිබෙන්නේ.

ජනතාව අද යම් කැප කිරීමක් කරන්න සූදානමින් ඉන්න බව මේ වැඩපිළිවෙළත් එක්ක පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. වංචා, දූෂණ කරලා තිබෙන්නේ ඒ ආණ්ඩුව වුණත්, මේ ආණ්ඩුව වුණත්, මොන ආණ්ඩුව වුණත් ප්‍රශ්නයක් නැහැ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වංචාවට, දූෂණයට, නාස්තියට එරෙහිව සෘජුව කටයුතු කරයි කියලා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. ආණ්ඩු බලයද, මේ පැත්තේ ඉන්න කට්ටියද, ඒ පැත්තේ ඉන්න කට්ටියද කියලා එහිදී අදාළ වෙන්නේ නැහැ. මේ රටේ ජනතාවට ප්‍රශ්නයක් නැහැ, එය මේ පැත්තෙන් කළාද එහෙම නැත්නම් අනෙක් පැත්තෙන් කළාද කියලා. ජනතාවගේ මුදල් වංචා කළා නම්, එයට විරුද්ධව දඬුවම් දීමට තමයි මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ. ඒ වෙනුවෙන් ජනාධිපතිතුමා ගෙනියන වැඩ පිළිවෙළට අපි අපේ ශක්තිය ලබා දෙනවා. මේ වෝහාරික විගණන වාර්තාව මඟින් හෙළිදරව් වන කරුණු අනුව, විශේෂයෙන්ම, මහ බැංකුවේ මහ දවල් මූල්‍ය වංචාව කරලා රටින් පැනලා ඉන්න, -අතුරුදහන් වෙලා ඉන්න- අර්ජුන මහේන්ද්‍රන් හැකි ඉක්මනින් ගෙන්වා ගෙන ඔහුට දඬුවම් ලබා දීමට කටයුතු කරයි කියන විශ්වාසය අපට තිබෙනවා. ඔහු වංචා කළ මුදල්, අර්ජුන් ඇලෝසියස් වංචා කළ මුදල් නැවත අය කර ගෙන මේ රටේ ජනතාවට ලබා දීමට කටයුතු කරයි කියන විශ්වාසය ද අපට තිබෙනවා. එම විශ්වාසය තබමින් මේ කටයුතු -මේ පරීක්ෂණ- ඉදිරියට පවත්වාගෙන යෑමට අවශ්‍ය සම්පූර්ණ සහයෝගය පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයකු විධියට ලබා දීමට මා සූදානම් බව සිහිපත් කරමින් නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඊ. සරවනපවන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 05ක කාලයක් නියමිතව තිබෙනවා.

[பி.ப. 4.42]

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை மத்திய வங்கியினால் வழங்கப்பட்ட திறைசேரி பிணைமுறிகள் தொடர்பான ஆய்வுத்துறைக் கணக்காய்வறிக்கைகள் சம்பந்தமான விவாதம் இங்கு நடைபெற்றுக் கொண்டிருக்கின்றது. நீங்கள் அர்ஜுன மகேந்திரன் சம்பந்தமாகப் பேசிக்கொண்டிருக்கிறீர்கள். ஆனால், எங்களுக்கு இதைவிட முக்கியமான பல விடயங்களைப் பற்றிப் பேசவேண்டியுள்ளது. அவற்றில் ஒன்றைப் பற்றி நான் இப்போது பேச விரும்புகின்றேன்.

இலங்கையின் இராணுவத் தளபதியான சவேந்திர சில்வாவும் அவரது குடும்பத்தினரும் அமெரிக்காவுக்குள்

[ගරු ඊ. සරවනපවන් මහතා]

பிரவேசிக்க அமெரிக்க அரசாங்கம் பயணத்தடையை அறிவித்துள்ளது. ஒரு நாட்டின் பாதுகாப்புக்குப் பொறுப்பான ஒரு படைத் தளபதிமீது இன்னொரு நாடு பயணத்தடை விதிக்கின்றதென்றால், அது சம்பந்தப்பட்ட நாட்டுக்கு ஏற்படுத்தப்பட்ட அவமானமென்றே கருதப்படுகிறது. அதிலும், சவேந்திர சில்வா, மக்களால் தெரிவு செய்யப்பட்ட முன்னாள் ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களினால் இராணுவத் தளபதியாக நியமிக்கப்பட்டவர் என்பதுடன், அவர் தற்போதைய ஜனாதிபதி அவர்களால் பாதுகாப்புப் படைகளின் பதில் பிரதானியாகவும் பதவியுயர்த்தப் பட்டுள்ளார். இரு ஜனாதிபதிகளின் நன்மதிப்பைப் பெற்ற ஒருவருக்கு இன்னொரு நாடு பயணத்தடை விதிக்கின்றது என்றால், குறித்த நாட்டுக்கு இழைக்கப்பட்ட அவமானம் என்றே அதைக் கருதவேண்டியுள்ளது.

இலங்கையில் இடம்பெற்ற இறுதிப் போரின்போது, சவேந்திர சில்வாவைக் கட்டளைத் தளபதியாகக் கொண்டிருந்த 58வது படைப்பிரிவால் மேற்கொள்ளப்பட்ட மனித உரிமை மீறல்கள் காரணமாகவே இந்தத் தடை விதிக்கப்பட்டுள்ளதாக அமெரிக்கா அறிவித்துள்ளது. ஐக்கிய நாடுகள் சபை மற்றும் பிற அமைப்புக்களால் ஆவணப்படுத்தப்பட்டுள்ள சவேந்திர சில்வாமீதான மனித உரிமை மீறல் குற்றச்சாட்டுக்கள் தீவிரமானவையெனவும் நம்பகத்தன்மை வாய்ந்தவையெனவும் அமெரிக்க இராஜாங்கத் திணைக்களம் தனது அறிக்கையில் குறிப்பிட்டுள்ளது. மேலும், போர்க்குற்றங்கள் மற்றும் மனித உரிமை மீறல்களில் ஈடுபடுவோரைப் பொறுப்புக்கூற வைக்கவும் பாதுகாப்புத்துறையைச் சீர்திருத்தவும் நீதி மற்றும் நல்லிணக்கம் தொடர அதன் பிற கடமைகளை ஆதரிக்கவும் இலங்கை அரசைக் கேட்டுக்கொள்வதாகவும் அமெரிக்கா தெரிவித்துள்ளது. எனினும், இலங்கை அரசு சவேந்திர சில்வாமீதான குற்றச்சாட்டுக்கள் ஆதாரமற்றவையெனவும் ஒருதலைப்பட்சமானவையெனவும் தெரிவித்து, சவேந்திர சில்வாமீதான பயணத்தடையை நீக்கும்படி கோரியுள்ளது. மேலும், வெளிவிவகார அமைச்சு அமெரிக்கத் தூதுவரை அழைத்து மேற்படி தடை தொடர்பாகத் தங்கள் ஆட்சேபனையைத் தெரிவித்துள்ளது.

இலங்கையில் இடம்பெற்ற இறுதிப் போரின்போது போர்க்குற்றங்கள், மனித உரிமை மீறல்கள் இடம்பெற்றன என்பது தொடர்பாகப் பல்வேறு தரப்பினராலும் குற்றச்சாட்டுக்கள் முன்வைக்கப்பட்டன. குறிப்பாக, 2015ஆம் ஆண்டில் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையில் நிறைவேற்றப்பட்ட 30/1 தீர்மானத்தில் மேற்படி குற்றச்சாட்டுக்கள் தொடர்பாக இலங்கை அரசாங்கம் சர்வதேச வழக்குரைஞர்கள், நீதியாளர்கள் துணையுடன் விசாரணை களை மேற்கொள்ள வேண்டுமெனவும் வலியுறுத்தப் பட்டிருந்தது. இப்போது நம்பத்தகுந்ததும் தீவிரமானதுமான ஆதாரங்களின் அடிப்படையிலேயே சவேந்திர சில்வாவுக்கும் அவரின் குடும்பத்துக்கும் பயணத்தடை விதிக்கப்பட்டிருப்பதாக அமெரிக்கா கூறுகிறது. அதே சவேந்திர சில்வாமீதான குற்றச்சாட்டுக்கள் ஆதாரமற்றவையென இலங்கை கூறுகிறது. இரு கருத்துக்களும் ஒன்றுக்கொன்று நேர்விரோதமானவை.

2015இல் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையில் இலங்கையின் அனுசரணையுடன் நிறைவேற்றப்பட்ட தீர்மானத்தின் அடிப்படையில், மேற்படி போர்க்குற்றங்கள், மனித உரிமை மீறல்கள் தொடர்பான குற்றச்சாட்டுக்கள் சம்பந்தமாக விசாரணை மேற்கொள்ளப்பட்டிருக்க வேண்டும். அது மேற்கொள்ளப்படாத நிலையில், இலங்கை அரசாங்கத்துக்கு இரு தடவை கால அவகாசம் வழங்கப்பட்டது. எனினும், தீர்மானம் மேற்கொள்ளப்பட்டு ஐந்து வருடங்களாகிவிட்டபோதிலும் அது தொடர்பான விடயங்கள் எதுவும் நிறைவேற்றப்படவில்லை. அதாவது, போர்க்குற்றங்கள், மனித உரிமை மீறல்கள் தொடர்பான விசாரணைகள் நடத்தப்படவில்லை. ஆனால், ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையில் 2015இல் நிறைவேற்றப்பட்ட தீர்மானத்தை ஐந்து வருடங்களின் பின்பு, தற்போது நிராகரிப்பதாக இலங்கை தெரிவித்திருக்கின்றது.

ஒரு தரப்பினர்மீது குற்றம் சுமத்தப்பட்டால் அதனை விசாரணைக்கு உட்படுத்துவதன்மூலமே அது உண்மையா, பொய்யா? என்பதைக் கண்டறிய முடியும். மேற்படி விசாரணைகள் நடத்தப்பட்டு, சவேந்திர சில்வாமீது சுமத்தப்பட்ட குற்றச்சாட்டுக்கள் ஆதாரமற்றவை என நிரூபிக்கப்பட்டிருந்தால், அமெரிக்கா பயணத்தடை விதிப்பதற்கான வாய்ப்புக்கள் உருவாகியிருக்க முடியாது. ஐ.நா. மனித உரிமைகள் பேரவை, சர்வதேச மனித உரிமை அமைப்புகள், தமிழ் அரசியல் தலைமைகள் எனப் பல்வேறு தரப்பினரும் விசாரணைகள் மேற்கொள்ளும்படி கோரியும் அது நடத்தப்படவில்லை. இவ்விசாரணைகளை இலங்கை அரசாங்கம் நடத்தாமல் தட்டிக்கழித்து வந்தமைக்கும், தற்சமயம் ஐ.நா. தீர்மானத்தையே நிராகரிப்பதாக அறிவித்திருப்பதற்குமான காரணம், விசாரணைகள் மேற்கொள்ளப்பட்டால் அரச படையினரின் போர்க் குற்றங்கள், மனித உரிமை மீறல்கள் நிரூபிக்கப்பட்டு விடுமென்ற அச்சம் என்றே நாம் கருதுகிறோம்.

இலங்கை வெளிவிவகார அமைச்சு, சவேந்திர சில்வாமீதான குற்றச்சாட்டுகளுக்கு ஆதாரம் இல்லையெனத் தெரிவிக்கிறது. அமெரிக்காவோ நம்பத் தகுந்த, தீவிரமான ஆதாரங்கள் இருப்பதாகக் கூறுகிறது. எப்படியிருப்பினும் ஒரு விசாரணையை மேற்கொண்டிருந்தால் அமெரிக்காவால் முன்வைக்கப்படக்கூடிய ஆதாரங்களை முறியடித்திருக்கலா மல்லவா? அரச படைகளால் மேற்கொள்ளப்பட்டதாகக் கூறப்படும் போர்க்குற்றங்கள், மனித உரிமை மீறல்கள் என்பன சர்வதேச அரங்கில் நிரூபிக்கப்பட்டுவிடுமென்ற அச்சத்தினாலேயே விசாரணைகள் நடத்தப்படுவது தட்டிக்கழிக்கப்பட்டு வந்ததென்பதை நாம் திடமாக நம்புகின்றோம். ஏற்கெனவே இலங்கையால் அனுசரணை வழங்கப்பட்ட ஐ.நா. மனித உரிமைகள் பேரவையின் தீர்மானத்தை நிராகரித்திருப்பதும் இவ்விடயங்களை மேலும் ஆதாரப்படுத்துகிறது.

இலங்கை அரசு சர்வதேச நியமங்களை அலட்சியப்படுத்தி வருமானால், எதிர்காலத்தில் சர்வதேசம் மேற்கொள்ளக்கூடிய நடவடிக்கைகளுக்கு இது ஒரு முன்னறிவித்தல் என்றே நாம் கருதுகிறோம். பொறுப்புக்கூறலிலிருந்து தப்புவதற்கு எடுக்கப்படும் முயற்சிகள் இலங்கையைச் சர்வதேச அரங்கில் தனிமைப்படுத்தும் நிலைக்கே இட்டுச்செல்லும் என நாம் திடமாக நம்புகின்றோம். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කනක හේරත් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

ගරු කනක හේරත් මහතා (වරාය සංවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கனக ஹேரத் - துறைமுக அபிவிருத்தி அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Ports Development Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 10ක කාලයක් තිබුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 6ක කාලයක් තමයි දැන් තිබෙන්නේ.

[අ.භා.4.48]

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද මේ වෝහාරික විගණන වාර්තාව ගැන කථා කරන්නට පෙර, මට ප්‍රථම කථා කළ අපේ ගරු මන්ත්‍රීවරයා ප්‍රකාශ කළ කාරණයක් ගැන සඳහන් කරන්න අවශ්‍යයි. එදා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී අපේ රට අනුග්‍රහය දැක්වූ යෝජනාව නිසා අද යුද අපරාධ ඔප්පු වෙලා තිබෙනවා කියලා එතුමා කියනවා. මම හිතන්නේ ඒක ඉතාම බරපතළ චෝදනාවක්. ඒ නිසා විශේෂයෙන්ම කියනවා, අද මේ සභාව සහ මේ රටේ ජනතාව නොමඟ යවන්න එතුමා එසේ කියපු බව. එහෙම චෝදනාවක් නැහැ. නමුත් කෙසේ වුණත් කියන්න ඕනෑ කාරණය තමයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාව - පසුගිය රජය - අනුග්‍රහය දක්වපු එම යෝජනාවට අත්සන් තැබීම තුළින් මතු වූ ඒ ගැටලු නිසා තමයි අද වෙනකොට ශවේන්ද්‍ර සිල්වා වැනි යුද විරුවෙකුට ඒ වාගේ චෝදනා එල්ල කරන්නේ. ඒ නිසා අපි එම චෝදනා තරයේ හෙළා දකිනවා. විශේෂයෙන්ම අපේ රටේ යුද්ධය අවසන් කරන්න කටයුතු කරපු ශවේන්ද්‍ර සිල්වා මැතිතුමාගේ නිර්දෝෂීභාවය ඔප්පු කරන්න අපි එතුමාත් සමඟ හිටගන්නවාය කියන එකත් මේ අවස්ථාවේ ප්‍රථමයෙන්ම ප්‍රකාශ කරනවා. අද මෙම ගරු සභාව තුළ ගරු සරත් ෆොන්සේකා මැතිතුමාත් ඉන්නවා. යුද්ධය අවසන් කිරීම පිළිබඳව එතුමා වෙනුවෙනුත් අපි ඕනෑම වේලාවක නැඟී සිටිනවාය කියන එකත් ප්‍රකාශ කරනවා.

ගරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෝහාරික විගණන වාර්තාව අපි දකින්නේ පසුගිය බැඳුම්කර වංචාව වහ ගන්න හදපු විගණන වාර්තාවක් හැටියටයි. මෙහිදී විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණය නම්, කැබිනට් අනුමැතියක් ඇතුව තමයි මේ විගණනය කරන්න මෙම සමාගම තෝරාගෙන තිබෙන්නේ. නමුත් ඒ ක්‍රමවේදය පිළිබඳව කිසිම පැහැදීමක් නැහැ; පැහැදිලි කිරීමකුත් නැහැ. ඒ වාගේම තමයි අද වෙනකොට මෙම සමාගම ඉන්දියාවේ වංචාවලට අසුවෙලා තිබෙන සමාගමක්. ඒ නිසා මෙම විගණන වාර්තාව පිළිබඳව අපට විශ්වාසයක් නැහැ. මේ විගණන වාර්තාවට අපි රුපියල් මිලියන දෙසීයක් වියදම් කරලා තිබෙනවා. අද පත්තරේක සඳහන්ව තිබෙනවා, ඒ සඳහා තවත් රුපියල් මිලියන තිස්හයක මුදලක් ශ්‍රී ලංකා රජයෙන් ඒ ගොල්ලන් බලාපොරොත්තු වෙනවා කියලා. වංචාවට ලක්වෙලා ඉන්න මේ සමාගම අපෙන් මෙතරම් මුදලක් ලබාගෙන මේ වාර්තාව ලබාදීම පිළිබඳව අපට සැකයක් මතු වෙනවා.

එපමණක් නොවෙයි, 2015දී මහ බැංකුව කොල්ලකනකොට මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයාම තමයි මේ විගණන වාර්තාව ඉදිරිපත් කරපු සමාගම තෝරා ගන්නකොටත් කටයුතු කරලා තිබෙන්නේ. එපමණක් නොවෙයි, ඒකේ Audit Coordinator හැටියට පත් කරපු පුද්ගලයා, 2015 පෙබරවාරි මාසයේ මහ බැංකු කොල්ලය කරනකොට Monetary Board එකේ හිටපු පුද්ගලයාම තමයි. අද වෙනකොට ඒ පුද්ගලයාට මිලියන 1.5ක මුදලක් ඒ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ගෙවලා තිබෙනවා. මේ වාර්තාව ලබා ගැනීමේදීත් මුදල් කොල්ල කාලා තිබෙනවාය කියන එක කියන්න ඕනෑ. අපි මේ වාර්තාව දකින්නේ මේ රටේ මේ මහ බැංකු කොල්ලයේ සැර අඩු කරන්න, එහෙමත් නැත්නම් ඒක යට ගහන්න, එහෙමත් නැත්නම් දේශපාලන වාසියක් ලබා ගැනීම වෙනුවෙන් එවකට තිබුණු රජය මැදිහත් වෙලා ඉදිරිපත් කරපු වාර්තාවක් හැටියටයි.

එදා රනිල් වික්‍රමසිංහ මහත්තයාට චෝදනා තිබුණා. මේ සිද්ධියේ මහ මොළකරු කියලා මුළු රටම දන්නා රනිල් වික්‍රමසිංහ මහත්තයා පමණක් නොවෙයි, අර්ජුන් ඇලෝසියස් ඒ වාගේම අර්ජුන මහේන්ද්‍රන් ඇතුළු මේකට සම්බන්ධ සියලුදෙනා ඉතාම කඩිනමින් නීතිය ඉදිරියට ගෙන ඒමට කටයුතු කිරීම තමයි අද කළ යුත්තේ කියන එක අපි මේ අවස්ථාවේ සඳහන් කරනවා.

2015දී මහ බැංකු කොල්ලය පිළිබඳව එදා අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරලා, අවසානයේ එදා පාර්ලිමේන්තුවේ COPE එකේ සභාපති ඩිව් ගුණසේකර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් COPE වාර්තාව එළිදක්වන්න කටයුතු කරමින් සිටි අවස්ථාවේ තමයි පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ. එදා COPE එකේ සභාපතිත්වය ඩිව් ගුණසේකර මැතිතුමා දරද්දී ඉදිරිපත් කළ වාර්තාව වාගේම, පසුගිය ආණ්ඩුව සමයේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා COPE එකේ සභාපතිවරයා හැටියට කටයුතු කරද්දී ඉදිරිපත් කළ වාර්තාවත්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මට තව විනාඩි පහක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට විනාඩි දහයක් ලබා දෙන්න තමයි නියම කර තිබෙන්නේ.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගේ කාලයත් මෙතුමාට ගන්න කිව්වා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මට තවත් විනාඩි 5ක් දෙන්න.

වංචාවක් කළා ද, එහෙම නැත්නම් පාඩුවක් කළා ද කියන එක නොවෙයි වැදගත්. ඒ ජනාධිපති කොමිසම, ඒ වාගේම විගණකාධිපති වාර්තාව කියන සියල්ලෙන් ඔප්පු වෙලා තිබෙනවා මේ කණ්ඩායම සංවිධානාත්මකව වංචාවක් කළාය කියන කාරණය. ඒක, ඔප්පු වෙලා තිබෙන කාරණයක්. එය සිදු වුණේ 2015 අවුරුද්දට ප්‍රථමද, 2015 අවුරුද්දට පසුවද කියන එක පිළිබඳ අපට ගැටලුවක් නැහැ. අපේ රටේ ජනතාවගේ මුදල් කොල්ල කාලා තිබෙනවා නම්, ඒ හැම කෙනෙකුටම දඬුවම් දීම වැදගත්.

අද තිබෙන චෝදනාව තමයි, 2015 අවුරුද්දට කලින් එවකට හිටපු මහ බැංකු අධිපති කබ්රාල් මැතිතුමා සහ එතුමාගේ ඥාතීන් සම්බන්ධ වෙලා එදා පැවති රජයට පාඩුවක් සිදු කළාය කියන කාරණය. ඒ පිළිබඳ මාධ්‍යයෙන් මුළු රටේම ප්‍රචාරය වුණත්, මේ වාර්තාවෙන් ඒ කිසිම කෙනෙකුට චෝදනාවක් එල්ල කරලා නැහැ. චෝදනා කෙසේ වෙතත්, කබ්රාල් මැතිතුමා සහ එතුමාගේ

[ගරු කනක හේරත් මහතා]

පවුලේ අය එයට සම්බන්ධ නම් ඒ අය නීතිය ඉදිරියට ගෙන එන්න හැකියාව තිබෙන බව අපි කියනවා. ඒ සම්බන්ධයෙන් නඩු දමන්න පුළුවන්. ඒ වාගේම, පොලීසියට, CID එකට ගිහිල්ලා ඒ ගැන පැමිණිලි කරන්න පුළුවන්. එසේ කිරීම සම්බන්ධයෙන් අපට ගැටලුවක් නැහැ. මේ වංචාවට සම්බන්ධ වෙලා සිටින ඕනෑම කෙනෙකුට චෝදනා කිරීම හෝ ඒ අය ගැන පාර්ලිමේන්තුවේ හෝ වේදිකාවේ හෝ කථා කිරීම නොවෙයි කළ යුත්තේ. ඒ අය නීතිය ඉදිරියට ගෙන ඒමට කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරනවා. අපට එක වංචාවක් ගැන විතරක් කියන්න බැහැ. වංචා කීපයක් ගැන අද මේ පාර්ලිමේන්තුවේ කථා කළා. පසුගිය කාලයේ පමණක් නොවෙයි, ඉදිරියේදීත් ඕනෑම වංචාවක් කරන කෙනෙකු නීතිය ඉදිරියට ගෙන ඒම සඳහා මේ රජය කටයුතු කරනවාය කියන එක අපි මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අය පසුගිය කාලයේ මේ රටේ මුදල් ටික අරගෙන විදේශ රටවලට ගිහිල්ලා ඒ රටවල බැංකුවල තැන්පත් කළ බව අපි දන්නවා. ඒ වාගේම චෝදනා තිබෙනවා, එවකට හිටපු අමාත්‍යවරුන්ට සහ අමාත්‍යවරුන්ගේ ලේකම්වරුන්ටත්. පැනමාවේ සිදු වූ වංචාවට සම්බන්ධ වූ කණ්ඩායම් ගැන චෝදනා තිබෙනවා. ඒ නිසා අපි එක තැනක නවතින්නේ නැතිව ඒ හැම දෙයක් ගැනම හොයා බැලීමට කටයුතු කළ යුතුයි.

මේ ව්‍යෝහාරික විගණන වාර්තාව ගැන කථා කරනකොට කියන්න ඕනෑ, 2002 අවුරුද්දේ සිට 2004 අවුරුද්ද දක්වා මේ වාර්තාවේ සඳහනක් වෙන්නේ නැහැ කියන කාරණය. විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා අපි දැක්කා, "ඒ පිළිබඳ දත්ත හොයා ගන්න හැකියාවක් ලැබුණේ නැහැ" කියලා. අපි මේ අවස්ථාවේදී කියනවා, දත්ත හොයා ගන්න හැකියාවක් ලැබුණේ නැහැ නොවෙයි, ඒ වකවානුව තුළදී ඒ තිබුණු වාර්තා සියල්ල සිතා මතා, සංවිධානාත්මකව හංගලා තිබෙනවා කියලා. එදා අග්‍රාමාත්‍යවරයා හැටියට හිටියේත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා. නැවතත් 2015 අවුරුද්දේ බැඳුම්කර වංචාවේ මහා මොළකරු හැටියට කටයුතු කළේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැතිතුමා. මේ වාර්තාවට අනුව මේක වංචාවක් ද, එහෙමත් නැත්නම් පාඩුවක් ද කියන එක ගැන නොවෙයි අපි බලන්න ඕනෑ. 2015 අවුරුද්දට කලින් එවැනි පාඩුවක් සිදු වෙලා තිබෙනවා. පාඩුවක් සිදු වුණාය කියන කාරණය වාගේම, අප විශේෂයෙන් බැලිය යුතු කාරණය වන්නේ අනෙක් පැත්තෙන් ලාභය ලබා ගත් සමාගම් මොනවාද කියන එක සොයා බැලිය යුතුය කියන කාරණයයි. ඒ ලාභයෙන් සියයට අනූනවයක්ම ලබාගෙන තිබෙන්නේ රජයට සම්බන්ධ ආයතන. විශේෂයෙන්ම ලංකා බැංකුව, මහජන බැංකුව, NSB එක, EPF එක තමයි ඒ ලාභ ලබාගෙන තිබෙන්නේ. 2015 එක්ක සංසන්දනය කර බැලුවාම, 2015 පෙබරවාරි මාසයේ පමණක් බැඳුම්කර වංචාවෙන් රුපියල් මිලියන 300ක් අරගෙන ආයෝජනය කරන්නේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමයි. ඒ එක ගනු දෙනුවකින් පමණක් ලාභය වශයෙන් රුපියල් මිලියන 4,600ක් ලබා ගන්නවා. සියයට 1,500ක ලාභයක් ලබා ගන්නා ඒ සමාගම පෞද්ගලික සමාගමක්. අද රටේ ජනතාව විශේෂයෙන්ම බලාගෙන ඉන්නේ, රනිල් වික්‍රමසිංහ හිටපු අග්‍රාමාත්‍යතුමා මේ රටින් බැහැර වෙන්න ඉඩ දුන්නු අර්ජුන මහේන්ද්‍රන් මේ රටට ගෙනෙන්නේ කවදාද කියන එකයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ඒ කාලයෙන් පසු මගේ කථාව අවසාන කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අවස්ථාවට සම්බන්ධ වෙලා සිටින අපේ ගරු විපක්ෂ නායකතුමාගෙන් මම ප්‍රශ්නයක් අහනවා. ගරු විපක්ෂ නායකතුමනි, එදා මහ බැංකු මං කොල්ලයට සම්බන්ධ වුණු, මහ බැංකුව මං කොල්ල කන්න එදා උපදෙස් ලබා දුන්නු හිටපු අමාත්‍යවරු ඉන්නවා. COPE එක නියෝජනය කරමින් ඉඳලා දුරකථන ඇමතුම් දුන්නු, පොත් ලියපු, footnotes දාපු, ගෙවල් ලබා ගත්තු අය ඉන්නවා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් නොයෙකුත් ආකාරයේ චෝදනා තිබෙන අය ඉන්නවා. ඒවා අද වෙන කොට ඔප්පු වෙලාත් තිබෙනවා. තමුන්නාන්සේගේ නායකත්වයෙන් ඒ කණ්ඩායමට ඉදිරි මැතිවරණයේදී නාම යෝජනා ලබා දෙනවා ද කියලා අපි අහන්න කැමැතියි. මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, ඉදිරි මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව හදන අපේ ආණ්ඩුව යටතේත් වංචාවට තිත තබන බව, වංචාවට තිත තබන ආණ්ඩුවක් ලෙස අපේ ඒ ආණ්ඩුව ඉතිහාසයට එක් කරන බව. අභූත චෝදනා නඟන්නේ නැතිව, ඒ සම්බන්ධයෙන් කුමන කාලයේ හෝ චෝදනාවලට ලක් වුණු සහ ඒ චෝදනා ඔප්පු කරන්න පුළුවන් සියලුදෙනා නීතිය ඉදිරියට ගෙන එන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි.

මීළඟට, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට විනාඩි 13ක කාලයක් තමයි තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම වෙන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු තේනුක විදානගමගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு தேனுக விதானகமகே அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. THENUKA VIDANAGAMAGE left the Chair, and THE HON. K. THURAIRETNASINGAM took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please start your speech.

[5.00 p.m.]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Presiding Member, thank you very much for giving me the opportunity to speak on this Adjournment Motion. This is a very sorry saga. But, I am very happy to contribute constructively to this Debate in order to ensure that the miscarriage of justice that seems to have happened with regard to many issues is rectified.

Sir, you could see that this is a situation where the fight is over, but the battle is not. This is a continuous battle that is on with the officials and I will explain why it goes on like this. The demonic Central Bank is at height of all these activities in this instance. Ninety eight per cent of the problems related to this issue are connected with the Central Bank. The Forensic Audit Report was a spin-off of the Presidential Commission of Inquiry set in motion to go into the Bond issuance of the Central Bank and a Forensic Audit Report was requested by that Presidential Commission, the Cabinet of Ministers and myself as a Minister then to ensure that there is an independent probe into the various political aspersions cast upon many people.

We were able to ensure, due to the sagacity of the Hon. Speaker, that the Forensic Audit Reports were tabled. For reasons unknown, the Forensic Audit Reports were not tabled in Parliament at the beginning and it is a mystery. The reason attributed and mentioned by the Central Bank was that that would inhibit certain actions that have got to be taken legally. But, once you go through the 10,800 pages that have now been tabled in Parliament, which acts as the custodian of the people's rights, you would see that it is nothing but suppression of the Central Bank officials; it is nobody else who had been tried to be suppressed. That is the irony. I thought it is my bounden duty to come clean only of matters referred to in the Forensic Audit Reports. As a Member of Parliament, I can withstand any pressures that come from within, from the Opposition or from the Government, but the officials may not be having the same privilege. Therefore, I would not want to burden any of them. What is already mentioned in the Forensic Audit Reports, I will substantiate with documentation.

Sir, as I said very clearly, no names of politicians are mentioned in those Reports, even though there have been aspersions cast on some. But, the officials of the Central Bank and certain disgraced companies have been referred to. The names of those companies have been withheld and that was the reason why the Forensic Audit Reports were not tabled.

මේ සම්බන්ධයෙන් පැත්තක් අරගෙන වාද විවාද කරනවා නම්, ඔහේ එහෙට මෙහෙට ගහ ගහා ඉන්න පුළුවන්. මහ බැංකු බැඳුම්කර ගනු දෙනුවෙන් පාඩු වෙන්න පුළුවන්. හෙජින් ගනු දෙනුවෙන් වූ පාඩුව රුපියල් බිලියන 86යි. ඒ කියන්නේ, රුපියල් කෝටි අටදහස් හයසියයක්. ඒ වාගේම, Greek Bondsවලින් කෝටි නවසිය හැත්තෑවක් පාඩු වුණා. ශ්‍රීලන්කන් ආයතනයේ අලාභය කෝටි අටදහසක්. මේවා සම්බන්ධයෙන් කියමින් නිරන්තරයෙන් ඒ පැත්තට මේ පැත්තට මඩ ගහගන්න පුළුවන්. හිටපු මුදල් ඇමති වශයෙන් මේ අවස්ථාවේදී මගේ අවශ්‍යතාව ඒක නොවෙයි. මේ වාගේ දේවල් මුදල් ඇමති ධුරය දරපු මහින්ද රාජපක්ෂගේ කාලයේ, මගේ කාලයේ, මංගල සමරවීරගේ කාලයේ වෙන්න පුළුවන්. නමුත් සැබෑ තත්ත්වය මේකයි. මෙතැන අප අතර යුද්ධයක් ඇති වුණාට, මේකේ සැබෑ සටන තිබෙන්නේ මහ බැංකුවේ ඉන්න නිලධාරින් සහ ඒ අය ගනු දෙනු කරන කොම්පැනිත් එක්ක නේද? එය තමයි මට හෙළිදරව් කරන්න අවශ්‍ය වන්නේ. එය තහවුරු කරන්න තමයි මම කටයුතු කරන්නේ.

Then, one of the most important things was that there was a doubt whether the selection of the audit firms was done only at the whims and fancies of the Central Bank. Sir, with your permission, I would like to **table*** this document I have here with me.

It states, I quote:

"As stated in the notice issued to the public on 14 January, 2019 on the progress of the procurement process to select audit firms, the FAs were conducted in five assignments as set out below on Terms of Reference that were finalized in consultation with the Auditor-General and the Attorney-General:"

So, there is a general assumption that the two world reputed audit companies, KPMG and BDO, were selected with the concurrence of the Auditor-General and the Attorney-General. Therefore, there is no escape on that basis. It is a collective responsibility; it gives validity to this.

With that, we can basically look at what the role of the Central Bank is. The two main objectives of the Central Bank are to maintain economic and price stability

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

and to maintain stability of the financial system. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා නීත්‍යනුකූලව තිබුණාට කිසිසේත්ම ක්‍රියාත්මකවෙලා නැහැ කියන එක මේකෙන් පෙනෙනවා. මේ මහ බැංකුව යටතේම අධීක්ෂණය වෙන Ceylinco Golden Key Credit Card Company එක කඩා වැටිලා තිබෙනවා, F& G Group of companies කඩා වැටිලා තිබෙනවා, CIFL එක කඩා වැටිලා තිබෙනවා. Entrust Securities PLC, ETI Finance Limited, the Finance Company, ස්වර්ණමහල්, ප්‍රමුඛ බැංකුව ඇතුළු බැංකු සහ ආයතන ගණනාවක් කඩා වැටිලා තිබෙනවා. ඒවා සම්බන්ධවත් ඇඟිල්ල දික් කරන්නේ දේශපාලනඥයන්ට. නමුත් මහ බැංකුව තමයි ඒවා අධීක්ෂණය කරන්නේ. The protective element is handled by the Central Bank. The regulatory role or the supervisory role into the activities of all those institutions is with the Central Bank. But, when such an institution falls down or comes down, it is the officials and the Minister in charge who are held responsible. Until such time, it is the officials who run those. That is the heinous crime and the specific reason why I draw your attention to and highlight where the problem is. We have won a battle, but we have not won the war. This is a continuous process. The subtlety of the financial transactions is not known to very many people; it is well above them. As a result, you are unable to determine the real forensic loss. But, now, to the best of their ability, an attempt has been made to find that out and I respect that. But, what goes on and the defences made now sometimes come out as hilarious excuses.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුව තමයි මේ ආර්ථිකය විනාශය කරා ගෙන යන්නේ කියන එක පෙන්වන්නට දැන් මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා. දැන්, Rs. 2.9 trillion, බිලියන 2,900ක්, 3,000ක් විතර තිබෙන සේවක අර්ථ සාධක අරමුදල සම්පූර්ණයෙන්ම පාලනය කරන්නේ මහ බැංකුව. මේ රටේ විදේශ සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන 7.8ක් පාලනය කරන්නේ මහ බැංකුව. ඒ වාගේම, මහ බැංකුව අවසර දෙනවා බැංකු වහන්න, අරින්න, ශාඛා ඇති කරන්න, අධ්‍යක්ෂවරු පත් කරන්න, තනතුරු නැති කරන්න වාගේ සියලු දේට. එම නිලධාරීන්ට අදාළව වයස් සීමා පනවලා තිබෙන්නේ මුදල් ඇමති නොවෙයි, ජනාධිපති නොවෙයි, අගමැති නොවෙයි, මහ බැංකුවේ සිටින අධීක්ෂකවරු. සමහර වෙලාවට Governor නොවෙයි මේ කටයුත්ත කරන්නේ, මහ බැංකුවේ සිටින සාමාන්‍ය superintendent කෙනෙක්. මේක තමයි භයානකම තත්ත්වය. එතකොට, විදේශ විනිමය අනුපාතය - exchange rate එක - තීරණය කිරීම, රුපියලේ අගය තීරණය කිරීම, එක රටක ඉඳලා තවත් රටකට මුදල් හුවමාරු කිරීමේ වැඩ කටයුතු - money transactions - වාගේ සියලු දේවල් කරන්නේ මහ බැංකුව තුළින්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමඟ, ලෝක බැංකුවත් සමඟ සාකච්ඡා කරන්නේ, නිල මට්ටමින් කටයුතු කරන්නේ මහ බැංකුවේ සිටින අය. ඒ වාගේම monetary funds ඇති කරන්නේත් මහ බැංකුවෙන්. ඒ වාගේම උකස් කරන දේවල් සම්බන්ධයෙන් සම්පූර්ණ වැඩ කටයුතු කරන්නේ මහ බැංකුවයි. මම මෙයින් පෙන්වන්නට හදන්නේ අද දේශපාලනඥයන් මේක වැරදි පැත්තකට යොමු කරලා තිබෙනවා කියන එකයි. සමහර වෙලාවට අපේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ම මේ සම්බන්ධයෙන් තෘප්තියක් ලබලා චරිත ඝාතන කරන වැඩ පිළිවෙළක් ගෙනගොස් තිබෙනවා. අපට විපක්ෂව සිටි කණ්ඩායම් මේක උපයෝගී කරගෙන "උඹලාගේම අය මෙහෙම කියනවා නම්, ආයේ මොනවා කියන්නද?" වැනි දේවල් කියමින් ඒකෙන් තෘප්තියක් ලබන්නට උත්සාහ කර තිබෙනවා.

වෝහාරික විගණන වාර්තාවෙන් කරුණු හෙළිදරව් වූ පසු මෙය සම්පූර්ණයෙන්ම වෙනත් මතයකටයි ගෙන ගියේ. 2002 සිට 2015 දක්වා සිදු වූ ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ සම්පූර්ණ බර පැටවිලා තිබෙන්නේ වර්තමාන ආණ්ඩු පක්ෂයට සහ එවකට හිටපු ආණ්ඩු පක්ෂයටයි. දැන් මේකේ සම්පූර්ණ වෙනස්වීමක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා තමයි මා ශ්‍රී ලංකා මහ බැංකුවේ වටිනාකම පෙන්වන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 4ක කාලයක් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට මිනිත්තු 10ක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Sending monies overseas, dealing with other companies and financial intelligence, මේ සියල්ලම සම්බන්ධයෙන් තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතුයි. හැබැයි ආණ්ඩු වෙනස් වුණත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් වෙනස් වෙන්නේ නැහැ. මේ කාරණය මා වග කීමක් සහිතව කියන්නේ මේ භයානක රාක්ෂයන් දැනුවත් කිරීමේ අදහසින්. එදා ශ්‍රී ලංකා මහ බැංකුවේ වැඩ කරපු අය අද පිටතට ගිහින් බොහොම සුදනන් වාගේ ලියුම් ලියනවා, පත්‍රවලට ලියනවා. නමුත් ඒ ගොල්ලන්ගේ ක්‍රියාව වෝහාරික විගණන වාර්තාව තුළින් හෙළිදරව්වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මුදල් ඇමති වශයෙන් පොලී අනුපාතය අඩු කරන්න කිසිසේත්ම අවස්ථාවක් තිබුණේ නැහැ. අපට අවශ්‍ය වුණේ එක පොලී අනුපාතයක් අඩු කරන්නයි. ඒ තුළින් රටේ ආර්ථිකයට ලොකු උදව්වක් ඇති වෙනවා. මේක තමයි එදා කළ යුතුව තිබුණේ. නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් අපේ වුවමනාවට වඩා දේවල් ඉෂ්ට කරගනිමින් කටයුතු කරගෙන ගියා. මේ කටයුතු සඳහා සැබෑ power එක තිබෙන්නේ මුදල් ඇමතිවරයාට නොවෙයි, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාට සහ එහි නිලධාරී මණ්ඩලයටයි. ඒ සම්බන්ධයෙන් conflict of interest එකක් තිබෙනවාය කියලා කියන්න පුළුවන්. එදා ක්‍රිෂාන්ත පෙරේරා ශ්‍රී ලංකා මහ බැංකුවේ Monetary Board එකේ සිටියා. හැබැයි එතුමා වැඩ කළේ Capital Alliance Ltd. එකේ සිටින Ceylon Tea Brokers PLC එකේ සිටි Chairman වශයෙන්. ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මොනවත් හෙළිදරව්වෙලා නැහැ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ Public Debt Department එකේ අසීම් නමැති නිලධාරියෙක් ඉන්නවා. මේ වෝහාරික විගණන වාර්තාවේ ඔහු ගැන මොනවත් සඳහන් වන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. ඒ ගනුදෙනු පිළිබඳව හෙළිදරව් වුණාම ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් පිරිසක් නිකරුණේ ගෙදර යවා තිබෙනවා. ඉතා වැදගත් විධියට කටයුතු කරපු සමරසිරි වැනි පුද්ගලයන් ශ්‍රී ලංකා මහ බැංකුවට ඉමහත් සේවයක් ඉෂ්ට කරලා තිබෙන නමුත් ඊර්ෂ්‍යාව නිසා ඔහු ගෙදර යවා තිබෙනවා. මේ රටේ තිබෙන ලොකුම හෙණය තමයි වැඩ කරන කෙනාට ගහන එක. නිකම් බලාගෙන ඉන්නකොට කිසි ප්‍රශ්නයක් නැහැ. වැඩ කරන්නේ නැතුව ඉන්නකොට ප්‍රශ්නයක් නැහැ. නමුත් වැඩ කරන කෙනාට ගහන එක තමයි ලංකාවේ තිබෙන ලොකුම සිරිත. මේ සම්බන්ධයෙන් වෝහාරික විගණන වාර්තාවේ සඳහන් වෙනවා.

අසීම් කියන පුද්ගලයාගේ computer එකෙන් ඔහුගේ නෝනාට ලේඛනයක් යවනවා. ඇය කොහේද වැඩ කරන්නේ? Capital Alliance Ltd. එකේ, another disgraced company that has been mentioned here. 2020 පෙබරවාරි මාසයේ 12 වැනි දා Treasury Bills නිකුත් කිරීම සම්බන්ධයෙන් වූ ලේඛනයේ ඔහුගේ නමත් සඳහන් වෙනවා. ඉන්ද්‍රජිත් කුමාරස්වාමි හෝ දැනට සිටින ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා ඒ සම්බන්ධයෙන් මොනවත් කරලා නැහැ. ඒ ප්‍රශ්නය අහන්නේ නැත්තේ ඇයි කියලා මා අහනවා.

ඒ විතරක් නොවෙයි. Capital Alliance Ltd. සම්බන්ධ කටයුතු දැන් අනිත් අයට තහනම් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කිසි ප්‍රශ්නයක් නැහැ. මා තර්ක විතරක් කරන්නේ නැහැ, මේ අය නම් කරලා තිබෙන නමුත් මේ අය තහනම් කරන්නේ නැත්තේ ඇයි කියලා. These are tainted primary dealers. Why is it that only a few selected have been targeted? I am not going to mention the names of those, but I am asking why the others are not given the same treatment. Ms. W.N.S. Fernando, Front Office එකේ ඉන්න අය සම්බන්ධයෙන් මොනවත් කරලා නැහැ.

කොතරම් Treasury Bills secondary market එකට issue කර තිබෙනවාද කියලා මා ළඟ තිබෙන මේ ලේඛනය තුළින් හෙළිදරවු වෙනවා. මා එම ලේඛනය **සභාගත*** කරනවා.

මේ අවස්ථාවේදී කනක හේරත් මන්ත්‍රීතුමාට මා උත්තර දෙනවා. එතුමා කිව්වා, මේවා ගත්තේත්, විකුණුවේත් රජයේ ආයතන දෙකක් තුළින් නිසා පාඩුවක් නැහැයි කියලා. එහෙම නොවෙයි. වැඩ කරන අහිංසක සේවක පිරිසට ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදලින් සියයට 15ක් ගන්න පුළුවන් අවස්ථාවේ දී රජය පොලී අනුපාතය අඩු කරන්න ඕනෑය කියලා, සියයට 7ක් දීලා, තව පැත්තකින් සියයට හතහමාරක් දුන්නාම සියයට 5ක, සියයට 6ක අලාභය දරන්නේ ඒ වැඩ කරන සේවක පිරිසයි. ඒකට සාධාරණය කිරීමක් වශයෙන් මේක කළාය කියලා කිසිසේත්ම කියන්න බැහැ.

Hon. Presiding Member, I took some initiatives on the 25th of November, 2016 when I saw the heinous crimes committed by the Central Bank and the demonic powers that had been -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කරුණාකරලා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I will take just three to four minutes and finish my speech.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No. There is no time left to be given.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, being a former Minister of Finance, I need to clarify these and ensure from this side that those are rectified.

Sir, due to lack of time, I would like to **table*** a document as Annexe I to show that I, together with the Cabinet of Ministers, proposed certain measures to ensure that we correct the errors that had been committed and to curtail too much power vested in certain people.

Furthermore, there is another document in which names of some officials of the Central Bank are given. I would also like to **table*** that as Annexe II.

With regard to Mr. N.W.G.R.D. Nanayakkara, the document states, "We noted various offers have been issued which caused avoidable loss to the Central Government". Then, there are certain references to Mr. S.S. Ratnayake of the Public Debt Department and Mrs. C.M.D.N.K. Seneviratne. With regard to Dr. M.Z.M. Aazim, it states, "We noted various offers were issued which caused avoidable loss to the Central Government and during his tenure, there was deviation from the laws, policies and guidelines -"

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාකරලා ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, just give me two more minutes.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No. ඔබතුමාට විනාඩි දෙකක් වැඩියෙන් දුන්නා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, we will ensure that that time is deducted from our side.

Then, with regard to Mrs. U.L. Muthugala, it states, "We noted various offers were issued which caused avoidable loss to the Central Government". Then, there is a reference to Ms. W.N.S. Fernando in the Front Office and the document states that the losses made on Direct Placements are not known. Then, with regard to Mr. C.J.P. Siriwardana - these are people who are in high office now - it states, "We noted various offers issued

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

which caused avoidable loss..." Then, there is also reference to Mr. K.G.D.D. Dheerasinghe. This information was not given in the Commercial Bank information-related activity. These were Direct Placements that had been made.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I will take just a minute more.

There is also reference to Mrs. Premaratna in this document. Then it refers to Mr. Wijewardena, the Godfather of all Bonds that were issued. He is the one who opened the subject matter on the 08th of January, 2008 to ensure that private placements go on. But, that was not rectified thereafter. Then, there is Mr. Nandalal Weerasinghe. He is connected with the EPF loss. The loss caused by Wijewardena was of Rs. 4,000 million. So, it goes on like this and there is a huge inflation -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නිමල් ලාන්සා රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.16]

ගරු නිමල් ලාන්සා මහතා (ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் லான்சா - சமுதாய அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Nimal Lanza - State Minister of Community Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. රවි කරුණානායක මැතිතුමාගේ කථාව මම අහගෙන හිටියා. මහ බැංකුවේ නිලධාරි මහත්වරුන්ගේ අඩු පාඩු පෙන්වමින්, එතුමන්ලා විසින් ආර්ථිකය ඝාතනය කරනවා වැනි කථාවක් කීමට තමයි එතුමා උත්සාහ ගත්තේ. විශේෂයෙන්ම, පසුගිය කාලය තුළ මේ නිලධාරිවාදය සිදු කළ ක්‍රියා නිසා රටට විශාල පාඩුවක් වුණාය කියන එක එතුමා පෙන්වා දුන්නා. නිලධාරීන්ට පමණක් ඇඟිල්ල දිගු කරලා ප්‍රධාන බලධාරීන්ට ඒවායින් බේරිලා යන්න පුළුවන්කමක් නැහැ කියන එකයි මට කියන්න තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

2015 වසරේ මහ දවල් සිදු වූ මහ බැංකුවේ මේ මුදල් කොල්ලකෑම පිළිබඳව කථා කරද්දී, අපට අර්ජුන මහේන්ද්‍රන් සහ අර්ජුන් ඇලෝසියස් කියන අය අයින් කරලා කථා කරන්න බැහැ; කසුන් පලිසේනව අයින් කරලා කථා කරන්න බැහැ. මොකද, අර්ජුන මහේන්ද්‍රන් තමයි මේ බැඳුම්කර වංචාවේ ප්‍රධාන චූදිතයා. එක්සත් ජාතික පක්ෂයෙන් මම අහනවා, අර්ජුන මහේන්ද්‍රන් ලංකාවට ගෙනැල්ලා දෙන්නේ කවදාද කියලා. පුළුවන් නම්, කවුරු හෝ ඒකට උත්තරයක් දෙන්න. මොකද, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අර්ජුන මහේන්ද්‍රන් වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේදී ලොකු සහතිකයක් දුන්නා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ඇහුවා, "අර්ජුන මහේන්ද්‍රන් රටින් පැනලා ගියා නේද?" කියලා. එතකොට රනිල් වික්‍රමසිංහ මහත්මයා කිව්වා, "නැහැ, අර්ජුන මහේන්ද්‍රන් ගියේ විවාහයකට සහභාගි වෙන්න" කියලා. එතුමා පිළිබඳව ලොකුම සහතිකය දුන්නේ එක්සත් ජාතික පක්ෂයට නායකත්වය දුන් හිටපු ගරු අගමැතිතුමායි.

එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මේ සභාවේ දැන් ඉන්නවා. මම ඉතාම පැහැදිලිව එතුමන්ලාගෙන් අහනවා, අර්ජුන මහේන්ද්‍රන් ලංකාවට ගෙනෙන්නේ කවදාද කියලා. මොකද, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් අද කථා කළ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා, චම්පික රණවක මැතිතුමා, ගරු රවි කරුණානායක මැතිතුමා කියන සියලුදෙනා පිළිගත්තා, මහ බැංකුවේ මහ දවල් සිදු වූ ඒ මුදල් කොල්ලකෑම නිසා මේ රටට විශාල පාඩුවක් සිදු වෙලා තිබෙන බව. එතැන වංචාවක් සිදු වී තිබෙන බව එතුමන්ලා පිළිගත්තා. එහෙම නම්, එක්සත් ජාතික පක්ෂයෙන්, එම පක්ෂයෙන් නායකත්වයෙන් අප අහන එකම ප්‍රශ්නය වන්නේ, ඔබතුමන්ලා අර්ජුන මහේන්ද්‍රන් ලංකාවට ගෙනෙන්නේ කවදාද කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මේ වාර්තාව ගැන කථා කරද්දී, BDO ආයතනය ගැන කිව්වා. KPMG වාර්තාව හොඳයි කියලා එතුමා කිව්වා. එතුමා කොහොමද මේ වාර්තාව හොඳයි කියලා කියන්නේ? ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාම කිව්වා, මහ බැංකුවේ ඉන්න සියලු දෙනා සම්පූර්ණයෙන්ම වැරදි වැඩ තමයි කරලා තිබෙන්නේ කියලා. ඒ අයම තමයි මේ වාර්තාව හදන්න ඒ ආයතනවලට උපදෙස් දුන්නේ; ඒ අය තමයි tenders call කළේ; මග පෙන්වීම කළේ. එතකොට, රවි කරුණානායක මහත්මයා කියන විධියට, හොරකම් කරන්න සම්බන්ධ වුණු නිලධාරි මහත්වරු ටිකම මේ සියල්ලම කරන්නත් උදව් කර තිබෙනවා. මොකද, රවි කරුණානායක මහත්මයා ඉතා පැහැදිලිව කිව්වා, මේ වාර්තාවේ සියලු කටයුතු කරන්න මහ බැංකුවේ නිලධාරි මහත්වරු උදව් කළා කියලා. එහෙම නම් අපි අහනවා, ගරු රවි කරුණානායක මහත්මයා කියනවා වගේ, මහ බැංකුවේ නිලධාරීන් එහෙම වැරදි වැඩ කළා නම්, මේ වාර්තාව හදන්න මහ බැංකුවේම නිර්දේශය ගත්තේ, මහ බැංකුවේම සහයෝගය ගත්තේ ඇයි කියලා. මොකද, මෙතැන ළබැඳියාව පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා. හොරකම් කළ අයම, ඒ මුදල් කොල්ල කාපු අයම, වංචා කළ අයම මණ්ඩලයක් පත් කරලා වාර්තාවක් හදනවා, තමන්ව බේරෙන විධියට.

අපි දැක්කා, එක්සත් ජාතික පක්ෂයේ හිටපු ඇමතිවරු කිව්වා, එතැන වංචාවක් වෙලා තිබෙනවා කියලා. අනෙක් පැත්තෙන්, ගරු රවි කරුණානායක මහත්මයා කිව්වා, නිලධාරීන් තමයි මේ ඔක්කෝම කරන්නේ කියලා. එහෙම නම්, අපට ඉතාම පැහැදිලිව පෙනෙන්න තිබෙන්නේ මොකක්ද? ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට අපට කියන්න තිබෙන්නේ මෙපමණයි. ඔබතුමා මේ වාර්තාව හොඳයි කියලා කියන්නේ කොහොමද? මේ වාර්තාව මඟින් හිටපු අගමැතිතුමා නිදොස් කොට නිදහස් කර තිබෙන නිසාද ඔබතුමා එහෙම කියන්නේ? එහෙම නැත්නම්, මේ වාර්තාව මඟින් හිටපු ඇමතිවරුන් නිදොස් කොට නිදහස් කර තිබෙන නිසාද ඔබතුමා එහෙම කියන්නේ? "එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරුන්ට සල්ලි දුන්නා, ඒ සල්ලි ගැනීම පිළිබඳව දිවුරුම් පෙත්සම් දීලා තිබෙනවා" කියලා ගරු මහින්දානන්ද අලුත්ගමගේ රාජ්‍ය ඇමතිතුමා කිව්වා, එවැනි අය නිදහස් කර තිබෙන නිසාද ඔබතුමා මේ වාර්තාව හොඳයි කියන්නේ? එම නිසා මේ වාර්තාව හොඳයි කියලා කියන්න බැහැ කියන කාරණය මට ගරු සුනිල්

හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට පැහැදිලිව කියන්න වෙනවා. මේ වාර්තාවේ හොඳ නරක බලන්න වෙන්නේ එය අධ්‍යයනය කිරීමෙන් පසුවයි. මේ සම්බන්ධයෙන් හසළ දැනුමක් තිබෙන අය මේ වාර්තාව හරියට අධ්‍යයනය කරන්න ඕනෑ. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්ව දෙයින්, අපට ඉතාම පැහැදිලිව පෙනෙන දෙයක් තිබෙනවා. මේ මුදල් හොරකම් කළ නිලධාරින් පිරිසම මේ වාර්තාව හදපු නිසා, ඔවුන් ඒක කළේ කොහොමද කියන එක පිළිබඳව අපට සදාචාරාත්මක ප්‍රශ්නයක් තිබෙනවා,

සමහර ගරු මන්ත්‍රීවරු කිව්වා, අර්ජුන මහේන්ද්‍රන්ට විරුද්ධව හඬ නඟන්න සදාචාරාත්මක අයිතියකුත් නැහැ කියලා. ඒ අය කට්න්ද, එහෙම නැත්නම් වෙන කොහෙන් හරි කථා කරනවාද කියලා මම දන්නේ නැහැ. විශේෂයෙන් අපි පසුගිය කාලය තුළ දැක්කා, එක් රාජ්‍ය නිලධාරියෙක් රුපියල් ලක්ෂ 2ක් හොරකම් කළා කියලා අවුරුදු 16කට හිරේ යවපු ආකාරය. එහෙම නම්, රුපියල් මිලියන 10,000ක් හොරකම් කළ අර්ජුන මහේන්ද්‍රන්ලා, අර්ජුන් ඇලෝසියස්ලා, කසුන් පලිසේනලා, රවි කරුණානායක මන්ත්‍රීතුමා කියපු ඒ නිලධාරින් පිරිස අවුරුදු කී දාහක් හිරේ දමන්න ඕනෑද? එතුමා හිටපු ආණ්ඩුව අවුරුදු 5ක් තිස්සේ ඒ එකම මිනිහෙකුටවත් නඩුවක් දමලා නැහැ. එතුමා හිටපු ආණ්ඩුවේ නිලධාරින්ටම තමයි එතුමා ඇඟිල්ල දිගු කළේ. එම නිසා මම ගරු රවි කරුණානායක මහත්මයාගෙන් අහනවා, ඔවුන්ට විරුද්ධව නඩු දමන්න එතුමන්ලාට ඒ කාලයේ ඉඩ දුන්නේ නැත්තේ කවුද කියලා. එතුමාට ඒක මේ පාර්ලිමේන්තුව තුළ කියන්න අයිතියක් තිබෙනවා.

අර්ජුන මහේන්ද්‍රන් රුපියල් මිලියන 300ක් වෙළෙඳ පොළේ ආයෝජනය කරලා දින ගණනක්, පැය ගණනක් තුළ රුපියල් මිලියන 4,600ක ශුද්ධ ලාභයක් ගත්තා. ලෝකයේ කොහේවත් ඒ විධියේ ශුද්ධ ලාභයක් ගන්න බැහැ. රුපියල් මිලියන 300ක් ආයෝජනය කරලා රුපියල් මිලියන 4,600ක ශුද්ධ ලාභයක් ලබනවා කියන්නේ, 1,500ක ප්‍රතිශතයක්. එතුමා ඒ වාගේ ශුද්ධ ලාභයක් ගන්නවා. ඒක තනිකරම හොරකමක්. රුපියල් ලක්ෂ 2ක් හොරකම් කරලා අවුරුදු 16ක් හිරේ යැව්වා නම්, එක වංචාවකින් රුපියල් මිලියන 4,600ක් හොරකම් කළ අර්ජුන මහේන්ද්‍රන් ඇතුළු ඒ කණ්ඩායම ඉතා ඉක්මණින් ලංකාවට ගේන්න කියලා අපි එක්සත් ජාතික පක්ෂයෙන් වැඳලා ඉල්ලනවා.

අර්ජුන මහේන්ද්‍රන්ව සියයට 100ක් විශ්වාස කරලා තමයි එක්සත් ජාතික පක්ෂය ඔහුව මහ බැංකුවට පත් කළේ. මොකද, එතුමාට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය තිබුණේ නැහැ. එතුමාගේ පුරවැසිභාවය පිළිබඳව හිටපු විපක්ෂ නායකවරයෙක් වන ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළා. එසේ ප්‍රශ්න කළාම එවකට හිටපු ගරු අගමැතිතුමා ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාට පොරොන්දු වුණා, අර්ජුන මහේන්ද්‍රන් පිළිබඳව තමන් වග කියනවා කියලා. සමහර අය අර්ජුන මහේන්ද්‍රන් පිළිබඳව පිටු ගණන් ලිව්වා. අර්ජුන මහේන්ද්‍රන් වංචාවක් කරලා නැහැ කියලා සමහර TV debatesවලටත් ගිහිල්ලා කිව්වා. හැබැයි, අද එක්සත් ජාතික පක්ෂයම පිළිගත්තා, අර්ජුන මහේන්ද්‍රන්ගේ කාලයේ රුපියල් බිලියන 10ක වංචාවක් වෙලා තිබෙන බව. විශේෂයෙන්ම බැඳුම්කර හොරකමක් සිදු වුණා කියලා අවුරුදු 5කට පස්සේ පිළිගැනීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ වාගේම, ඒ සියලුදෙනාටම විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරනවා කියලා අපි පැහැදිලිව කියනවා. එහිදී "A" ද, "B" ද, කොළ පාට පක්ෂයද, නිල් පාට පක්ෂයද කියන එක අපට අදාළ නැහැ. ඒක අපි පැහැදිලිව මේ ගරු සභාවට කියනවා.

ඊළඟට, මෙතැනදී පැහැදිලිවම කිව්වා, අර්ථ සාධක අරමුදලට විශාල පාඩුවක් වෙලා තිබෙනවා කියලා. මම යූඇන්පී එකේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහනවා, 2010 ඉඳලා 2018 දක්වා වූ කාලය තුළ අර්ථ සාධක අරමුදලේ තිබුණු සියලු මුදල්වලට ලැබී තිබුණු පොලී අනුපාතය කීයද කියලා තමුන්නාන්සේලා බැලුවාද කියලා. 2010දී සියයට 12.5යි, 2011දී සියයට 11.5යි, 2012දී සියයට 11.5යි, 2013දී සියයට 11යි, 2014දී සියයට 10.5යි. සාමාන්‍ය පොලී ප්‍රතිශතය 11.4යි. තමුන්නාන්සේලා බලන්න, 2015 ඉඳලා 2019 දක්වා කාලයේදී පොලී අනුපාතය වැඩි වෙලා තිබෙන්නේ කීයකින්ද කියලා. 2015දී සියයට 10.5යි, 2016දී සියයට 10.5යි, 2017 වර්ෂයේදී සියයට 10.5යි, 2018දී සියයට 9.5යි. සාමාන්‍ය ගත්තාම ප්‍රතිශතය 10.2යි. හැබැයි, මේක සිදු වෙන්නේ නිකම්ම නොවෙයි. අපේ කාලයේ රටේ පොලී අනුපාතය ක්‍රමක්‍රමයෙන් අඩු වෙලා තිබෙනවා. හැබැයි, එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව කාලයේ පොලී අනුපාතය ක්‍රමක්‍රමයෙන් වැඩි වෙද්දීත්, අර්ථ සාධක අරමුදලේ සාමාජිකයන්ට ලැබුණු ආදායම අඩු වෙලා තිබෙනවා. 2015 ඉඳලා 2019 දක්වා වූ කාලය තුළ අර්ථ සාධක අරමුදලේ සාමාජිකයන්ට ලැබුණු ආදායම පැහැදිලිවම අඩු වෙලා තිබෙනවා. මේ පිළිබඳව ඕනෑම කෙනෙක් එක්ක විවාදයකට එන්න මම ලෑස්තියි.

ඊළඟට, base price එක ගැන කථා කළා. මම ඒ ගැනත් කථා කරන්නම්. BDO පාදක කරගෙන, base price එක වඩා වැඩි මිලෙන් සිදු කරන නිකුතු ගැන කථා කළා, අඩු මිලෙන් සිදු කරන නිකුතු ගැනත් කථා කළා. හැබැයි, මේ ගොල්ලන් මේ සභාවේ කථා කළේ, base price එකට වඩා අඩු මිලකට සිදු කළ නිකුතු පිළිබඳව විතරයි. සාමාන්‍යයෙන් ඕනෑම ව්‍යාපාරයක් කරද්දී ලාභ-පාඩු බලන ක්‍රමවේදයක් තිබෙනවා. පාඩුව විතරක් බලන්නේ නැහැ, ලාභයත් බලන්න ඕනෑ. ලාභය සහ පාඩුව දෙකම බලා තමයි එම ව්‍යාපාරය ලාභද, පාඩුද කියන එක බලන්නේ. හැබැයි, මේ අනුව ඉතාම පැහැදිලිවම තිබෙනවා -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු පියල් නිශාන්ත ද සිල්වා මන්ත්‍රීතුමාට වෙන් කළ කාලයත් තිබෙනවා, ගරු සුසන්ත පුංචිනිලමේ රාජ්‍ය ඇමතිතුමාට වෙන් කළ කාලයත් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගනුදෙනු 2,783කින් බිලියන 28ක් ලාභ වෙලා තිබෙනවා. 2015ට ඉස්සෙල්ලා අලාභයක් වුණාය කියලා මේ කාරණය ලඝු කරන්න යනවා. අපි කියමුකෝ, අලාභයක් වුණාමයි කියලා. හැබැයි, අලාභයක් වෙලා නම්, වංචාවක් වෙලා නම්, එම මුදල් යා යුත්තේ ඒ හිටපු නිලධාරි මහත්වරුන්ට නේ. නමුත් එහෙම කාටවත් ගිහිල්ලා නැහැ. එහෙම කාටවත් ශතයක් ගිහිල්ලා නැහැ. මේ වාර්තාවේ පැහැදිලිවම කියනවා, සමහර තැන්වල අලාභ වුණත්, එම මුදල් ගිහින් තිබෙන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව වාගේ රාජ්‍ය බැංකුවලට බව. මේවා ජනතාවගේ බැංකු; රජයේ බැංකු. හැබැයි, මම ඉතාම පැහැදිලිව මේ සභාවට හඬ නගා කියනවා, 2015ට ඉස්සෙල්ලා කාලය තුළ ශත පහක මුදලක් ඒ හිටපු නිලධාරි මහත්වරුන් කාටවත් අත යටින් හෝ වංචාවෙන් ලැබිලා නැහැ කියන එක. ඒක මේ වාර්තාවෙන්ම ඔප්පුවෙලා තිබෙනවා. මෙම වාර්තාවෙන් ඉතාම පැහැදිලිව ඔප්පු කර තිබෙනවා, එක රුපියලක් පෞද්ගලික ආයතනයකට හෝ කෙනෙකු අතට ගිහින් නැහැ කියලා.

[ගරු නිමල් ලාන්සා මහතා]

මේ වාර්තාවෙන්ම ඔප්පු කරන්නේ මොකක්ද? අර්ජුන මහේන්ද්‍රන් බිලියන දහයකට වඩා ලාභයක් ගත්තාය කියා තිබෙනවා. එතකොට එම ගනුදෙනුවයි, මේ ගනුදෙනුවයි දෙකක්. එම ගනුදෙනුව කළ විධියයි, මේ ගනුදෙනුව කළ විධියයි දෙවිධියක්. අර්ථ සාධක අරමුදලට යම්කිසි පාඩුවක් වෙද්දීත්, මේ ගනුදෙනුවේ ලාභය ලැබී තිබෙන්නේ මහජන බැංකුවට, ජාතික ඉතිරි කිරීමේ බැංකුවට හා ලංකා බැංකුවට. හැබැයි, අර ගනුදෙනුවෙන් රජයට පාඩුවක් වෙලා තිබියදීත්, එය ලාභය විධියට ගිහින් තිබෙන්නේ කාටද? අර්ජුන මහේන්ද්‍රන්ලාට, ඇලෝසියස්ලාට, කසුන් පලිසේනලාට, එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරුන්ට. ඒ අයට සල්ලි බෙදුවා. ඒ නිසා 2010-2015 කාලය තුළ ශත පහක වංචාවක් සිදු වෙලා නැහැ කියන එක මේ පාර්ලිමේන්තුවට අපට කියන්න පුළුවන්. ශත පහක් වංචා කරලා නැහැ, ඒ කාලයේ සිටි නිලධාරින්.

අපි තමුන්නාන්සේලාට ආණ්ඩුව භාර දෙද්දී, මේ රටේ පැවැති ආර්ථිකය ගැන තමුන්නාන්සේලාට විශේෂයෙන් කියන්න ඕනෑ. අපි ආර්ථික වර්ධන වේගය සියයට හතට ගෙනැවිත් තිබුණා. යහ පාලන ආණ්ඩුවේ අන්තිම කාලයේ ආර්ථික වර්ධන වේගය සියයට 1.6යි. රුපියලේ අගය 131ට තිබුණේ. යහ පාලනය අවසාන වෙද්දී රුපියලේ අගය 182යි. රාජ්‍ය ණය ඩොලර් බිලියන 42ට තිබුණේ. හැබැයි, එය 54 දක්වා ගෙනාවා. ඊළඟට, තරුණ සේවා වියුක්තිය සියයට 16ට තිබුණේ. එය සියයට 22 දක්වා වැඩි කර තිබෙනවා. ආසියාවේ සියයට සියයක්ව තිබුණු අපේ කොටස් වෙළෙඳ පොළ, සියයට 40, සියයට 60 දක්වා ගෙනාවා. ඒ වාගේම සියයට 11ට තිබුණු ආනයන-අපනයන පරතරය සියයට 15ට ගෙනාවා. ඒ නිසා මේ ආර්ථිකය ගැන පසුගිය යහ පාලන ආණ්ඩුවට කථා කරන්න බැහැ. ආර්ථිකයේ සියලු සංඛ්‍යාලේඛන කඩා වැට්ටුවා. ජනතාව කබලෙන් ලිපට දැම්මා.

ඒ නිසා තමයි මේ රටේ 69ලක්ෂයක් ජනතාව යහ පාලන රජය ගෙදර යවන්න ඡන්දය පාවිච්චි කළේ. යහ පාලන රජය හොඳට කළා නම් ලෝකයේ අනෙකුත් රටවල ආර්ථික දර්ශකවලට සාපේක්ෂව ලංකාවේ ආර්ථික දර්ශකයත් උඩට එන්න ඕනෑ. නමුත් මොකක්ද වුණේ? ආර්ථික වර්ධන වේගය කඩා ගෙන වැටුණා. මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැතිව ගියා. ඒ ආර්ථිකය කඩා වට්ටපු වැට්ටිල්ල නැවත අපට ගොඩගන්නත්, අතිගරු ජනාධිපතිතුමාට ගොඩ ගන්නත් තව ටික කාලයක් යයි. යහ පාලන ආණ්ඩුව ආපු ගමන් කෙළින්ම මහ බැංකුව කොල්ලකාලා මුළු ආර්ථිකයම අනෙක් පැත්තට හරවපු එක. බලන්න, ණය පොලිය කොච්චර වැඩි කළා ද කියලා. පොලී අනුපාතිකය සියයට 2.5කින් වැඩි කිරීම තුළ අපේ රට විසින් විදේශයට ගෙවන්න ඕනෑ මුදල කොපමණ වැඩි වුණාද? රටේ උද්ධමනය වැඩිවීම නිසා, ඩොලර් එක වැඩිවීම නිසා රුපියල් බිලියන කීයක් වැඩිපුර ගෙවන්න වුණාද? දේශීය බැංකුවලින් ණය අරගෙන තිබුණා. ඒ ණය අරගෙන තිබුණේ සියයට 6.6ට, එහෙම නැත්නම් සියයට 6.8ට. ඒක සියයට 12 දශම ගණනක් දක්වා වැඩි වුණා. මිනිස්සුන් කී දෙනෙක්ගේ සල්ලි ගෙවන්න වුණාද? යහ පාලන ආණ්ඩුව ඇවිල්ලා සියයට සියයක් බදු ගහලා ආදායම වැඩි කළත්, විදේශ රටවලට ණය ගෙවන්න හෝ ලංකාවේ බැංකුවලට ණය ගෙවන්න ඒ ආදායම ප්‍රමාණවත් වුණේ නැහැ. ඒ නිසා තමයි අපි ඉතාම පැහැදිලිව කියන්නේ, මහ බැංකුවේ මහ දවල් කොල්ලය නිසා මේ රට ආපහු කිසිම නායකයෙකුට ගොඩ ගැනීමට නොහැකි තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියලා. මේක අවිවාදයෙන් යුතුව තමුන්නාන්සේලා අපි සියලු දෙනා පිළිගන්න ඕනෑ. රවි කරුණානායක මන්ත්‍රීතුමාත් ඒක කිව්වා. රවි කරුණානායක මන්ත්‍රීතුමා ඒක නොකියා කිව්වා. රවි කරුණානායක මන්ත්‍රීතුමා දේශපාලන කථාවක් කරන්නේ නැතිව ඉතාම හොඳ කථාවක් කළා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි කියන්නේ කවුරු හොරකම් කළත් හොරකම හොරකමමයි. කවුරු කොල්ල කෑවත් කොල්ලය කොල්ලයමයි. ඒ නිසා මේ වංචාව කළ සියලුදෙනාට විරුද්ධව -රුපියලක් හෝ වංචාවක් කළ අයට විරුද්ධව, රුපියලක් හෝ සතයක් හෝ හොරකම් කළ අයට විරුද්ධව- නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන එක අපි මේ සභාව ඉදිරියේ පෙන්වලා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ‍ෆෝරෙන්සික් විගණන වාර්තාවට අදාළ අය ගැන මම මීට වඩා කථා කරන්නේ නැහැ. මේ වන විට නීතිපතිතුමාට සම්පූර්ණ වාර්තාව ලැබිලා තිබෙනවා. මේ වාර්තාව අනුව සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා යෝජනා කළ විධියට හෝ මේ වැරදි කරපු සියලුදෙනාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරලා, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන අන්දමට මේ වැරදි කරපු අයට දඬුවම් කරන්න කටයුතු කරන්න කියලා මම අවසාන වශයෙන් නීතිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. වැරදි කරපු මේ සුදු කරපටි හොරු ගැන තීන්දුවක් අරගෙන මේ රටේ ජනතාවට සාධාරණය ඉටු කරන්න කියලා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙනුත් ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Ashok Abeysinghe. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.31]

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

මේ ෆෝරෙන්සික් විගණන වාර්තාව ආවාට පස්සේ වර්තමාන ආණ්ඩු පක්ෂයේ අය කොපමණ කලබල වෙලාද කියලා මේ කරන කථා වලින් අපට තේරෙනවා. මම කෝප් කමිටුවේ සාමාජිකයකු විධියට වග කීමෙන් කියනවා, එවකට හිටපු විපක්ෂයේ මන්ත්‍රීවරු තමයි "මේ සඳහා ෆෝරෙන්සික් විගණනයක් කළ යුතුයි" කියලා කෝප් කමිටුවේදී ඉල්ලා සිටියේ කියලා. එවකට හිටපු විපක්ෂය අපට හැම වෙලාවේම කිව්වේ මහ දවල් මහ බැංකුව කොල්ල කාලා කියලායි. හැබැයි, එවකට හිටපු විපක්ෂය ඉල්ලපු ෆෝරෙන්සික් විගණන වාර්තාව අද එළියට ආවාට පස්සේ අපට තේරෙනවා, මහ දවල් විතරක් නොවෙයි, 2005 සිට 2015 දක්වා දිවා රෑ නොබලා මහ බැංකුව කොල්ල කාලා තිබෙනවාය කියලා. ඒක මේ ෆෝරෙන්සික් විගණන වාර්තාවේ හොඳට පැහැදිලි කරලා තිබෙනවා. විශේෂයෙන්ම එම වාර්තාවේ එක් ස්ථානයක තිබෙනවා, පවුල් ගහක් පිළිබඳව. I quote:

"FAMILY TREE OF AJIT NIVAD CABRAAL (TERM 2006-2015) AND THEIR RELATIONSHIPS ASSOCIATED"

එම වාර්තාවේ තිබෙනවා primary dealersලා -මහ බැංකුවට ණය දෙන ආයතන- 18 තුළ අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාගේ පවුලේ සාමාජිකයන් දහදෙනෙක් හිටපු හැටි. 2013 අර්ජුන ඇලෝසියස් මැතිතුමාගේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අධ්‍යක්ෂවරියක ලෙස හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාගේ සහෝදරිය ඉඳලා තිබෙනවා. එතුමිය අයින් වෙලා තිබෙන්නේ, 2015දී. මහ බැංකු අධිපතිවරයාගේ සහෝදරියක් සිටින ආයතනයකට, බැඳුම්කර ගනුදෙනුව හරහා මහ බැංකුවට ණය ලබා දීමට කටයුතු කරන්න පුළුවන් වෙන්නේ කොහොමද? මෙන්න මේක තමයි දැන් තිබෙන ප්‍රශ්නය.

අර්ජුන් මහේන්ද්‍රන් මැතිතුමා ගැන බොහෝ දෙනෙක් කිව්වා. දැන් එතුමා ලංකාවේ නැහැ. ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා, එතුමා ගෙන්වා ගන්න. හැබැයි, දැන් ලංකාවේ ඉන්නවා ඊට වඩා වැඩි හොරෙක්. ඒ කවුද? හිටපු මහ බැංකු අධිපති. මේ වෝහාරික විගණන වාර්තාවේ තිබෙනවා, හිටපු මහ බැංකු අධිපතිවරයාගේ කාලයේ -2005 සිට 2015 අතර කාලය තුළ- බිලියන 10.4කට වැඩි ප්‍රමාණයකින් රජයට පාඩු වෙලා තිබෙනවා කියලා. ඒ පාඩුව කාගෙන්ද අය කර ගන්නේ? අර්ජුන් මහේන්ද්‍රන් අත්අඩංගුවට ගෙන මේ රටට ගෙනෙනකම් ඇයි අපට බැරි, මේ වාර්තාවේ තිබෙද්දීත් 2005 ඉඳලා 2015 දක්වා වූ පාඩුවට සම්බන්ධ අය අත් අඩංගුවට අරගෙන ක්‍රියා කරන්න? මේ ගැන දැන් තමයි කලබල වෙලා, භූමිතෙල් ගෑවුණු ගැරඬි වාගේ දඟලන්න පටන් අරගෙන තිබෙන්නේ.

ඔබතුමන්ලා දැන් කියනවා, මේ වාර්තාව කිසිසේත්ම නොවටිනා ලියවිල්ලක් කියලා. මෙය නොවටිනා ලියවිල්ලක් යැයි කියන්න හේතුව මොකක්ද? ඒ ගොල්ලන්ගේ කාලයේ සිදු වූ පාඩුව වැඩි නිසා. බැඳුම්කර සම්බන්ධයෙන් අපේ රජය කාලයේ වරදක් වුණේ නැහැ කියලා අපි කියන්නේ නැහැ. වැරැද්දක් වෙලා තිබෙනවා. ඒ වැරදි කළ අයට දඬුවම් දිය යුතු බවත් අපි කියා තිබෙනවා. හැබැයි, අපේ කාලයේ තිබුණේ මිලියන 630ක -කෝටි 63ක, 64ක- පාඩුවක්. ඒ ගොල්ලන්ගේ කාලයේ කෝටි එක්දහස් ගණනට වඩා වැඩි වංචාවක් වෙලා තිබෙනවා. වංචා කරලා තිබෙන්නේ, බැඳුම්කරවලින් - bonds - විතරක් නොවෙයි. සැලසුම් සහගත ලෙස ජනතාවගේ සේවක අර්ථ සාධක අරමුදලිනුත් වංචා කරලා තිබෙනවා; මහ දවල් කොල්ල කාලා තිබෙනවා. මේ ගැන විනාඩි හතක් හෝ අටක් තුළ කථා කරන්න බැහැ. මේ ගැන අප දීර්ඝ වශයෙන් කථා කළ යුතුයි.

මම COPE එකේ සාමාජිකයෙක්. 2016 COPE වාර්තාව මා ළඟ තිබෙනවා. ඒ ගැන මේ අවස්ථාවේ ගරු සභාව දැනුවත් කරන්න මම කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාව බලපුවාම පෙනෙනවා රජයට කරපු පාඩු සහ හොරකම් මොනවාද කියලා. එම වාර්තාවේ තිබෙනවා, අපේ රජය එන්න ඉස්සෙල්ලා -2015ට පෙර- පැවැති රජයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිවරයා ලෙස ගත් තීන්දුවක් නිසා ලංකාවේ මහ බැංකුවට පළමුවැනි වතාවට කෝටි 7,160ක් පාඩු වුණේ කෙසේද කියලා. කෝටි 7,160ක් කියන්නේ පොඩි ගණනක් නොවෙයි; බිලියන 71.6ක්. 2015, 2016 දක්වා තිබෙන සමස්ත මහ බැංකුවේ බැඳුම්කර වංචාව කියන එක බිලියන 20ක් පමණයි. ඒගොල්ලන්ගේ ඒ අවුරුදු තුන තුළ බිලියන 71.6ක් මහ බැංකුවට පාඩු කරලා තිබෙනවා. පාඩු කරලා තිබෙන්නේ කෙසේද? ඒ වෙලාවේ රජයට විදේශ මුදල් සංචිත තිබුණේ නැහැ. ඒ නිසා එතුමා මුදල් ඇමතිවරයා හැටියට තීන්දුවක් ගත්තා. ඒ තමයි, ඕනෑම බැංකුවකට ඩොලර් ණයට ගන්න පුළුවන්; ඒ ඩොලර් භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් ලෙස මහ බැංකුවේ ආයෝජනය කරන්න පුළුවන්; බැඳුම්කර හා බිල්පත් ලෙස ඒ ඩොලර් මහ බැංකුවේ ආයෝජනය කළාම ඒවා කල් පිරෙන අවස්ථාවේදී ඩොලර් එකේ රුපියලේ අගයේ වෙනසක් වෙලා තිබුණොත් ඒ වෙනසේ පාඩුව මහ බැංකුව දරන්න ඕනෑ කියලා. ඒ වෙනස නිසා 2013දී මහ බැංකුවේ පාඩුව දෙදහස් දෙසීය විසිහතරකෝටි අසූතුන්ලක්ෂ දොළොස්දාහයි. 2014දී මහ බැංකුවේ පාඩුව තුන්දහස්එකසිය පනස්තුන්කෝටි දහඅටලක්ෂ අනූහතරදාහයි. 2015දී මහ බැංකුවේ පාඩුව එක්දහස්හත්සිය අසූඑක්කෝටි තිස්හයලක්ෂ හැටදෙදාහයි. සමස්ත පාඩුව කෝටි හත්දහස් එකසිය හැටයි. මේ සමස්ත පාඩුවට කවුද වග කියන්නේ? ශ්‍රී මහ බැංකුව ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට පාඩු ලබන ආයතනයක් බවට පත් වුණේ 2015ට පෙර තිබුණු රජයේ මුදල් ඇමතිවරයා ගත්ත අත්තනෝමතික තීන්දුවක් නිසායි. ඒ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. 2005 සිට මේ දක්වා වන කාලයට අදාළව බිලියන 20ක් ගැන කථා කරනවා. නමුත් එදා බිලියන 71ක් පාඩු කරලා තිබෙනවා. මේවා අය කර ගන්නේ කාගෙන්ද? මේ ගැන කථා කරන්නේ නැහැ. මේ ගැන වෙනම විවාදයක් තිබෙන්න ඕනෑ. මේවා ගැන කථා කරන්නේ නැහැ. මහ බැංකු අධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් නැතිව බ්‍රිතාන්‍යයෙන් උපදේශකවරු තුන්දෙනෙක් ගත්තා. ඒ තුන්දෙනාට කෝටි 139ක් - 1.39 billion - ගෙවලා තිබෙනවා. එක්කෙනෙකුගේ මාසික පඩිය කෝටි හතරයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් නැතිව කෝටි හතරක මාසික වැටුපට උපදේශකවරු තුන්දෙනෙක් අරගෙන තිබෙනවා. මේවාට වග කියන්නේ කවුද? දැන් මේ ගැන කථා කරනවා. මේ වාර්තාව ආවාට පසුව භූමිතෙල් ගාපු ගැරඬි වාගේ කෑගහනවා. අජිත් නිවාඩ් කබ්රාල් අත්අඩංගුවට ගන්නකෝ. අද ගන්න පුළුවන් නේ. එතුමාත් එක්ක පවුලේ අය දසදෙනෙක් ඉන්නවා. ඒ අයගේ නම් තිබෙනවා නේ. ඒ ගොල්ලන් කොච්චර දේවල් කරලා තිබෙනවාද? ඒ ගැන කථා කරන්නේ නැත්තේ ඇයි? ඒ ගැන කථා කරන්නේ නැතිව විරුද්ධ පක්ෂයේ සිටින අපට මඩ ගහනවා. ඒ විතරක් නොවෙයි.

මේ අය සිල් ගත්ත අය වාගෙයි කථා කරන්නේ. පසුගිය ආණ්ඩුව 2005 සිට 2015 දක්වා කාලයේ මොකුත් කරලා නැහැ. සිල් ගත්ත අය වාගෙයි ඉන්නේ. ඊත් දැන් ඔය එන්නේ. මිග් ගනුදෙනුවට සම්බන්ධ අය තමයි දැන් රිමාන්ඩ් වුණේ. ශ්‍රීලන්කන් ගුවන් සමාගමට ගුවන් යානා මිලට ගනිද්දී ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එතැනදී ඇමෙරිකානු ඩොලර් මිලියන 16.84ක් - රුපියල් බිලියන තුනක්- කොමිස් ඉල්ලා රුපියල් කෝටි 36ක් ලැබිලා තිබෙනවා. ඒකට සිදු වුණු දේ දැන් පෙනෙන්න තිබෙනවා. රුපියල් කෝටි 55,000ක් - US Dollars 2.8 billion - පමණ වන ගනුදෙනුව කවදාවත් SriLankan Airlines එකේ සභාපතිවරයා නොදැන කරන්න පුළුවන්ද, මුදල් ඇමතිවරයා නොදැන කරන්න පුළුවන්ද? මෙවැනි දේවල් තමයි පසුගිය රජය කාලයේ සිදු වුණේ. දැන් සිල් ගත්තා වාගේ කථා කරනවා. කිසි දෙයක් නොකළා වාගේ කථා කරනවා. [බාධා කිරීමක්]

අපේ රජය කාලයේත් යම්කිසි වරදක් සිදු වෙලා තිබෙනවා. ඒකට අනිවාර්යයෙන්ම දඬුවම් දෙන්න ඕනෑ. පසුගිය කාලයේ - 2005 සිට 2015 දක්වා කාලයේ- සිදුවීම් සම්බන්ධයෙන් අජිත් නිවාඩ් කබ්රාල් ඇතුළු පවුලේ සියලුදෙනාටත් දඬුවම් දෙන්න, ඔවුන් වහාම අත්අඩංගුවට අරගෙන ඒ මුදල් රජයට අය අරගන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කංචන විජේසේකර රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

ගරු කංචන විජේසේකර මහතා (තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - தேயிலைக் கைத்தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera- State Minister of Tea Industry Development)

Sir, I have 10 minutes.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. State Minister, you have only six minutes.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මම ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගේ වේලාවත් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාට වේලාව වෙන් කරලා නැහැ. Hon. State Minister, you have been allotted only six minutes.

[අ.භා.5.40]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් වෝහාරික විගණන වාර්තාව පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී අපි කනගාටු වෙන්න ඕනෑ, මීට පෙර පැවැති පාර්ලිමේන්තුවේත් විවාද කරපු, මේ පාර්ලිමේන්තුවේත් විවාද කරන මේ ගනුදෙනු සම්බන්ධයෙන් වගකිව යුතු පිරිස බන්ධනාගාර ගත කිරීමට, අධිකරණය වෙත ගෙන යෑමට අපට තවමත් පුළුවන්කමක් නොලැබීම ගැන. 2015 පෙබරවාරි මාසයේ පළමුවැනි ගනුදෙනුව සිදු වුණාම තමයි මේ රටේ ජනතාව බැඳුම්කර වංචාව කියන එක පිළිබඳව අවබෝධයක් ලබා ගත්තේ. අපේ හිටපු රාජ්‍ය ඇමතිතුමා කිව්වා, "බොහෝදෙනෙක් සිල් අරගෙන වාගේ ඉන්නවා" කියලා. එතුමන්ලා නියෝජනය කරන පක්ෂයේ නායකයා මේ බැඳුම්කර වංචාව පිළිබඳ විමර්ශනය කරන්න කමිටුවක් පත් කළා; "පිටිපන කමිටුව" කියලා නීතිඥ කමිටුවක්. එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය නියෝජනය කරන නීතිඥ කණ්ඩායමකින් සමන්විත කමිටුවකින්, "කිසිම වංචාවක් සිදු වෙලා නැහැ. මේ කාරණා සියල්ලම සිදු වෙලා තිබෙන්නේ නීතියට අනුකූලව" කියලා වාර්තාවක් දුන්නා. ඩිව් ගුණසේකර මැතිතුමා COPE එකෙන් බැඳුම්කර වංචාව පිළිබඳව විමර්ශනය කරන අවස්ථාවේ, ඒ විමර්ශන වාර්තාවෙන් කරුණු අනාවරණ වෙනකොට හිටපු ආණ්ඩුවේ එක්තරා රාජ්‍ය ඇමතිවරයෙක් මේ වාර්තාව නිකුත් කරන්න එපා කියලා අධිකරණයට ගියා. එහෙම තහනම් නියෝගත් ගත්තා. පොත් ලිව්වා. "බැඳුම්කරයේ ඇත්ත නැත්ත" කියලා පොතක් ලිව්වා. ඒ පොත ලියපු පුද්ගලයා අර්ජුන් අලෝසියස් සමඟ මුදල් ගනුදෙනු සිදු කරලා තිබෙනවා කියලා පසුකාලීනව හෙළිදරව් වුණා.

ඒ වාගේම, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පසුගිය පාර්ලිමේන්තුව විසුරුවන අවස්ථාවේ කිව්වා, "ආණ්ඩුව බේරා ගැනීම වෙනුවෙන් COPE එකේ වාර්තාව එළිදැක්වීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පවා සිදු වුණා." කියලා. මුල සිට මේ වංචාව යටපත් කරන්න හදපු කණ්ඩායම මේ වෝහාරික වාර්තාවෙනුත් කළේ තවත් කල් ගැනීම පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුදු පහ තුළ හිටපු ආණ්ඩුවට හෝ හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල්ට හෝ කාට හරි මේ චෝදනා එල්ල කළා. නමුත් පසුගිය කාලයේ අනාවරණ වුණා, ඔවුන් කොහොමද අධිකරණය සම්බන්ධයෙන් වැඩ කටයුතු කළේ; දුරකථන සංවාද තුළින් කොහොමද අධිකරණයේ කටයුතුවලට බලපෑම් කළේ කියලා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය කිව්වා, කොහොමද මේක කළේ කියලා. සුහද ගම්ලත්ලා කිව්වා, කොහොමද බලපෑම් එල්ල වුණේ කියලා. FCID එකේ කටයුතු කළ රවි වෛද්‍යාලංකාර හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්. ඒ සියලුදෙනා එදා කරුණු අනාවරණ කළා, එවකට සිටි විපක්ෂයට එරෙහිව කටයුතු කරන්න හිටපු ආණ්ඩුව කොහොමද බලපෑම් එල්ල කළේ කියලා. ඔවුන් යම් කිසි වංචාවක් පිළිබඳව විමර්ශනයක් කර තිබුණා නම්, ඒ ගැන යම් කිසි අවබෝධයක් තිබුණා නම්, යම් කිසි සාක්ෂියක් තිබුණා නම් එදා දවසේ අජිත් නිවාඩ් කබ්රාල් පමණක් නොවෙයි, අපේ විපක්ෂයේ සිටි සියලුදෙනාම අධිකරණය වෙත ගෙන යනවා. මේ වෝහාරික විගණන වාර්තාවත් පාවිච්චි කළේ එක්තරා ආකාරයකින් ඔවුන්ගෙන් සිදුවුණු වංචා වසා ගැනීම සඳහා පමණයි.

අපට මතකයි COPE වාර්තාව. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා එ් වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වෙලාවේ මෙතුමන්ලා නියෝජනය කරපු COPE එකේ හිටියා, පාද සටහන් දාපු අය; දුරකථන සංවාද කරපු අය; මුදල් හුවමාරු කරගත් අය. ඒ විතරක් නොවෙයි, ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත්කරලා තවත් අවුරුදු එකහමාරක් මේ කටයුත්ත කරගෙන ගියා. විශේෂ අධිකරණ පැනවුවා. හැබැයි, විශේෂ අධිකරණවල මූලිකත්වය දුන්නේ බැඳුම්කර වංචාවෙන් සිදුවුණු පාඩුව පිළිබඳව විමර්ශනය කරන්න නොවෙයි, විපක්ෂයේ දේශපාලන කඳවුර නියෝජනය කළ පිරිස් දඩයම් කිරීම සඳහායි. වෝහාරික විගණන වාර්තාවක් ඉල්ලා තවත් අවුරුදු එකහමාරක කාලයක් ගත්තා. ඒ විතරක් නොවෙයි, වෝහාරික විගණන වාර්තාව සකස් කිරීම වෙනුවෙන් මහ බැංකුවේ මුදල් රුපියල් මිලියන 200කට වැඩි මුදලක් -ලක්ෂ 2000කට වැඩි මුදලක්- පාවිච්චි කරලා තිබෙනවා. ඒ සඳහා දඬුවම් ලැබිය යුතු පිරිස මොන පැත්තේද ඉන්නේ, ඔවුන් වෙත දඬුවම් ලබාදිය යුතුයි, ඒ ගැන අපට කිසි ගැටලුවක් නැහැ. [බාධා කිරීමක්]

අපට මතකයි හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් බැඳුම්කර විමර්ශන කොමිෂන් සභාවෙන් ලිඛිතව ඉල්ලීමක් කළා, "උත්තර දෙන්න අවස්ථාවක් ලබාදෙන්න. ප්‍රශ්න කරන්න එන්නම්. ඕනෑම කාරණාවක් වෙනුවෙන් එන්නම්" කියලා. නමුත් එක් අවස්ථාවක්වත් ලබාදුන්නේ නැහැ. මේ වන විට රුපියල් බිලියන 10ක අලාභයක් පෙන්වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රුපියල් බිලියන 10ක අලාභය පෙන්වන්නේ 2005 ඉඳලා 2015 දක්වායි. මහ බැංකුව හරහා යම් යම් ගනුදෙනු කරනකොට ලාභ අලාභ සිද්ධ වෙනවා. අපි කියන්නේ එවැනි ගනුදෙනු ගැන නොවෙයි. සංවිධානාත්මකව කරපු හොරකමක් නිසා අවුරුද්දක් ඇතුළත රුපියල් බිලියන 9කට වැඩි පාඩුවක් සිද්ධ කරපු ආණ්ඩුව පමණක් නොවෙයි, ඒ තුළින් නිකුත් කළ බැඳුම්කර නිසා අවුරුදු 30ක් යනතෙක් මේ රටේ ජනතාවට සියයට 3ක පොලී වැඩිවීම නිසා මේ රටේ ණය බර වැඩිවීම පමණක් නොවෙයි, මේ රටේ බැංකු පද්ධතියේ පොලී අනුපාතය වෙනස් වීම තුළ මේ රටට විශාල හානියක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ කාරණා පිළිබඳව අවධානය යොමු කළ යුතුයි.

මෙය මේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන අවසාන විවාදය වෙන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේදීත් මේ ගැන විවාද කරලා ඊළඟ පාර්ලිමේන්තුවටත් ගෙනයන්න උත්සාහ කරන්නේ නැතිව බැඳුම්කර වංචාවේ නියම සැකකරුවන් හැටියට ඉන්න, චෝදනා එල්ල වුණු දේශපාලන අධිකාරිය, විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ හිටපු අගමැතිතුමා ප්‍රමුඛ ඒ දේශපාලන අධිකාරියට විරුද්ධව ඒ කටයුතු සිදු කළ යුතුයි. ඔවුන් සියලුදෙනාම මේ වෙනුවෙන් වගකිව යුතුයි. මෙය සංවිධානාත්මකව වුණු හොරකමක් කියන එක අපි පැහැදිලි කරලා කිව්වා. මේ ගනුදෙනුව සිදු කරන්න කොහොමද මේ auction ක්‍රමයට ගියේ? ඒ වෙනුවෙන් මුදල් වෙන් කරගත්තේ කොහොමද? ලංසු තබන වෙලාවේ අඩුම තරමින් මේ බැඳුම්කරය වෙනුවෙන් ලංසු තැබීමට මුදල් ලබාගන්නේත් රජයේ

බැංකුවක් හරහායි. ඒ නිකුත් කිරීම් ඉල්ලූ බැංකුවකින්ජ් බැඳුම්කර වංචාවට සම්බන්ධ සමාගම දින 2ක ණය ලබාගෙන තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 දක්වා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම ගනුදෙනු කරලා තිබෙනවා. 2015 දක්වා ඔවුන්ට හිමිවෙලා තිබෙන්නේ සියයට එකක පමණ බැඳුම්කර පමණයි. නමුත් සියයට 96ක බැඳුම්කර ගනුදෙනු 2015න් පස්සේ සිද්ධ වෙලා තිබෙන්නේ. ඔවුන්ගේ ලාභාංශවල කියනවා 2015දී සිදුවෙච්ච ගනුදෙනු දෙක නිසා 2014ට සාපේක්ෂව සියයට 1500කින් ඔවුන්ගේ ලාභාංශ කොටස් වැඩිවෙලා තිබෙනවා කියලා. 2015 පෙබරවාරි මාසයේත්, 2016 මාර්තු මාසයේත් සිදුවුණු ගනුදෙනු නිසා ලැබූ ලාභය සියයට 1500කින් වැඩිවෙලා තිබෙනවා.

මෙය මේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන අවසාන විවාදය වෙන්න පුළුවන්. ලබන පාර්ලිමේන්තුව වෙනකොට මේ සම්බන්ධව අධිකරණ කටයුතු සිදුකරලා මේ සඳහා අදාළ පුද්ගලයන් සොයාගෙන ඔවුන්ට දඬුවම් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වෙද්දී ඒ වෙනුවෙන් අපට හැකි උපරිම සහයෝගය ලබාදෙන්න අප කටයුතු කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Field Marshal Hon. Sarath Fonseka. You have 17 minutes.

[අ.භා.5.47]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස පුරාවට වෝහාරික විගණන වාර්තාව ගැන කළ නොයෙක් ප්‍රකාශ අපි අහගෙන හිටියා. හුඟාක් වෙලාවට ඒ පැත්තෙන් මේ පැත්තට, මේ පැත්තෙන් ඒ පැත්තට බෝලේ පාස් කරනවා අපි දැක්කා.

ඒ වාගේම මෙහිදී හුඟක් කියැවුණේ මෙතැන තිබෙන ගණන් හිලව් ගැන. වරින් වර හැමකෙනාම අයිසින් දම දමා, ටොෆි චොකලට් ගාව ගාවා, රහ කර කර මේ ගැන කථා කළා. නමුත්, මේකේ අවසානය කොහේද කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය. අපේ රජය තියෙද්දී සිදු වූ බැඳුම්කර වංචාව ගැනත්, ඒ වාගේම ඊට කලින් පැවැති රජය ඒ ක්‍රමවේදය විශාල ප්‍රමාණයෙන් ආරම්භ කරපු ආකාරයත් මේ වෝහාරික විගණන වාර්තාවෙන් හෙළිදරව් කර තිබෙනවා. එතකොට, මේ බැඳුම්කර වංචා ක්‍රමවේදය ආරම්භ කරලා තිබෙන්නේ කලින් පැවැති රජයයි. ඒ ක්‍රමය දිගින් දිගටම පැවතගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ කාලයේදීත් විශාල වශයෙන් වංචා වෙලා තිබෙනවා. මේ ගැන පරීක්ෂණයක් පැවැත්වුවා; වාර්තාවක් ගෙනාවා. මේ වාර්තාව ගේන්න කියලා COPE එක යෝජනා කරලා තිබෙනවා. COPE එක ඒ සම්බන්ධයෙන් යෝජනා කළාම රජය නියෝජනය කරමින් කමිටුවේ සිටින සාමාජිකයන්ද ඒකට එකඟ වෙලා තිබෙනවා. ඒ නිසා මේක අපේ තනි කැමැත්තට කළ එකක් නොවෙයි. ඒ ගොල්ලන්ගේත් අපේත් අවශ්‍යතාව මත තමයි මේක වුණේ. ඒ කාලයේ ඔය පැත්තේ සිටින අය බැඳුම්කර ප්‍රශ්නය ගැන තමයි උදේ නැඟිටපු වෙලාවේ ඉඳලා කථා කළේ. තමුන්නාන්සේලා bed tea එක කටට ගන්නේත් බැඳුම්කරයෙන්; රෑට බයිට් එක ගන්නේත් බැඳුම්කරයෙන්. තමුන්නාන්සේලා කිය කියා හිටියේ, මන්තරයක් වාගේ මැතිරුවේ ඒක විතරයි. ඒ අවශ්‍යතාව මත තමයි මේ දේවල් කළේ. දැන් ඒක කැරකිලා ඒ ගොල්ලන්ගේ පැත්තටත් එනකොට මේ වෝහාරික විගණන වාර්තාව සැපයූ සමාගමට දොස් කියන හැටි මම අහගෙන සිටියා. දැන් මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද? මොකාගේද නඩුව මොකාද අහනවා වාගේ කථාවක් තමයි මෙතැන වෙලා තිබෙන්නේ. මේ දේ කරන්න කියලා කෑ ගහපු අය දැන් බෝලය ඒ පැත්තට පෙරළෙන කොට කෑ ගහනවා, "මේක කරලා තිබෙන හැටි වැරදියි, වංචාවක් නැහැ. ඒ ගොල්ලන් වංචා කරලා නැහැ. මේ සමාගම දූෂිතයි" කියලා. ඒ සමාගම දූෂිත නම්, සමහර වෙලාවට ඒ ගොල්ලන්ගෙන් කෙරුණු වංචා මීට වඩා අධික වෙන්නත් පුළුවන් බව අපට හිතාගන්න පුළුවන්. ඒ සමාගමට අල්ලස් දුන්නා වෙන්නත් පුළුවන්. මොකද, සමාගම් සඳහා අල්ලස් දීමේ ක්‍රමවේදය, ඒවා එහෙට මෙහෙට හැසිරවීමේ ක්‍රමවේදය හොඳින් හදාරා තිබෙන්නේ ඒ ගොල්ලන් තමයි. මට හිතෙන විධියට ඒ ගොල්ලන් ඒ සමාගම දූෂිතයි කියලා ඔච්චර කෑ ගහන්නේ සමහර විට අනිවාර්යයෙන්ම ඒ ගොල්ලන් මීටත් වඩා මේකෙන් හොරකම් කරලා තිබෙන නිසා වෙන්න ඇති; අනිවාර්යයෙන්ම ඒවාත් හංගලා ඇති. නමුත් අපි කියන්නේ මේ වාර්තාවට අනුව නීතිය ක්‍රියාත්මක කරන්න කියලායි. නීතිය ක්‍රියාත්මක කරන්න එපා කියලා අපි කියන්නේ නැහැ. අපේ පැත්තේ කෙනෙකු වුණත් හොරකම් කළා නම්, වංචා කළා නම්, අනිවාර්යයෙන්ම හිර ගෙදරට යවන්න, දඬුවම් කරන්න ඕනෑ. අපි කවුරුවත් ඒකට විරුද්ධ නැහැ. මෙවැනි ප්‍රශ්නවලදී මේ රටේ ජනතාව ඇත්ත දැනගන්න ඕනෑ. ඒ පැත්තේ අය හොරකම් කළාම ඒවා ආරක්ෂා කරන ඩීල්කාරයෝ මේ පැත්තේත් ඉන්නවා. මේ පැත්තේ අය හොරකම් කළාම ඒවා ආරක්ෂා කරන ඩීල්කාරයෝ ඒ පැත්තේත් ඉන්නවා. ඔය කොච්චර කෑ ගැහුවත් අන්තිමට මේ වාර්තාව දැන් හංගන්නයි හදන්නේ. මේ වාර්තාවේ ඒ understanding එක, ඒ අවබෝධය තිබෙනවා. හැම පැත්තේම ඩීල්කාරයෝ ඉන්න හින්දා මට ලොකු සැකයක් තිබෙනවා, මේ වාර්තාවට අනුව කිසිම දෙයක් අන්තිමට වෙන්නේ නැහැ, මේ වාර්තාව නිකම් පුස්සක් වෙයි කියලා. දැන් සමහර වෙලාවට ඒ ගැන සමගියෙන් කථා බහ කරලා වැඩ කරනවාත් ඇති. ඒ නිසා අපි කියන්නේ මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න කියලායි. අනිවාර්යයෙන්ම මේ රටේ ජනතාවට ඒ සම්බන්ධයෙන් දැනගන්න අයිතියක් තිබෙනවා. මේ වෝහාරික විගණන වාර්තාව තමයි දැනට තිබෙන එකම නීතිමය වාර්තාව. ඒ අනුව හෝ මේ කටයුත්ත ඉදිරියට ගෙන යන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ඒ ගොල්ලන්ගේ පැත්තෙන් මේ ප්‍රශ්න ඇති කරන කොට ඒ ගොල්ලන්ගේ රණවිරුවා තමයි, නිවාඩ් කබ්රාල්. නිවාඩ් කබ්රාල් කියන්නේ ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ ඔඩොක්කුවේම ජීවත් වූ කෙනෙක්. අපි ඒ කාලයේ දැක්කා, මේ අය මහ බැංකුවේ උඩ තට්ටුවේ බාල් නටන හැටි. මේ අය පෙළපාළි යනවා; අල්ලාගෙන සින්දු කියනවා; නටනවා; බොනවා; පාටි දමනවා. රාජපක්ෂ පවුලේ සියල්ලන්ම ඒ පාටිවල ඉන්නවා. අපි ළඟ ඒ පින්තූර තිබෙනවා, වීඩියෝ තිබෙනවා, බැසිල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ කියන ඒ ඔක්කෝම නිවාඩ් කබ්රාල් එක්ක එකතු වෙලා පාටි දමපු හැටි. මට අවුරුදු තුනක සිර දඬුවමක් දුන්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒ පාටි එකේ බීලා නටනවා. ඒ ඔක්කෝම පින්තූර සහ වීඩියෝ අපි ළඟ තිබෙනවා. ඒ වාගේ සමයක් ගත කරපු ඒ ගොල්ලන් එකතු වෙලා මේ දේවල් කළා. නිවාඩ් කබ්රාල්ගේ සහෝදරිය Perpetual Treasuries Limited එකේ -අර්ජුන් ඇලෝසියස්ගේ සමාගමේ- වැඩ කරනවා. ඒ පවුල් ගහේ පාලනය තවත් නොයෙක් නොයෙක් තැන්වලට ඉන්නවා. ඇලෝසියස් ගොඩ නැඟුවේ කවුද? ඇලෝසියස් ගොඩ නඟලා තිබෙන්නේත් ඒ ගොල්ලන්ම තමයි. ඇලෝසියස් මේවා ආරම්භ කරලා තිබෙන්නේ, ඇලෝසියස් කරළියට ඇවිල්ලා තිබෙන්නේ රාජපක්ෂවරු එක්කයි. නාමල් රාජපක්ෂ -ඔටුන්න හිමි කුමාරයා- අර්ජුන ඇලෝසියස්ගේ හොඳ හිතවතෙක්. ඒ කාලයේ නාමල් රාජපක්ෂ CHOGM කියලා එකක් අල්ලා ගෙන වටේ දිව්වා. අපි දන්නවා, ඒවාට ශක්තිය දුන්නේ, ඒවාට කර තිබ්බේ ඇලෝසියස්ලා තමයි. එතකොට රාජපක්ෂලා ඇලෝසියස් දමාගෙන මේ චෝදනා අපේ පැත්තට හරවන්න ගියාට, අපට වඩා ඇලෝසියස්ලාත් එක්ක ගනුදෙනු කරලා තිබෙන්නේ, නාඩගම්, තොවිල් නටලා තිබෙන්නේ රාජපක්ෂලා තමයි.

[ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

අපේ කාලයේ අර්ජුන් ඇලෝසියස් දිගටම හිරේ හිටියා. අපි ඒවාට ඇඟිලි ගැහුවේ නැහැ, අධිකරණය ක්‍රියාත්මක වුණා. අපි ඔහුට පිට රට යෑම පවා තහනම් කරලා තිබුණා. ගෝඨාභය රාජපක්ෂ ජයග්‍රහණය කරලා, දවස් දහයෙන් තීන්දුවක් ලැබුණා; අර්ජුන් ඇලෝසියස්ට පිටරට යෑමට තිබුණු තහංචිය ඉවත් වුණා. ඒවා වෙන්නේ කොහොමද? ඒවා සිද්ධ වෙන්නේ අනිවාර්යයෙන්ම තිරය පිටුපසින් සිදුවන යම් යම් සෙල්ලම්වල ප්‍රතිඵල හැටියට. දැන් අර්ජුන් ඇලෝසියස්ලාට නිදහස තිබෙනවා.

අර්ජුන මහේන්ද්‍රන් අල්ලා ගෙන කෑ ගහනවා. අර්ජුන මහේන්ද්‍රන් කියන මිනිහා ඒ වංචාව කළා නම්, අපේ රජයේත් අර්ජුන මහේන්ද්‍රන් ආරක්ෂා කරන්න වැඩ කරපු අය ඉන්නවා නම්, ඔහු ගෙනාපු අය ඉන්නවා නම් ඒගොල්ලන්ටත් වගකීමක් පැවරෙන්න ඕනෑ. රජයේ නිලධාරියකු, බැංකු ප්‍රධානියකු වංචාවක් කළාය කියලා ඒ අංශ භාර ඇමතිවරුන්ට ඒකෙන් ගැලවෙන්න බැහැ. ඒගොල්ලන් ඉන්නේ ඒවා බලන්න; ඒවා අධීක්ෂණය කරන්න; එවැනි දේ ගැන තීන්දු තීරණ ගන්න. එහෙනම් අනිවාර්යයෙන්ම අපේ රජයේත් හිටපු, ඒවාට වග කියන්න ඕනෑ අයට විරුද්ධව චෝදනා එල්ල වෙන්න ඕනෑ. ඒ හා සමානවම රාජපක්ෂවරුන්ටත් මේ චෝදනා එල්ල වෙන්න ඕනෑ.

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරණයට ඉස්සෙල්ලා පොරොන්දු වුණේ බලයට ඇවිල්ලා සුමාන දෙකින් හොරු අල්ලනවා කියලායි. බලයට ඇවිල්ලා සුමාන දෙකෙන් එතුමා කළේ මොකක්ද? අර්ජුන් ඇලෝසියස්ට පිටරට යන්න පුළුවන් විධියේ පාරක් හදා දුන්නා. සුමාන දෙකෙන් හොරු ඇල්លුවාද? දැන් මාස තුනකුත් පැනලා. අල්ලපු එක හොරෙක් ඉන්නවා නම් අපට කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යවහාරික විගණන වාර්තාව ගැනම කථා කරන්නේ නැතිව මම මෙතැනදී පොඩ්ඩක් එයින් පිටතට යනවා. ව්‍යවහාරික විගණන වාර්තාවට වඩා ලොකු ප්‍රශ්න දැන් මේ රටේ තිබෙනවා. ඒක නිසා මම පොඩ්ඩක් ඒ ගැන කථා කරනවා. හොරු අල්ලනවා කියලා කෑ ගැහුවාට අර්ජුන් ඇලෝසියස්ලා ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයකුත් ඒගොල්ලන් අතේ තිබෙනවා. මේ රජය අනිවාර්යයෙන්ම නොයෙක් ආකාරයේ හොරුත් එක්ක ගනුදෙනු කරන්න නැවත පටන් ගෙන තිබෙනවා. අතීතයේ තිබුණු ගනුදෙනු නැවත ක්‍රියාත්මක වනවා. මේ රජය කවදාවත් හොරු අල්ලන්නේ නැති බව මට සක් සුදක් සේ පැහැදිලියි.

ළඟදී දවසක මම දැක්කා, ඉතා ප්‍රබල ස්වාමීන් වහන්සේ නමක් දේශනාවක් කරනවා. එතැන විශේෂ අමුත්තා හැටියට හිටියේ මහින්ද රාජපක්ෂ මැතිතුමායි. ඒ දේශනාව රූපවාහිනියේත් විකාශ වුණා. විනාඩි දහයක් විතර ඒ ස්වාමීන් වහන්සේ එක දිගට දේශනා කළා, "මේ රජය දැන් හරි පාරේ යන්නේ නැහැ. මේ රජය ජනතාවට දුන්නු පොරොන්දු ඉෂ්ට කරන්නේ නැහැ. ජනතාවට හුඟක් බලාපොරොත්තු තිබුණා. අගමැතිතුමා ඇයි අර බැඳුම්කර වංචාවට සම්බන්ධ හොරුන්ට විරුද්ධව ක්‍රියාත්මක නොවෙන්නේ?" කියලා. දිගින් දිගටම කිව්වා. ඒ ස්වාමීන් වහන්සේලා තමයි මුලින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට ආශීර්වාද කළේ. ගෝඨාභය රාජපක්ෂලාගේ රජය ආපු ගමන් ශක්‍රයා වාගේ වැඩට බහීවි, ආපු ගමන් හතර වටේටම ශිල්ප දක්වයි කියලා ඒගොල්ලන් හිතුවා. නමුත් ඒගොල්ලන් රැවටුණා කියලා ඒ ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට දැන් තේරෙනවා. එතකොට මහින්ද රාජපක්ෂ මැතිතුමා දුන්නු උත්තරය මොකක්ද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

එතුමා කියනවා මම දැක්කා, "හාමුදුරුවනේ, අපට තුනෙන් දෙකේ බලය නැහැ නේ" කියලා. හැම දේකටම තුනෙන් දෙක! ආණ්ඩුව ගත්තේ ඇයි? අපට ආණ්ඩුව කරගෙන යන්න තිබුණා. නමුත් මේ අය පැනලා ආණ්ඩුව ගත්තා. ඡන්ද ඕනෑ කියලා හැම දාම කෑ ගැහුවා. දැන් හැම එකටම කියන්නේ මොකක්ද? දැන් උණ, හෙම්බිරිස්සාවක් හැදුණත් තුනෙන් දෙක නැහැ කියනවා. බඩගිනි වුණත් තුනෙන් දෙක නැහැ කියනවා. හාල් නැති වුණත් තුනෙන් දෙක නැහැ කියනවා. බොම්බයි ලූනු මිල ඉහළ නැග්ගත් තුනෙන් දෙක නැහැ කියනවා. දැන් තුනෙන් දෙකද, තුනෙන් තුනම නැද්ද කියන්න මම දන්නේ නැහැ. මේ කියන විධියට ගියොත් මේ ආණ්ඩුව කවදාවත් මේ රටේ කිසිම දෙයක් කරන්නේ නැහැ. හැම දාම තුනෙන් දෙකේ බලය නැහැ කියමින් ඉන්නවා. ඒ ස්වාමීන් වහන්සේ අර ප්‍රශ්නය ඇහුවාම අගමැතිතුමා කියනවා, "අපට තුනෙන් දෙක නැහැ හාමුදුරුවනේ, මොකුත් කරන්න බැහැ" කියලා. මේක තමයි හැම තැනම නිදහසට කියන කාරණය. තුනෙන් දෙකේ බලය දුන්නොත් ඒවා නොවෙයි කරන්නේ. එතකොට හොරු අල්ලන්නේ නැහැ, හොඳට හොරකම් කරන්න, හොරු ආරක්ෂා කරන්න පාර හදා ගන්නවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ප්‍රසිද්ධියේ කියනවා එතුමාට වැඩිපුර බලය ඕනෑ කියලා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හදන්නේ පාර්ලිමේන්තුවේ බලය ඉවත් කරලා, එතුමාට බලය ලබා ගන්නයි. ඒ බලය ගන්නේ මොකටද? හෙංචයියන් එක්ක නටන්න.

අභයාරාමය තමයි මූලාසනය. එතැනින් තමයි පොහොට්ටුව පටන් ගත්තේ. පොහොට්ටුව පිපුණේ අභයාරාමයේ. එතැන අපේ මුරුත්තෙට්ටුවේ ආනන්ද හාමුදුරුවෝ ඉන්නවා. මේ ළඟදී දවසක උන් වහන්සේත් කියනවා,"ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට හොඳ හදවතක් තිබෙනවා. හැබැයි, වටේ ඉන්නේ කුක්කෝ" කියලා. හොඳ හදවතක් තිබෙනවා නම් දෙවියනේ, කුක්කෝ ළං කර ගන්නවාද? කුක්කෝ ළං කර ගන්නේත්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හොඳ හදවතක් තිබෙනවා නම් ළං කර ගන්නේ හොඳ හදවතක් තිබෙන මිනිස්සු. හැම දාම රාජපක්ෂවරුන්ට ආශීර්වාද කරපු මේ ස්වාමීන් වහන්සේ කියනවා, "ගෝඨාභය රාජපක්ෂගේ වටේ ඉන්නේ කුක්කෝ" කියලා. උන් වහන්සේ කිව්වේ සම්පූර්ණ ඇත්ත. අපේ සිංහල භාෂාවට අනුව කියනවා නම් ස්වාමීන් වහන්සේගේ කටේ -අපි උන්වහන්සේලාට ගරු කරන නිසා අපට එහෙම දමන්න අවසරයක් නැහැ- රත්තරන් එහෙමත් නැතිනම් මසුරන් දාන්න ඕනෑ. උන්වහන්සේ සම්පූර්ණ ඇත්ත කිව්වේ. ඔබ වහන්සේලා දැන්වත් මේවා තේරුම් අරගෙන, සත්‍ය අවබෝධ කරගෙන, ජනතාව වෙනුවෙන් ඇත්ත කථා කරන්න පටන් ගැනීම සම්බන්ධයෙන් අපි ඔබ වහන්සේලා ගැන ආඩම්බර වනවා. අපි ඔබ වහන්සේලාට අවශ්‍ය සියලු ශක්තිය ලබා දෙනවා. ඔබ වහන්සේලා ඉදිරියටත් ඒ ක්‍රියාදාමය ඒ විධියටම කරගෙන යන්න.

ඒ කුක්කෝ කථාව කියන කොට මට තව දෙයක් මතක් වෙනවා. එක දවසක් මම දැක්කා, තවත් ස්වාමීන් වහන්සේ නමක් කියන කතාවක්. දැන් එක එක ජාතියේ අය ජනාධිපතිට ළං වෙනවාලු. ඒ අය ඡන්ද කාලයේ ළඟ හිටිය අය නොවෙයිලු. වැඩක් නැති එක එක අය ළං වෙනවාලු, courtesy, මැදගම අබේතිස්ස හාමුදුරුවෝ. ඡන්දය දිනලා සුමාන දෙකෙන් ඒ ස්වාමීන් වහන්සේ මෙහෙම කිව්වේ. ඡන්දය දිනලා සුමාන දෙකෙන් ඒ ස්වාමීන් වහන්සේ බෙල්ලත් ඇද කරගෙන, බොහොම කනගාටුවෙන් මෙහෙම කියනවා මම දැක්කා. උන් වහන්සේ කිව්වේ සම්පූර්ණ ඇත්ත. මේ අය යන්නේ හරි පාරේ නොවෙයි. මේ වාගේ මොකක් හෝ අල්ලාගෙන, ගිරිය කඩාගෙන කෑ ගැහුවාට, ගිරිය කඩාගෙන උඩ පැන්නාට ඔය උඩ පැනපු අයගෙන් භාගයක් හොරු. ඔය උඩ පැනපු අය තමයි පසුගිය කාලයේ වැඩියෙන්ම හොරකම් කළේ; රට විනාශ කළේ.

මීට ඉස්සෙල්ලා කථා කළා උදයංග වීරතුංග ගැන. හැමදෙනාම ඔහු ගැන ටික ටික කිව්වා. උදයංග වීරතුංග මම හොඳට හඳුනනවා. මම හමුදාපති කාලයේ ඔහු අපට කථා බහ කළා රුසියාවේ තානාපති හැටියට. ඔහු ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේත්, ජනාධිපතිතුමාගේත් ඥාති සහෝදරයා. ඔහු නිතරම කළේ මේ ගොල්ලන් එක්ක ගනු දෙනු කරපු එක තමයි. මේ ගොල්ලන්ගේ වැඩ තමයි එහේ ඉඳගෙන කළේ. උදයංග වීරතුංගට තිබෙන චෝදනාව තමයි, ඇමෙරිකානු ඩොලර් මිලියන 7ක මිග් යානා 4කට ඇමෙරිකානු ඩොලර් මිලියන 14ක් ගෙවීම. කෙළින්ම ඇමෙරිකානු ඩොලර් මිලියන 7ක් වැඩියි. ඔහු එංගලන්තයේ හොර කොම්පැනියක් හැදුවා. ඒ කොම්පැනියට තිබෙන්නේ telephone එකක් විතරයි. එතැනට ඇමෙරිකානු ඩොලර් මිලියන 14ක් ගෙව්වා. රුසියාවේ කොම්පැනි එකට අදාළ ගනු දෙනුවේ ඇත්තම වටිනාකම හැටියට ගියේ ඇමෙරිකානු ඩොලර් මිලියන 7යි. උදයංග වීරතුංග ඒ කපුකම කළා. Cheque එක ලියලා, මුදල් ගෙව්වේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හැටියට. එතකොට පළමුවැනි චූදිතයා උදයංග වීරතුංග. දෙවැනි චූදිතයා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දැන් පළමුවැනි චූදිතයා දෙවැනි චූදිතයා ළඟට එනවා, අත් දෙකේ මාංචු දමාගෙන. ඔහු දන්නවා තමන් බේරා ගන්නවා කියලා. එතකොට මේවාට වන්දි ගෙවන්න ඕනෑ කවුද? මේ මුදල් කාගෙන්ද අය කර ගන්නේ? ඇමෙරිකානු ඩොලර් මිලියන 7ක් කියන්නේ, රුපියල් මිලියන 1,260ක්. ඒක කොච්චර විශාල සල්ලියක්ද? ඒ කියන්නේ, රුපියල් කෝටි 126ක වංචාවක්. යුද්ධයට ගෙනාපු මිග් යානාවලින් හොරකම් කළා. තවත් මොනවාද කථා කරන්නේ? මේ රටේ ජනතාව රැවටුණා. අපේ තරුණයෝ රැවටුණා; රටට ආදරේ කරන ජනතාව රැවටුණා; සිංහල බෞද්ධයෝ රැවටුණා, "මේ ගොල්ලෝ ජාතියට ආදරෙයි. මේ ගොල්ලෝ රටට ආදරෙයි" කියලා.

ඊළඟ කෙනා, ශ්‍රීලංකන් එකේ හිටපු කපිල චන්ද්‍රසේන. කපිල චන්ද්‍රසේන කියන්නේ, රාජපක්ෂ පවුලේ ළඟම ඉන්න හිතවතෙක්; ළඟින්ම ආශ්‍රය කරන කෙනෙක්. එයා 2015ට ඉස්සෙල්ලා ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි හැටියට හිටියා. දවස් 52 ආණ්ඩුව ආවාට පස්සේ නැවත ශ්‍රීලංකන් ගුවන් සමාගමේ සභාපති කරලා ඔහු වහාම ගෙන්නුවා. ඔහු ඒ අයට එච්චර හිතවතෙක්. ඔහු එච්චරට ප්‍රබලයෙක්. ඔහු කරපු වංචාවේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 20යි. ඒකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 2ක් හම්බ වුණා. තවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 18ක් එන්න තිබෙනවා. ඒ වාගේ වංචා කරපු අය එක්ක තමයි මේ ගොල්ලන් ගනු දෙනු කළේ. එතකොට මේ ගොල්ලන් මේවා ගැන දැනගෙන හිටියේ නැද්ද? මට දුක, මේ රටේ ජනතාව මේක තේරුම් ගන්නේ නැති එක ගැනයි. රට විනාශ කරන්න කරපු වංචා ඔක්කොම අමතක කරලා, බැඳුම්කරය අල්ලාගෙන, බැඳුම්කරය ගැන විතරක් හිතලා මේ රටේ ජනතාව ඡන්දය දුන්නා. ඒ ගැන අපට කනගාටුයි. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

එක්තරා කථිකයෙක් අනෙක් අයටත් හිනා වෙවී, කෑ ගහ ගහ අද මේ ගරු සභාවේ කථා කරනවා මම දැක්කා. අද දවල් මට කථා කළා, දිවුලපිටියේ අහිංසක මිනිස්සු කීප දෙනෙක්. ඒ ගොල්ලෝ මට කථා කරලා කිව්වා, "අනේ මහත්තයෝ, රන්ජන් රාමනායක මහත්මයාත් දැන් මෙහේ නැහැ. අපි වෙනුවෙන් කථා කරන්න කෙනෙක් නැහැ. අනේ, අර 'පස් ඉන්දිකයා' කරන විනාශය ගැන ඔයගොල්ලන් කථා කරන්න" කියලා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තමයි මෙතැන ඉඳගෙන කෑ ගැහුවේ. "පස් ඉන්දිකයා අපේ දිවුලපිටියට කරන විනාශය බලන්න. පළාතම විනාශ කරලා ලොරි ගණන්, ටොන් ගණන්, ට්‍රැක්ටර් ගණන් පස් කපනවා." කියලා ඒ අය කිව්වා. කවුද, පස් ඉන්දිකට ආශීර්වාද කරන්නේ?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේ ආණ්ඩුව ඇවිල්ලා සුමාන දෙකක් ගියේ නැහැ, පස්වලට, වැලිවලට තිබුණු තහනම ඉවත් කළා. ඒ ඉවත් කළේ මොනවාටද? ඒ ගොල්ලන්ට කෝටිපතියන් වෙන්න, රට විනාශ කරන්න, පරිසරය විනාශ කරන්න අවසර දෙන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අපට බලාපොරොත්තු වෙන්න පුළුවන් මොනවාද? ඒ වාගේ අය රටට ආදරේද? පස් ඉන්දික වාගේ අයට පරිසරය විනාශ කරන්න අවසර දෙනවා නම්, පරිසරය විනාශ කරන්න නීතිය හදලා දෙනවා නම්, ඒ ගොල්ලන්ගෙන් අපට මොකුත් බලාපොරොත්තු වෙන්න බැහැ.

දැන් තව තව දේවල් සිද්ධ වෙනවා. දැන් 'පොහොට්ටුවට' සභාපති කෙනෙක් ඇවිල්ලා ඉන්නවා. දැන් පොහොට්ටුවට කණ කොකා අඬන්න පටන් ගෙන තිබෙනවා. අපි හිතුවා, පොහොට්ටුව මොනවා හෝ කරලා, ඔළුව උස්සගෙන, රටට මොනවා හරි කරයි කියලා. දැන් පොහොට්ටුවට හිටන්, අලුත් සභාපති කෙනෙක් හිටන් ඇවිල්ලා ඉන්නවා. මම දැක්කා එතුමා හිටන් කියනවා, "මම අමනුස්සයෝ කවුද කියලා දැන ගත්තේ පරාද වුණාට පස්සේ" කියලා. එතුමා පරාද වුණේ නැහැ නේ. එතුමා ධුර කාලය ඉවර වෙලා ගියා. එතුමා දැන් කියනවා, අමනුස්සයන් හඳුනාගත්තේ පරාද වුණාට පස්සේ කියලා.

අපි නම් අමනුස්සයා හඳුනා ගත්තේ ජයග්‍රහණය කරපු දවසේ ඉඳලාමයි. එදා ඉඳලාම තමයි අපි අමනුස්සයා හඳුනා ගත්තේ. මොකද, ජයග්‍රහණය කරපු දවසේ ඉඳලාම කළේ අමනුස්සකම්. එතුමා ජයග්‍රහණය කරලා පළමුවැනි සාකච්ඡාව පැවැත්වූවේ මාත්, චන්ද්‍රිකා මැඩම් සහ රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක. එතුමාගේ පාලන කාලයේදී අපි තුන්දෙනාටම වළ කැපුවා; අපි තුන්දෙනාටම වළ කැපුවා. එහෙම නම්, අමනුස්සයා කවුද කියලා කණ්ණාඩිය ඉස්සරහට ගියා නම් පෙනෙයි. පොහොට්ටුවට දැන් අමනුස්ස බැල්ම හෙළලා. පොහොට්ටුවට දෙයියන්ගේම පිහිටයි! පොහොට්ටුවේ සභාපති පොහොට්ටුවට මොනවා කරයිද කියලා අපට හිතා ගන්නත් බැහැ.

මේ ගොල්ලන්ගේ හොඳ හොඳ සෙල්ලම් තිබෙනවා. පසුගිය දවස්වල අපි දැක්කා කඩොලාන මල්ලිගේ වැඩ. කඩොල් කැලේ වීරයා ගිහිල්ලා දේවානි කියන සුන්දර යුවතියගෙන් හොඳට බඩ පිරෙන්න ඉල්ලාගෙන කෑවා. අපි කියනවා ඒ වාගේ අයට ජයවේවා කියලා. ඒ වාගේ රජයේ සේවකයන්ට අපි ශක්තිය දෙනවා. බඩ පිරෙන්න දුන්නාට පස්සේ ඒ පැත්තේ ඉන්න අයම කියනවා, "දේවානි, ජයවේවා!" කියලා. මරු වැඩේ කියන්නේ ඒක තමයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

ඒ ගොල්ලන්ට "ජයවේවා!" කියන්න, ඒ ගොල්ලන් ආරක්ෂා කරන්න අපි ඉන්නවා.

[ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. ඒ පැත්තේ වනජීවී ඇමති කෙනෙක් ඉන්නවා. මාත් හිටියා, වනජීවී ඇමති විධියට. වනජීවී ඇමති මොකක්ද කියන්නේ? "ගමට අලි එනවා නම්, වටේ තිබෙන කැලය කපපල්ලා" කියනවා. කොහොමද ඒක? නියම සෙල්ලම් දාන්නේ මේ ගොල්ලෝ. ගම්වලට අලි එන කොට වනජීවී ඇමති වැඩේට බැහැලා, ගස් කප්පාදු කරන්න, ගස්වලට වැඩේ දෙන්න. මේවා නවත්වන්න බැහැ. රාජපක්ෂලාගේ පාලන සංකල්පය මේක තමයි. රාජපක්ෂලාගේ සංස්කෘතිය මේක තමයි.

අවසාන වශයෙන් මා මේ කාරණය කියන්න ඕනෑ. එහා පැත්තේ ඉන්න කට්ටිය අදත් කිඹුල් කඳුළු හෙළුවා, හමුදාපති ගැන. ඒ අය හමුදාපති ගැන කිඹුල් කඳුළු හෙළනවා, හමුදාපතිට ඇමෙරිකාවට යන්න දෙන්නේ නැහැ කියලා. දැන් තමයි ඇමෙරිකාව වීසා නැති කරන එක ගැන ඒ ගොල්ලන් දැනගත්තේ. මීට ඉස්සෙල්ලා නිලධාරීන්, ජනරාල්ලා 51දෙනෙකුට ඇමෙරිකාවට යෑම තහනම් කරලා තිබෙනවා. ප්‍රථමයෙන් තහනම පැනවූයේ මට. මම ජනාධිපතිතුමා එක්ක එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සැසිවාරයකට යන්න හදන කොටත් මට වීසා දුන්නේ නැහැ, තහනම් කළා, මා හිටපු හමුදාපති හින්දා. ඒ වෙලාවේ මේ කවුරුවත් කිඹුල් කඳුළු හෙළුවේ නැහැ. ඒ වෙලාවේ දුක් වුණේ නැහැ. ශවේන්ද්‍ර සිල්වා වර්තමාන හමුදාපති හින්දා දැන් කිඹුල් කඳුළු හෙළනවා. ශවේන්ද්‍ර සිල්වා හොඳ නිලධාරියෙක්. ඔහුට ඇමෙරිකාවට යන්න නොදෙන එක ගැන මාත් විරෝධය දක්වනවා. ඒක අනිවාර්යයෙන් වැරැදියි. නමුත්, සමස්තයක් වශයෙන් ගත්තාම අපි හැමෝම ඉන්නේ එකම බෝට්ටුවේ. අපට යන්න නොදෙන කොට, මේගොල්ලන් "ජයවේවා!" කියනවා. ඒ ගොල්ලන්ට දේශපාලන වාසියක් ගන්න ඕනෑ වුණාම කිඹුල් කඳුළු හෙළනවා. රණ විරුවන්ට ආදරය නිසා නොවෙයි, ශවේන්ද්‍ර සිල්වා ගැන කථා කරන්නේ, දේශපාලන වාසියක් ගන්නයි.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.6.04]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව තවත් කපලා තිබෙනවාද? විනාඩි 15 විනාඩි 12ක් වුණා. ඒ විනාඩි 12 දැන් විනාඩි 10ක් වුණා. එහෙම වෙන්න බැහැ. කරුණාකර ඒ ගැන සලකා බලන්න. මට විනාඩි 15ක් තිබුණා, මුලින්ම. ඊට පස්සේ විනාඩි 12ක් කියලා කිව්වා. දැන් ආයෙත් ඒක අඩ කරලා තිබෙනවා. කරුණාකර ඒ ගැන සලකා බලන්න ඕනෑ. ඒ ගැන සලකා බලා මට නියමිත කාලය වැඩි කරන්න කියන ඉල්ලීම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෝහාරික විගණන වාර්තාව ගැන සාකච්ඡා කරන කොට, ඒක හැල්ලුවට ලක් කරන්න අද වෑයමක් තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රධාන ජාත්‍යන්තර විගණන සමාගම් වන KPMG සමාගමට, BDO සමාගමට පහර ගහන්න මෙතුමන්ලා කියනවා, 'මේවා සුදුසු නැහැ' කියලා. මම කැමැතියි, ඔබතුමන්ලාට මේ කාරණය කියන්න. ඔබතුමන්ලා ගිහිල්ලා රියාස් මියුලාගෙන්, චාමර අබේරත්නගෙන්, යොහාන් පෙරේරාගෙන් අහන්න, KPMG සමාගම ගැන. ඒක ලෝකයේ තිබෙන විගණන සමාගම් හතරින් එකක්; Fortune 100 Companiesවලින් එකක්. එය consulting companiesවලින් ප්‍රධාන එකක්.

ඒ වාගේම මම කියනවා, BDO සමාගම ගැන සුජීව රාජපක්ෂ මැතිතුමාගෙන් ගිහිල්ලා අහන්න කියලා. මේ අය ඔක්කෝම මගේ මිත්‍රයෝ. මේ රජය සුජීව රාජපක්ෂද එක එක තනතුරුවලට පත් කරලා තිබෙනවා. ගිහිල්ලා ඔහුගෙන් අහන්න, ඒ BDO සමාගම ගැන. මේ ආකාරයට කැමති කැමති විධියට නිකම් මඩ ගහලා වැදගත් වෝහාරික විගණන වාර්තාවක් යට ගහන්න හදන්න එපා කියන එක සඳහන් කරන්න ඕනෑ.

මේ වාර්තාවේ තිබෙන ප්‍රධාන කරුණුවලින් කියනවා, විශේෂයෙන්ම අර්ථසාධක අරමුදලෙන් හොරකම් කරපු ක්‍රමය, විධිය ගැන. අර්ථසාධක අරමුදලේ විශාල මුදලක් තිබෙනවා. සමහර ඒවා යනවා, භාණ්ඩාගාර බිල්පත්වලට. සමහර ඒවා යනවා, බැඳුම්කරවලට. සමහර ඒවා දානවා, කොටස් වෙළෙඳ පොළේ කොටස්වලට. ඒවා කොටස්වලට දාන්න තීරණ ගන්න කොට, සුරැකුම්පත්වලට දාන කොට සීමා තිබෙනවා. ඒ සීමාවලට ගරු කළේ නැහැ. මෙහි ඒ ගැන සඳහන් කරනවා. ඒ වාගේම, මේවායේ Investment Committees තිබෙනවා. මේ ආයෝජන විශ්ලේෂණය කරන්න ඕනෑ. නමුත් මේ ආයෝජන විශ්ලේෂණය කරලා නැහැ. ඒවා කරන්නේ නැතිව කොටස් වෙළෙඳ පොළට දාලා තිබෙනවා. මේ ගනු දෙනු ප්‍රවේශපත්‍රත් නැහැ කියලා සඳහන් කරලා තිබෙනවා.

ඊට පසුව සඳහන් කරලා තිබෙනවා, ලැයිස්තුගත නොකළ කොටස්වලටත් යොදවලා තිබෙනවා කියලා. මෙයින් ස්වල්පයක් ගැන දැන් මම ඉක්මනට කථා කළොත්, Brown & Company PLC එකට විශාල අලාභයක් සිදු වුණා, රුපියල් කෝටි 130ක. එක කොටසක ශුද්ධ වත්කම රුපියල් 214යි. නමුත් ඒ ගනුදෙනුව වුණේ, රුපියල් 290ට. නමුත් මාස ස්වල්පයකදී රුපියල් 17.50ට ඒ කොටසේ අගය පහළ බැස්සා. ඒ නිසා විශාල අලාභයක් සිදු වෙලා තිබෙනවා. මේකේ deal ticket එකවත් හොයා ගන්න බැහැ ලු; අත්සන් කළ පුද්ගලයාවත් හොයා ගන්න බැහැ ලු. බොහොම භයානක දේවල් සිදු වෙලා තිබෙනවා. Ceylon Grain Elevators සමාගමට රුපියල් කෝටි 65ක පාඩුවක් සිදු වුණා. මේ පාඩුව වුණා, අර්ථ සාධක අරමුදලටත්. ශුද්ධ වත්කම රුපියල් 31යි, නමුත් ගනුදෙනුව කළේ රුපියල් 205ට. ඉතින් මෙන්න බලන්න, මේ නිසා වෙලා තිබෙන දේ. එතකොට මේ වාර්තාවේ සඳහන් කරනවා, එදා මහ බැංකුවේ හිටපු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාම මේකට දායකත්වය දැක්වූ විධිය. ඒ ගැන මහ බැංකුවේ අය සඳහන් කරලා තිබෙනවා. ඒකත් එම වාර්තාවේ සඳහන් වෙනවා. ගලදාරි හෝටලයටත් රුපියල් කෝටි 62ක අලාභයක් සිදු වෙලා තිබෙනවා. ඒ ශුද්ධ වත්කම රුපියල් 4.86යි; ගනුදෙනුව වුණේ රුපියල් 34ට. ඒ වාගේම අපි දන්නවා, කොළඹ Dockyard එකේත් අලාභය රුපියල් කෝටි 186ක් බව. ඒ ශුද්ධ වත්කම රුපියල් 110යි. නමුත් ගනුදෙනුව වුණේ රුපියල් 292ට.

මේ වාගේ මට තව විස්තර කියාගෙන, කියාගෙන යන්න පුළුවන්. වෙලාවක් නැති නිසා මම ඒ විස්තර ඔක්කෝම කියන්න යන්නේ නැහැ. ඇත්තටම මොනවාද මෙතැන වෙලා තිබෙන්නේ? මෙතැන වෙලා තිබෙන්නේ විශාල හොරකමක්. මීට ප්‍රථමයෙනුත් කවුරුන් හෝ සඳහන් කළා, මහ බැංකුවට ප්‍රශ්නයක් තිබෙනවා කියලා. එක පැත්තකින් ණය ඒජන්තවරයා රජය වෙනුවෙන් ණය ගන්න ඕනෑ අඩුම පොලියට. අනෙක් පැත්තෙන් අර්ථ සාධක අරමුදලේ - EPF - ඒජන්තවරයා EPF එකේ සාමාජිකයන්ට වැඩිම ලාභයක් දෙන්න ඕනෑ. මා වාගේ අය වැඩ කරලා, වැඩ කරලා ඉතිරි කර ගත්ත මුදලට වැඩියෙන්ම ලාභයක් ගන්න ඕනෑ. ඉතින්

මෙතැන සට්ටනයක් තිබෙනවා. 1958 වසරේ මහ බැංකුවේ අධිපති වශයෙන් සිටි ආතර් රණසිංහ මහතා සඳහන් කළා, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා කියලා. එන්.යූ. ජයවර්ධන මැතිතුමා පසුව අධිපති වුණා, එතුමාත් සඳහන් කළා මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඉතින් මහ බැංකුව මේ ප්‍රශ්නය අවම කිරීමට යම් පියවර ගත්තා. එක පියවරක් තමයි ව්‍යාපාරික කොටස්වල EPF ආයෝජනය සියයට 5කට සීමා කිරීම. අනෙක් එක, පෞද්ගලික ව්‍යාපාරවල කළමනාකාරිත්වයට සම්බන්ධ වෙන්න බැහැ කිව්වා. EPF එකට සම්බන්ධ වෙන්න බැහැ, මේ ගැටලුව තිබෙන නිසා. ඒ වාගේම EPF එකට බැංකුවක ආයෝජනය නොකර ඉන්න කියලාත් සඳහන් කළා. හේතුව, මහ බැංකුව බැංකු නියාමන කටයුතු කරන නිසා. ඒ අයට හුඟක් විස්තර තිබෙනවා. එතකොට ඒ විස්තරවලට insider trading කියනවා. ඒ insider information පාවිච්චි කරලා මේ කටයුතු කරන නිසා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙන් යම් කිසි නීති රීති රාමුවක් දාලා තිබුණා. නමුත් අජිත් නිවාඩ් කබ්රාල් අධිපති වුණාම ඒක සම්පූර්ණයෙන්ම නොසලකා ක්‍රියා කළා.

මා දන්නවා, අද බැංකුවල ඉන්න සමහර විධායක නිලධාරින් කථා කරන්නත් ටිකක් බයයි ලු. මට ආරංචි වුණා, නියෝජ්‍ය අධිපති එස්.ආර්. ආටිගල මහත්මයා ඒ අය මුදල් අමාත්‍යාංශයට ගෙන්වලා සාකච්ඡාවක් පවත්වනකොට කිව්වා ලු, කථා කරන්න කියලා. කථා කරන්න, බය වෙන්න හේතුවක් නැහැ. මොනවාද එදා කළේ? එදා බැංකුවල කොටස් ගත්තා. මහ බැංකුව ගත්තේ. මහ බැංකුවේ නියෝග හරහා ක්‍රියාත්මක වුණේ. නිවාඩ් කබ්රාල්ගේ ක්‍රියාව හරහායි ක්‍රියාත්මක වුණේ. කවදාවත් මහ බැංකු අධිපති කෙනෙක් හැටියට කරන්න තිබුණු දේවල් නොවෙයි ඒවා. මේ වාර්තාවේ කියා තිබෙනවා, මෙතැන ළඟදියා ගැටුම් තිබෙනවා කියලා. මට එය සභාගත කරන්න පුළුවන්. එම වාර්තාවේ රාමුවක්ම තිබෙනවා, පවුලේ අය කොහොමද මේකට හවුල් වෙලා තිබෙන්නේ කියලා. එදා ළඟදියා ගැටුම් ගැන සාකච්ඡා කරනකොට මෙතැන ඇවිල්ලා කිව්වා, අර්ජුන මහේන්ද්‍රන්ගේ සහ අර්ජුන් ඇලෝසියස්ගේ ළඟදියා ගැටුම තමයි මාමයි බෑනයි කියලා. අපි පිළිගන්නවා, ඒක ළඟදියා ගැටුමක් කියලා. එතකොට අපට චෝදනා කළා, අර්ජුන මහේන්ද්‍රන් ඉක්මනට ඉවත් කළොත් මේ පරීක්ෂණය හරියට කරගෙන යන්න පුළුවන් කියලා. මම ඔබතුමන්ලාට කියනවා, මේ චෝහාරික විගණන වාර්තාවේ නිවාඩ් කබ්රාල්ගේ සම්බන්ධතාව පැහැදිලිව සඳහන් වෙනවාය කියන කාරණය. මම ඔබතුමන්ලාට කියනවා, මේ පරීක්ෂණ අවසන් වෙනකල්, ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුවෙන් නඩු පවරනකල් මේ අය ඉන්න තනතුරුවලින් ඉවත් වෙන්න ඕනෑ කියලා.

මේ චෝහාරික විගණන වාර්තාවේ සඳහන් වන හොරකම් සිදු වන කොට එදා මේ රටේ මුදල් ඇමති ගරු මහින්ද රාජපක්ෂ. එදා මුදල් අමාත්‍යාංශයේ ලේකම් කවුද? පී.බී. ජයසුන්දර. මහ බැංකු අධිපති කවුද? නිවාඩ් කබ්රාල්. අද ඉන්නෙත් ඔය කණ්ඩායම නේද? ඒ කණ්ඩායම නොවෙයිද අද ඉන්නේ? ඒ නිසා ඔබතුමන්ලාට මේකෙන් නිදහස් වෙන්න ඕනෑ නම් නිවාඩ් කබ්රාල් එතැනින් අයින් වෙන්න ඕනෑ. මේකේ පරීක්ෂණ අවසන් වනතුරු අයින් වෙන්න ඕනෑ.

මේ වාර්තාවේ 70 පිටුවේ, "Appointment of Primary Dealers without Fulfillment of Necessary Requirements" කියලා සඳහන් වෙනවා. මේ ඔක්කෝම කියවන්න බැරි නිසා මම කෙටියෙන් කියන්නම්. මෙහි 72 පිටුවේ සඳහන් වෙනවා, "Hence, it can be concluded that the appointment of PTL was done overlooking the considerations as were stated by the Supervision department. The submissions done for non-appointment of PTL as a Primary Dealer were modified to delete certain critical points. No remarks as to why the said critical points were deleted could be in the documents provided by the department for review, hence, the activity of deletion remains questionable. Hence, it can be concluded that the assessment done for granting clearance was not done in a proper manner. Moreover, there is no defined regulatory action considered for such non-compliances,...." යනුවෙන්.

මොනවාද මේකෙන් කියන්නේ? එක එක dealersලාට permits දුන්නා නේ. ඒවා දුන්නේත් නිවාඩ් කබ්රාල් කියන එක මම සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිවාඩ් කබ්රාල් මහත්මයාගේ පවුලේ අය ගැන මම කියන්නේ නැහැ. මේවා ගැන අපට ටිකක් කථා කරන්න අමාරුයි. එතුමාගේ පවුලේ හුඟක් වැදගත් වෘත්තියවේදීන් සිටිනවා. මම ඒ ඔක්කෝම අය හඳුනනවා. නමුත්, මෙතැන තිබෙන්නේ ඒ ගැන ප්‍රශ්නයක් නොවෙයි. දැන් මම මේ පාර්ලිමේන්තුවට කවුරුත් නොදන්නා යමක් කියන්නම්. මම අර්ජුන මහේන්ද්‍රන්වත් හඳුනනවා. මම ලංකාවේ ප්‍රසිද්ධ පාසලකට ගියේ. මම ඒ පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා වෙලා සිටියා. අර්ජුන මහේන්ද්‍රන් මගේ මිත්‍රයෙක්. මම ප්‍රධාන ශිෂ්‍ය නායකයා වෙලා ඉන්න කොට ඔහුත් ශිෂ්‍ය නායකයෙක්. අපි ලංකාවේ බොහෝ දෙනෙක් දන්නවා. ඒ නිසා සමහර වෙලාවට මේවා කියන්නත් ලජ්ජයි. නිවාඩ් කබ්රාල්ගේ පවුලේත් හුඟක් හොඳ වෘත්තියවේදීන් ඉන්නවා. ගැටලුව ඒක නොවෙයි. එහෙමනම් ගැටලුව මොකක්ද? සම්බන්ධතාවක් තිබෙනවා නම්, ළඟදියා ගැටුමක් තිබෙනවා නම්, -අර්ජුන මහේන්ද්‍රන් වෙන්න පුළුවන්; නිවාඩ් කබ්රාල් වෙන්න පුළුවන්- ඒ අය දැන ගන්න ඕනෑ ඒකෙන් අයින් වෙන්න.

ඊළඟට, මේ චෝහාරික විගණන වාර්තාව ආවාට පස්සේ එදා මහ බැංකු අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි 2019 ඔක්තෝබර් මාසයේ 03 වැනි දා හිටපු අධිපති නිවාඩ් කබ්රාල්ට ලියලා කියනවා, "ඔබතුමා කරුණාකර, Forensic Auditorsලා මුණ ගැහෙන්න" කියලා. 08 වැනි දා ඔහු ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමිට ලියලා ඉල්ලනවා, "මට ඔක්කෝම වාර්තා එවන්න" කියලා. 2019 ඔක්තෝබර් මාසයේ 09 වැනි දා නැවතත් ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි නිවාඩ් කබ්රාල්ට ලියලා කියනවා, "මම මේක මුදල් මණ්ඩලයට දන්වා තිබෙනවා" කියලා. ඔක්තෝබර් මාසයේ 14 වැනි දා නැවතත් ඉන්ද්‍රජිත් කුමාරස්වාමි දන්වා කියනවා, "ඔබතුමාට අවශ්‍ය ඔක්කෝම දෙන්න අපි ලෑස්තියි. video conference එකක් හරහා ලබා දෙන්න පුළුවන්" කියලා. ඔක්තෝබර් මාසයේ 18 වැනි දා ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමිට නිවාඩ් කබ්රාල් ලියනවා, "මම බොහොම කාර්ය බහුලයි" කියලා. Mr. Cabraal informed the Governor that he is busy with the Presidential Election campaign and that he would respond once he is back in town.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මා අවසන් කරනවා.

එදා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති, ආටිගල මහතා අවශ්‍ය කරුණු ඔක්කෝම ලිව්වා. නමුත්, චෝහාරික විගණන වාර්තාවට පිළිතුරු දෙන්න තියෙද්දී ඔහු ඒකට පිළිතුරු දුන්නේ නැහැ.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මම තව එක කරුණක් ගැන කියලා කථාව අවසන් කරන්නම්. මේක වෝහාරික විගණන වාර්තාව ගැන නොවෙයි. අගමැතිතුමා ඉන්දියාවට ගිහිල්ලා ප්‍රකාශයක් කරනවා, ඉන්දියාවෙන් ගත්ත ණය නැවත ගෙවන්න අමාරුයි, ඒ නිසා ඒක reschedule කරන්න කියලා. මම දන්නේ නැහැ, නිලධාරින් ඒකට අවස්ථාව දුන්නේ ඇයි, නිලධාරින් ඔහුට හරියට අවවාද කළේ නැත්තේ ඇයි කියලා. මේකෙන් වෙළෙඳ පොළට ගිය signal එක මොකක්ද? වෙළෙඳ පොළට signal එකක් ගියා, "ශ්‍රේණිගත කිරීම් පහළට එනවා, මේ රට විශාල ආර්ථික අර්බුදයකට යනවා. අප්‍රේල් මාසයෙන් පස්සේ ඉන්ධන මිල සූත්‍රයක් විතරක් නොවෙයි, විදුලි මිල සූත්‍රයක්, වතුර මිල සූත්‍රයක් - මේ සියල්ලම - ජනතාව මත පටවන්න වෙනවා. මම කාරණයක් කියන්න කැමැතියි. ඒ ගැන අපේ මේ සිටින ගරු මන්ත්‍රීවරුත් මා එක්ක තරහා වේවි. මේ ගරු මන්ත්‍රීවරුන්ට දෙන permit එකත් අයින් කර ගන්න සිදුවේවි කියලා මා හිතනවා. මොකද, වැරදි ආර්ථික කළමනාකාරිත්වයක් හරහා ජනතාවට මේ වාගේ බර පටවන්න එපා කියලා මා ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිලංග සුමතිපාල රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා.6.17]

ගරු තිලංග සුමතිපාල මහතා (තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலங்க சுமதிபால - தொழில்நுட்ப மற்றும் புத்தாக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. Thilanga Sumathipala - State Minister of Technology and Innovations)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුදු 5ක පමණ කාලය තුළ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තමයි තිබුණේ. මාත් ඒ ආණ්ඩුව කාලයේ අවුරුදු දෙකහමාරක් විතර නියෝජ්‍ය කථානායකවරයා හැටියට කටයුතු කළා. ඒ කාලය තුළ එතුමන්ලා මහන්සි වෙලා මේ දේවල් සොයා නොගත්තේ ඇයි කියලා අද මේ විවාදයට ඇහුම්කන් දෙනකොට මට හිතෙනවා. ඒකට හේතුව මේකයි. ජනතාවගේ පැත්තෙන් හිතන්නේ, දැන් කොපමණ කෑ ගැහුවත් 2015ට කලින් තිබුණු වැරදි, ඒ කාලයේ කරපු අපරාධ, නාස්ති කියන ඒවා පසුගිය නොවැම්බර් මාසයේ 16වන දායින් පස්සේ වලංගුභාවයක් නැහැ කියලායි. ඒක තමයි ජනතාවගේ මතය. ඒ නිසා, අද දවස පුරාම කියන්න උත්සාහ ගත්ත පුද්ගලයන් ගැන, මේ පරීක්ෂණ ගැන කථා කිරීමෙන් වැඩක් වෙයිද කියන එකයි මා මේ කල්පනා කරන්නේ.

එතුමන්ලාට සියලු බලය තිබුණා. අවුරුදු 5ක් එතුමන්ලා ආණ්ඩු කළා. ඒ කාලය තුළ එතුමන්ලා මේ කිසි දෙයක් සොයා බැලුවේ නැද්ද? එහෙම නම්, වගකීමක් ඇති ආණ්ඩුවක් හැටියට එතුමන්ලා මොනවාද කළේ? ජනතාව ඒ ප්‍රශ්නය නඟනවා.

ඊළඟට, මෙන්න මේ කාරණය කෙරෙහි මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න මා කැමැතියි. 1997 වෙනතුරු අප Treasury Billsවලින් තමයි කටයුතු කරගෙන ගියේ. Bonds issue කරන්න අප උත්සාහ ගත්තේ නැහැ. නමුත් ඊට පස්සේ, ආණ්ඩුවට ණය ඕනෑ වුණාම තමයි අපි මේ EPF, ETF, Bank of Ceylon, People's Bank, NSB වාගේ ඒවා යොදාගෙන, ඒවායේ ශක්තිය පාවිච්චි කරලා ප්‍රාග්ධනය වැඩි කරන්න කටයුතු කළේ. 2015 වෙනතුරු අපේ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රජයේ ආයතනවලින් තමයි සහයෝගය ලබා දුන්නේ. ඒ නිසා ඒ වාසිය - ලාභය - EPF එකට හා ETF එකටත්, ඒ වාගේම ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව වැනි රජයේ ආයතනවලටත් විශාල ශක්තියක් වුණා.

2015දී වූ මේ සිද්ධිය මට මතකයි. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාත් සමඟ මාත් මහ බැංකුවට ගියා, මේ ගැන පැමිණිලි කරන්න. මෙවැනි විශාල ප්‍රශ්නයක් ඇති වුණේ, පෞද්ගලික අංශයට ආරාධනා කරලා, දේශපාලන වශයෙන් ගත්ත ඒ තීන්දුව නිසායි. ඒ තීන්දුව අනුව, අපේ දේශීය ආයතනවල ශක්තිය ඉවත් කරලා, පෞද්ගලික අංශය මූල්‍ය පාලනයට පැමිණීම නිසා ඇති වූ තත්ත්වයට තමයි අද අපට මේ මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ. මේක, දේශපාලන වශයෙන් ගත්ත එජ් ආර්ථික ප්‍රතිපත්තියේ වැරැද්ද නිසා සිදු වූ දෙයක්.

මට මතකයි, 2002දී මම ටෙලිකොම් ආයතනයේ සභාපති වශයෙන් කටයුතු කරනකොට EPF එකටයි, ETF එකටයි කිව්වා, සියයට 4ක, 5ක කොටස් ගන්න කියලා. මොකද, අපි කොටස් වෙළෙඳ පොළට සියයට 15ක කොටස් නිකුත් කළා. එහෙම කොටස් ගත්තේ නැත්නම් සියයට පණහේ අයිතිය ලංකාවට තියා ගන්න බැරි වෙනවා. ආණ්ඩු කරන්නත්, ආණ්ඩුව පවත්වා ගෙන යන්නත් මහ බැංකුවේ තිබුණු මූලික සිද්ධාන්තය තමයි අපි 2015දී ප්‍රතිපත්තිමය වශයෙන් විනාශ කළේ. ඉස්සරවෙලාම අපි ඒක තේරුම් ගන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මම කථාව පටන් ගත්තා විතරයි නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපට පැහැදිලිව පෙනෙනවා, පසුගිය රජය කාලයේ මහ බැංකුවේ විශාල හොරකමක් වෙලා තිබෙන බව. ඒ හොරකම ගැන මේ වෙනකොට පරීක්ෂණ පවත්වනවා. ඊට කලින් අවුරුදුවල වූ ඒවා ගැනත් සාකච්ඡා කර තිබෙනවා. පාර්ලිමේන්තුව පාලනය කරන්නේ සම්පූර්ණයෙන්ම විගණකාධිපතිතුමාගේ උපදෙස් මතයි. රාජ්‍ය මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතුවයි තිබෙන්නේ. විගණකාධිපතිතුමාගේ උපදෙස් පාර්ලිමේන්තුවට අවශ්‍යයි. දැන් මේ වෝහාරික විගණනය සඳහා පත් කරන ලද BDO ආයතනය දෙන වාර්තාවේම කියනවා, තුන්වැනි පාර්ශ්වයකට අප වගකියන්නේ නැහැ කියලා. ඒ නිසා, මෙය පාර්ලිමේන්තුවේ විවාදයට ගත යුතුම කාරණයක් වනවා. මේ වාර්තාවේ තිබෙන කාරණා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ උපදෙස් පාර්ලිමේන්තුවට අවශ්‍යයි. මොකද, මේ පාර්ලිමේන්තුවේ Budget office එකක් නැහැ. ඊළඟ වසරට ඕනෑ අය වැය පාර්ලිමේන්තුවෙන් සම්මත කරනවා. නමුත් අය වැය ඉදිරිපත් කරන්න ඉස්සර වෙලා, එය විශ්ලේෂණය කිරීමේ ක්‍රමයක්, pre-Budget system එකක්, අපේ පාර්ලිමේන්තුවේ නැහැ. අපි දිගටම කිව්වා, පාර්ලිමේන්තුවේ Budget office එකක් තිබෙන්න ඕනෑ බව. Budget office එකක් නැති පාර්ලිමේන්තුවකට හැම දාම මේවා විවාද කරන්න සිද්ධ වෙනවා.

මා අවුරුදු ගණනාවක් තිස්සේ පසු පෙළ මන්ත්‍රීවරයකු හැටියට හිඳිමින් කිව්වා, අය වැය කාර්යාලයක් - Budget office - එකක් පාර්ලිමේන්තුවේ ඇති කරන්න කියලා. Budget office එකක් නැති පාර්ලිමේන්තුවකට මේ වෙන අයුතු වැඩ, සල්ලි නාස්ති කරන ඒවා, වියදම් වැඩි වෙන ඒවා, මේ දූෂිත ක්‍රියා ගැන කවදාවත් දැන ගැනීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒවා පාර්ලිමේන්තුවට දැන ගන්න ලැබෙන්නේ නාස්ති කරලා, වියදම් කරලා අවසන් වුණාට පසුවයි. ඊට පස්සේ තමයි අය වැය සම්මත වෙන්නේ; ඊට පස්සේ තමයි audit කරන්නේ. ඒ නිසා තමයි එවැනි කාර්යාලයක් අවශ්‍ය වන්නේ.

අපි අවුරුදු 4කට, 5කට පස්සේ, දැන් මේ audit එකක් පස්සේ ගිහිල්ලා ඉතිහාසයේ සිද්ධ වූ ඒවා ප්‍රශ්න කරන රටක් බවට පත්වෙලා ඉන්නවා. මේ ප්‍රශ්නයෙන් අපට කවදාවත් ගැලවීමක් නැහැ. මේ පාර්ලිමේන්තුවට ස්වාධීන Budget office එකක් අවශ්‍යයි. ඒ වාගේම අය වැය පාලනය දැනගෙන, එය විශ්ලේෂණය කරන්නත් අවශ්‍යයි. ආර්ථික විශ්ලේෂණයකුත් අවශ්‍යයි. අය වැය කාර්යාලයක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපිත කළාම, හැම අය වැයක්ම අවසන් වුණාට පසුව, ගිය අවුරුද්දේ සැලසුම් කළේ කොහොමද, මුදල් වෙන් කරලා තිබුණේ කොහොමද, ඒවා වැය කළේ කොහොමද කියලා සංසන්දනාත්මකව පරීක්ෂා කර බලන්න අපට පුළුවන්. එවැනි අවබෝධයක් නැති පාර්ලිමේන්තුවකට මෙවැනි ප්‍රශ්න කොපමණ ආවත්, ඒවාට විසඳුමක් සොයාගන්න බැහැ කියා මා විශ්වාස කරනවා. කෙසේ වෙතත්, වැරදි කළ අයට රජයක් හැටියට අප දඬුවම් කරන බව පැහැදිලිව කියමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා.6.24]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 5ක කාලයක් වෙන් කර තිබුණා.

ඇත්තටම මේ රජය බලයට ආවේ මේ රටේ ජනතාවට කාරණා තුනක් කියලායි. ඒ ප්‍රධාන කාරණාවලින් එකක් තමයි, පාස්කු ප්‍රහාරයට වග කිව යුත්තන් ගැන සොයනවාය කියන එක. ඊළඟට, MCC ගිවිසුම ගැන කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමානයේ පාස්කු ප්‍රහාරය පිළිබඳව කිසිම කථාවක් නැහැ. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ, අප ආරක්ෂා කළාය කියන දේශපාලනඥයන් ගැන අද මෙතුමන්ලා කථා කරන්නේ නැහැ. අද මෙතුමන්ලා පාස්කු ප්‍රහාරය අමතක කරලා තිබෙනවා. ඒ වාගේම, MCC ගිවිසුමේ සියයට 70ක් දැන් එතුමන්ලාට හොඳ වෙලා තිබෙනවා.

තුන්වන කාරණය තමයි, මේ බැඳුම්කර සිද්ධිය පිළිබඳව ඔවුන් කියපු කාරණා. හැංගි හැංගි වෙස් බැන්දාට මේ අයට නටන්න වෙන්නේ එළිපිටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය 2008 සිට 2014 දක්වා කාලයේ කළ හොරකම්, වංචා අද මේ වෝහාරික විගණන වාර්තාවත් එක්ක රටට හෙළි වෙලා තිබෙනවා. මේ දේවල්වලට එකතු වෙලා හිටපු පී.බී. ජයසුන්දර, අජිත් නිවාඩ් කබ්රාල් වැනි අය දැන් මොකද කියන්නේ? මේ වෝහාරික විගණන වාර්තාව පිළිගන්නේ නැහැ කියලා ඒ අය කියනවා. මේ ගැන අවුරුදු තුන හතරක් තිස්සේ කෑ ගහපු කණ්ඩායම් අද මේ ගරු සභාවේවත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වෝහාරික විගණන වාර්තාවත් එක්ක අද මේ අයගේ නිරුවත හෙළිවෙමින් තිබෙනවා.

විශේෂයෙන්ම බැඳුම්කර සිද්ධි ගැන කථා කරද්දී මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. මේ රටේ අහිංසක, දුගී දුප්පත්, වැඩ කරන ජනතාවගේ දහඩිය මහන්සියෙන් හම්බ කළ මුදල් තිබෙන අර්ථසාධක අරමුදලේ රුපියල් බිලියන 9.9ක් හොරකම් කරපු කණ්ඩායමක් තමයි අපේ පාලනයට කලින් තිබුණු ආණ්ඩුවේ සිටියේ. ඒ පැවතුණු රජයේ මැති ඇමතිවරු, ඒ වාගේම මේ අයට උදව් දුන්න ආර්ථික විශ්ලේෂකයන් කියන අය තවම ඒ මුල් පුටුවල ඉන්නවා. එදා ආණ්ඩුවේ ඇමතිවරුම කියපු විධියට ඒ අය "ආර්ථික ඝාතකයෝ." ඒ අය තවමත් ඒ ප්‍රධාන පුටුවල ඉන්නවා. අපි පැහැදිලිව මේ කාරණය කියනවා. මේ කණ්ඩායම් අද මේ වෝහාරික විගණන වාර්තාව පිළිගන්න සූදානම් නැහැ කියන්නේ, ඒ අයට චෝදනා තිබෙන නිසායි. ඒ අය බැඳුම්කර සිද්ධියට සම්බන්ධ වෙලා හොරකම් කළ නිසා තමයි අද මේ වාර්තාව පිළිගන්නේ නැත්තේ. ඉතින් මේක "හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ" වැඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මිනිත්තු 5ක් තිබුණා. ඒක මිනිත්තු 3ට අඩුවීම ගැන මම කනගාටු වෙනවා. එම සුළු කාලය හෝ ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
විනාඩි පහක් නේද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි තුනයි ඔබතුමාට තිබෙන්නේ.

[අ.භා.6.27]

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය පටන් ගත් වෙලාවේ සිට කළ කථා මම අහගෙන හිටියා. ඒ පැත්තේ අය බැන්නා, මේ පැත්තේ කට්ටිය හොරු කියලා. මේ පැත්තේ කට්ටිය බැන්නා, ඒ පැත්තේ අය හොරු කියලා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බැඳුම්කර සිද්ධියේදී පක්ෂයක් හැටියට අපි යම් යම් දේශපාලන ආදර්ශ ලබා දුන්නා. එනම්, මහ බැංකු අධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම, මුදල් ඇමතිවරයා තනතුරෙන් ඉවත්වීම සහ අගමැතිවරයා බැඳුම්කර කොමිසම ඉදිරියේ සාක්ෂි ලබා දීම. ඒවා අපි ලබා දුන් දේශපාලන ආදර්ශ. නමුත්, මෙරට මහා පරිමාණ වංචාවලට පණ පොවන ආණ්ඩු පක්ෂයේ අයගේ ආදර්ශයක් අපි දුටුවේ නැහැ. අද මෙරට වූ මහා පරිමාණ වංචාවක් ලෙස airbus ගනුදෙනුව ගැන කථා කරනවා. මේවා ගැන කථා කරනකොට අපට අහන්න වෙන්නේ, "වෙහෙරක් ගිලපු එකාට අග්ගලාව කජ්ජක්ද?" කියලායි. ඒ තරමට ඒ පැත්තේ හොරකම් තිබෙනවා.

[ගරු පාලිත තෙවරප්පෙරුම මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යවහාරික විගණන වාර්තාව හදන්න මේ රටේ මුදල් රුපියල් මිලියන 275ක් පමණ වැය කර තිබෙනවා. මේ පිළිබඳව අධිකරණයට කරුණු ඉදිරිපත් කරන්න කියලා අපි ආණ්ඩුවට යෝජනා කරනවා. විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය කියන මේ සෑම දේකම බලය තිබෙන්නේ ආණ්ඩු පක්ෂයේ අයට. ඒ නිසා මේ කරුණ අධිකරණයට ඉදිරිපත් කරලා මෙම සිද්ධියට සම්බන්ධ පල් හොරුන් තනතුරුවලින් ඉවත් කර, ඒ පුද්ගලයන්ට ඉදිරි මැතිවරණයේදී නාමයෝජනා ලබා නොදීමට සහ විශේෂ අධිකරණයක් පත්කොට නීතිමය තත්ත්වය යටතේ දඬුවම් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මා යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ සිටින 225ක් වන මන්ත්‍රීවරුන්ගෙන් කෙනෙක් මම. මගේ පෞද්ගලික වත්තකට ජනවාරි මාසයේ ඉඳලා අද වෙනකොට තුන්වරක් මතුගම පොලීසියේ නිලධාරි මහත්වරු ඇවිල්ලා ගේට්ටුව කඩලා, ඒවාට යතුරු දමලා, පොලීසියේ අය ගේට්ටුව ඉදිරියේ තබලා, මට මරණ තර්ජන කරලා මගේ දේශපාලන ජීවිතයට තර්ජනයක් වන විධියට කටයුතු කරනවා. මේ සම්බන්ධව මම පොලිස් කොමිසමට පැමිණිලි කළා; පොලිස් මූලස්ථානයට පැමිණිලි කළා; කළුතර පොලීසියේ SSP මහතාට පැමිණිලි කළා. නමුත්, ඒ වෙනුවෙන් මට කිසිම සාධාරණයක් ඉටු වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය රජය කාලයේ බන්ධනාගාර නිලධාරින් සහ පොලීසිය එකතු වෙලා වැලිකඩ හිරගෙදර හිටිය 21 දෙනෙක් මරා දැම්ම හැටි අපි දැක්කා. එහෙම මරා දමලා, army එකෙන් අත්අඩංගුවට ගත් ආයුධ 21ක්, අර රාජ්‍ය නිලධාරින් විසින් මරා දැමූ හිරකරුවන් ළඟට දැම්මා.

පසුගිය දවස්වල කළුතර බන්ධනාගාරයේ "සමයං" කියලා අපරාධකාරයෙක් හිටියා. ඒ අපරාධකාරයා police uniform එකක් ඇඳගෙන ඇවිල්ලා සිරකරුවන් පස් හයදෙනෙක් මරලා, ලොකු අපරාධයක් කළා. ඒ නිසා මම දන්නේ නැහැ මගේ ගේට්ටුව ළඟ ඉන්නේ පොලීසියේ අයද, අපරාධකාරයෝද කියලා. පොලීසිය කිසිම නීතිමය තත්ත්වයක් නැතිව; සෝදිසි වරෙන්තුවක් නැතිව; අධිකරණ නියෝගයක් නැතිව, ඉහළ නියෝගයක් කියලා මට හිරිහැර කිරීම නිසා මගේ ජීවිතයට ලොකු අනතුරක් වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් මා කළ පැමිණිලිවලට සාධාරණයක් ඉටු වී නැහැ. මට මේ ගැන කියන්න වෙනත් තැනක් නැහැ. මම පොලීසියට කියලා තිබෙනවා; පොලිස් කොමිසමට කියලා තිබෙනවා. අදත් ඒ අය ඇවිල්ලා තිබෙනවා. මට අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. එම නිසා ඔබතුමා මැදිහත් වෙලා මගේ ජීවිතය ආරක්ෂා කර දෙන්න, මගේ දේශපාලන චරිතය ආරක්ෂා කර දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

එකල්හි වේලාව අ.භා. 6.30 වුයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2020 පෙබරවාරි මස 19වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி.ப 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2020 பெப்ருவரி 19, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

Parliament adjourned accordingly until 1.00 p.m. on Wednesday, 19th February, 2020.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.